පාලිභාෂාවතරණය

දෙවැනි පොත

PALIBHASHAWATHARANAYA

Book Two

අග්ගමහා පණ්ඩිත දර්ශනවිශාරද සාහිත්‍ය චක්‍රවර්තී

පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත

මහානායක ස්ථවිර

විඥාපනය

(1955 දී මුද්‍රණය කරන ලද පාලිභාෂාවතරණය දෙවැනි පොතේ පළ වී ඇති විඥාපනය පාඨකයාගේ දැනගැනීම සඳහා ඒ අයුරින් ම මෙහි ද පළ කරනු ලැබේ.)

පාලිභාෂාවතරණයේ 1 වැනි පොත දැන් දහහත්වැනි වරටත් මුද්‍රිතව තිබෙන බැවින් ඒ පොත කොතරම් ජනප්‍රිය වී තිබේදැයි දත හැක. මේ දෙවැනි පොතේ අටවැනි මුද්‍රණයයි. දෙවෙනි පොත මුලින් තිබුණාට වඩා පිටු 40 කින් පමණ වැඩි වූ බැවින් එහි කර තිබෙන සංස්කරණ විශාල බව පෙනෙනවා ඇත. දෙවෙනි පොතෙන් එහාට ගොස් වැඩිදුර ඉගනීම කරන්නන් ඉතා අඩු බව තෙවැනි පොතෙන් ඔප්පු වේ. එය පළමු වර පළකරන ලද්දේ 1930 දී ය. ඒ පිටපත් දෙදහ අවසන් වීමට අවුරුදු 17 ක් පමණ ගතවිය. එය නැවත විශාල සංස්කරණයකට පමුණුවා 1948 දී දෙවෙනිවර මුද්‍රිත විය. ක්‍රියාකාරක සම්බන්ධය ගැනත් වාක්‍ය විච්ඡේදනය ගැනත් අලුත් පරිච්ඡේද දෙකක් එකට එක්කරන ලදි. දැන් පොතේ ප්‍රමාණය පිටු 215 කි.

එහි පොත්වලින් ගත් උදාහරණය සහිතකොට අර්ථ පැහැදිලි කර තිබෙන නිපාත සංඛ්‍යාව 213 කි. උපග්‍රන්ථයෙහි පාලියේ ඇති තාක් ගැඹුරු - දුර්ලභ වචන තිබෙන තැන් පෙන්වා අර්ථ පැහැදිලි කර තිබේ. ඉංග්‍රීසියේ දැක්වෙන 'ඇනලිසිස්' ක්‍රමයට පාලි වාක්‍යයන් බෙදා කොටුවල යොදා පෙන්වීම මින් පෙර ඇති නොවූවකි. පාලිවාක්‍ය රචනාවට එයින් ලැබෙන රුකුල ඉතා මහති. එබැවින් උසස් විභාගවලට පෙනී සිටින්නන් ඒ (තෙවැනි) පොතෙන් ප්‍රයෝජන ගන්නවා ඇතැයි බලාපොරොත්තු වෙමු.

පාඨ පරීක්ෂණවලට පෙනී සිටින්නන්ගේ වාක්‍ය රචනාව දුර්වල යයි නොයෙක් විට අසන්ට ලැබුණ බැවින් ඒ සඳහා 'පාලි වාක්‍ය රචනාව හා පරිවර්තන පරිචය' නමැති පොතක් 1947 දී පළ කරවන ලදි. එහි අන්‍යොන්‍ය විරුද්ධාර්ථ ඇති ආමක-පක්ක ආදී වචනයන්ගේ සූචියක් ද නිතර එක්ව යෙදෙන හට්ඨ - පහට්ඨ ආදී වචනයන්ගේ

සූචියක් ද වෙති. වර්තමාන ක්‍රියාපදය, ඒකේ අතීත පදය හා පූර්ව ක්‍රියා පද දක්වන අකාරාදී පිළිවෙළින් යෙදූ ක්‍රියා මාලාව පිටු 12 ක් පැතිර පවතී. සිංහල පාලියට පෙරළන සැටි උගන්වන පිටු 30 ක් ද පාලියේ භාෂාරීති දක්වන පිටු 9 ක් ද එහි වෙති. එබැවින් වැඩිදුර ඉගෙන ගනු කැමැත්තන් විසින් ඒ පොත ද ලබාගත යුතු ය.

මා විසින් සම්පාදිත වූ පාලි - සිංහල ශබ්දකෝෂය හා පාලි - ඉංග්‍රීසි ශබ්දකෝෂය දැන් ලබා ගත හැක. "පඨම පාඨාවලී" - "පාලිපාඨාවලී" යන පාලි පාඩම් පොත්වල වචන මාලාවලට ඉංග්‍රීසි තේරුම් යොදා තිබෙන බව ද සැලකිය යුතු.

1-2 වැනි පොත් දෙකේ අභ්‍යාසයන් සිංහලටත් පාලියටත් පෙරළා දෙන "පාලිභාෂාවතරණ යතුර" ක් ද මුද්‍රිතව තිබෙන බව දැනුම් දෙමි. එය ගුරුවරුන්ගේ හා තනිව ඉගෙන ගන්නන්ගේ ප්‍රයෝජනය සඳහා ය.

පොල්වත්තේ බුද්ධදත්ත ස්ථවිර
20-5-1959

අග්ගාරාමය,
අම්බලම්ගොඩ.

පටුන

සංඥා **6**

සන්ධි **7**

1. සර සන්ධි 8
2. ව්‍යඤ්ජන සන්ධි 20
3. නිග්ගහීත සන්ධි 26
4. මිශ්‍රසන්ධි 31

අත්ත-රාජ ශබ්දයෝ 32

මනොගණය **36**

ගො-ශබ්දය **36**

සමාස නාම **41**

1. කම්මධාරය සමාසය 42
2. දිගු සමාසය 46
3. තප්පුරිස සමාසය 51
4. ද්වන්ද සමාසය 53
5. බහුබ්බීහි සමාසය 59
6. අව්‍යයීභාව සමාසය 62
7. මිශ්‍ර සමාස පද 66

තද්ධිත පද **71**

සාමඤ්ඤතද්ධිතයෙහි අපච්චත්ථ 72
සාමඤ්ඤතද්ධිතයෙහි අනෙකත්ථ 72
සාමඤ්ඤතද්ධිතයෙහි අත්ථත්ථ 81
සාමඤ්ඤතද්ධිතයෙහි සංඛ්‍යාතද්ධිත 72
භාව තද්ධිතය 94
අව්‍යය තද්ධිතය 99

ආඛ්‍යාත හෙවත් ක්‍රියාපද **104**

අවශේෂ ධාතු ගණයෝ 122
උපසර්ගයෝ 127
කර්මකාරක ක්‍රියා 135

හෙතුඵ පද 139

කිතක පද 144

කිච්චප්‍රත්‍යයෝ 145

කිත් ප්‍රත්‍යයෝ (වර්තමානයෙහි) 159

අතීත කිත්ප්‍රත්‍යයෝ 159

කාලත්‍රයෙහි කිත්ප්‍රත්‍යයෝ 161

නිපාත මෙන් ගණිනු ලබන (පූර්ව ක්‍රියා) කිතක පද 166

පාලි - සිංහල වචන මාලාව 175

සිංහල පාලි වචන මාලාව 176

පාලිභාෂාවතරණය

දෙවැනි පොත

නමත්ථු සත්ථුනෝ

සංඥා

1. පළමු පොතෙහි දැක්වූ අකුරු 41 අතරෙන්

A. **අ ආ ඉ ඊ උ ඌ එ ඔ**

යන අටදෙන සර (ස්වර) නම් වෙති. ඉතිරි තෙතිස් (33) දෙන ව්‍යඤ්ජන නම් වෙති.

B. ස්වරයන් අතුරෙන් **අ-ඉ-උ** යන තිදෙන රස්ස (හ්‍රස්ව) නම් වෙති. **ආ, ඊ, ඌ, එ, ඔ** යන පස් දෙන දීඝ (දීර්ඝ) නම් වෙති.

C. **ක ඛ ග ඝ ඞ** යන අකුරු පස ක යන්න මුල්කොට ඇති හෙයින් **ක**-වග්ග (කවර්ග) යයි කියනු ලැබේ. එසේ ම:

ච ඡ ජ ඣ ඤ යන පස **ච** - වග්ග නම් වේ.
ට ඨ ඩ ඪ ණ යන පස **ට** - වග්ග නම් වේ.
ත ථ ද ධ න යන පස **ත** - වග්ග නම් වේ.
ප ඵ බ භ ම යන පස **ප** - වග්ග නම් වේ.

ක - යන්න පටන් ම - යන්න අවසන් කොට ඇති මේ විසිපස් දෙන වග්ග හෙවත් **වර්ගාක්ෂර** නම් වෙති.

D. **ඞ - ඤ - ණ - න - ම** යන අකුරු පස වර්ගයන්ගේ කෙළවර සිටි බැවින් **වග්ගන්ත (වර්ගාන්ත)** නම් වෙති.

E. **ය - ර - ල - ව - ස - හ - ළ - අං** යන මොහු වර්ගයන්ට අයත් නැති බැවින් **අවග්ග (අවර්ග)** නම් වෙති.

F. මෙයින් **අං** යන්න බින්දු යයි ද **නිග්ගහීත** යයි ද කියනු ලැබේ. මෙහි අ - යන්න කියවීමේ පහසුව සඳහා යොදනු ලැබේ.

බිඳුව නම් 'ං' යන්න පමණයි. (මෙය පාලියෙහි දීඝ ස්වරයකින් පරව නොයෙදේ.)

G. අතරෙහි ස්වරයක් නැති ව බැඳුණු **'ක්ක' 'ත්ථ'** ආදි ව්‍යඤ්ජන ද්වයකට **සංයෝග** යයි කියනු ලැබේ.

H. අකුරක් මකාදැමීම **ලෝප** නම් වේ (සුවසේ කීම පිණිස සන්ධි කිරීම ආදි ප්‍රයෝජනයක් සලකා ලෝපය කරනු ලැබේ.)

I. තිබෙන අකුරක් මකා අන්‍ය අකුරක් කිරීම **ආදේශ** නම් වේ.

J. තිබෙන අකුරු දෙකක් මැද (ඒ අකුරු නොමකා) අන් අකුරක් කිරීම **ආගම** නම් වේ.

K. එකිනෙකට සමාන වූ ස්වරයෝ **සවණ්ණ** හෝ **සරූප** නම් වෙති.

අ-යන්නට අ-ආ දෙදෙන ද ආ-යන්නට ආ-අ දෙදෙන ද සරූප හෝ සවණ්ණ වෙති. එසේ ම ඉ-කාරයට ඉ-ඊ දෙදෙන ද උ-කාරයට උ-ඌ දෙදෙන ද සරූප-සවණ්ණයෝ වෙති. එ-ඔ දෙදෙනට සමාන රූප ඇති අන්‍ය ස්වරයන් නැති බැවින් ඒ දෙදෙන අසවණ්ණ නම් වෙති.

සන්ධි

2. ළංව සිටි අකුරු දෙකක් එක් කොට ගැළපීම සන්ධි නම් වේ.

ඒ ගැළපීම අකුරු ලොප් කිරීමෙන් හෝ ආදේශ කිරීමෙන් හෝ ආගම කිරීමෙන් හෝ දීඝ කිරීමෙන් හෝ අන්‍යවිධියකින් හෝ කරනු ලැබේ. ගැළපීමක් කටයුතු වන්නේ වෙන්වීමක් ඇති තැනක ය. එබැවින් බොහෝ සේ ම වෙන්වූ පස දෙකක අකුරු එක්කොට සන්ධිය කරනු ලැබේ. ස්වර දෙකක් එක තැන සිටි විට කියවීම අපහසු බැවින් එක් පදයක් තුළ වුවත් (එක් තැන සිටි) ස්වරයක් අතර සන්ධිකාර්‍යය කොට සුඛොච්චාරණය (සුවසේ කිය හැකි බව) ට පමුණුවනු ලැබේ.

1. සරසන්ධි
2. ව්‍යඤ්ජන සන්ධි
3. නිග්ගහීත සන්ධි යයි තුන් කොටසකට බෙදේ.

1. සර සන්ධිය

3. ළංව සිටි (පද දෙක) ස්වර දෙකෙන් එකක් මැකීමෙන් හෝ ආදේශ කිරීමාදී අන්‍ය ක්‍රමයකින් හෝ ගැළපීම සර සන්ධි නම්.

"පුත්තා මෙ අත්ථි" යන තැන "මෙ + අත්ථි" යන වචන දෙක අතරේ සන්ධියක් කටයුතුව තිබේ යයි සලකමු. මෙය වනාහි ස්වර දෙකක් ගළපා කටයුතු සන්ධියකි. එයින් 'අත්ථි' යන තැන අකාරය වෙන්ව තිබෙන නමුත් 'මෙ' යන්නෙහි ස්වරය ව්‍යඤ්ජනයක් හා බැඳී තිබේ. එසේ තිබියදී සන්ධි කිරීම අපහසු බැවින් පළමු කොට ඒ ස්වරය ව්‍යඤ්ජනයෙන් වෙන් කළ යුතුයි. එසේ වෙන් කළ විටඃ-

"ම් - එ + අත්ථි"

කියා සිටී. මෙහි එ - යන්න සන්ධි කටයුතු අකුරු දෙකෙන් මුල් අකුර බැවින් ඊට පූර්වස්වර යයි ද 'අත්ථි' යන තැන අ-යන්න පසුව සිටි අකුර බැවින් පරස්වර යයි ද කියනු ලැබේ.

4. ස්වරයෙන් පරව සිටි කල්හි පූර්ව (මුලින් සිටි) ස්වරයන්ට ලොප් වේ. * යන ව්‍යාකරණ නියමයෙන් 'ම්-එ අත්ථි' යන තැන මුලින් සිටි එ - යන්න මකා දැමියයුතු. ඉන් පසු ම් - යන්න පස්සෙන් සිටි අ - යන්න හා ගැළපූ කල 'මත්ථි' කියා සිද්ධ වේ. එවිට 'පුත්තා මත්ථි' කියා සිටී.

* 'සරාසරෙ ලොපං' කච්චායන සූත්‍ර යි.

සංලක්ෂ්‍යය :-

මේ ව්‍යාකරණ නියමයට අනුව අ - යන්න මුලින් සිට අ-ආ-ඉ-ඊ-උ-ඌ-එ-ඔ යන අකුරු අටෙන් එකක් පරව සිටි කල්හි මුලින් සිටි අ-යන්න මැකිය හැකි. ආ-ඉ-ඊ-උ-ඌ-එ-ඔ යන අකුරු හතෙන් එකක් මුලින් සිට ස්වර අටෙන් එකක් පසු වී සිටි කල්හි ද මුලින් සිටි ස්වර මැකිය හැක. උදාහරණ ස්වල්පයක් මෙසේයි:-

මුලදී තිබුණ සැටි	**ස්වර වෙන් කළ විට**
1. අභිවන්දිය + අග්ගං	- අභිවන්දියේ - අ = අග්ගං
2. පඤ්ඤත්තානෙව+ආසනානි	- පඤ්ඤත්තානෙව් - අ + ආසනානි
3. පඤ්ඤ + ඉන්ද්‍රියං	- පඤ්ඤ් - ආ + ඉන්ද්‍රියං
4. තීණි + ඉමානි	- තීණ් - ඉ + ඉමානි
5. නොහි + එතං	- නොහ් - ඉ + එතං
6. භික්ඛුනී + ඔවාදෙ	- භික්ඛුන් - ඊ + ඔවාදෙ
7. මාතු + උපට්ඨානං	- මාත් - උ + උපට්ඨානං
8. සමෙතු + ආයස්මා සංඝෙන	- සමෙත්-උ+ආයස්මා සංඝෙන
9. ධනම්මෙ + අත්ථි	- ධනම් - ම් - එ + අත්ථි
10. සබ්බෙ + එව	- සබ්බ් - එ + එව
11. අමනුස්ස + උපද්දවො	- අමනුස්ස් - අ + උපද්දවො
12. අසන්තො + එත්ථ	- අසන්ත් - ඔ + එත්ථ
13. තයො + අස්සු ධම්මා	- තය් - ඕ + අස්සු ධම්මා
14. සබ්බම්පි + ඉදං	- සබ්බම්ප් - ඉ + ඉදං

පූර්ව්ස්වර මකා ගැළපූ විට

1. අභිවන්දිය'ග්ගං (=අග්‍රයන් වහන්සේ වැඳ)
2. පඤ්ඤත්තානෙවාසනානි (=පණවන ලද්දු වූ ම ආසනයෝ.)
3. පඤ්ඤි'න්ද්‍රියං (=ප්‍රඥ නමැති ඉන්ද්‍රිය)
4. තීණිමානි - (=මේවා තුනකි.)

5. නො හෙ'තං (=මෙය නො වේ.)

6. භික්ඛුනො'වාදෙ (=භික්ෂූණීන්ට අවවාදය)

7. මාතු'පට්ඨානං (=මවට උපස්ථානය)

8. සමෙතායස්මා සංඝෙන = ආයුෂ්මත් තෙමේ සංඝයා හා එකඟ වේවා.)

9. ධනම්ම'ත්ථි (=මට ධනය තිබේ.)

10. සබ්බෙ'ව (=සියල්ලෝ ම)

11. අමනුස්සු'පද්දවො (අමනුෂ්‍යොපද්‍රවය.)

12. අසන්තෙ'ත්‍ථ (=මෙහි අසත්පුරුෂයෝ)

13. තය'ස්සු ධම්මා (=ධර්මයෝ තිදෙනෙක් වන්නාහ.)

14. සබ්බම්පි'දං (=මේ සියල්ලම)

5. අසමානස්වරයා කෙරෙන් පරවූ ස්වරය ඇතැම් විට ලොප් කරනු ලැබේ.[1]

අ- ආ දෙදෙනාට ඉ-ඊ ආදී අන්‍ය ස්වරයෝ සියලු දෙන අසමානයහ. ඉ-ඊ දෙදෙනට අ-ආ-උ-ඌ ආදී අන්‍ය ස්වරයෝ අසමානයහ. මේ ක්‍රමයෙන් ඉතිරි ස්වරයන්ගේ ද අසමානත්වය සලකාගත යුතුයි.

මුලදී සිටි ආකාරය	පරස්වරය මකා සන්ධි කළ පසු
යස්ස + ඉදානි	= යස්සදානි (= යමකට දැන්)
සඤ්ඤූ + ඉති	= සඤ්ඤූති (=සංඥවයැයි)
ඡායා + ඉව	= ඡායාව (=සෙවණැල්ල මෙන්)
ඉති + අපි	= ඉතිපි (=මෙසේ ද)
චක්ඛු + ඉන්‍ද්‍රියං	= චක්ඛුන්‍ද්‍රියං (=ඇස නමැති ඉන්‍ද්‍රිය)
අකතඤ්ඤූ + අසි	= අකතඤ්ඤූ'සි (=අකෘතඥ වෙහි.)
තෙ + අපි	= තෙ'පි (=ඔවුහු ද)
වන්‍දෙ + අහං	= වන්‍දෙ'හං (= මම වඳිමි.)
සො + අහං	= සො'හං (= ඒ මම)
අනාථපිණ්ඩිකො+අපි	= අනාථපිණ්ඩිකො'පි (= අනේපිඬු

* 'වා පරො අසරූපා'

සිටුතෙමේ ද)

මොග්ගල්ලානො+ආසි = මොග්ගල්ලානො'සි

(= මෞද්ගල්‍යාන ස්ථවිර තෙම විය.)

කථා + එව කා = කථාවකා (= කුමන කතාවක් ද?)

පාතො + එව = පාතො'ව (= උදෑසන ම)

ආබාධිකො + අහං = ආබාධිකො'හං (= රෝගී වූ මම)

දෙවතා නු + අසි = දෙවතා නු'සි?(=දේවතාවක් හෝ වෙහි ද?)

සංලක්ෂ්‍යය :-

යස්සදුනි යන තැන පූර්ව ස්වරය ලොප් කොට **යස්සිදුනි** කියා ද සන්ධි කළ හැක. එහෙත් 'තෙ අපි' යන තැන පූර්ව ස්වරය ලොප් කොට 'තපි' කියා සන්ධි කළහොත් සන්ධි කොට තිබෙන්නේ අසවල් පද දෙකයයි තේරුම් ගැනීම අපහසු වේ. එබැවින් එවැනි තැන්වලදී පූර්ව ස්වර ලෝප සන්ධිය නොකොට පරස්වර ලෝප සන්ධිය කටයුතු.

6. අසමාන වූ පූර්ව්‍ස්වරයා ලොප් කළ කල්හි පසුව සිටි ඉ-ඊ දෙදෙන එ-කාර බවට ද උ-ඌ දෙදෙන ඔ - කාර බවට ද පැමිණෙත්.[1]

"බන්ධුස්ස + ඉව" යන තැන සකාරයේ අකාරය ලොප් කළ විට පරස්වරය වූ ඉ - යන්නට එ - යන්නක් වේ. එවිට 'බන්ධුස්ස් + එව කියා සිටී. එක් කළ කල්හි **බන්ධුස්සෙව** කියා වේ.

"ජින + ඊරිතං" යන තැන න-යන්නේ අ-යන්න ලොප් කොට පසුව සිටි ඊ - කාරයට එ - කාරයක් කළ කල්හි **ජිනෙරිතං** කියා සිටී.

"යථා + උදකෙ" යන තැන ථා - යන්නේ ආ - යන්න ලොප් කොට පසුව සිටි උ-යන්නට ඔ-යන්නක් කළ කල්හි **යථොදකෙ** කියා සිටී. මෙසේ ම:-

උප + ඉක්ඛති = උපෙක්ඛති (=මධ්‍යස්ථ වේ.)

උප + ඉතො = උපෙතො (=යුක්ත වූයේ)

[1] "සවචාසවණ්ණං ලුත්තෙ"

න + උපෙති = නොපෙති (= නො එළඹේ)

චන්ද + උදයෝ = චන්දෙදයෝ (සඳුගේ උදාවීම)

යන සන්ධි ද වෙති.

අභ්‍යාසය 1
සිංහලට නැඟිය යුතු

1. තෙසං ද්වින්නං නිවෙසනෙසු බහූන්නං භික්ඛූනං පඤ්ඤත්තානෙ'වා'සනානි හොන්ති. 2. 'පුත්තා ම'ත්ථි ධනම්ම'ත්ථි ඉති බාලො විහඤ්ඤති. (ධම්මපද) 3. පුරා වෙසාලිවාසීනං මහන්තො රොගුපද්දවො අහොසි. 4. සබ්බෙ'ව මයං ධම්මං සුත්වා තං සාධුකං මනසිකරිස්සාම. 5. සබ්බම්පි'දං අම්හාකං දෙහනිස්සිතං විනස්සති. 6. 'නො හෙ'තං භන්තෙ'ති භික්ඛූ භගවතො වදිංසු. 7. දුසෙනාහටානි දුරූනි ගහෙත්වා දුසී යාගුං පචි. 8. යදූ'හං නගරමගමාසිං තදෙ'කො පුරිසො මම ඡත්තං ගණ්හි. 9. දුරකා පුප්ඵානො'චිනිතුං වනං ගන්ත්වා සෙතානි'පි නීලානි'පි පුප්ඵානා'හරිංසු. 10. තෙන හා'වුසො ගණ්හථ මෙ පත්තචීවරන්ති ථෙරො ආහ. 11. ථෙරො නාසාය තෙලං අසිඤ්චන්තො නිසින්නකො'ව ආසිඤ්චිත්වා අන්තොගාමං පාවිසි. (ධ. අ.) 12. අනාථපිණ්ඩිකො'පි විසාඛා'පි මහාඋපාසිකා නිබද්ධං දිවසස්ස ද්වෙ වාරෙ තථාගතස්සුපට්ඨානං ගච්ඡන්ති. 13. උග්ගණ්හිතුකාමා දුරකා පාතො'වුට්ඨාය කිඤ්චි භුඤ්ජිත්වා සත්ථුසාලං ගච්ඡන්ති. 14. කුම්භඝොසකො කාලස්සෙ'ව වුට්ඨාය රාජගහනගරෙ කම්මකාරෙ පබොධෙසි. 15. මහාමහින්දථෙරො අඤ්ඤෙහි චතූහි පබ්බජිතෙහි සද්ධිං ලඞ්කාදීපමාගන්ත්වා ජිනෙරිතං ධම්මං ලඞ්කිකානං දෙසෙසි.

පළමු පොතෙහි නොදැක්වූ මේ අභ්‍යාසය සම්බන්ධ වචනඃ-

අන්තොගාම = ඇතුල්ගම,
ගම ඇතුළ. න.
අහොසි = විය
ආවුසො - ඇවැත්නි. නි.
(ආලපන)
ආසිඤ්ඤන්ත = ඉසින; ඉසිමින්,
වත්කරන. 3.
ආසිඤ්ඤිත්ථා = ඉස, වත්කොට
ආහ = කීයේ ය.
ඉති = මෙසේ. නි.
උග්ගණ්හිතුකාම = ඉගෙනගනු
කැමති. 3.
උපට්ඨාන = එළඹ සිටීම, වතාවත්
කිරීම. න.
කාලස්සෙව - කලින් ම. නි.
කිඤ්චි = කිසිවක්. නි.
කුම්භසොසක = නමක්. පු.
තථාගත = සර්‍වඥ, බුදුර. පු.
තෙල = තෙල්. න.
ථෙර = ස්ථවිර. පු.
දෙහනිස්සිත = ශරීරය ආශ්‍රිත. 3.
ද්වෙ වාරෙ = දෙ වරක්
නිබඣං = නිතර. ක්‍රි. වි.
නිවෙසන = ගෙය. න.
පඤ්ඤත්ත = පිළියෙළකළ,
පැණවූ. 3.
පත්තචීවර - පාත්‍රය හා සිවුර. න.
පබොධෙති = පුබුදුවයි.
නින්දෙන් නැගිටුවයි.
පබ්බජිත = පැවිදි වූ, පැවිද්ද. පු.
බාල = අඥානයා. පු.
භන්තෙ = ස්වාමීනි, (ආලපන)
රොගුපද්දව = රෝගය නිසා
පැමිණි උවදුර. පු.
ලංකික = ලක්දිව උපන්. පු.
විනස්සති = විනාශ වේ.
විහඤ්ඤති = වෙහෙසේ
වුට්ඨාය = නැගිට. පූ. ක්‍රි.
වෙසාලිවාසී=විශාලනුවරවැසියා. පු.
සත්ථසාලා = පාසැල. ඉ.

සන්ධි සහිත කොට පාලියට නැගිය යුතු

1. මා ගමට ගිය කල්හි මගේ එක් මිත්‍රයෙක් මට පොතක් දුන්නේ ය. 2. සියලු සත්වයෝ ම තමන්ගේ ශරීරයන් හැරදමා පරලොව යති. 3. කුමරියෝ නිල් වූ ද රතු වූ ද මල් නෙලා ගෙනවුත් මවුට ද පියාට ද දුන්හ. 4. පියා ගෙනා ගෙඩි දහයක් මවිසින් පුතුන්ට ද දූන්ට ද බෙදා දෙන ලදහ. 5. සර්‍වඥයන් වහන්සේට වැඩහිඳීමට ජේතවන විහාරයෙහි බොහෝ ආසනයෝ පණවන ලද්දෝ ම වූහ.

6. පෙර ලක්වැසියන්ට මහත් වූ අමනුෂ්‍යොපද්‍රවයක් ද රෝගයක් ද ඇතිවිය. 7. 'ඇවැත්නි, එය (එසේ) නොවේ' යයි සැරියුත් මහ තෙරුන් වහන්සේ භික්ෂූන්ට කීහ. 8. 'අපි හෙට සැවැත් නුවරට යන්නෙමු' යි ස්ථවිරතුමා ගම්වැසියන්ට කීහ. 9. භික්ෂුතෙම උදෑසන ම නැඟිට මලු හැමදීමාදිය කරයි. 10. සර්‍වඥදේශිත ධර්‍මය වට්ටගාමණී අභය රජුගේ කාලයේදී පොත්වල ලියන ලදි. 11. රෝගී වූ මම විසි දිනක් වෙදකුගෙන් බෙහෙත් අනුභව කොට නිරෝගී වීමි. 12. සර්‍වඥතෙමේ විහාරට පැමිණි සියලු දෙනට ම ධර්‍මය දේශනා කෙළේ ය. 13. අනේපිඬු සිටුතුමාත් විශාඛා උපාසිකාවත් සැවැත් නුවර විහාර දෙකක් සාදවා තථාගතයන් වහන්සේට දුන්හ. 14. උන්වහන්සේත් ඒ කුල දෙක නිසා අවුරුදු 26 ක් සැවැත් නුවර විසූහ. 15. මිගාර සිටුතුමා ද තමාගේ ලේලිය වූ විශාඛාව මවු තනතුරෙහි තැබී ය. එබැවින් ඕතොමෝ 'මිගාරමාතා' යි ප්‍රකට විය.

මෙහි ආ අමුතු වචන

ගම්වැසියා = ගාමවාසී. පු.
ගිය කල්හි = ගතෙ
නිසා = නිස්සාය. පූ. ක්‍රි. නි.
නෙලා = ඔචිනිත්වා
පරලොව = පරලොක. පු.
පොත = පොත්ථක. පු. න.
ප්‍රකට විය = පඤ්ඤායි
බෙහෙත = භෙසජ්ජ. න.
හැරදමා = චජිත්වා, පහාය. පූ. ක්‍රි.
මලු ඇමදීමාදිය = මාලක - සම්මජ්ජනාදි. පු. න.
මවුතනතුර = මාතුට්ඨාන. න.
ලියනලද = ලිඛිත. 3.
ලේලිය = සුණිසා. ඉ.
වැඩහිඳීමට = නිසීදිතුං. නි.
ශරීරය = දෙහ. පු. න.
සත්‍වයා = සත්ත, පාණි. පු.

7. **පූර්‍ව ස්වරය ලොප් කළ විට ඇතැම් තැනක පරස්වරයට දීර්ඝ වේ. (අ, ඉ, උ යන මොවුන්ට පිළිවෙළින් ආ - ඊ - ඌ යන මොහු වෙතියි දත යුතු.)**

"බුඬ + අනුස්සති" යන තැන පූර්වස්වරය වූ අ-කාරය ලොප් කළ විට "බුද්ධ + අනුස්සති" කියා සිටී. පරස්වරය වූ අ-කාරයට දීර්ඝ කළ විට "බුද්ධ + ආනුස්සති" කියා සිටී. එක්කළ විට බුද්ධානුස්සති කියා වේ.

මුලින් සිටි ආකාරය	පූර්වස්වරය ලොප් කොට පරස්වරය දීර්ඝ කොට එක් කළ විට
1. තත්‍ර+ අයං	= තත්‍ර් + ආයං = තත්‍රායං
2. තද් + අහං	= තද් + ආහං = තදහං
3. යානි + ඉධ	= යාන් + ඊධ = යානීධ
4. ගච්ඡාමි + ඉති	= ගච්ඡාමි + ඊති = ගච්ඡාමීති
5. කිකී + ඉව	= කික් + ඊව = කිකීව
6. බහු + උපකාර	= බහ් + ඌපකාර = බහූපකාර
7. මධු + උදකං	= මධ් + ඌදකං = මධූදකං
8. සු + උපධාරිතං	= ස් + ඌපධාරිතං = සූපධාරිතං
9. යොපි + අයං	= යොප් + ආයං = යොපායං
10. ඉදානි + අහං	= ඉදාන් + ආහං = ඉදානාහං
11. සචෙ + අයං	= සච් + ආයං = සචායං
12. තථා + උපමං	= තථ් + ඌපමං = තථූපමං
13. අප්පස්සුතො+අයං	= අප්පස්සුත් + ආයං = අප්පස්සුතායං

8. පරස්වරය ලොප් කළ විට ඇතැම් තැනක පූර්වස්වරය දීර්ඝ බවට පැමිණේ. [1]

"පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති" යන තැන ලොකස්ස + ඉති" යි විසන්ධි කළ යුතුයි. එහි පරස්වරය වූ ඉ-කාරය ලොප් කළ විට පූර්වස්වරය වූ අ - කාරයට දීර්ඝ වේ. හෙවත් ආකාරයක් වේ. එවිට ලොකස්සාති යි සිටී. අන්‍ය උදාහරණ :-

දෙව + ඉති = දෙවාති (දේවයන් වහන්සැයි)

විජ්ජු + ඉව = විජ්ජූව (විදුලිය මෙන්)

[1] "පුබ්බොච"

වි + අතිනාමෙන්ති = වීතිනාමෙන්ති (කල්යවත්)
සාධු + ඉති = සාධූති (යහපතැයි)
කිංසු + ඉධ විත්තං = කිංසූධ විත්තං (මෙහි කිනම් සම්පතක්)

9. ස්වරයක් පර කල්හි ඇතැම් තැනක පූර්ව සිටි ඔ - උ දෙදෙනට ව් - කාරයක් වේ.[1]

අනු + අද්ධමාසං = අන්වද්ධමාසං (අඩමසක් පාසා)
සු + ආගතං = ස්වාගතං (යහපත්වීම)
සු + අක්ඛාතො + ස්වාක්ඛාතො (මනාකොට කියන ලදී)
සො + අහං = ස්වාහං (ඒ මම)
යො + අයං = ය්වායං (යම් මේ)
මේ තුන් තැන පරස්වරයට දීර්ඝ ද වේ.
අනු + එති = අනෙති = (අනුව ඒ)
න තු + එව = නතෙව = (නැත්තේ ම ය)
අථබ්බො + අස්ස = අථබ්බවස්ස (ඉක්බිති ඔහුට)
යාවතකො + අස්ස කායො = යාවතක්වස්ස කායො (ඔහුගේ ශරීරය යම් පමණ වේ ද.)

10. ස්වරයක් පර කල්හි ඇතැම් තැනක ය-ව-ම-ද-න-ත-ර-ළ යන අකුරු ආගම වෙති.[2] **(ආගමය කුමක් දැයි මෙහි 8 පිටේ J අක්ෂරයෙන් විස්තර කරන ලදි.)**

න + ඉදං	= නයිදං (මෙය නොවේ)
න + ඉධ	= නයිධ (මෙහි නොවේ)
ති + අඞ්ගුලං	= තිවඞ්ගුලං (අඟල් තුනක්)
අත්ත + අත්ථා	= අත්තදත්ථා (ආත්මාර්ථය)
ඉතො + ආයති	= ඉතොනායති (මින් මත්තෙහි)
තස්මා + ඉහ	= තස්මාතිහ (එබැවින්)
නි + අන්තරං	= නිරන්තරං (නිරතුරුව)
නි + උත්තරො	= නිරුත්තරො (වඩා ශ්‍රේෂ්ඨයකු නැති)

[1] "වමොදුදන්තානං"
[2] "යවමදනතරළා චාගමා"

ඡ + අභිඤ්ඤ = ඡළභිඤ්ඤ (අභිඥවෝ සඳෙන)

අභ්‍යාසය 2

සිංහලට නැඟිය යුතු

1. "ස්වා'යං කුමාරො අගාරං අජ්ඣාවසති රාජා භවිස්සති චක්කවත්ති."

2. "සම්ම, ඉදනා'හං විහාරං ගන්ත්වා ථෙරං තයා කතපණ්ණසාලායං නිසින්නං දිස්වා ආගතො'ම්හි." (ධ.අ.)

3. "ස්වා'හං අබ්බුළ්හසල්ලො'ස්මි,
සීතිභූතො'ස්මි නිබ්බුතො"

4. "කොපි ත්වං භන්තෙ'ති? ථෙරස්ස භාගිනෙය්‍යොම්හීති.

5. "යථා හි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රුහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තතී දුක්ඛමිදං පුනප්පුනං. (ධම්මපද)

6. "කිංසූ'ධ චිත්තං පුරිසස්ස සෙට්ඨං
කිංසූ සුචිණ්ණො සුඛ'මාවහාති?"
"සධීධ චිත්තං පුරිසස්ස සෙට්ඨං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති." (සංයුත්ත)

7. "තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං පඤ්ඤුවුඩියා වඩ්ඩිස්සාමාති." (අඞ්ගුත්තර එකක නිපාත) 8. "තයො, මෙ භික්ඛවෙ ගිලානා සංවිජ්ජමානා ලොකස්මිං.... තයො' මෙ ගිලානූපමා පුග්ගලා." (අඞ්ගුත්තර) 9. අණ්ඩං රක්ඛන්ති කිකී'ව, වාලධිං රක්ඛන්ති චමරී'ව තුම්හෙ'පි සාධුකං අත්තනොසීලං රක්ඛථ.

10. 'තතො නං සුඛ'මෙති ඡායා'ව අනපායිනී.' (ධම්මපද)

11. යාවතකවස්ස කායො, තාවතකවස්ස ව්‍යාමො (හොති).

12. 'නයි'ධ නච්චං වා ගීතං වා තාළං වා සුසමාහිතං." (ජාතක)

මෙහි ආ අමුතු වචන

ආගාර = ගෙය, න.
අජ්ඣාවසති = වාසය කෙරේ
අනපායිනී = අත්හැර
නොයන්නී. ඉ.
අසි = වෙහි
අනුපද්දව = උපද්‍රව නැති. 3
අනූහත = නොඉදුරු. 3.
අබ්බුළ්හසල්ල=ඉදුරුහුල් ඇති. 3.
අම්හි = වෙමි
අස්මි = වෙමි
ආවහති = එළවයි, ගෙන දෙයි
කිකී = කිරල්දෙන. ඉ.
කිංසු=ප්‍රශ්න විචාරීමෙහි නිපාත
යක්. නි.
ගිලාන = රෝගියා. පු. රෝගීවූ
ගිලානූපම = රෝගියාට
සමාන වූ. 3.
ගීත = ගී කීම. න.
චක්කවත්ති = සක්විති. පු.
චමරී = සෙමරා. පු.
තණ්හානුසය = මුල්බැසගත්
තෘෂ්ණාව. පු.
තස්මා = එහෙයින්. නි.
තාදිස = එවැනි. 3.
තාවතක = එපමණ. 3.
තාළ = තූර්‍යවාදනය. න.
නච්ච = නැටීම. න.
දළ්හ = දැඩි, ස්ථීර. 3.
නිබ්බුත = නිවුණු, සංසිඳුණු. 3.
පණ්ණසාලා = පන්සල. ඉ.
පුග්ගල = පුද්ගලයා. පු.
පුනප්පුනං = නැවත නැවත. නි.
භාගිනෙය්‍ය = බෑනා. පු.
යාවතක = යම්පමණ. 2.
රාජ = රජ. පු.
රුහති = නැගේ, වැඩේ
වාලධි = වල්ගය. පු.
විත්ත = සම්පත. න.
ව්‍යාම = බඹය. පු.
සද්ධා = ශ්‍රද්ධාව. ඉ.
සම්ම = මිත්‍රය. පු. (ආලපන)
සංවිජ්ජමාන = විද්‍යමාන වූ.
ඇත්තා වූ. 3.
සික්ඛිතබ්බ = හික්මිය යුතු. 3.
සීතිභූත = සිහිල් වූ. 3.
සුචිණ්ණ = මනාසේ පුරුදු කළ. 3.
සුසමාහිත = මනාසේ යෙදූ. 3.
සෙට්ඨ = ශ්‍රේෂ්ඨ වූ. 3.

හැකි තැන්වල සන්ධි යොදමින් පාලියට නැඟිය යුතු ය.

1. මෙහි රැස්වූ යම් අමනුෂ්‍ය කෙනෙක් වෙත් නම් ඒ සියලු දෙන ම සතුටු සිතැත්තෝ වෙත්වා. 2. මහණෙනි, මේ අකුශල මූලයෝ තුන්දෙනෙක්

වෙති. 3. යම් සේ කැපූ ගස බිම වැටේ ද, එමෙන් මාරයා විසින් මනුෂ්‍යයෝ මරණයට හෙළනු ලැබෙත්. 4. ඒ මම තාගේ කීම නොකරමි. මාගේ මෑණියන් කී සේ කරමි. 5. ඉදින් මේ කුමරා පැවිදි වන්නේ නම් බුද්ධත්වය ලබන්නේ ය. 6. මම දැන් මාගේ දරුවන් සමග විහාරයට ගොස් බණ අසා ආවෙමි. 7. මාණවකය, නොපැතිය යුත්තක් පතන තෝ අඥානයෙක් වෙහි. 8. 'මේ ගම අසල කිසියම් කැලෑබද විහාරයක් ඇත්තේ දැ'යි ඇසූ විට උපාසකයා 'ස්වාමීනි ඇතැ'යි කීය. 9. ඇමතියා 'යහපති, දේවයන් වහන්සැ'යි කියා රජගෙයින් නික්ම ගියේ ය. 10. ආනන්ද සිටුතෙමේ අඩමසක් පාසා තමාගේ නෑයන් රැස් කරවා ඔවුන් ඉදිරියෙහි පුත්‍රයාට අවවාද කෙළේ ය. 11. යම් සේ එක් ඇසක් ඇති මිනිසෙක් ඒ ඇස රක්නේ ද, එමෙන් ශීලය මනාව රැක්ක යුතු. 12. දේවතාවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට එළඹ උන්වහන්සේට වැඳ ප්‍රශ්නයක් විචාළේ ය.

1. පඤ්චින්ද්‍රියානි, සත්තුත්තමෝ, සුරියොදයෝ, ධම්මානුස්සති, අත්‍රාහං, යානිමානි, තාවදෙව, ස්වාහං, තාතාති, සඬ්ඪ, මිගීව, හඤ්ඤං, තතොහං, හතචක්ඛුස්මි, නෙව තාවාහං, චත්තාරොමෙ, සම්මදක්ඛාතෝ යන සන්ධීන් වෙන් කොට සන්ධිවූ ආකාරය දක්වනු.

2. තත්‍ථ + අහං, තස්ස + උපරි, අජ්ජ + එව, තදා + අපි, වසලෝ + ඉති, අවිජ්ජා + ඔඝෝ, මූළ්හෝ + අපි, තථා + එව, දු + අංගුලං, අථ ඛෝ + එතං, න + උදෙති, තානි + අහං යන මේවා සන්ධිකොට දැක්විය යුතු.

සිංහල කොටසෙහි ආ අමුතු වචන

අකුශලමූලය = අකුසලමූල.න.	ප්‍රශ්නය = පඤ්හ. 3.
අමනුෂ්‍යයා = භූත. පු. න.	බුදුබව = බුඬත්ත. න.
අවවාද කෙළේය = ඔවදි	මාණවකයා = මාණව. පු.
ඇමතියා = අමච්ච. පු.	මාරයා = මාර. පු.
උපාසකයා = උපාසක. පු.	රජගෙය = රාජගෙහ, රාජභවන. න.
කැලැබද = අරඤ්ඤක. 3.	රැස්කරවා = සන්නිපාතෙත්වා. පූ.ක්‍රි.
කීම = වචන, න. කථා. ඉ.	රැස්වූ = සමාගත. 3.
කී සේ = වුත්තනයෙන	විචාළේය = පුච්ඡි
නොපැතිය යුතු = අපත්ථිය. 3.	විද්‍යමාන වේ = විජ්ජති
පතන = පතොන්ත. 3.	සතුටු සිතැති = සුමන. 3.
පැවිදි වේ = පබ්බජති	හෙළනු ලබයි = පාතීයති

2. ව්‍යඤ්ජන සන්ධිය

11. **ස්වරයා කෙරෙන් පර වූ ව්‍යඤ්ජනයට යෝග්‍ය ස්ථානයේදී ද්විත්ව වේ.[1] (ද්විත්වය නම් එක් ව්‍යඤ්ජනය දෙකක් කිරීමයි. ක් යන්න 'ක්ක' යි යෙදීම කකාරය ද්විත්ව කිරීමයි.**

අ + පමාදෙ = අප්පමාදෙ (අප්‍රමාදය)
සු + පතිට්ඨිත = සුප්පතිට්ඨිත (මනාව පිහිටි)
අනු + ගහො = අනුග්ගහො (අනුග්‍රහය)
වි + ඤාණං = විඤ්ඤාණං (සිත; විඥානය)
දු + කර = දුක්කර (කිරීමට අපහසු)
අව + සයො = අවස්සයො (පිහිට)
අප්ප = සුතො = අප්පස්සුතො (ස්වල්ප ඉගනීම් ඇත්තා.)
පරි + චජති = පරිච්චජති (පරිත්‍යාග කරයි)

උප + දවො = උපද්දවො (උපද්‍රවය)

[1] "පරද්වෙභාවො ඨානෙ."

උප + කිලිට්ඨ = උපක්කිලිට්ඨ (කිලිටි වූ)

නි + මල = නිම්මල (මල රහිත වූ)

පරා + කමො = පරක්කමො (පරාක්‍රමය) (මෙතැන පූර්ව ස්වරය හ්‍රස්ව වේ.)

12. ස්වරයකින් පර වූ වර්‍ගීයන්ගේ දෙවෙනි සතරවැනි (මහා ප්‍රාණ අක්‍ෂරයන්ට ද්විත්ව වෙන විට ඒ ඒ වර්ගයන්ගේ පළමු තෙවැනි (අල්පප්‍රාණ) අක්‍ෂරයෝ වෙති.[1]

(ක වර්‍ගයේ දෙවෙනි අකුර ඛ - යන්නයි. එයට ද්විත්ව වෙන විට තවත් ඛ - යන්නක් නොවී ඒ වර්ගයේ මුලකුරවූ ක් - යන්නක් වේ. එවිට 'ක්ඛ' යි සිටී, වර්ගයන්ගේ දෙවැනි අක්‍ෂරයන්ට ප්‍රථම අක්‍ෂරයෝත් සිවුවෙනි අක්‍ෂරයන්ට තෙවැනි අක්‍ෂරයෝත් ද්විත්ව වශයෙන් පැමිණෙතියි දතයුතු.)

දු + භික්ඛං = දුබ්භික්ඛං (දුර්භික්‍ෂය)

නි + ධනො = නිද්ධනො (ධනය නැත්තා)

නි + භය = නිබ්භය (භය නැති)

පඨම + ඣානං = පඨමජ්ඣාන (ප්‍රථමධ්‍යානය)

රූප + ඛන්ධා = රූපක්ඛන්ධා (රූපස්කන්ධය)

ආයු + ඛයො = ආයුක්ඛයො (ආයුෂ ගෙවීම)

සෙත + ඡත්තං = සෙතච්ඡත්තං (සුදු කුඩය)

තත්‍ර + ඨිතො = තත්‍රට්ඨිතො (එහි සිටියේ)

නි + ඵලං = නිප්ඵලං (ඵල රහිත දෙය)

උ + ඝොසනං = උග්ඝොසනං (=උද්ඝෝෂණය කිරීම)

13. ව්‍යඤ්ජනයක් පරකල්හි ඇතැම් විට ස්වරයෝ දීර්ඝ බවට පැමිණෙත්.[2] **(මෙය වනාහි බොහෝ සේ ගාථාවල ශබ්දස් නොබිඳීම පිණිස කරනු ලැබේ.)**

ඛන්ති + පරමං + ඛන්තී පරමං

ජායති + සොකො = ජායතී සොකො

---

[1] "වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා"

[2] "දීඝං

මඤ්ඤති + බාලො = මඤ්ඤතී බාලො

නිබ්බත්තති + දුක්ඛං = නිබ්බත්තතී දුක්ඛං

(9 වැනි අඞ්කයෙහි දැක්වූ 'ස්වාහං, ස්වායං' යන දෙතැන ඔකාරයට වකාර කළ පසු පරස්වරය දීර්ඝ වන්නේ මේ 13 වැනි රීතියෙනැයි දත යුතු.)

14. සංයුක්ත ව්‍යඤ්ජනයක් (බැඳි අකුරක්) පරවූ කල්හි බොහෝ සේම ස්වරයෝ හ්‍රස්ව බවට පැමිණෙත්.[1]

පාලියෙහි බැඳි අකුරකට මුලින් දීර්ඝ ස්වරයක් දක්නා ලැබෙන්නේ ස්වල්ප වශයෙනි.

"මහා + ඵලං" යන තැන 12 වැනි රීතියෙන් ද්විත්වය වූ පසු මේ (14 වැනි) රීතියෙන් පූර්ව ස්වරයට හ්‍රස්ව වේ. එවිට "මහප්ඵලං" යි සිටී.

ආ + ඛාතො = අක්ඛාතො (කියන ලද්දේ)

තණ්හා + ඛයො = තණ්හක්ඛයො (තෘෂ්ණාව ක්‍ෂය කිරීම)

ආණා + ඛෙත්තං = ආණක්ඛෙත්තං (අණ පවත්නා තැන)

යන මේ තැන් ද 'මහප්ඵල' යන්න මෙන් සිඛවෙත්.

පරා + කමො = පරක්කමො (පරාක්‍රමය) ආ + සාදෙ = අස්සාදෙ (ආස්වාදය : රස විඳීම) යන තන්හි 11 වැනි රීතියෙන් ද්විත්වය වූ පසු පූර්ව ස්වරයට හ්‍රස්ව වේ.

යිට්ඨං වා + හුතං වා + ලොකෙ = යිට්ඨංව හුතංව ලොකෙ

යදි වා + සාවකෙ = යදි ව සාවකෙ

භොවාදී + නාම සො = භොවාදි නාම සො යන තන්හි ඡඳස් නොබිඳීම සඳහා හ්‍රස්ව වේ.

15. ව්‍යඤ්ජනයක් හෝ ස්වරයක් පර වූ කල්හි එත - ත - යන ශබ්දයන්ගේ පඨමා එකවචනයෙහි වූ ඔකාරයට අකාරයක් වේ.[2]

---

[1] 'රස්සං'

[2] 'ලොපං ව තත්‍රාකාරො'

එසො + ධම්මො = එසධම්මො = (මේ ධර්මතෙම)

සො + මුනි = සමුනි (හෙතෙම මුනි වේ.)

සො + සීලවා = සසීලවා (හෙතෙම සිල් ඇත්තේ ය.)

එසො + පත්තො = එසපත්තො (හෙතෙම පැමිණියේ.)

එසො + ඉදනි = එසදනි (මේ තෙම දැන්)

අභ්‍යාසය 3

සිංහලට නැඟිය යුතු.

1. මනුස්සා ආයුක්ඛයෙන කම්මක්ඛයෙන පුඤ්ඤක්ඛයෙන මරන්ති. 2. සුමෙධතාපසො පඨමජ්ඣානං දුතියජ්ඣානං ච නිබ්බත්තෙසි. 3. නිම්මලස්ස සීලස්ස පාලනං මහප්ඵලං මහානිසංසං හොති.

4. 'පෙමතො ජායතී සොකො - පෙමතො ජායතී භයං
පෙමතො විප්පමුත්තස්ස - නත්ථී සොකො, කුතො භයං?

5. භගවතා තණ්හක්ඛයාය ධම්මො දෙසිතො හොති.

6. 'උපක්කිලිට්ඨස්ස විසාඛෙ කායස්ස උපක්කමෙන පරියොදපනා හොති.'

7. 'යො ච තුලං ච පග්ගය්හ වර'මාදය පණ්ඩිතො
පපානි පරිවජ්ජෙති ස'මුනි තෙන සො මුනී.' (ධම්මපද)

8. 'නහි වෙරෙන වෙරානී - සම්මන්තී'ධ කුදචනං,
අවෙරෙන ච සම්මන්ති - එස ධම්මො සනන්තනො'

(ධම්ම පදය)

9. ධම්මාසොකො දෙවානම්පියතිස්සස්ස බහූ පණ්ණාකාරෙ පෙසෙත්වා පුනපි රජ්ජාභිසෙකං කාරෙසි.

10. 'යම්හි ඣානං ච පඤ්ඤා ච - ස'වෙ නිබ්බානසන්තිකෙ.'

(ධම්ම පද)

11. 'සබ්බෙ සංඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා. (එම)

මෙහි අමුතු වචන

අනිච්ච = නිත්‍ය නොවූ. 3

අවෙර = මෛත්‍රිය. න.

උපක්කම = උපාය, උපක්‍රමය. පු.

කම්මක්ඛය = කර්‍මය ගෙවීයාම. පු.

කුදාචනං = කිසිකලෙකත්. නි.

ජායති = උපදී

ඣාන = ධ්‍යානය. න.

තාපස = තාපසයා. පු.

නිබ්බත්තෙති = උපදවයි

නිබ්බින්දති = කලකිරේ

පග්ගය්හ = ඔසවා ගෙන. පූ.ක්‍රි.

පණ්ණාකාර = පඬුර. පු.

පරියොදපනං = පිරිසිදු කිරීම. ඉ.

පරිවජ්ජෙති = දුරුකරයි

පාලන = රැකීම. න.

පුඤ්ඤක්ඛය = පින් ගෙවීම. පු.

පෙම = ප්‍රේමය. න.

පෙසෙත්වා = යවා; එවා. පූ.ක්‍රි.

භය = බිය. න.

මහප්ඵල = මහත් ඵල ඇති. 3.

මහානිසංස = මහත් අනුසස් ඇති.3.

රජ්ජාභිසෙක = රාජ්‍යාභිෂේකය. පු.

වර = උතුම්. 3.

විප්පමුත්ත = මිදුණු. 3

විසුද්ධි = විසුද්ධිය, නිවණ. ඉ.

වෙර = වෛරය. න.

සනන්තන = පුරාතනවූ. 3.

සම්මති = සංසිඳේ

සංඛාරා = සංස්කාරයෝ. පු.

සොක = ශෝකය. පු.

සන්ධි යොදමින් පාලියට නැඟිය යුතු.

1. දෙවිවරු පින් ගෙවීමෙන් ද ආයුෂ ගෙවීමෙන් ද දෙව් ලොවින් චුත වෙති. 2. තාපසවරු ප්‍රථමධ්‍යානය ලබා සිත් නිමිල කෙරෙත්. 3. ධනය නැත්තන් විසින් දන්දීම අපහසු ය. 4. යමෙක් අල්පශ්‍රැත වේ නම් හෙතෙම නිවන නොලබයි.

5. රූපස්කන්ධය පෙණපිඬක් වැනි යයි තථාගතයන් වහන්සේ වදළහ. 6. සර්වඥයන් වහන්සේ විශාලා නුවරට වඩින කල්හි බිම්බිසාර රජතුමා උන්වහන්සේට ද භික්ෂූන්ට ද ශ්වෙතච්ඡත්‍ර දැරෙව්වේ ය. 7. නිර්මල ශීලය රැක දෙව් ලොව ඉපිද දිව්‍ය සම්පත් අනුභව කරන්නාහ. 8. සත්පුරුෂයන් විසින් කුසල් කිරීම පහසු ය. 9. රජවරු තමන්ගේ රටවල දුර්භික්ෂය වළක්වන්නට නොහැකි වෙත්. 10. මනුෂ්‍යයෝ මහත්ඵල ලැබීම සඳහා දානාදි පින් කරත්.

ප්‍රශ්න

1. බහු + සුතො, සො + යාති, පුග්ගලා + ධම්මදසා, සම්මා + පධානං, මහා + ධනො, පඤ්ච + බන්ධා, දු + කරං යන තන්හි කෙසේ සන්ධි කළ යුතු ද?

2. පග්ඝරති, මහබ්භයං, සප්පුරිසො, මහබ්බලො, වෙදනාක්ඛන්ධො, අප්පටිපුග්ගලො, අස්සාසො යන තැන්හි කෙසේ සන්ධි වෙන් කළ යුතු ද?

මෙහි අමුතු වචන :

අනුභව කරයි (දුක් - සැප) = අනුභවති, විඳති

කිරීම = කරණ. න.

චුතවේ = චවති

දැරෙව්වේය = ධාරාපෙසි

දිව්‍ය සම්පත = දිබ්බසම්පත්ති. ඉ.

දෙව්ලොව = දෙවලොක. පු.

පහසු = සුකර. 3.

පෙණපිඬ = ඵෙණපිණ්ඩ. පු.

බිම්බිසාර රජ = බිම්බිසාර රාජ. පු.

ලැබීම සඳහා = ලභිතුං. නි.

වළක්වන්නට = වාරෙතුං, නිවාරෙතුං. නි.

නිර්මල = නිම්මල. 3.

3. නිග්ගහීත සන්ධිය

16. වර්ගයකට අයත් ව්‍යඤ්ජනයක් පර කල්හි මුලින් සිටි බින්දුවට ඒ ඒ වර්ගයේ කෙළවරෙහි වූ (පස්වැනි) අකුර ආදේශ වේ.[1]

ක වර්ගයේ අකුරකට මුලින් සිටි බින්දුවට ඒ වර්ගයේ අන්තාක්ෂරය වූ ඔ යන්න ආදේශ වේ. මෙපරිද්දෙන් අන්‍ය වර්ගයකට අයත් අකුරකට මුලින් සිටි බින්දුවට ඒ ඒ වර්ගයේ පස්වැනි අකුර ආදේශ වේ. වර්ගාන්තයෝ නම් **ඔ - ඤ - ණ - න - ම** යන මොහුයි.

කිං + කරො = කිඞ්කරො (මෙහෙකරුවා)

ධම්මං + චරෙ = ධම්මඤ්චරෙ (ධර්මයෙහි හැසිරෙන්නේ ය)

තං + ඨානං = තණ්ඨානං (ඒ ස්ථානය)

ජුතිං + ධරො = ජුතින්ධරො (ආලෝකය දරන්නා)

තං + ඵලං = තම්ඵලං (ඒ ගෙඩිය)

දීපං + කරො = දීපඞ්කරො (එනම් සම්බුදුතෙමේ)

සං + ඨිතො = සණ්ඨිතො (මනාව පිහිටියේ)

සං + චරති = සඤ්චරති (හැසිරේ)

සං + මතො = සම්මතො (සම්මත වූයේ)

එවං + මෙ සුතං = එවම්මෙ සුතං (මෙසේ මා විසින් අසන ලදි.)

සංලක්ෂ්‍යය :-

වර්ගයේ පස්වැනි අකුර පරව සිටි විට බින්දුවට එයම ආදේශ වන බව සම්මතො, එවම්මෙ යන උදාහරණ දෙකේ පැහැදිලි වේ.

[1] 'වග්ගන්තං වා වග්ගෙ'

පුං + ලිඞ්ගං = පුල්ලිඞ්ගං ආදි තන්හි ලකාරය පර වූ විට බින්දුවට ලකාර වේ යයි දතයුතු.

17. එකාරය ද හකාරය ද පර කල්හි බින්දුවට ඤකාරාදේශ වේ.[1] එකාරය පර කල්හි ඤකාරයට ද්විත්‍ව ද වේ.

තං + එව = තඤ්ඤෙව (එයම)
පච්චත්තං+එව = පච්චත්තඤ්ඤෙව (තම තමා කෙරෙහි ම)
තං + හි = තඤ්හි (එය වනාහි)
එවං + හි = එවඤ්හි (මෙසේ වනාහි)

18. යකාරය පර කල්හි පූර්‍ව සිටි බින්දුව ඒ යකාරය සමග ඤකාර බවට පැමිණේ.[2] ඤකාරය ද්විත්ව වේ.

සං + යොගෝ = සඤ්ඤෙෝගෝ (යෙදීම)
සං + යතෝ = සඤ්ඤතෝ (හික්මුණේ)
යං + යදෙව = යඤ්ඤදෙව (යමක් යමක් ම)
ආනන්තරිකං + යමාහු = ආනන්තරිකඤ්ඤමාහු (යමක් ආනන්තරිකයයි කීවාහු ද)

19. ස්වරයක් පර කල්හි බින්දුවට ඇතැම් තැනකදී දකාරය ද ඇතැම් තැනකදී මකාරය ද ආදේශ වෙති.[3]

(දකාරාදේශය ය-ත එත ශබ්දයන් කෙරෙන් පර වූ බින්දුවට පමණෙකි.)
එතං + එව = එතදෙව (මෙය ම)
තං + අනත්තා = තදනත්තා (එය අනාත්මයයි.)
තං + අහං = තමහං (මම ඔහු)
තං + එව = තමෙව හෝ තදෙව (එයම)
එවං + එව = එවමෙව (මෙසේ ම)

[1] 'එහෙඤ්ඤං'
[2] 'සයෙ ච'
[3] 'මදුසරෙ'

කිං + එතං = කිමෙතං (මෙය කුමක් ද?)
එතං + ආවොච = එතදවොච (මෙය කීය)

20. ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් පර කල්හි ඇතැම් තැනක බින්දුවට ලොප් වේ. ඉන්පසු ඇතැම් විට පූර්ව්‍ස්වරයට ලෝපය ද පරස්වරයට දීඝ ද වේ.

තාසං + අහං = තාසාහං (මම ඇලාට)

අදසිං + ආහං = අදසාහං (මම දුනිමි)

එවං + අහං = එවාහං (මෙසේ මම)

සච්චානං + දස්සනං = සච්චානදස්සනං (සත්‍යයන් දැකීම)

බුඩානං + සාසනං = බුඩානසාසනං (බුදුවරුන්ගේ අනුශාසනය)

ගන්තුං + කාමෝ = ගන්තුකාමෝ (යනු කැමැත්තේ.)

21. ඇතැම් තැනක බින්දුවෙන් පරවූ ස්වරයට ලොප් වේ. ඉන්පසු බින්දුවට මුල කී වර්ගාන්තාදේශය ද වේ.

කතං + ඉති = කතන්නි (කරන ලදැයි)

චක්කං + ඉව = චක්කංව (චක්‍රය මෙන්)

තවං + අසි = තවංසි (තෝ වෙහි)

අභිනන්දුං + ඉති = අභිනන්දුන්ති (සතුටු වූහයි.)

ඉදං + අපි = ඉදම්පි (මෙයද)

උත්තරිං + අපි = උත්තරිම්පි (මත්තෙහිත්)

කිං + ඉදානි = කින්නු (දැන් කුමක්)

හලං + ඉදානි = හලන්නු (දැන් පමණය)

22. ඇතැම් තැනක ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් පර කල්හි බින්දුවක් ආගම වේ.

චක්ඛු + උදපාදි = චක්ඛුං උදපාදි (ඇස හටගත්තේය.)
අණු + ථූලානි = අණුං ථූලානි (කුඩා මහත් දේවල්)

අව + සිරො = අවංසිරො (යටිකුරු හිස් ඇත්තේ)
යාව + ච + ඉධ = යාවිඤ්චිධ (මෙහි යම් පමණ)

අභ්‍යාසය 4

සිංහලට නඟා සන්ධි විසන්ධි කළ යුතු.

1. තස්ස අත්තනො ච තාසඤ්ච දෙවතානං සඬඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරතො චිත්තං පසීදති.

(අඞ්ගුත්තර)

2. "තස්මා සඤ්ඤමයත්තානං අස්සං භද්‍රං'ච වාණිජො."

(ධම්මපද)

3. "කරොමි තෙ තං වචනං ඣං'සි ආචරියො මම" (ධ.අ)

4. අනුස්සරෙථ සම්බුධං භයං තුම්හාකං නො සියා. (සංයු)

5. එවා'හං විත්තයිඤාන නෙකකොටිසතං ධනං නාථානාථානං දඤාන හිමවන්තමුපාගමිං" (බුධවංස)

6. "දයකො දනපති යඤ්ඤදෙ'ව පරිසං උපසඞ්කමති..... විසාරදෙ'ව උපසඞ්කමති." (අඞ්ගුත්තර) 7. "අඤ්ඤය ච පනා'හං සමණානං සක්‍යපුත්තියානං ධම්මං එවා'හං තස්මා ධම්මවිනයා අපක්කන්තො." (තිකඞ්ගුත්තර) 8. තෙන'හි ගහපති තඤ්ඤෙ'වෙ'ත්‍ථ පටිපුච්ඡිස්සාමි.

9. තඤ්හි තස්ස සකං හොති තඤ්ච ආදය ගච්ඡති. (සං.නි.)

10. ඉමානි චත්තාරි අරියසච්චානීති භික්ඛවෙ..... යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං." (තිකඞ්ගුත්තර) 11. තණ්හඞ්කරො මෙධඞ්කරො සරණඞ්කරො දීපඞ්කරොති චත්තාරො බුධා එකස්මිඤ්ඤෙව කප්පෙ උප්පජ්ජිංසු, 12. 'ඉදමවොච භගවා, අන්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.' (බොහෝ සූත්‍රවල.)

13. 'කාමං පතාමි නිරයං උඩපාදෙ අවංසිරො.' (බදිරඞ්ගාර ජාතක)

මෙහි අමුතු වචන

අඤ්ඤය = දැනගෙන. පූ. ක්‍රි.
අනාථ = අසරණ වූ, පිහිට නැති. 3.
අනුස්සරති = සිහි කරයි
අනුස්සරන්ත = සිහි කරන. 3.
අපක්කන්ත = ඉවත්ව ගිය. 3.
අභිනන්දති = සතුටු වේ
අරියසච්ච = ආර්‍ය්‍ය සත්‍යය. න.
ආචරිය = ආචාර්‍ය්‍යයා. පු.
උඩපාද = උඩිකුරු පා ඇති. 3.
උපාගමි = එළඹියේ ය.
කප්ප = කල්පය. පු.
කාමං = එකාන්තයෙන්. නි.
චාග = පරිත්‍යාගය. පු.
චින්තයිත්‍වාන = සිතා. පූ. ක්‍රි.
දානපති = දීමෙහි ස්වාමියා. පු.
දායක = දෙන්නා. පු.
ධම්මවිනය = ධර්‍මය හා විනය. පු.
නාථ = පිහිට ඇති. 3.
නිරය = නරකය. පු.
සමණ = ශ්‍රමණයා. පු.
නෙකකොටිසත = නොයෙක් කෝටි සිය ගණන් ඇති. 3.
පටිච්ච = නිසා. නි.පූ. ක්‍රි.
පටිපුච්ඡති = නැවත විචාරයි.
පසීදති = පහදියි
භද්‍ර = යහපත්. 3.
භාසිත = කීම. න.
විසාරද = (සැක නැතිව) නිර්භය වූ. 3.
සක = තමාසතු. 3.
සක්‍යපුත්තිය=ශාක්‍ය පුත්‍රයන්ට අයත්. 3.
සඤ්ඤමයති = හික්මවයි
සියා = වන්නේ ය.

සන්ධි යොදා පාලියට නැගිය යුතු.

1. සිල්වතා යම් යම් පිරිසක් කරා පැමිණේ නම් නිර්භයව ම පැමිණෙයි. මෙය ද ශීලයාගේ එක් ඵලයකි. 2. මම මෙසේ සිතා දෙසියයක් යාචකයන්ට දන් දුනිමි. 3. ඒ කාරණය ම මම ඔහුගෙන් නැවත විචාළෙමි. 4. ධර්‍මදේශනාවන්ගේ අවසානයේ දී භික්ෂූහු සැරියුත් මහ තෙරුන් වහන්සේගේ කීමට සතුටු වූහ. 5. ඉදින් තෙපි නිතර බුදුන් සිහිකරව් නම් තොපට භයක් නූපදින්නේ ය. 6. මනුෂ්‍යයා යම් පිනක් හෝ පවක් කෙරේ නම් එය ම ඔහු අනුව යයි. 7. අපි අද ම බුදුන් ද ධර්‍මය ද සංඝයා ද සරණ යමු. 8. ගොනාගේ පය අනුව යන රෝදය මෙන් දුක පව් කරන්නා අනුව යයි. 9. 'තමාගේ සිත සියලු පව්වලින් පිරිසිදු කළ යුතු ය' යන මෙය බුදුවරුන්ගේ අනුශාසනයයි. 10. භාග්‍යවත් තෙම මෙය වදාරා මත්තෙහිත් ඔවුන්ට ධර්‍ම දේශනා කෙළේ ය.

11. මා විසින් යමක් කියන ලද්දේ නම් එය මේ සඳහා කියන ලදි. 12. මිනිසා උඩිකුරු පා ඇතිව යටිකුරු හිස් ඇතිව ගසෙන් බිමට වැටුණේ ය.

මෙහි අමුතු වචන

අනුව යන = අනුගච්ඡන්ත. 3.
දන් = දන. න.
අවසානය = ඔසාන. න.
නිර්භය = නිබ්භය, විසාරද. 3.
කාරණය = කාරණ. න.
පිරිසිදු කළයුතු = සොධෙතබ්බ.3.
කියන ලද = වුත්ත, කථිත. 3.
වදරා = වත්වා. පූ.ක්‍රි.

සරණ යයි = සරණං ගච්ඡති

මිශ්‍රසන්ධි

23. අසමාන ස්වරයා කෙරෙන් පූර්‍ව වූ ඉ-ඊ-එ යන මොවුහු ඇතැම් විට ය් - බවට පැමිණෙත්. එම ය් - කාරය පූර්‍ව ව්‍යඤ්ජනය සමග නොයෙක් ආකාරයට පෙරළේ.

සොතී + අත්‍ථු = සොත්ථියි + අත්‍ථු = සොත්‍ථ්‍යත්‍ථු
තෙ + අහං = ත්‍යේ + අහං = ත්‍යාහං = ත්‍යාහං
සත්තමී = අත්‍ථෙ = සත්තම්‍යේ + අත්‍ථෙ = සත්තම්‍යත්‍ථෙ

යන මේවා ය් - කාරාදේශයට උදාහරණයි. මේ තැන්හි ය් - කාරය විකාරයට නොපැමිණෙතත් අන්‍ය බොහෝ තැන්හි එය විකාරයට පැමිණේ.

i ත්‍යේ යන්න ච්චේ බවට පැමිණේ :-

ඉති + එවං = ඉත්‍යේ + එවං = ඉච්චෙවං
අති + අන්තං = අත්‍යේ + අන්තං = අච්චන්තං
ඉති + ආදි = ඉත්‍යේ + ආදි = ඉච්චාදි
ජාති + අන්ධා + ජාත්‍යේ + අන්ධා = ජච්චන්ධා

ii ද්‍ය - යන්න ජ්ජ් බවට පැමිණේ :-

යදි + එවං = යජ්ජෙවං

නදී + ආ = නද්‍ය් + ආ = නජ්ජා

iii. ධ්‍ය - යන්න ජ්ඣ - බවට පැමිණේ :-

බොධි + අඞ්ගා + බොධ්‍ය + අඞ්ගා = බොජ්ඣඞ්ගා

අධි + අගමා + අධ්‍ය + අගමා = අජ්ඣගමා

iv. භ්‍ය - යන්න බ්හ් බවට පැමිණේ :-

අභි + උග්ගච්ඡති = අභ්‍ය් + උග්ගච්ඡති = අබ්භුග්ගච්ඡති

අභි + ඔකාසො = අභ්‍ය් + ඔකාසො = අබ්භොකාසො

v. ප්‍ය - යන්න ප්ප් - බවට පැමිණේ :-

අපි + එකච්චෙ = අප්‍ය් + එකච්චෙ = අප්පෙකච්චෙ

අපි + එකද = අප්‍ය් + එකද = අප්පෙකද

පළමු පොතේ නොදැක්වූ නිතර ව්‍යවහාරයට පැමිණෙන ශබ්ද කීපයක්:-

24. අකාරාන්ත පුල්ලිංග අත්ත ශබ්දය

එකවචන	බහුවචන
ප. අත්තා (තෙමේ)	අත්තානො (=තුමූ)
දු. අත්තානං; අත්තං (=තමා)	අත්තානො (=තමන්)
ත.ක අත්තෙන; අත්තනා (=තමා විසින්)	අත්තනෙභි; අත්තනෙහි (=තමන් විසින්)
ච. අත්තනො (=තමාට)	අත්තානං (=තමන්ට)
ප. අත්තනා (=තමා කෙරෙන්)	අත්තනෙභි; අත්තනෙහි (= තමන් කෙරෙන්)
ෂ. අත්තනො (=තමාගේ)	අත්තානං (=තමන්ගේ)
ප. අත්තනි (=තමා කෙරෙහි)	අත්තනෙසු (තමන් කෙරෙහි)
ආ. (හෙ) අත්ත; අත්තා (= එම්බා ආත්මය)	(හෙ) අත්තානො (=එම්බා ආත්මයෙනි)

අත්තා = ආත්මතෙම ආදී වශයෙන් ද අර්ථ කිය හැක.

25. අකාරාන්ත - පුල්ලිඞ්ගික රාජ ශබ්දය

එක වචන	බහු වචන
ප. රාජා (= රජතෙම)	රාජානො (=රජවරු)
ද්‍ව. රාජානං; රාජං (=රජ)	රාජානො (=රජවරු)
ත. රඤ්ඤ; රාජෙන (= රජු විසින්)	රාජූහි; රාජූහි; රාජෙභි රාජෙහි (= රජුන් විසින්)
ච. ෂ. රඤ්ඤෙ; රාජිනො	රඤ්ඤං; රාජූනං; රාජානං
ප. රඤ්ඤ; රාජම්හා; රාජස්මා	රාජූහි; රාජූහි; රාජෙභි, රාජෙහි
ස. රඤ්ඤෙ; රාජිනි රාජම්හි; රාජස්මිං	රාජූසු; රාජෙසු
ක. රඤ්ඤ; රාජෙන	රාජූහි; රාජූහි; රාජෙභි; රාජෙහි
ආ. (හෙ) රාජ, රාජා	(හෙ) රාජානො

අභ්‍යාසය 5
සිංහලට නැඟිය යුතු

1. රාජා නගරෙ චරන්තො ධම්මං දෙසෙන්තමෙකං තාපසං පස්සි. 2. ධම්මං සුණන්තා බහූ මනුස්සා රාජිනි ආගච්ඡන්තෙ තමෙව ඔලොකෙසුං. 3. රාජූසු අන්තනො අත්තනො රට්ඨෙසු චරන්තෙසු බහූ සෙවකා සෙතච්ඡත්තානි ගහෙත්වා තෙ අනුගච්ඡන්ති. 4. රාජානො අත්තානං කුමාරෙ සකෙ සකෙ රජ්ජෙ පතිට්ඨාපෙතුමිච්ඡන්තා තෙසං නානාසිප්පානි සික්ඛාපෙන්ති. 5 දුට්ඨගාමිණිරඤ්ඤෙ සාලිකුමාරො නාම එකොව පුත්තො අහොසි. සො අත්තනො පිතුසන්තකං රජ්ජං ලභිතුං න ඉච්ඡි. 6. සො රාජා එළාරං දමිළරාජානං මාරෙත්වා බුද්ධසාසනං සංගණ්හන්තො මහන්තානි චෙතියානි බහූ විහාරෙ ච කාරෙසි.

7. "ඉච්චෙව' මච්චන්තනමස්සනීයං
නමස්සමානො රතනත්තයං යං
පුඤ්ඤාභිසන්දං විපුලං අලත්ථං
තස්සානුභාවෙන හතන්තරායො" (විනය අටුවා)

8. "අථ'ස්ස උපපරික්ඛතො එතද'හොසි පච්චන්තිමෙසු ඛො ජනපදෙසු සාසනං සුප්පතිට්ඨිතං භවිස්සතීති" (විනය අටුවා)

9. "සෙට්ඨී කම්පමානො ධනසොකෙන සතිං පච්චුපට්ඨාපෙතුං අසක්කොන්තො තත්ථෙ'ව පති.' (ඉල්ලීස ජාතක)

10. එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති..... සොච හොති..... බව්හාබාධො කාණො වා කුණි වා.
(අඞ්ගුත්තර)

මෙහි ආ අමුතු වචන

අච්චන්තනමස්සනීය = අතිශයෙන් පිදිය යුතු. 3.
අලත්ථං = ලැබීමි.
අසක්කොන්ත = නොහැකි. 3.
ආදි = පටන් ගැන්ම; ආදිය. පු.
ආනුභාව = බලය. පු.
උපපරික්ඛන්ත = පරීක්ෂාකරන. 3.
එකච්ච = ඇතැම්. 3.

කම්පමාන = වෙව්ලන. 3.
කාණ = එකැස් කණා. පු.
කුණි= කොරවූ අත් ඇත්තා. පු.
ජනපද = රට, පිටිසර. පු.
බුඬසාසන = බෞඬාගම. න.
රතනත්තය = බුඬාදිරත්න තුන. න.

දමිළරාජ = දෙමළ රජ. පු.
දෙසෙන්ත = දේශනා කරන. 2.
නමස්සමාන = වඳින. 3.
නානාසිප්ප = නොයෙක් ශිල්ප. න.
පච්චන්තිම = දුර පිහිටි. 3.
පච්චාජාත = උපන්. 3.
පච්චුපට්ඨාපෙතුං (= සිහිය) එළවාගන්ට. නි.
පිතුසන්තක = පියාසතු. 3.
පතිට්ඨාපෙති = පිහිටුවයි
බව්හාබාධ = බොහෝ රෝග ඇති. 3.
සුප්පතිට්ඨිත = මනාසේ පිහිටි. 3.
සික්ඛාපෙති = උගන්වයි
සෙවක = මෙහෙකරුවා. පු.

විපුල = ඉතා මහත්. 3.
සංගණ්හන්ත = සංග්‍රහ කරමින්. 3.
සොක = සෝකය. පු.
හතන්තරාය = නැසූ අනතුරු ඇති. 3

හැකි තැන්හි සන්ධි යොදමින් පාලියට නැඟිය යුතු ය.

1. දුටුගැමුණු මහ රජු විසින් අනුරාධපුරයෙහි රුවන්මැලි මහසෑය කරවන ලදි. 2. පස්වැනි ජෝර්ජ් මහරජ තෙමේ තමාගේ පුත්‍ර වූ ඇඩ්වඩ් කුමරා ලක්දිවට එවීය. 3. දේවානම්පියතිස්ස රජු ලක්දිව රාජ්‍යය කරන කල්හි අශෝකාධිරාජයාගේ පුත්‍ර වූ මහින්ද ස්ථවිරතුමා ලක්දිවට අවුත් බුද්ධ ශාසනය පිහිටුවිය. 4. රජුන්ගේ අණින් කරවූ බොහෝ විහාරයෝ ද චෛත්‍යයෝ ද මෙහි ඇත්තාහ. 5. බුදුරද කපිලවස්තුවෙහි සිය නෑයන් කරවූ විහාරයෙහි මාස කීපයක් පමණක් විසී. 6. ධර්මාශෝක රජ තෙමේ අනාගතයෙහි ප්‍රත්‍යන්ත දේශයන්හි බෞද්ධාගම මනාසේ පිහිටන්නේයයි දැන ගත්තේ ය. 7. තමන්ගේ ස්වාමි වූ අධිරාජයාගේ ඔටුනු පැළඳීම දැකීමට බොහෝ රජවරු රැස්වෙති. 8. සියලු රජවරු තමන්ගේ ඇවැමෙන් ස්වකීය පුත්‍රයන් තම තමාගේ සිංහාසනයන්හි තැබීමට කැමති වෙත්. 9. රජකු තමාගේ රටෙහි ගම් හා නගරයන් පරීක්ෂාකරමින් හැසිරෙන කල්හි බොහෝ සේවකයෝ ඔහු අනුව යති. 10. බණ අසමින් හුන් මිනිස්සු රජු පැමිණි කල්හි ගෞරව දැක්වීම පිණිස නැගිට්ටාහ.

අමුතු වචන

අණ = ආඥා. ඉ
අධිරාජයා = අධිරාජ. පු.
අනාගතය = අනාගත. පු.
ඇවැමෙන් = අච්චයෙන
ඔටුනුපැළඳීම = කිරීටධාරණ. න.
කපිලවාස්තු = කපිලවත්‍ථු. න.
කීපයක් = කතිපය. 3.
ගෞරවය = ගාරව. පු.
පැමිණි = පත්ත; සම්පත්ත. 3.
පිහිටන්නේ යයි = පතිට්ඨහිස්සතීති
පිහිටුවිය = පතිට්ඨාපෙසි.
මහරජ = මහාරාජ. පු.
රාජ්‍ය කරන = රජ්ජං කරොන්ත. 3.
රුවන්මැලිසෑය = රතනමාලිචෙතිය න.

තබන්ට = ඨපෙතුං. නි.
තමතමාගේ = අත්තනො අත්තනො
දක්වන්ට = දස්සෙතුං. නි.
දූනගත්තේ ය = ජානී, අඤ්ඤාසි
රැස්කරවයි = සන්නිපාතෙති
රැස්වේ = සන්නිපතති
සිංහාසන = සීහාසන. න.
ස්ථවිරතුමා = ථෙරවර. පු.

26. මනොගණය

අකාරන්ත - පුල්ලිඞ්ගික මන ශබ්දය

එකවචනය;	බහුවචනය;
ප. මනො (= සිතතෙම)	මනා (= සිත්තුමූ)
දු. මනං (සිත)	මනෙ (= සිත්)
ත.ක. මනසා, මනෙන	මනෙභි; මනෙහි
ච.ඡ. මනසො; මනස්ස	මනානං
ප. මනසා, මනම්හා, මනස්මා	මනෙභි; මනෙහි
ස. මනසි; මනෙ; මනම්හි; මනස්මිං	මනෙසු
ආ. (හෙ) මන; මනා	(හෙ) මනා

මේ මන ශබ්දය ද මතු දක්වනු ලබන මනොගණයට අයත් අන්‍ය ශබ්දයෝ ද පුල්ලිඟුවෙහි මෙන් නපුංසක ලිඞ්ගයෙහි ද වැටෙත්.

නපුංසක ලිඞ්ගයෙහි මන ශබ්දය :

ප. මනං	මනා; මනානි
ආ. (හෙ) මන; මනා	(හෙ) මනානි
දු. මනං	මනෙ; මනානි

මේ තුන් තැන චිත්ත ශබ්දය මෙන් ද ඉතිරි විභක්තිවල දී පුල්ලිඟුවෙහි දැක්වූ ලෙස ද වරනැගේ. මීට සමානව ලිඟුදෙකෙහි වර නැගෙන ශබ්දයෝ නම් :-

තම = අන්ධකාරය	උර = ළය	පය = කිරි හෝ ජලය
තප = තපස	සිර = හිස	චෙත = සිතිවිල්ල
තෙජ = තේජස	රජ = ධූලි	වය = වයස
වච = වචනය	යස = යශස්	අය = යකඩ
ඔජ = ඕජාව	වාස = වස්ත්‍රය	සර = විල

යන මොහුයි. මොවුන්ගේ සමූහයට මනෝගණ යයි කියනු ලැබේ. මනෝගණයට අයත් ශබ්දයන්ගේ විශේෂ ලක්ෂණ නම් (1) තතියා එකවචනය සා-යන්නෙන් ද, චතුත්‍ථී-ඡට්ඨී එක වචන සෝ-යන්නෙන් ද, සත්තමී එක වචනය සි-යන්නෙන් ද කෙළවර වීම, (2) තවත් පදයක් හා සමාස වෙන විට මනෝ සෙට්ඨා, තමොනද්ධෙ යනාදි වශයෙන් ඔකාරයකින් යුක්තව සිටීම (3) තද්ධිත ප්‍රත්‍යයක් යෙදුණු විට මනොමයං ආදි වශයෙන් ඔකාරයකින් යුක්ත වීම ද වෙත්.

27. සමාස තද්ධිතවලදී මනෝගණික ශබ්දයන්ගේ විභක්ති ලොප් කළ විට අන්තයෙහි වූ අකාරයට ඔ-කාරයක් ආදේශ වේ.

මෙය වනාහි ව්‍යඤ්ජන සන්ධියෙහි ඇතුළත් වුවත් මනෝ ගණය ඊට කලින් නොදැක් වූ බැවින් සන්ධි කාණ්ඩයේදී මේ කාරණය නොදැක්වීමු. සමාසයේදී විභක්ති ලොප් වන ආකාරය මතු සමාස කාණ්ඩයෙන් බලා ගත යුතුයි. උදාහරණ :-

මන + මය = මනොමය (සිතින් උපන්)

අය + පත්ත = අයොපත්ත (යකඩ පාත්‍රය)

තම + නුද = තමොනුද (= අන්ධකාරය දුරු කරන)

සිර + රුහ = සිරොරුහ (හිසකෙස්)

පය + නිධි = පයොනිධි (= මුහුදු)

තප + ධන = තපොධන (= පැවිද්දා)

තෙජ + ධාතු = තෙජොධාතු (උෂ්ණ ගුණය)

28. ඔකාරාන්ත පුල්ලිඞ්ගික ගො - ශබ්දය

එක වචන	බහු වචන
ප. ගො (= ගවතෙම)	ගාවො (ගවයෝ)
දු. ගාවුං; ගාවං; ගවං (= ගවයා)	ගාවො; (= ගවයන්)
ත. ගාවෙන; ගවෙන	ගොහි; ගොහි
(= ගවයා විසින්)	(= ගවයන් විසින්)
ච. ෂ. ගාවස්ස; ගවස්ස	ගවං, ගූන්නං; ගොනං
ප. ගාවා; ගවා	
ගාවම්හා; ගවම්හා;	ගොහි; ගොහි
ගාවස්මා, ගවස්මා	
ස. ගාවෙ; ගවෙ;	ගාවෙසු, ගවෙසු, ගොසු
ගාවම්හි, ගවම්හි;	
ගාවස්මිං, ගවස්මිං	
ක. ගාවෙන; ගවෙන	ගොහි, ගොහි
ආ. (හෙ) ගො	(හෙ) ගාවො

අභ්‍යාසය 6

සිංහලට නඟා මනෝඥික ශබ්දය දක්වනු.

1. ද්වීහි වාණිජෙහි යාචිතො භගවා අත්තනො සීසතො මුට්ඨිමත්තෙ සිරොරුහෙ තෙසං අදාසි.

2. තෙ භගවන්තං සිරසා නමස්සිත්වා තානි අත්තනො නගරං නෙත්වා සරොරුහාදීහි පූජයිංසු.

3. "එකූනතිංසො වයසා බොධිසත්තො'හි නික්ඛමි්.
පඤ්චතිංසො'ථ වයසා බිම්බිසාරමුපාගමි්." (මහා වංස)

4. තමොනුදෙ භගවා මනොමයෙන කායෙන කම්මට්ඨානානි මනසිකරොන්තානං භික්ඛූනං අභිමුඛෙ පාතුභවති. 5. ඉධිමා තපොධනො පයොනිධිම්පි සොසෙතුං.

සමතෙථා හොති. 6. මහානිරයෝ පන අයොපාකාරෙන පරික්ඛිත්තෝ, අයොපිධානෙන පිහිතෝ, තස්ස අයොමයා භූමි තෙජසා ජලිතා හොති. 7. සාකටිකා ගුන්නං තිණ්ණං දත්වා තෙ සකටෙසු යොජෙත්වා පාජෙන්තා බාරාණසිං අගමංසු.

8. "මනොපුබ්බඞ්ගමා ධම්මා, මනොසෙට්ඨා මනොමයා"

(ධම්මපද)

9. මනුස්සා ගවා පයං, පයසා දධිං, දධිතෝ සප්පිඤ්ච ලභන්ති. 10. සෝ මෙත්තාසහගතෙන චෙතසා එකදිසං ඵරිත්වා විහරති. තථා දුතියං. තථා තතියං. 11. භගවති චෙතෝ පසාදෙන බහවෝ ජනා මහන්තං දිබ්බසම්පත්තිං ලභිංසු. 12. භගවා නහසා ලඞ්කාදීපමාගම්ම යක්ඛසමාගමස්ස උපරි නහසි නිසීදිත්වා ධම්මදෙසනාය තෙ දමෙසි.

13. අයසා'ච මලං සමුට්ඨිතං
තදුට්ඨාය තමෙව ඛාදති" (ධම්මපද)

14. වචසා කතං කම්මං වාචසිකං, මනසා කතං කම්මං මානසිකං නාම හොති.

මෙහි අමුතු වචන

අභිනික්ඛමි = ගිහිගෙයින් නික්ම ගියේය.
අභිමුඛ = ඉදිරිය. න. ඉදිරි යෙහි වූ. 3.
අයොපාකාර=යකඩ ප්‍රාකාරය.පු.
අයොමය = යකඩින් කළ. 3.
ඉද්ධිමන්තු = සෘඩි ඇති. 3.
උට්ඨාය = නැගිට. පූ. ක්‍රි.
උපගාමි = එළඹියේය
කම්මට්ඨාන = භාවනාපිළිවෙළ.න.
පිහිත = පියන ලද. 3.
චෙතොපසාද = සිතේ පැහැ දීම. පු.
ජලිත = දැල්වුණු. 3.
දමෙති = දමනය කරයි.
නහ = අහස. පු.න.
නමස්සිත්වා = වැඳ. පූ. ක්‍රි. පරික්ඛිත්ත = වටකළ. 3.
පාජෙන්ත = පදවන. 3.
පාතුභවති = පහළ වේ පිධාන = පියන. න.
යාචිත = ඉල්වන ලද. 3.

පුබ්බඞ්ගම = ඉදිරියෙහි යන. 3.
එරිත්වා = පතුරුවා. පූ. ක්‍රි.
බාරාණසී = බරණැස් නුවර.ඉ.
භජති = සේවනය කෙරේ
භොග = (මිනිසාගේ) ජීවිකාවට උවමනා දේ. පු.
මනොසෙට්ඨ = සිත ප්‍රධාන කොට ඇති. 3.
මානසික = සිතෙන් හටගත්. 3.
මුට්ඨිමත්ත = මිටක් පමණ. 3.
යොජෙත්වා = යොද. පූ. ක්‍රි.
වාචසික = වචනයෙන් කළ. 3.
සකට = කරත්තය. පු.න.
සමත්ථ = හැකි, සමර්ථ. 3.
සමුට්ඨිත = හටගත්. 3.
සාරොරුහ = පියුම. න.
සහගත = යුක්ත වූ. 3.
සාකටික = ගැල්පදවන්නා. පු.
සීස = හිස. න.
සොසෙති = වියලවයි
යක්ඛසමාගම = යකුන්ගේ රැස්වීම. පු.

මනෝගණික ශබ්දවලින් ද යුක්ත කොට පාලියට නැඟිය යුතුයි.

1. භික්ෂුතෙම කරුණාසහගත සිතින් මුළුලොව පතුරුවමින් වාසය කරයි. 2. පක්ෂීහු අහසින් ගමන්කොට තමන් කැමැති තැන්වලට යත්. ("අහසින්" යන්නට නභ ශබ්දය යොදනු) 3. අපේ කුඹුරු සීසෑමෙහි සහායවූ අපට කිරි හා ගිතෙල් දෙන ගවයෝ අප විසින් නොමැරිය යුත්තාහ. 4. කයින් ද වචනයෙන් ද සිතින් ද පින් කරත්. ඒ තුන්දෙරින් පව් ද කළ හැක. 5. වෙළඳුන් දෙදෙනෙකුන් විසින් තථාගතයන් වහන්සේගේ කේශ ධාතූන් (සිරොරුහ යොදනු) පිහිටුවා මහාචෛත්‍යයක් කරවන ලදි. 6. ඒ චෛත්‍යය වෙතට පයින් ගොස් හිසෙන් නැමද දිව්‍ය සම්පත් ලබන්නෝ බොහෝ වෙති. 7. මෙකල ධනවත්තු පෙර සෘද්ධිමතුන් මෙන් අහසින් ගමන්කොට අභිමත තැනට වහා පැමිණෙත්. 8. යකඩින් කළ පාලම් ලක්දිව බොහෝ ගංගාවන් මත්තෙහි දක්නා ලැබේ. 9. සිටුවරු විශාල යකඩ පෙට්ටිවල තමන්ගේ ධනය සුරැකි ලෙස තබත්. 10. හංසයා කිරෙන් ජලය වෙන්කොට බීමට සමර්ථ වෙයි. 11. භික්ෂුතෙම සිවුරු පොරවා යකඩපාත්‍රයක් අතින් ගෙන ධූලියෙන් ගැවසුණු මාර්ගයෙහි ගියේ ය. 12. හිරුරැසින් (තෙජ යොදනු) පීඩිත වූ මගියා විලෙහි නා නෙළුම්මල් හිස පැළඳගෙන ගමට ඇතුළු විය. 13. වයසින් විසිනව හවුරුදු ඇති බෝධිසත්ව තෙමේ ගිහි ගෙයින් (=අගාරා) අභිනිෂ්ක්‍රමණය කළේ ය. 14. දඹදිව වැසියෝ ගවයන්ට බොහෝ සංග්‍රහයන් කරත්. ගවයන්ගේ මස් කෑමෙන් රෝග හටගැනෙත් යයි සලකත්.

මෙහි අමුතු වචන

අභිමත තැන = අභිමතට්ඨාන. න.
කැමති තැන = ඉච්ඡිතට්ඨාන. න.
කෙළින් = උජුකං. ක්‍රි. වි.
කේශධාතු = කෙසධාතු. පු.
ගැවසුණු = ආකිණ්ණ. 3.
තුන්දෙරින් = තීහි ද්වාරෙහි
පාලම = සෙතු. පු.
පොරවා = පාරුපිත්වා. පූ. ක්‍රි.

මගියා = පදික; පථික. පු.
මස් කෑම = මංසභක්ඛන. න.

මෙන් = විය. නි.
ලබන්නා = ලභන්ත. පු.
වෙන් කොට = විසුං කත්වා;
වියොජෙත්වා. පූ. ක්‍රි.
සලකයි = සල්ලක්ඛෙති
සහාය වූ = සහායක. 3.
සංග්‍රහ කරයි = සංගණ්හාති.
සුරැකි ලෙස =සුරක්ඛිතං.
ක්‍රි. වි.
හටගනී = නිබ්බත්තති.
හංසයා = හංස. පු.

සමාස නාම

29. 'සමාස' නම් පද දෙකක් හෝ වැඩි ගණනක් එක්කොට එක් පදයක් වෙන සේ ගැළපීමයි. ඒ සමාසවෙන පදයන්ගේ මුලින් තිබුණු විභක්ති ලොප් කරනු ලැබේ. ඉන්පසු ඒ සියල්ල එක් පදයක් මෙන් සලකා අන්තයෙහි එක් විභක්තියක් පමණක් යොදනු ලැබේ. (පළමු කොට පඨමාවිභක්තිය යෙදිය යුතු.)

"නීලං + උප්පලං" යන විභක්ති සහිත පද දෙක සමාස කළ විට "නීල + උප්පල" කියා සිටී. පූර්වස්වර ලෝපසන්ධියෙන් ගැළපූ විට 'නිලුප්පල කියා සිටී. මෙය (සමාස නිසා එක් පදයක් වූ බැවින්) අන්තයෙහි පඨමා එකවචනය යෙදූ විට නීලුප්පලං කියා සිටී. මුල්පදයේ විභක්තිය ලොප් නොවී සමාසවෙන ශබ්ද ස්වල්පයක් ද විද්‍යමාන වේ.

පාලි භාෂාවෙහි සමාසය

1. කම්මධාරය
2. දිගු
3. තප්පුරිස
4. ද්වන්ද
5. බහුබ්බීහි
6. අව්‍යයීභාව

යන සකොටසකට බෙදනු ලැබේ.

1. කම්මධාරය සමාසය

30. විශේෂණ විශේෂ්‍ය වශයෙන් එක් අර්ථයෙක්හි පවත්නා වූ සමාන විභක්ති ඇති පද දෙකක් එක් කිරීම කම්මධාරය සමාස නම් වේ.

"සෙතං + වත්ථං" යන තැන 'සෙත' යන්න 'වත්ථං' යන්නට විශේෂණයි. 'වත්ථං' යන්න විශේෂ්‍ය (වෙහෙසිය යුතු) පදයයි. සමාසයේදී විභක්ති ලොප්කටයුතු බැවින් පද දෙකේ විභක්ති ලොප් කළ විට "සෙතවත්ථ" කියා සමාසනාමය සිඬ වේ. ඉන්පසු පඨමා එක වචනය යෙදූ විට "සෙතවත්ථං" යි සිටී.

විශේෂණ පදය මුලින් සිටීම මේ කම්මධාරය සමාසයේ බහුල වූ පැවැත්මයි. නමුත් ඇතැම් විට විශේෂණපදය පසුවී ද සිටී.

පඨමො + පුරිසො = පඨමපුරිසො = (ප්‍රථමපුරුෂයා). පු.

සෙතො + හත්ථී = සෙතහත්ථී = (සුදු ඇතා). පු.

රත්තං + උප්පලං = රත්තුප්පලං (= රතු උපුල). න.

වීරො + පුරිසො = වීරපුරිසො (= වීරපුරුෂයා). පු.

කණ්හො + සප්පො = කණ්හසප්පො (කළු සර්පයා). පු.

ලොහිතං + චන්දනං = ලොහිතචන්දනං (රත් සඳුන්). න.

ඛත්තියා + කඤ්ඤා = ඛත්තියකඤ්ඤා (= රාජකන්‍යාව). ඉ.

සාරිපුත්තො + ථෙරො = සාරිපුත්තත්ථෙරො
(= ශාරීපුත්‍රස්ථවිරතෙම). පු.
සුමෙධො + පණ්ඩිතො = සුමෙධපණ්ඩිතො
(සුමේධ පණ්ඩිත තෙම). පු.
බුද්ධඝොසො + ආචරියො = බුද්ධඝොසාචරියො
(බුද්ධඝෝෂාචාර්‍යතෙම) පු.

31. මේ සමාසයේදී මහන්ත ශබ්දය අන්‍ය ශබ්දයකට විශේෂණ වී මුලින් සිටි කල එයට 'මහා' ආදේශය වේ.

මහන්තො + පුරිසො = මහාපුරිසො (= මහා පුරුෂයා). පු.
මහන්තො + විහාරො = මහාවිහාරො (= මහාවිහාරය). පු.
මහන්තො + මුනි = මහාමුනි (= සර්‍වඥයන් වහන්සේ). පු.
මහන්තී + පඨවී = මහාපඨවී (= මහපොළොව). ඉ.
මහන්තං + බලං = මහාබලං (= මහත් වූ බලය හෝ සේනාව) න.
මහන්තං + භයං = මහාභයං හෝ මහබ්භයං (= මහත් වූ භය). න.

'මහබ්භය' යන තැන මහ ආදේශයයි දක්වා තිබේ. සන්ධි විධියෙන් ආකාරයට හ්‍රස්ව කරන්නට ද හැකි ය.

32. සමාසයේ දී විභක්තිය ලොප් කළ විට ප්‍රකෘති ශබ්දය ඉතිරි වේ. ආකාරාන්ත ස්ත්‍රීලිංගික ශබ්දයන්ගේ විභක්තිය ලොප් කළ විට ද එය ආකාරාන්තව සිටී. නමුත් යට දක්වූ 'කත්තියකඤ්ඤූ' යන පදයෙහි 'ඛත්තියා' ශබ්දයේ ආකාරය හ්‍රස්ව වී තිබේ. ඊට හේතු මෙසේයි:- කම්මධාර සමාසයේදී ස්ත්‍රීලිංගික ශබ්දයක් විශේෂණ වී මුලින් සිටි විට (ඒ ශබ්දය පුල්ලිඟුවෙහි ද වැටෙන ශබ්දයක් වී නම්) එය පුල්ලිඞ්ගික ශබ්දයට සමාන වේ.

ඛත්තියා - ශබ්දය පුල්ලිඞ්ගයෙහි ඛත්තිය කියා සිටී. එබැවින් මෙහි ඛත්තියකඤ්ඤූ යයි සමාසය සිඳ විය. අන්‍ය වූ ආකාරන්ත-ඊකාරාන්ත ස්ත්‍රී ලිංගික ශබ්දයන්ට ද (පුල්ලිඟුවෙහිත් වැටෙන ශබ්ද වී නම්) මෙසේ පුල්ලිඞ්ගික භාවය පැමිණෙන බව සැලකිය යුතු.

උදාහරණ :-

රත්තා + ලතා = රත්තලතා (= රතු වැල). ඉ.

බ්‍රාහ්මණී + දාරිකා = බ්‍රාහ්මණදාරිකා (බැමිණි දැරිය). ඉ.

ඛත්තියා + කුමාරී = ඛත්තියකුමාරී (රාජකුමරිය). ඉ.

නාගී + මාණවිකා = නාගමාණවිකා (නාමෙනෙවිය). ඉ.

තරුණී + බ්‍රාහ්මණී = තරුණබ්‍රාහ්මණී (= තරුණ බැමිණිය). ඉ.

දුතියා + භික්ඛා = දුතියභික්ඛා (= දෙවෙනි භික්ෂාව). ඉ.

සංලක්ෂණය :-

පූර්ව පදය සංඥා නාමයක් වූ විට පුල්ලිඞ්ගභාගය නොවේ. "නඤ්ඤපොක්ඛරණී" "නඤ්ඤදෙවී" යනු උදාහරණයි.

33. උපමාවක් වූ විශේෂණ පදය සමාස පදයේ අගින් සිටී. සීහො විය සීහො (= සිංහයා වැනිනුයි 'සීහ නම් වේ.) මුනි ච සො සීහො චාති මුනිසීහො (= මුනි වූයේත් හෙතෙමේය. සිංහ වූයේත් හෙතෙමේනුයි මුනිසීහ නම් වේ.) යන තන්හි සීහ යන විශේෂණය උපමාවකි. තාපසයෙක් හෝ භික්ෂු නමක් සිංහයකු විය හැකි නොවේ. එහෙයින් 'මුනිසීහ' යන්නේ අර්ථය 'සිංහයාට සමාන වූ මුනිතෙම' යයි දත යුතු. මෙසේ විශේෂණ පදය උපමාවක් වූ විට එය අගින් යෙදිය යුතුයි. තවත් උදාහරණ :-

නාගො විය බුද්ධො = බුද්ධනාගො (= බුද්ධනාගතෙම, ශ්‍රේෂ්ඨ වූ සර්ඒයන් වහන්සේයි.) මෙහි 'නාග' නම් හස්තියායි. මේ සීහ, නාග, උසභ, ආදී ශබ්ද ශ්‍රේෂ්ඨාර්ථයෙහි යයි දතයුතු.

ආදිච්චො විය බුද්ධො = බුද්ධාදිච්චො = (බුද්ධ නමැති සූර්‍යතෙම). පු.

චන්දෙ විය මුඛං = මුඛචන්දෙ = චන්ද්‍රා වැනි මුහුණ හෝ මුහුණ නමැති චන්ද්‍රයා). පු.

පදුමං විය මුඛං = මුඛපදුමං (= මුවපියුම, පියුම වැනි මුහුණ). න.

පුණ්ඩරීකං විය සමණෝ = සමණපුණ්ඩරීකෝ (= හෙළ පියුමකට බඳු ශ්‍රමණතෙම). පු.

34. මේ සමාසයේදී න නිපාතය මුලින් සිටි විට එයට ව්‍යඤ්ජනයක් පර කල්හි අකාරාදේශ ද ස්වරයක් පර කල්හි අන්-ආදේශ ද වෙති.

ව්‍යඤ්ජන පර කල්හි :

න + සුරෝ = අසුරෝ (= අසුරයා. පු. දෙවි නුවූයේ යන අර්ථ ඇත්තේයි.)

න + බ්‍රාහ්මණෝ = අබ්‍රාහ්මණෝ (බ්‍රාහ්මණ නොවූයේ. පු. බ්‍රාහ්මණයාට සමාන වූයේ යන අර්ථ ඇත්තේයි). පු.

න + සමණෝ = අස්සමණෝ (= ශ්‍රමණ නොවූයේ; ශ්‍රමණයාට සමාන වූයේ). පු.

න + මනුස්සෝ = අමනුස්සෝ (= අමනුෂ්‍යයා; මනුෂ්‍යයාට සමාන වූයේ.) පු.

න + කුසලං = අකුසලං (අකුශලය). න.

න + කරොන්තෝ = අකරොන්තෝ (= නොකරන්නේ). පු.

ස්වරය පර කල්හි

න + අස්සෝ = අනස්සෝ (= අශ්ව නොවූයේ). පු.

න + අරියෝ = අනරියෝ (= අනාර්‍යතෙම). පු.

න + අස්සවෝ = අනස්සවෝ (= නොකීකරු අය). පු.

න + ඉට්ඨෝ = අනිට්ඨෝ = (අනිෂ්ට වූයේ). පු.

35. මේ සමාසයේදී කු-නිපාතයට ස්වරයක් පර කල්හි කද් යනාදේශ වේ. කු - නිපාතය නින්දිතාර්ථයෙහි වැටේ.)

කු - අන්නං = කදන්නං (= නින්දිත වූ බත). න.
කු + අසනං = කදසනං (= නින්දිත වූ ආහාරය). න.

"කුපුත්තෝ, කුදිට්ඨී" යනාදි තන්හි ස්වරයක් පරව නැති බැවින් කදෘදේශය නොවේ.

36. අල්පාර්ථයෙහි වැටෙන විට කු - නිපාතයට කා යන ආදේශය වේ.

කු + ලවණං = කාලවණං (= ලුණු ස්වල්පය). න.
කු + පුප්ඵං = කාපුප්ඵං (= මල් ස්වල්පය). න.

37. පුරිස ශබ්දය පරවූ කල්හි නින්දිතාර්ථයෙහි ද කු - නිපාතයට කා - ආදේශය ඇතැම් විට වේ.

කු + පුරිසෝ = කාපුරිසෝ (= නින්දිත පුරුෂයා). පු. කුපුරිසෝ කියා ද සිටී.

2. දිගු සමාසය

38. සංඛ්‍යාවන් පූර්ව කොට ඇති කම්මධාරය සමාසය ම 'දිගුසමාස' නම් වේ. මේ සමාසයේ විශේෂ ලක්ෂණයක් නම් සමාස වූ පදය නපුංසක ලිඟු ඒක වචනයෙන් සිටීමයි. ඇතැම් විටක බහුවචනයෙන් ද සිටී.

ද්වෙ + රත්තියෝ (රාත්‍රීහු දෙදෙන) යන තැන විභක්ති ලොප් කළ විට 'ද්විරත්ති' කියා සිටී. සමාසයේදී පදන්ත වූ ඉකාරාදීන්ට අකාරාදේශ කළ හැකි බැවින් රත්ති ශබ්දයේ ඉකාරයට අකාරාදේශ කොට නපුංසකලිඟු ඒකවචනය යෙදූවිට 'ද්විරත්තං' කියා සිටී. උදාහරණ:-

ද්වෙ + අඞ්ගුලියෝ = ද්වඞ්ගුලං (අඟල් දෙකක් 'ද්විරත්තං' යන්න මෙනි). නි.

තයෝ + ලොකෝ = තිලොකං (= තුන්ලොව). න.

තයෝ + දණ්ඩා = තිදණ්ඩං (= එකට බැඳි දඬු තුන: (ත්‍රිදණ්ඩය). න.

චතස්සෝ + දිසා = චතුද්දිසං (= සිව්දිග: දිශාහතර). න.

පඤ්ච + සීලානි = පඤ්චසීලං (= පන්සිල්). න.

සත්ත + අහානි = සත්තාහං (= සතියක්: සත්දිනක්). න.

සතං + යොජනානි = සතයොජනං (= සියක් යොදුනක්). න.

"එකපුග්ගලො, චතුද්දිසා, තිභවා" යනාදිය දිගුසමාස වුවත් නපුංසක ඒකවචන බවට නො පැමිණේ.

අභ්‍යාසය 7

සිංහලට නඟා සමාස පදයන් සිඳ වූ සැටි දක්වනු.

1. බුඩාදිච්චෙ අනුදිතෙ චන්දරිසුරිය - සහස්සානිපි මොක්ඛ මග්ගං පාකටං කාතුං න සක්කොන්ති. 2. මහාපුරිසෙ මහාබොධි මුපසඞ්කමන්තෙ මහාපඨවී මහාරවා රවමානා කම්පි. 3. ධම්මාසොකමහාරාජා සට්ඨිසහස්සමත්තෙ සමණපතිරූපකෙ නීහරිත්වා බුඬසාසනං නිම්මලමකාසි. 4. සක්‍යසීහො අනාථපිණ්ඩිකම්හා සෙට්ඨිනා කාරිතෙ ජෙතවනමහාවිහාරෙ එකුනවීසතිවස්සානි වසි. 5. සාරිපුත්තත්ථෙරො පිප්ඵලිගුහායං සමාපත්තිසුඛෙන සත්තාහං වීතිනාමෙසි. 6. බුඬසොසාචරියො ජම්බුදීපතො සීහලදීපමාගන්ත්වා අනුරාධපුරෙ මාගධභාසාය පරිවත්තෙසි. 7. වට්ටගාමණිඅභයමහාරඤ්ඤෙ කාලෙ බහවො මහාථෙරා මාතුලජනපදෙ ආලොකගුහායං සන්නිපතිත්වා පරියත්තිධම්මං තාලපණ්ණෙසු ලිඛිංසු. 8. තිත්ථියා රත්තචන්දනමණ්ඩපං කාරාපෙත්වා තං නීලුප්පලපත්තෙහි ඡාදාපෙත්වා මහාජනස්ස පාටිහාරියං දස්සෙස්සාමාති තත්ථ අට්ඨංසු. 9. මහාමොග්ගල්ලානත්ථෙරො අත්තනො ඉද්ධිබලෙන සක්කස්ස. දෙවරඤ්ඤෙ වෙජයන්තපාසාදං කම්පෙසි. 10. දෙවදත්තත්ථෙරො රාජගහනගරෙ අජාසත්තුකුමාරං පසාදෙත්වා මහාලාභං උප්පාදෙසි. 11. සිද්ධත්ථකුමාරො උරුවෙලායං ගයාපදෙසෙ නෙරඤ්ජරානදීතිරෙ අස්සත්ථරුක්ඛමූලෙ නිසීදිත්වා වෙසාඛ පුණ්ණමියා පච්ඡිමයාමෙ අභිසම්බොධිං පාපුණි. 12. කිසා ගොතමී නාම ඛත්තියකඤ්ඤා නගරං පදක්ඛිණං කරොන්තස්ස බොධිසත්තස්ස රූපසිරිං දිස්වා එකං ගාථමාහ.

මෙහි අමුතු වචන

අජාතසත්තු = අජාසත්. පු.
අට්ඨකථා = අටුවාව. ඉ.
අනුදීත = උදුනොවූ. 3.
අනෙක = නොයෙක්. 3.
අභිසම්බොධි = බුඩකඳය. ඉ.
අස්සත්ථරුක්ඛ = ඇසටු ගස. පු.
ආලොකගුහා = අලුවිහාර
යෙහි ගුහාව. ඉ.
ඉධිබල = සෘධියේ බලය. න.
උපසඞ්කමන්ත = එළඹෙන. 3.
උරුවෙලා = එනම් පෙදෙස
කම්පි = කම්පාවිය.
ඡාදුපෙඡා = වස්වා, සෙවිලි
කරවා. පූ. ක්‍රි.
ජම්බුදීප = දඹදිව. පු.
තාලපණ්ණ = පුස්කොළ,
තල්කොළ. න.
පසාදෙඡා = පහදවා. පූ. ක්‍රි.
පාටිහාරිය = ප්‍රාතිහාය්‍යය. න.
පිප්ඵලිගුහා = එනම් ඇති
ගුහාව. ඉ.
බුඩවචන = බුඩධර්මය. න.
මණ්ඩප = මණ්ඩපය, මඩුව. පු.
මහාජන = මහජනයා. පු.

තිපිටකපාළි = තුන්පිටක පෙළ.ඉ.

තිත්ථිය=අන්‍යදෘෂ්ටික ශ්‍රමණයා.පු.

දෙවරාජ = දෙව්රජ. පු.
නීහරිඡා = නෙරපා, පිටතට ගෙන.
පූ. ක්‍රි.
පකාසෙතුං = ප්‍රකාශ කරන්ට. නි.
පච්ඡිමයාම = රාත්‍රියේ අවසාන
කොටස. පු.
පදක්ඛිණා = වටේ යාම,
ප්‍රදක්ෂිණා කිරීම. ඉ.
පරිවත්තෙති = පෙරළයි,
අන්බසකට නගයි
පරියත්තිධම්ම = පර්යාප්ති
(ත්‍රිපිටක) ධර්මය. පු.

රවමාන = ශබ්ද කරමින්. පු.
රාජගහනගර = රජගහනුවර. න.
රූපසිරි = රූප සම්පත. ඉ.
වීතිනාමෙති = කල් යවයි
වෙජයන්තපාසාද =
වෛජයන්ත නම් ප්‍රාසාදය. පු.
වෙසාඛපුණ්ණමී = වෙසක්
පසළොස්වක. ඉ.

මහාරහ = ඉතා වටිනා. 3.

මහාලාභ = මහත් ලාභය. පු.

මාගධභාසා = මගධ (පාලි භාෂාව. ඉ.

මාතලජනපද = මාතලේ පෙදෙස. පු.

මොක්ඛමග්ග = නිවණට මග. පු.

රව = ශබ්දය, නාදය. පු.

සක්‍යසීහ = ශාක්‍යසිංහ (බුදුරද) පු.

සමාපත්තිසුඛ = සමවත් සැපය. න.

සමණපතිරූපක = පැවිද්දකු මෙන් වංචාවෙන් පෙනී සිටින්නා. පු.

සමාස යොදමින් පාලියට නැඟිය යුතු :-

1. ක්ෂත්‍රිය - බ්‍රාහ්මණ කන්‍යාවෝ රතුවස්ත්‍ර ඇඳ රතුපුල් ගෙන ජේතවන විහාරයට ගොස් ශාක්‍යමුනීඳුන් වැන්දහ. 2. පන්සියයක් මහරහත්හු රජගහනුවර සත්තපණ්ණිගුහාද්වාරයෙහි අජාසත් මහරජු කරවූ මණ්ඩපයෙහි ධර්මසංගීතිය කළහ. 3. සිද්ධාර්ථ කුමාර තෙමේ ඇසළ පුර පසළොස්වක්දා මධ්‍යම යාමයේදී යශෝධරාදේවිය ද රාහුල කුමරු ද සියලු සම්පත් ද හැර දමා පැවිදිවීමට ගියේ ය. 4. මේඝවණ්ණාභය මහ රජතුමා රත්සඳුන් කරඬුවක රන්කරඬුවක් තබා එය තුළ දන්තධාතුව තැන්පත් කොට මහා පූජවක් කරවීය. 5. 'මෙන්ඩුන්' නමැති බුරුම අධිරාජතුමා බුද්ධගයාවේ මහාබෝධිය අසල මහා විහාරය මහත් ධනව්‍යයකින් ප්‍රතිසංස්කරණය කරවීය. 6. බුද්ධඝෝෂාචාර්‍ය තෙමේ මහා විහාරවාසී සංඝපාල මහ තෙරුන්ගෙන් සිංහල අටුවා ඉගෙන ඒවා පාලි භාෂාවට නැඟී ය.[1] 7. පළමුවැනි පරාක්‍රමබාහු මහ රජ තෙම මුළු ලක්දිව එකච්ඡත්‍ර නංවා නිකායත්‍රය එකක් කොට ශාසනය ශුද්ධ කෙළේ ය. 8. ශාක්‍යසිංහතෙම තුන්ලොව සියලු දෙවි මිනිසුන්ට දහම් දෙසීය. 9. මහා කාශ්‍යප ස්ථවිරතුමා පන්සියයක් භික්ෂූන් සමග කුසිනාරානුවරට ගොස් පිරිනිවි භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වැන්දේ ය. 10. මල්ලරජවරු බුද්ධදේහය රන්දෙනක බහා සුවඳතෙල් වත්කොට සඳුන් දරසෑයක තබා දැවූහ.

[1] මෙය 'ආරොපෙසි' යි පාලියට නැඟුවොත් භාෂාව කියවෙන වචනය දුතියාවෙන් තැබිය යුතු. 'පරිවත්තෙති' යන්න යෙදුවොත් එය තතියාවෙන් තැබිය යුතු.

11. රජගහසිටුතුමා රත්සඳුන් පාත්‍රයක් සාදවා සෘධිමත්හු ඇත්නම්[1] අහසින් අවුත් ගනිත්වායි කියා එය සැටරියන් උස් උණලීයක් මත්තෙහි තැබී ය. 12. පිණ්ඩොලභාරද්වාජ ස්ථවිරතුමා අහසින් ගොස් එය ගත්තේ ය. නමුත් සර්ෂපයන් වහන්සේ ඒ පාත්‍රය බින්දෙව් සේක. 13. රතුරෙදි නිල්රෙදි සුදුරෙදි ආදියෙන් සැරසූ මහා මණ්ඩප සුධර්මා දේවසභාව මෙන් බබළයි. 14. උපාසක උපාසිකාවෝ සුදුවස්ත්‍ර ඇඳ සුදුනෙළුම් රතුපුල් එළසඳුන් ආදිය ගෙන ගොස් රුවන්වැලි මහසෑය ද මහා බෝධිය ද මිරිසවැටි සෑය ද පුදත්.

මෙහි අමුතු වචන

ඇසළ පුර පසළොස්වක = ආසාළ්හපුණ්ණමී. ඉ.

උණලීය = වෙළු. වෙළුයට්ඨි.ඉ.

කරඬුව = කරණ්ඩක. පු.

තර්ජනය කොට = තජ්ජෙත්වා. පූ.ක්‍රි.

තැන්පත්කොට = නිදහිත්වා: ඨපෙත්වා. පූ. ක්‍රි.

දරසෑය = චිතක. පු.

ධනව්‍යය = ධනබ්බය. පු.

විස්සජ්ජන. න.

ධර්මසංගීතිය = ධම්මසංගීති. ඉ.

නමුත් = තථාපි. නි.

නංවයි = ආරොපෙති

නිකායත්‍රය = නිකායත්තය. න.

පැවිදිවීමට = පබ්බජිතුං. නි.

පිරිනිවි = පරිනිබ්බුත. 3.

ප්‍රතිසංස්කරණය කරවයි = පටිසංඛාරාපෙති

බහා = පක්ඛිපිත්වා. පූ.ක්‍රි.

බින්දෙව්වේය = භින්දුපෙසි.

බුරුම අධිරාජයා = මාරම්මාධිරාජ. පු.

මධ්‍යමයාමය = මජ්ඣිමයාම. පු.

මහරහත් = මහාඛීණාසව. පු.

මිරිසවැටි සෑය = මරිචවට්ටිචෙතිය. න.

රන්දෙණ = සුවණ්ණදෙණී. ඉ.

රියන = රතන, න. හත්ථ. පු.

වත්කොට = ආසිඤ්චිත්වා පූ. ක්‍රි.

ශුද්ධකෙළේය = සොධෙසි.

සඳුන්දර = චන්දනදරු. න.

සුවඳතෙල් = ගන්ධතෙල. න.

*සචෙ - නිපාතය මුලට යෙදීමෙන් 'නම්' යන අර්ථය ලැබේ.

3. තප්පුරිස සමාසය

37. දුතියාව පටන් සත්තමිය දක්වා ඇති විභක්තීන්ගෙන් යුත් පදයන් තමන්ට පරව සිටි පදයන් හා සමාසවීම තප්පුරිස සමාස නමි.

කම්මධාරය-දිගු සමාසයෝ ප්‍රථමාවෙන් සිටි පදයන් අතර පමණක් සිද්ධවෙති. පූර්වපදය ප්‍රථමාවෙන් සිටිකල්හි තප්පුරිස සමාසය සිද්ධ නොවේ. නමුත් පසු පදය එහිත් ප්‍රථමාවෙන් සිටී. (සමාසය සිද්ධ වූ පසු කොයි සමාසයකට අයත් පදයක් වුවත් නාම පදයක් මෙන් සලකා සියලු විභක්තිවල වරනැගිය හැකි බව සැලකිය යුතු.)

38. දුතියාවෙන් යුත් පදයක් මුලට සිට සමාස වූ කල ඊට දුතියා තප්පුරිස සමාස යයි කියනු ලැබේ. තතියාදියෙන් යුත් පද මුලට සිට සමාස වූ විට තතියාතප්පුරිස යනාදි නම් යොදනු ලැබේ.

1. දුතියාතප්පුරිසය

සරණං + ගතෝ = සරණගතෝ (සරණ ගියේ). පු.

ගාමං + ගතෝ = ගාමගතෝ (= ගමට ගියේ). පු.

සුඛං + පත්තෝ = සුඛප්පත්තෝ (= සැපයට පැමිණියේ). පු.

රථං + ආරූළ්හෝ = රථාරූළ්හෝ (= රථයට නැංගේ). පු.

සොතං + ආපන්නෝ = සොතාපන්නෝ (= සෝවාන් වූයේ). පු.

(නිවන කරා පැමිණෙන හෙයට පැමිණියේ යන අර්ථයි.

පමාණං + අතික්කන්තෝ = පමාණාතික්කන්තෝ. (= ප්‍රමාණය ඉකුත් කළේ). පු.

2. තතියාතප්පුරිසය

බුද්ධෙන + දෙසිතෝ = බුද්ධදෙසිතෝ (= සර්වඥයන් වහන්සේ විසින් දෙසන ලද්ද ධර්මයයි). පු.

අග්ගිනා + දඩ්ඪෝ = අග්ගිදඩ්ඪෝ (= ගින්නෙන් දවන ලද්දේ). පු.

සප්පෙන + දට්ඨො = සප්පදට්ඨො (= සර්පයා විසින් ඩසින ලද්දේ). පු.
රඤ්ඤ + හතො = රාජහතො (= රජු විසින් නසන ලද්දේ). පු.

කරණාථයෙහි තතියා තප්පුරිසය :

අසිනා + කලහො = අසිකලහො (= කඩුවෙන් කරන කලහය). පු.
වාචාය + නිපුණො = වාචානිපුණො (= වචනයෙන් දක්ෂ වූයේ). පු.

3. චතුත්‍ථීතප්පුරිසය

චීවරස්ස+දුස්සං = චීවරදුස්සං (= සිවුරට වස්ත්‍රය හෝ සිවුරුපිළි). න.
යාගුයා + තණ්ඩුලා = යාගුතණ්ඩුලා (= කැඳට සහල්). පු.
සංඝස්ස + භත්තං = සංඝභත්තං (= සංඝයාට බත්, සඟබත්). න.
බුද්ධස්ස + දෙය්‍යං = බුද්ධදෙය්‍යං (= බුදුන්ට දිය යුතු දේ). න.
පාසාදය + දබ්බං = පාසාදදබ්බං (= ප්‍රාසාදයට දැව). න.

4. පඤ්චමීතප්පුරිසය

රුක්ඛා + පතිතො = රුක්ඛපතිතො (= ගසෙන් වැටුණේ). පු.
රාජතො + භයං = රාජභයං (= රජුගෙන් වූ භය. රාජභය). න.
බන්ධනා + මුත්තො = බන්ධනමුත්තො (= බැම්මෙන් මිදුණේ). පු.
අග්ගිතො + භයං = අග්ගිභයං (= ගිනිභය). න.
පාපතො + භීතො = පාපභීතො (= පවෙන් භයවූයේ). පු.
දුච්චරිතො + විරති = දුච්චරිතවිරති (දුෂ්චරිතයෙන් වෙන්වීම). ඉ.

5. ෂට්ඨීතප්පුරිසය

ජිනස්ස + වචනං = ජිනවචනං (= බුද්ධවචනය). න.
රඤ්ඤෙ + පුත්තො = රාජපුත්තො (= රජුගේ පුත්‍රයා, රාජපුත්‍රයා).
ධඤ්ඤනං + රාසි = ධඤ්ඤරාසි (= ධාන්‍යරාශිය). පු.
හත්‍ථීනො + පදං = හත්‍ථිපදං (= හස්තිපාදය). න.
පුප්ඵස්ස + ගන්ධො = පුප්ඵගන්ධො (= මලේ සුවඳ). පු.
බුද්ධස්ස + සාවකො = බුද්ධසාවකො (= බුද්ධශ්‍රාවකතෙම). පු.

අරඤ්ඤෙ + වාසො = අරඤ්ඤවාසො (= වනයෙහි විසීම, වනවාසය) පු.
ගාමෙ + සූකරො = ගාමසූකරො (ගම්ඌරා). පු.
කූපෙ + මණ්ඩූකො = කූපමණ්ඩූකො (= ළිඳේ මැඩියා). පු.
වනෙ + පුප්ඵං = වනපුප්ඵං (= වනයෙහි මල්, වල් මල්). න.
සමුද්දෙ + කච්ඡපො = සමුද්දකච්ඡපො (= මුදුකැස්බෑවා). පු.
ධම්මෙ + රතො = ධම්මරතො (= ධර්මයෙහි ඇලුණේ). පු.
අන්තෙ + වාසිකො = අන්තෙවාසිකො (= අතවැසියා). පු.
මනසි + කාරො = මනසිකාරො (= මෙනෙහි කිරීම, මනස්කාරය). පු.
පඞ්කෙ + රුහං = පඞ්කෙරුහං (= නෙළුම්මල). න.
පුබ්බෙ + නිවාසො = පුබ්බෙනිවාසො (= පෙර විසීම, පූර්වේනිවාසය). පු.

මේ ආදිය තප්පුරිස සමාසය වුවත් මුල් පදවල විභක්ති ලොප් නොවී එසේ ම සිටිත්. ඇතැම් සමාස පදයන්ගේ විභක්ති ලොප් නොවන බව මුලදී දක්වන ලදි.

මේ තප්පුරිස සමාසයෙහි වූ බොහෝ පද තුන්ලිඟුවෙහි වැටෙති. "සරණගතො පුරිසො, සරණගතා ඉත්ථී, සරණගතං කුලං" ආදි වශයෙන් තුන් ලිඟුවෙහි සියලු විභක්තිවල වරනැගිය යුතු.

4. ද්වන්ද සමාසය

39. කම්මධාරය සමාසයෙහි මෙන් විශේෂණ විශේෂ්‍ය භාවයක් නැත්තා වූ ද තප්පුරිසයෙහි මෙන් ද්විතීයාදි පූර්වපද නැත්තා වූ ද වෙන් වෙන් අර්ථයන් ප්‍රකාශ කරන ශබ්දයන් සමාස කිරීම ද්වන්ද සමාස නම් වේ.

"දෙවා ච මනුස්සා ච = දෙවමනුස්සා" යනාදි වශයෙන් ච - ශබ්දයෙන් සම්බන්ධකරන ශබ්දයන් ද්වන්ද සමාසයට පැමිණෙන බව සැලකිය යුතු. ච - ශබ්දය සිංහලයෙහි ද - ශබ්දයට සමාන වේ. එහෙයින් සිංහල ව්‍යාකරණයෙහි මේ සමාසය 'ද - අරුත් සමස්' යි නම් කරන ලදි.

ච - ශබ්දයෙන් සම්බන්ධවෙන ශබ්ද දෙකක් හෝ ඊට වැඩි ගණනක්

හෝ ද්වන්ද සමාසයේ දී එක් පදයක් කොට ගැළපිය හැක. පද දෙකකට වැඩි ගණනක් සමාස කිරීමේ බලය අන්‍ය සමාසයන්ට ඇති බවක් නො පෙනේ.

40. ද්වන්ද සමාසය සමාහාර ද්වන්දය, ඉතරෙතරද්වන්ද යයි දෙකොටසකට බෙදනු ලැබේ. සමාහාර ද්වන්දයේදී සමාස පදය නපුංසක ඒක වදනයෙන් සිටී. (පද දසයක් සමාස කළත් ඒක වචන බවට පැමිණේ යයි දත යුතු) ඉතරෙතරද්වන්දයේදී ඒ සමාස වූ පදවලට අයත් ලිඟුවල බහුවචන වී සිටිත්.

41. කම්මධාරයෙහි 'සෙතහත්ථී' යන පදයෙන් 'හත්ථී' යන පසු පදය ප්‍රධාන වේ. 'සෙත = සුදු' යන්න ප්‍රධාන විය නොහේ. තප්පුරිසයෙහි 'ගාමගතො' යන පදයෙහි 'ගතො = ගියේ' යන්න ප්‍රධාන වේ. මෙසේ ඒ සමාස දෙක්හි පසු පදය ප්‍රධාන 'වෙන නමුත් ද්වන්දයෙහි එක් පදයක් ප්‍රධාන නොවන බව සැලකිය යුතු. එසේ පද දෙක සමාන බල ඇති කල්හි මුලින් යෙදිය යුතු කිනම් පදයක් දැයි නිශ්චය කොට ගැන්ම අපහසු වන බැවින් අඩු අකුරු ඇති පදය මුලින් යෙදිය යුතු ය. තඤ්ඤයෙන් උසස් පදය මුලින් යෙදිය යුතුය. ආදී නියමයෝ පූර්වාචාර්‍යයන් විසින් දක්වන ලදහ.

A සමාහාරද්වන්දය

නාමඤ්ච රූපඤ්ච = නාමරූපං (= නාමය ද රූපය ද 'නාමරූප' නම්). න.
චක්ඛුඤ්ච සොතඤ්ච = චක්ඛුසොතං (= ඇස හා කන). න.
ගීතඤ්ච වාදිතඤ්ච = ගීතවාදිතං (= ගීකීම් හා වැයීම්). න.
ඡවි ච මංසඤ්ච ලොහිතඤ්ච = ඡවිමංසලොහිතං
හත්ථීනො ච අස්සා ච රථා ච පත්තිකා ච = හත්ථස්සරථ
පත්තිකං (= ඇත් = අස් - රිය - පාබලසෙනග). න.
හත්ථී ච ගාවො ච අස්සා ච වළවා ච = හත්ථිගවාස්සවළවං (= ඇත් - ගව - අස් - වෙළඹ). න.

B. ඉතරෙතරද්වන්දය

චන්දෙ ච සුරියෝ ච = චන්දසුරියා (= චන්ද්‍ර සූර්‍යයෝ). පු.
සාරිපුත්තෝ ච මොග්ගල්ලානෝ ච = සාරිපුත්තමොග්ගල්ලානා (= සැරියුත් - මුගලන් මහතෙරහු). පු.
සමණා ච බ්‍රාහ්මණා ච = සමණබ්‍රාහ්මණා (= මහණ බමුණෝ). පු.
දෙවා ච මනුස්සා ච = දෙවමනුස්සා (= දෙවිමිනිස්සු). පු.
මාතා ච පිතා ච = මාතාපිතරෝ (= මවුපියවරු). පු.

සුරා ච අසුරා ච නරා ච උරගා ච නාගා ච යක්ඛා ච = සුරා'සුරනරොරගනාගයක්ඛා (= දෙවි - අසුර - මනුෂ්‍ය - උරග - නාග - යක්ෂයෝ). පු.

අභ්‍යාසය 8.

සිංහලට නඟා සමාස පද සිද්ධ වූ සැටි දක්වනු.

"උත්තමඞ්ගරුහා මය්හං ඉමෙ ජාතා වයොහරා,
පාතුභූතා දෙවදූතා, පබ්බජ්ජාසමයො මම." (මඛාදෙව ජාතකය.)

2. "මහාසත්තෝ පන ආගච්ඡන්තෝ කහාපණසහස්සෙන සද්ධිං එකං සාටකං තාම්බූලපසිබ්බකෙ ඨපෙත්වා ආගතෝ." (මහොසධ ජාතක)

3. පණ්ඩිතෝ උප්පාදිතධනං ච ආහටධනං ච සබ්බං තස්සා මාතාපිතූන්නං දත්වා තෙ සමස්සාසෙත්වා තමාදාය නගරමෙව අගමාසි.

4. "ජරසක්කො අම්හෙ මත්තෙ කත්වා මහාසමුද්දපිට්ඨෙ ඛිපිත්වා අම්හාකං දෙවනගරං ගණ්හි. මයං තෙන සද්ධිං යුජ්ඣිත්වා අම්හාකං දෙවනගරමෙව ගණ්හිස්සාම." (කුලාවක ජාතක)

5. තස්ස ගමනමග්ගෙ සිම්බලිවනං තාලවනං විය ඡිජ්ජිත්වා සමුද්දපිට්ඨෙ පතති. සුපණ්ණපොතකා සමුද්දපිට්ඨෙ පරිවත්තන්තා මහාරවං රවිංසු" (ජාතක නිදාන)

6. "මහාමයාදෙවී .....ගන්ධොදකෙන නහායිත්වා චත්තාරි

සතසහස්සානි විස්සජ්ජෙත්වා මහාදානං දත්වා..... අලංකතපටියත්තං සිරිගබ්භං පවිසිත්වා සිරිසයනෙ නිපන්නා..... ඉමං සුපිනං අද්දස” (ජාතක නිදාන.)

7. “රාජා.....කපිලවත්ථුතො යාව දෙවදහනගරමග්ගං සමං කාරාපෙත්වා..... දෙවිං සොවණ්ණසිවිකාය නිසීදුපෙත්වා මහන්තෙන පරිවාරෙන පෙසෙසි.” (එම)

8. “ද්වින්නං පන නගරානං අන්තරෙ උභයනගරවාසීනම්පි ලුම්බිනීවනං නාම මඞ්ගලසාලවනං අත්ථි.” (එම)

9. සකලං ලුම්බිනීවනං චිත්තලතාවනසදිසං මහානුභාවස්ස රඤ්ඤො සුසජ්ජිත - ආපානමණ්ඩලං විය අහොසි.”

10. බොධිසත්තො පන ධම්මාසනතො ඔතරන්තො ධම්මකථිකො විය..... ද්වෙ හත්ථෙ ද්වෙ පාදෙ ච පසාරෙත්වා කාසිකවත්ථෙ නික්ඛිත්ත - මණිරතනං විය ජොතන්තො මාතුකුච්ඡිතො නික්ඛමි.” (එම)

11. “අථෙකදිවසං බොධිසත්තො උය්‍යානභූමිං ගන්තුකාමො සාරථිං අමන්තෙත්වා ‘රථං යොජෙහී’ති ආහ.

12. “සො’ ‘සාධූ’ති පටිසුණිත්වා මහාරහං උත්තමරථං සබ්බා ලංකාරෙන අලඞ්කරිත්වා..... චත්තාරො මඞ්ගලසින්ධවෙ යොජෙත්වා බොධිසත්තස්ස පටිවෙදෙසි.” (එම)

මෙහි අමුතු වචන

ආගච්ඡන්ත = එන. 3.
ආපානමණ්ඩල = මත්පැන් බීමේ උත්සවයට සැදූ මණ්ඩපය. න.
ආමන්තෙත්වා = කථාකොට. පූ.ක්‍රි
උත්තමඞ්ගරුහ = හිසකෙස්. පු.
උප්පාදිත = ඉපදවූ, සැපයූ. 3.
උය්‍යානභූමි = උයන්බිම. ඉ.
ඔතරන්ත = බසින. 3.
කහාපණ = කහවණුව (කාසිය).පු.
පටිවෙදෙති = දැනුම් දෙයි.
පබ්බජ්ජාසමය=පැවිදිවීමට කාලය.පු.
පරිවත්තත්ත = පෙරළෙමින්. 3.
පසාරෙත්වා = දිගුකොට. පූ.ක්‍රි.
පසිබ්බක = පසුම්බිය. පු.
පාතුභූත = පහළ වූ. 3.
පොතක = පැටියා. පු.
මඞ්ගල = ශුභවූ. රාජකීය. 3.
මණිරතන = මාණික්‍ය රත්නය. න.

කාසිකවත්ථ = කසීරට වස්ත්‍ර. න.
බිපිත්‍වා = දමා, විසිකොට. පූ. ක්‍රි.
ගන්ධොදක = සුවඳ කළ පැන්. න.
ගමනමග්ග = යනමාගීය. පු.
චිත්තලතාවන = දෙව්ලොව
උයනක නමක්. න.
ජරසක්ක = මහලු ශක්‍රයා. පු.
ජාත = උපන්. 3.
ජොතන්ත = බබළන. න.
තාම්බූල = බුලත්. න.
තාලවන = තල්වනය. න.
දෙවදූත = දෙවියන්ගේ
දූතයා. පු.

ධම්මාසන = ධර්‍මාසනය. න.
ධම්මකථික = බණ
කියන්නා. පු.
නගරවාසී = නුවර වැසියා. පු.
නික්ඛිත්ත = තැබූ; දැමූ. 3.
නිපන්න = හොත්. 3.
පටියත්ත = පිළියෙළ කළ. 3.

මත්ත = මත්වූ. 3.
මහානුභාව = මහත් ආනුභාව
ඇති. 3.
මාතුකුච්ඡි = මවුකුස. පු.ඉ.
යුජ්ඣිත්‍වා = යුද්ධකොට. පූ. ක්‍රි.
රවි = නාද කෙළේය.
වයොහර = ආයුෂය පැහැර
ගන්නාවූ. 3.
විස්සජ්ජෙත්‍වා = වියදම්
කොට. පූ. ක්‍රි.
සකල = සියලු. 3.
සදිස = සමාන වූ. 3.
සමස්සාසෙත්‍වා = අස්වසා. පූ.ක්‍රි.

සමුද්දපිට්ඨ = මූදමතුපිට. න.
සිම්බලි = ඉඹුල් ගස. පු.
සුපණ්ණ = ගුරුළා. පු.
සාටක = වස්ත්‍රය. පු. න.
සිරිගබ්භ = රාජකීය කාමරය. පු.
සිරිසයන = රාජකීය ඇඳ. න.
සුපින = සිහිනය. න.
සුසජ්ජිත = මනාසේ සැරසූ.

සමාසයුක්තකොට පාලියට නැඟිය යුතු.

1. සුමේධ පණ්ඩිත තෙමේ අමෘතදායක වූ දීපඞ්කර මහ මුනිහු ඉදිරියෙහි බුදුබව සඳහා ප්‍රාර්‍ථනා කළේ ය. 2. බුදුන් සරණ ගිය දෙව් - මිනිස් - අසුර - නාගයෝ ප්‍රමාණාතික්‍රාන්ත සැපයට පැමිණියහ. 3. සර්‍වාලඞ්කාරයෙන් සැරසුණු මහරජතුමා සැරසූ මඟුලැතු පිට නැගී දෙව්පුරයක් මෙන් අලඞ්කෘත වූ නගරයෙහි හැසුරුණේ ය. 4. කූපමණ්ඩූකයා තමා වසන ළිඳ මහා සාගරය

මෙන් සලකයි. එමෙන් අල්පශ්‍රැතයා ද තෙමේ මහා පණ්ඩිතයෙකැයි සිතයි. 5. ධර්‍මාශෝක පුත්‍ර වූ මිහිඳු කුමාර තෙමේ මොග්ගලිපුත්තතිස්ස මහාස්ථවිරයන් වහන්සේ වෙත පැවිදිව පිටකත්‍රය ඉගෙන ගත්තේ ය. 6. ගමට ගිය පුරුෂයා ධාන්‍ය රාශියක් ගෙනවුත් නුවරවැසි වෙළඳුන් දශ දෙනකුන්ට වික්කේ ය. 7. ගින්නෙන් දෑ වනයෙහි සිංහ - ව්‍යාඝ්‍ර- කොටි ද, උෂ්ට්‍ර - මුව පක්‍ෂීහු ද නොවසත්. 8. බැමිවලින් මිදුණු ගව මහිෂයෝ ද එළු බැටළුවෝ ද වෘක්‍ෂපත්‍ර - තණ ආදිය කමින් ක්‍රීඩා කරමින් ඇවිද්දහ. 9. බුදුන් දෙසූ නිවන් දෙන දහම් ඇසූ ස්ත්‍රී පුරුෂයෝ සිවුරුපිළි ගෙනවුත් භික්‍ෂු-භික්‍ෂුණී - සාමණෙර - සාමණෙරින්ට දුන්හ. 10. ලක්දිව ගම්-නියම්ගම් - නුවරවල - තල් - පොල් - කිතුල් - අඹ - කොස් - දෙල් ගස් ඇත්තාහ. 11. ගසෙන් වැටුණු වඳුරා ගම්වැසි බල්ලන් විසින් අල්වන ලදි. 12. චන්ද්‍ර- සූර්‍ය්‍ය- තාරකාවෝ අහසෙහි හැසිරෙමින් මුළුලොව අලඞ්කාර කරත්. 13. සර්පයන් විසින් ඩසින ලද බාල - මහලු - දුගී - ධනවත් සියල්ලෝ මහත් දුකට පැමිණෙත්. 14. ක්‍ෂත්‍රිය - බ්‍රාහ්මණ - වෛශ්‍ය - ශූද්‍රයෝ බුද්ධශාසනයෙහි පැවිදිව මහ මුහුදට පැමිණි නොයෙක් ගංගාවන්ගේ ජලය මෙන් සමාන බවට පැමිණෙත්.

ප්‍රශ්න :

1. රුක්ඛං + ආරුළ්හො, බුද්ධෙන + භාසිතො, රත්තං + වත්‍ථං. සෙතො + ගොණො, චොරතො + භයං, තිස්සො + රත්තියො, චත්තාරි + සච්චානි, නරො ච නාරී ච, නච්චං ච ගීතං ච වාදිතං ච, යන තන්හි කෙසේ සමාස කටයුතු ද? සමාසවල නම් ද දක්වනු.

2. ගෙහගතො, මුඛනාසිකං, පත්තචීවරං, ඛත්තියබ්‍රාහ්මණා, මහාමොහො, දසසීලං, ඡළායතනං, අලාභො, කාලවණ්ණං, මජ්ඣිමපුරිසො, පුරාණවිහාරො, ගුත්තිලාචාරියො, මහොසධ පණ්ඩිතො යන සමාස පද කිනම් සමාසවලට අයත් වෙත් ද? පද වෙන්කොට සමාස කරන ආකාරය පෙන්විය යුතු.

අලංකාරකරයි = මණ්ඩෙති; අලංකාරොති

අල්පශ්‍රැතයා = අප්පස්සුත. 3.

කිතුල් = හින්තාල. පු.

කොටියා = දීපි. පු.

තාරකාව = තාරා, තාරකා. ඉ.

දුගී = දුක්ඛිත, දිළිද්ද. 3.

දෙල් = ලබුජ. පු.

නියම්ගම = නිගම. පු.

නිවන්දෙන = අමතඤ්ඤද. 3.

පැමිණේ = පාපුණාති

ප්‍රාර්ථනා කෙළේ ය = පත්‍ථයි

බුදුබව = බුද්ධත්ත. න.

බැටළුවා = මෙණ්ඩ, මෙණ්ඩක. පු.

භික්ෂුණිය = භික්ඛුනී. ඉ.

මඟුලැතා = මඞ්ගලහත්ථී. පු.

මහීෂ (=මීමා) = මහිස. පු.

ව්‍යාඝ්‍ර = ව්‍යග්ඝ. පු.

ශුද්‍ර = සුද්ද

සඳහා = අත්‍ථාය

සමාන බව = සමානත්ත. න.

සර්වාලංකාර = සබ්බාලංකාර. න.

සලකයි = සල්ලක්ඛෙති

සැරසුණු = පතිමණ්ඩිත. 3.

සැරසූ = අලඞ්කත; මණ්ඩිත. 3

5. බහුබ්බීහි සමාසය

42. සමාස වූ පසු ඒ පදයන්ගේ අර්ථයන් හැර අන්‍යාර්ථයක් ප්‍රකාශ කරන්නා වූ සමාසය බහුබ්බීහි නම් වේ.

"ඡින්නහත්ථ" යන තැන 'ඡින්න' ය 'හත්ථ' යයි පද දෙකකි. 'කැපූ, අත' යන අර්ථ දෙකක් ඒ දෙපදයෙන් කියවේ. නමුත් බහුබ්බීහි විධියෙන් සමාස වූ මේ දෙපදයෙන් ඒ පදයන්ට අයත් එක් අර්ථයක් වත් ප්‍රමුඛ වශයෙන් ප්‍රකාශ කරනු නොලැබේ. කැපූ අත් ඇති මිනිසෙක් මෙයින් කියවේ. එබැවින් බහුබ්බීහියෙහි සමාස වීමට පැමිණෙන එක් පදයක් වත් ප්‍රධානඞය නොපවත්වන්නේ යයි ද අන්‍යාර්ථයක් ප්‍රධාන වන්නේ යයි ද දත යුතු.

ආගතා සමණා යං, සො - ආගතසමණො (විහාරො)

(= ආවා වූ ශ්‍රමණයෝ යම් තැනකට ද, ඒ තැන ආගතසමණ නම් වේ; විහාරයයි.)

ආරුළ්හා වාණිජා යං, සා = ආරුළ්හවාණිජා. (නාවා)

(=නැංගාවූ වෙළෙන්දෝ යමකට ද, එය ආරුළ්හවාණිජා නම් වේ. නැවයි).

ආරුළ්හෝ වානරෝ යං, සෝ = ආරුළ්හවානරෝ, (රුක්ඛෝ) (= වඳුරා යමකට නැංගේ ද, එය ආරුළ්හවානර නම් වේ; ගසයි.)

මේ පද තුන ම කර්මාර්ථයෙහි සිද්ධ වේ. ඒමට කර්මය වූ විභාරය ද නැඟීමට කර්ම වූ නැව හා ගස ද මේ පදවලින් ප්‍රකාශ කරනු ලබන බැවින් කර්මාර්ථයෙහි වෙතියි දත යුතු. නැංගා වූ - වෙළෙන්දෝ, වඳුරා යන අර්ථවලින් එකක් වත් සමාස වූ පසු ප්‍රධාන නොවී අන්‍යාර්ථයක් ප්‍රකාශ වෙන ආකාරය සැලකිය යුතු.

විජිතා මාරා යෙන, සෝ = විජිතමාරෝ. (භගවා)

(=මාරයෝ යමකු විසින් පරදවන ලදහු ද, හෙතෙම විජිත මාර නම් වේ. භාග්‍යවතුන් වහන්සේයි.)

දිට්ඨෝ ධම්මෝ යෙන, සෝ = දිට්ඨධම්මෝ (අරියසාවකෝ)

(= ධර්මය යමකු විසින් දක්නා ලද්දේ ද හෙතෙම දිට්ඨධම්ම නම් වේ ආර්‍යශ්‍රාවකයායි.)

(= දිනන ලද ඉඳුරෝ යමකු විසින් ද, හෙතෙම ජිතින්ද්‍රිය නම් වේ. ශ්‍රමණයායි.)

මේ පද තතියා විභක්ති අර්ථයෙහි වෙති.

දින්නෝ සුඞ්කෝ යස්ස, සෝ = දින්නසුඞ්කෝ (රාජා)

(= දෙන ලද සුංගම් හෝ අයබදු යමකු ද, හෙතෙම දින්න සුඞ්ක නම් වේ. (රජ තෙමේයි.)

උපනීතං භොජනං යස්ස, සෝ = උපනීතභොජනෝ

(= ගෙනෙන ලද ආහාරය යමකුට ද, හෙතෙම උපනීතභොජන නම් වේ.)

මොවුහු චතුර්ථී අර්ථයෙහි වෙති.

අපෙතං විඤ්ඤාණං යස්මා, සො = අපෙතවිඤ්ඤාණෝ. (මතකායෝ.)

(= පහ වූ විඥානය යමක් කෙරෙන් ද, එය අපෙතවිඤ්ඤාණ නම් වේ. මෘතශරීරයයි.)

නිග්ගතා ජනා යස්මා සො = නිග්ගතජනෝ. (ගාමෝ)

(= මනුෂ්‍යයෝ යමකින් නික්මුණාහු ද, එය නිග්ගතජන නම් වේ. ගමයි.)

නිග්ගතෝ අයෝ යස්මා සො = නිරයෝ, (=සැපය නික්ම ගියේ යමක් කෙරෙන් ද, එය නිරය නම් වේ. නරකයයි.) මොවුහු පඤ්චමී අර්ථයෙහි වෙති.

ඡින්නා පාදා යස්ස, සො = ඡින්නපාදෝ. (පුරිසෝ)

(= යමකුගේ පාදයෝ සිඳින ලදහු ද හෙතෙම ඡින්නපාද නම් වේ. දඬුවම් ලැබූ පුරුෂයෙකි.)

ඛීණා ආසවා යස්ස, සො = ඛීණාසවෝ. (අරහා)

(= ක්‍ෂීණ වූ ආශ්‍රවයෝ යමකුගේ ද, හෙතෙම ඛීණාසව නම් වේ. රහතන් වහන්සේයි.)

දුට්ඨං සීලං යස්ස, සො = දුස්සීලෝ (දුස්සීල පුග්ගලෝ)

(= දූෂිත වූ සිල් යමකුගේ ද, හෙතෙම දුස්සීල නම් වේ. සිල් නැති පුද්ගලයෙකි.)

සුන්දරෝ ගන්ධෝ යස්ස, තං = සුගන්ධං, (චන්දනාදි)

(= යහපත් වූ ගන්ධය යමකගේ ද, එය සුගන්ධ නම් වේ. සඳුන් ආදි දෙයකි.)

මොවුහු ඡට්ඨී අර්ථයෙහි වෙති.

ආකිණ්ණා මනුස්සා යස්සා, සා = ආකිණ්ණමනුස්සා (රාජධානි)

(= ගැවසීගත් මනුෂ්‍යයෝ යම් තැනක ද, එය ආකිණ්ණ මනුස්ස නම් වේ. රාජධානියයි.)

බහවො තාපසා යස්මිං, සො = බහුතාපසො. (අස්සමො)

(= බොහෝ තාපසයෝ යම් තැනක ද, එය බහුතාපය නම් වේ. ආශ්‍රමයයි.)

සම්පන්නානි සස්සානි යස්මිං, සො = සම්පන්නසස්සො (ජනපදෙ)

(= සමෘද්ධ වූ සස්‍යයෝ යම් තැනක ද, එය සම්පන්නසස්ස නම් වේ. ජනපදයයි.)

මොවුහු සත්තමී අර්ථයෙහි වෙති.

43. මේ සමාසයේදී ඇතැම් තැනක මුලින් සිටින සහ ශබ්දයට සකාරාදේශ වේ. සමාසපදයාගේ අන්තයෙහි කකාරයක් ආගම වේ. සහ හෙතුනා යො වත්තතෙ, සො = සහෙතුකො, සහෙතු.

(= හේතුව සමග යමක් පවත්නේ ද, එය සහේතුක හෝ සහේතු නම් වේ. හේතු සහිත සිත් ආදියයි.)

සහ පරිවාරෙන යො වත්තතෙ, සො = සපරිවාරො (= පිරිවර සමග යමෙක් පවත්නේ ද, හෙතෙම සපරිවාර නම් වේ. පිරිවර ඇති රජදරු ආදීහුයි.)

මොවුහු ප්‍රථමාර්ථයෙහි වෙති.

6. අව්‍යයීභාව සමාසය

44. අව්‍යයන් හෙවත් උපසර්ග - නිපාතපදයන් මුලින් සිට පරවූ පදයන් හා සමාසවෙන විට අව්‍යයීභාව සමාස නම් වේ. මේ සමාසයෙහි පූර්ව වූ උපසර්ග නිපාතයන්ගේ අර්ථය ප්‍රධාන වේ. අව්‍යයීභාව සමාස පදයෝ නපුංසක ලිංගයෙහි වෙති. අකාරාන්ත වූ අව්‍යයීභාව සමාසය ශබ්දයන් කෙරෙන් පර වූ හැම විභක්තීන්ට ම ඇතැම් විට අං ආදේශ වේ; ඉකාරාන්තාදී ශබ්දයන් කෙරෙන් සියලු විභක්තීන්ට ලොප් වේ.

නගරස්ස + උප = උපනගරං (= නගරයාගේ සමීපය හෙවත් උපනගරය.)

දරථානං + නි = නිද්දරථං (= දුහයන් නැති බව). න.

රථස්ස + අනු = අනුරථං (= රථයට පසුව, රථය අනුව). න.

අද්ධමාසං + අනු = අඬද්ධමාසං (= අඩමසක් පාසා). න.

පබ්බතස්ස + තිරො = තිරොපබ්බතං (= පර්වතයට එහා). න.

නගරස්ස + අන්තො = අන්තොනගරං (= නුවර ඇතුළ). න.

පාසාදස්ස + උපරි = උපරිපාසාදං (= ප්‍රසාදයාගේ මස්තකය). න.

මඤ්චස්ස = හෙට්ඨා = හෙට්ඨාමඤ්චං (= ඇඳයට). න.

භත්තස්ස + පච්ඡා = පච්ඡාභත්තං (= පසුබත් කාලය, සවස් වරුව).න.

ගඞ්ගාය + උප = උපගඞ්ගං (= ගඟට සමීප පෙදෙස). න.

වුද්ධානං + (පටිපාටි) යථා = යථාවුද්ධං (=වෘද්ධ පිළිවෙළින්). න.

කමො + යථා = යථාක්කමං (= පිළිවෙළින් හෙවත් ක්‍රමය නොයික්මවා). න.

ජීවස්ස + (පරිච්ඡෙදෙ) යාව = යාවජීවං (ජීවිතයාගේ පරිච්ඡේදය යම් පමණ ද එය යාවජීව නම් වේ. 'ජීවිතාන්තය දක්වා' යන අර්ථයි).

නගරතො + බහි = බහිනගරං (= නුවරින් පිට හෙවත් පිටිනුවර). න.

සත්ති + යථා = යථාසත්ති (= ශක්ති පරිද්දෙන්, ශක්තිය නොයික්මවා). න.

වාතස්ස + පටි = පටිවාතං (= විරුද්ධ වාතය, උඩුසුළඟ). න.

අතොථා + යාව = යාවදත්ථං (= ඕනෑ පමණ). න.

කුඩ්ඩස්ස + තිරො = තිරොකුඩ්ඩං (= බිත්තියෙන් එහා). න.

වාතස්ස + අනු = අනුවාතං (= අනුවාතය, යටිසුළඟ). න.

භත්තස්ස + පුරෙ = පුරෙභත්තං (= පෙරබත, උදය කාලය). න.

පුබ්බස්ස + අනු = අනුපුබ්බං (= පිළිවෙළ). න.

වස්සස්ස + අන්තො = අන්තොවස්සං (= ඇතුළු වස, වර්ෂා කාලය තුළ). න.

(මෙහි 'යථාසත්ති' යන්න ඉකාරාන්ත බැවින් විභක්තියට ආදේශ නොවී ලෝපය වූ බව සැලකිය යුතු.

අභ්‍යාසය 9

සිංහලට නඟා සමාස පද දැක්විය යුතුඃ

1. තස්මිං සමයෙ සත්ථා අනුපුබ්බෙනාගන්ත්වා අනාථපිණ්ඩිකෙන මහාසෙට්ඨිනා කාරිතෙ ජෙතවනමහාවිහාරෙ විහරති මහාජනං සග්ගමග්ගෙ ච මොක්ඛමග්ගෙ ච පතිට්ඨාපයමානො.

(ධම්මපදට්ඨ කථා.)

2. "තදා සාවත්ථියං සත්තමනුස්සකොටියො වසන්ති, තෙසු අරියසාවකානං ද්වෙ යෙව කිච්චානි අහෙසුං පුරෙභත්තං දානං දෙන්ති, පච්ඡාභත්තං ගන්ධමාලාදිහත්ථා වත්ථභෙසජ්ජපානකාදිං ගාහාපෙත්වා ධම්මසවණත්ථාය ගච්ඡන්ති." (එම)

3. සුරනරමහිතො සත්ථා සහස්සභික්ඛුපරිවාරො ආකිණ්ණ මනුස්සං රාජගහං පාවිසි. 4. ආරුළ්හවාණිජා මහානාවා නිරුපද්ද වෙන මහාසමුද්දං තරිත්වා සත්තාහෙන ලඞ්කාදීපං සම්පාපුණි.

4. සපරිවාරො රාජා අඩ්ඩමාසමන්තොපුරා නික්ඛමිත්වා නානා තරුසණ්ඩමණ්ඩිතං දිජගණකුජිතං උය්‍යානං ගච්ඡති.

5. "සීලගන්ධසමො ගන්ධො කුතො නාම භවිස්සති,
යො සමං අනුවාතෙ ච පටිවාතෙ ච වායති?" (විසුද්ධිමග්ග.)

6. බහවො බ්‍රාහ්මණා බහිනගරතො අන්තොනගරං පවිසිත්වා යාවදත්ථම්භුඤ්ජිත්වා සකසකගෙහානි ආගමංසු. 7. දුස්සීලා යාව ජීවමකුසලානි කත්වා පරම්මරණා නිරයෙ උප්පජ්ජිත්වා අතිකටුක දුක්ඛං විඳන්ති. 8. ඡළභිඤ්ඤප්පත්තා පඤ්චසතඛීණාසවා අන්තො වස්සං රාජගහසමීපෙ වසන්තා ධම්මවිනයසඞ්ගීතිං අකංසු. 9. සම්බුද්ධපරිනිබ්බාණතො වස්සසතච්චයෙන වෙසාලිවාසිනො වජ්ජිපුත්තකා භික්ඛූ සාසනෙ අබ්බුදං උප්පාදෙසුං.

මෙහි අමුතු වචන

අතිකටුක = ඉතා දරුණු. 3.
අනුපුබ්බෙන = පිළිවෙළින්. ක්‍රි.වි.
අබ්බුද = අර්බුදය, භේදය. පු.
ඡළභිඤ්ඤප්පත්ත = අභිඥාසය ලැබූ. 3.
අරියසාවක = ආර්‍යශ්‍රාවකයා. පු.
කිච්ච = වැඩේ, කෘත්‍යය. න.
ගාහාපෙත්වා = ගෙන්වා ගෙන. පූ. ක්‍රි.
මණ්ඩිත = සරසන ලද. 3.
මහිත = පිදූ; පුදන ලද. 3.

තරුසණ්ඩ = ගස් සමූහය. පු.
දිජගණකූජිත = පක්ෂි සමූහයා විසින් නාදිත වූ. 3.
ධම්මසවණ = බණඇසීම. න.
නිරුපද්දව = උපද්‍රව නැති. 3.
පතිට්ඨාපයමාන = පිහිටුවමින්. 3.
පරං = මත්තෙහි; පසුව. ක්‍රි. වි.
පරනිබ්බාණ = පිරිනිවීම. න.
පරිවුත = පිරිවරන ලද. 3.
පානකාදි = බොන දේ ආදිය. පු.
වජ්ජිපුත්තක = වජ්ජීන්ගේ පුත්‍ර වූ. 3.
වායති = හමයි.
විඳති = විඳියි.
සග්ගමග්ග = ස්වර්ගයට මග. පු.
සත්තමනුස්සකොටියො = සත් කෝටියක් මිනිස්සු
සම = සම (මට්ටම්) වූ. 3.
සමය = කාලය; ආගම. පු.
සීලගන්ධ = ශීල නමැති සුවඳ. පු.

පාලියට නඟා යෝග්‍ය තැන්හි සමාස කටයුතු :

1. පිරිවර සහිත දෙවනපෑතිස් රජතෙම මහාමහිඳු තෙරුන් වහන්සේගේ ධර්මය අසා බුද්ධශ්‍රාවකයෙක් විය. 2. සැමදාම පෙර බත් කාලයෙහි පන්සියයක් භික්ෂූහු අනේපිඬු මහසිටුහුගේ ගෙට වැඩියාහ. 3. රතෙම පිරිවර සහිතව උයනින් නික්ම ඇතුළු නුවරට පිවිස බණ ඇසීමට ගියේ ය. 4. වෙළඳුන්නැගි නැව සමුද්‍රය තරණය කොට තුන් මසකින් චීන රටට පැමිණියේ ය. 5. පිළිවෙළින් වඩින්නා වූ සර්වඥයන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයට පැමිණ ක්ෂත්‍රිය - බ්‍රාහ්මණාදීන්ට ධර්ම දේශනා කළසේක. 6. බිම්බිසාර මහ රජතෙම ඒ ධර්මය අසා එක් ලක්ෂ විසිදහසක් මිනිසුන් සමග සෝවාන් විය. 7. ආර්‍යශ්‍රාවකයෝ පෙරබත් කාලයෙහි දන් දී පසු බත් කාලයෙහි බණ අසත්. 8. මිහිඳු මහ තෙරුන් වහන්සේ ජීවිතාන්තය දක්වා සමෘද්ධසස්‍ය ඇති ගැවසීගත් මිනිසුන් ඇති ලඞ්කාද්වීපයෙහි විසූසේක. 9. ඇතුළුවස තුන්මස මුළුල්ලේ සර්වඥතෙම දෙව්ලොව වසමින් දෙවියනට දහම් දෙසී ය. 10. මල් සුවඳ යටිසුළඟට මිස උඩුසුළඟට කිසි කලෙකත් නොයයි.

මෙහි අමුතු වචන

චීනරට = චීනරට්ඨ. න.
දෙව්ලොව = දෙවලොව. පු.
මල් සුවඳ = පුප්ඵගන්ධ. පු.
සෝවාන් = සොතාපන්න. 3.

මිශ්‍ර සමාස පද

47. මෙහි දැක්වූ සමාසයන් මිශ්‍ර වීමෙන් ද සමාස පද පැදෙති. 7 වෙනි අභ්‍යාසයේ 1 වැනි වාක්‍යයෙහි "චන්‍දසුරියසහස්සානි" යන්න මිශ්‍ර සමාස පදයකි. මෙහි "චන්‍දෙ ච සුරියෙ ච = චන්‍දසුරියා" යි පළමු කොට ද්වන්‍ද සමාසය වේ. ඉක්බිති 'චන්‍දසුරියානං සහස්සානි = චන්‍දසුරියසහස්සානි" යි තප්පුරිස සමාසය වේ.

(2) ඒ අභ්‍යාසයෙහි ම 3 වෙනි වාක්‍යයෙහි සට්ඨිසහස්ස මත්තෙ යන්න ද මිශ්‍ර සමාස පදයකි. එහි "සහස්සානං සට්ඨි = සට්ඨිසහස්සං" යි පළමු කොට තප්පුරිස සමාසය වේ. ඉක්බිති "සට්ඨිසහස්සං මත්තා යෙසං තෙ = සට්ඨිපහස්සමත්තා" යි බහුබ්බීහි සමාසය වේ. සැටදහස ප්‍රමාණය වූයේ යම් කෙනකුන්ට ද ඔව්හු "සට්ඨිසහස්සමත්ත" නම් වෙති. (මත්ත = ප්‍රමාණය)

(3) එහි ම 8 වැනි වාක්‍යයෙහි රත්තචන්‍දනමණ්ඩපං යන පදයෙහි 'රත්තං ච තං චන්‍දනං චාති = රත්තචන්‍දනං" යි පළමු කොට කම්මධාරය සමාසය වේ. ඉන්පසු "රත්තචන්‍දනස්ස මණ්ඩපො = රත්තචන්‍දනමණ්ඩපො" යි තප්පුරිස සමාසය වේ. (රත්සඳුන් පිළිබඳ හෙවත් එයින් කළ මණ්ඩපයයි.) 11 වෙනි වාක්‍යයෙහි අස්සත්‍ථරුක්ඛමූලෙ යන්න ද මීට සමාන පදයකි.

(4) 9 වැනි අභ්‍යාසයේ 2 වැනි වාක්‍යයෙහි ගන්‍ධමාලාදි හත්‍ථා යන්නෙහි පළමු කොට "ගන්‍ධා ච මාලා ච = ගන්‍ධමාලා" යි ද්වන්‍දය වේ. ඉන්පසු "ගන්‍ධමාලා ආදි යෙසං, තෙ = ගන්‍ධමාලාදයො (සුවඳ මල් ආදිය වූයේ යම් ද්‍රව්‍යයන්ට ද ඒ ද්‍රව්‍යයෝ 'ගන්‍ධමාලාදි නම් වෙති) යි බහුබ්බීහි සමාසය වේ. නැවත "ගන්‍ධමාලාදයො හත්‍ථෙසු යෙසං, තෙ = ගන්‍ධමාලාදිහත්‍ථා" (සුවඳ මල් ආදීහු යම් කෙනකුන්ගේ අත්වල තිබෙත් ද) ඔවුහු 'ගන්‍ධමාලාදිහත්‍ථ' නම් වෙති'යි බහුබ්බීහි සමාසය වේ.

(5) ඒ වාක්‍යයෙහි ම සත්තමනුස්සකොටියො යන්නෙහි "මනුස්සානං කොටි = මනුස්සකොටි" යි ඡට්ඨිතප්පුරිස වේ. ඉන්පසු "සත්ත මනුස්සකොටියො = සත්තමනුස්සකොටියො" යි දිගු සමාසය වේ. මෙහි සමාස බලයෙන් සත්ත-ශබ්දය මුලට වැටුණ නමුත් 'සත්කෙළක් මනුෂ්‍යයෝ' යි කෝටි - ශබ්දය හා සම්බන්ධ කොට ම අර්‍ථ ගතයුතුයි. තවත් මෙවැනි පද ඇත්තාහ.

(6) ඒ වාක්‍යයෙහි ම වත්‍ථුභෙසජ්ජපානකාදිං යන්නෙහි 'වත්‍ථානි ච භෙසජ්ජානි ච පානකානි ච = වත්‍ථුභෙසජ්ජපානකානි' යි ද්වන්දය වේ. ඉන්පසු 'වත්‍ථුභෙසජ්ජපානකානි ආදීනි යස්ස, සො = වත්‍ථුභෙසජ්ජපානකාදි" යි බහුබ්බීහිය වේ. වස්ත්‍ර බෙහෙත් - පානයන් ආදි කොට ඇති ද්‍රව්‍ය සමූහය කියවේ.

(7) 9 වැනි අභ්‍යාසයේ 3 වැනි වාක්‍යයෙහි සුරනරමහිතො "යන්නෙහි සුරා ච නරා ච = සුරනරා" යි ද්වන්දය ද ඉන්පසු 'සුරනරෙහි මහිතො = සුරනරමහිතො" යි තප්පුරිසය ද වේ.

(8) ඒ වාක්‍යයෙහි ම සහස්සභික්ඛුපරිවාරො යන්නෙහි 'සහස්සං භික්ඛු = සහස්සභික්ඛු' යි දිගු සමාසය ද ඉන්පසු 'සහස්ස භික්ඛු පරිවාරො යස්ස, සො = සහස්සභික්ඛුපරිවාරො'යි බහුබ්බීහිය ද වේ. දහසක් භික්ෂූන් පිරිවර ඇත්තා කියවේ.

(9) 9 වැනි අභ්‍යාසයේ 5 වැනි වාක්‍යයෙහි 'නානා තරු සණ්ඩමණ්ඩිතං යන්නෙහි 'නානා ච තෙ තරවො චාති = නානාතරවො' යි කම්මධාරය ද, නානාතරූනං සණ්ඩො = නානා තරුසණ්ඩො' යි තප්පුරිසය ද, නැවත නානාතරූනං සණ්ඩෙහි මණ්ඩිතං = නානාතරුසණ්ඩමණ්ඩිතං' යි තප්පුරිසය ද වෙති.

සංලක්ෂ්‍යය :

මෙසේ නානා සමාසයන් මිශ්‍ර වී සෑදී තිබෙන සමාස පදයන් ඇදින ඒවා ඒ ඒ සමාසයනට ගැළපෙන සේ සාදගත යුතුයි. එවැනි පදවලදී අවසානයෙහි කෙරෙන සමාසය ප්‍රධාන කොට සැලකිය යුතු, ඇතුළතෙහි ඇති සමාසයන් අවසාන සමාසයෙහි ගර්භවෙති. මෙහි (9) වැනි අඞ්කයෙහි දැක්වූ සමාස පදයට කම්මධාරය ගර්භකොට ඇති තප්පුරිස සමාසයයි කියනු ලැබේ.

අභ්‍යාසය 10

මිශ්‍ර සමාසයන්ට උදාහරණ

1. සාඛන්තරෙහි චෙව පුප්ඵන්තරෙහි ච පඤ්චවණ්ණභමරගණා නානාප්පකාරා ච සකුණසංඝා මධුරස්සරෙන විකූජන්තා විචරන්ති." (ජාතකනිදාන).

2. "රාහුලමාතා සුමනමල්ලිකාදීනං පුප්ඵානං අම්මණමත්තෙන අභිප්පකිණ්ණසයනෙ පුත්තස්ස මත්ථකෙ හත්ථං ඨපෙත්වා නිද්දයති." (එම)

3. "සො 'සාධු දෙවා'ති අස්සභණ්ඩකං ගහෙත්වා අස්සසාලං ගන්ත්වා ගන්ධතෙලප්පදීපෙසු ජලන්තෙසු සුමනපට්ටවිතානස්ස හෙට්ඨා රමණීයෙ භූමිභාගෙ ඨිතං කත්ථකං අස්සරාජානං..... කප්පෙසි." (එම)

4. "තතො පට්ඨාය මාලා - ගන්ධ - විලෙපන - කප්පූර - කටු කප්ඵලාදීනි ගහෙත්වා මහාජනස්ස සත්ථුධම්මදෙසනං සුත්වා නගරං පවිසනකාලෙ ජෙතවනාභිමුඛී ගච්ඡති" (සුන්දරීවත්ථු ධ.අ.)

5. භගවතො කිර භික්ඛුසඞ්ඝස්ස ච පඤ්චන්නං මහානදීනං මහොඝසදිසෙ ලාභසක්කාරෙ උප්පන්නෙ හතලාභසක්කාරා අඤ්ඤතිත්ථියා සුරියුග්ගමනකාලෙ බජ්ඣොපනකසදිසා හුත්වා..... මන්තයිංසු." (එම)

6. "අහං හි තෙන සද්ධිං එකගන්ධකුටියං වසාමීති වත්වා අඤ්ඤතරස්මිං තිත්ථියාරාමෙ වසිත්වා පාතොව ජෙතවනමග්ගං ඔතරිත්වා නගරාභිමුඛී ගච්ඡති." (එම)

7. "රාජා යොජනන්තරෙ ජණ්ණුමත්තෙන ඔධිනා පඤ්චවණ්ණානි පුප්ඵානි ඔකිරාපෙත්වා ධජපතාකකදලිආදීනි උස්සාපෙත්වා.....පූජං කරොන්තො.....ගංගාතීරං පාපෙත්වා..... වෙසාලිකානං සාසනං පහිණි." (ගඞ්ගාරොහණ වත්ථු ධ.අ.)

8. "මහාජනො නගරමජ්ඣෙ සත්ථාගාරං සබ්බගන්ධෙහි උපලිම්පෙත්වා උපරි සුවණ්ණතාරකාදිවිචිත්තං විතානං බන්ධිත්වා බුද්ධාසනං පඤ්ඤපෙත්වා සත්ථාරං ආරොචෙසි." (එම)

9. "තෙ සුවණ්ණ-රජත-මණිමයා නාවායො මාපෙත්වා සුවණ්ණ-රජත-මණිමයෙ පල්ලඞ්කෙ පඤ්ඤපෙත්වා පඤ්චවණ්ණ - පදුමසඤ්ඡන්නං උදකං කරිත්වා..... අත්තනො අත්තනො නාවාභිරුහනත්ථාය සත්ථාරං යාචිංසු." (එම)

10. "අථස්ස පරිවාරකපුරිසා නානාවණ්ණානි දුස්සානි නානාප්පකාරා

ආභරණවිකතියෝ මාලාගන්ධවිලෙපනානි ච ආදාය සමන්තා පරිවාරෙත්වා අට්ඨංසු” (ජාතක නිදාන)

මෙහි අමුතු වචන :-

අඤ්ඤතිත්ථිය = අන්‍යදෘෂ්ටික (ශ්‍රමණයා.) පු.
අභිප්පකිණ්ණ = විසුරුවන ලද. 3.
අභිමුඛී = අභිමුඛවූවා. ඉ.
අභිරුහනත්ථාය = නැගීම පිණිස.
අම්මණමත්ත = අමුණක් පමණ. 3.
අස්සභණ්ඩක = අශ්වයාගේ පැළඳුම්. න. අස්ගොව්වා. පු.
අස්සසාලා = අස්හල. ඉ.
ආභරණවිකති = ආභරණ විශේෂය ඉ.
ආරොවෙති = දන්වයි; සැල කරයි
උපලිම්පෙත්වා = තවරා. පූ. ක්‍රි.
උස්සාපෙත්වා = ඔසවා. පූ. ක්‍රි.
ඔකිරාපෙත්වා = විසුරුවා. පූ. ක්‍රි.
ඔධි = සීමාව; ප්‍රමාණය. පු.
කටුකප්ඵල = එන්සාල් - සාදික්කා ආදිය; කුළුබඩු. න.
කප්පූර = කපුරු. පු. න.
කප්පෙති = අන්දවයි; සරසයි
බජ්ජොපනක = කණාමැදිරියා. පු.
ගන්ධකුටි = ගඳකිළිය; බුදුන් විසූ ගෙය ඉ.
ඡණ්ණුමත්ත = දණක් පමණ. 3.
ජලන්ත = දැල්වෙන. 3.
තතො පට්ඨාය = එතැන් පටන්. නි.
තිත්ථියාරාම = තීර්ථකාරාමය. පු.
නානාවණ්ණ = නොයෙක් පැහැති. 3.
නානාප්පකාර = නොයෙක් ආකාර ඇති. 3.
පඤ්චවණ්ණ = වණ් පසක් ඇති. 3.
පතාකා = කොඩිය. ඉ.
පරිවාරකපුරිසං = සේවකයා. පු.
පල්ලඞ්ක = පලඟ; ඇඳිනැති ආසනය. පු.
පවිසනකාල = ඇතුළු වන කාලය. පු.
පුප්ඵන්තර = මල් අතර. න.
භමරගණ = බඹර සමූහයා. පු.
මත්ථක = මුදුන. පු.
මත්ථකෙ = මත්තෙහි
මධුරසර = මිහිරි හඬ. පු.
මන්තයති = සාකච්ඡා කරයි.
මල්ලිකා = සීනිද්ද. ඉ.
මහොඝසදිස = සැඩ පහරක් බඳු. 3.
මාපෙත්වා = මවා. පූ. ක්‍රි.

යොජනන්තර = යොදුනක් අතර න.
රමනීය = සිත් අලවන; රම්‍ය. 3.
ලාභසක්කාර = ලාභය හා ගෞරවය. පු.
විකූජන්ත = නොයෙක් නාද කරන. ඉ.
විලෙපන = ඇඟ ගල්වන සුවඳ විලවුන්. න.
වෙසාලික = විසාලා නුවර වැසි. 3.
සකුණසංඝ = පක්ෂි සමූහය. පු.
සඤ්ඡන්න = වැසුණු. 3.
සත්‍ථාගාර = නගර ශාලාව. ඉ.
සාඛන්තර = අතු අතර. න.
සුමනපට්ටවිතාන = සමන් මල් පටින් කළ වියන. න.
සුරියුග්ගමන = හිරුනැඟීම. න.
සුවණ්ණතාරකාදිවිචිත්ත = රන් තරු ආදියෙන් විසිතුරු වූ. 3.
හත = නසන ලද. 3.

සමාස යොදමින් පාලියට නැඟිය යුතු.

1. බෝසත්තෙම අතට පත් සක්විතිරජ සැප කෙළ පිඬක් නේ ඉවතලා සිය නුවරින් නික්ම ගියේ ය. 2. මහා බලැති හෙතෙමේ අටළොස්රියන් උසැති නගරප්‍රාකාරයට* උඩින් පැන යන්ට සිතුවේ ය. 3. හෙතෙම සුදු වූ අධික ජවසම්පන්නවූ කන්ථක අසුපිට† නැඟී එක් රැයකින් තිස්යොදුන් මග ගෙවා අනෝමා ගංතෙරට පැමිණියේ ය. 4. කාශ්‍යප බුඬ කාලයේදී ජෝතිපාලමාණවක නමින් සිටි බෝසතුගේ මිත්‍රයා වූ ඝටීකාර බමුණා බඹලොව ඉපද සිටියේ එතුමාට තුන් සිවුරු ගෙනවුත් දුන්නේ ය. 5. සත් දිනක් අනුපිය අඹ වනයෙහි විසූ එතුමා පයින් තිස්යොදුනක් ගොස් රජගහනුවරට ඇතුළු විය. 6. එහි හැසිරෙන ඒ පැවිද්ද දැක නගරවැසියෝ කලබලව තමන්ගේ රජුට ඒ පුවත දැන්වූහ. 7. මගධාධිපති බිම්බිසාර මහරජතුමා එතුමන් වෙත පැමිණ තමා හා රාජ්‍ය සම්පත් අනුභව කෙරේවායි ඉල්විය. 8. එතුමා නේරඤ්ජරා නදී තීරයෙහි රිදීතහඩුවක් වැනි වැලිතලාවක් ඇති උරුවේලා පෙදෙසෙහි සිත්කලු වනරොදක සය වසක් විසී ය. 9. පෙර කල අනුරාධපුරය ධ්වජ - පතාකවලින් ද නානාවණ්ණ වස්ත්‍රයෙන් ද සරසා වීථීන්හි පඤ්චවර්ණ පුෂ්පයන් විසුරුවා අවුරුදු පතා දළඳ පූජාව පවත්වන ලදි. 10. ඒ උත්සවයේ දී නානාලඞ්කාරයෙන් සැරසූ ඇත්රජකු විසින් සත්රුවන් කරඬුවක තැබූ දළදුව උසුළාගෙන යන ලදි.

---

* 'උඩින් පැන' යන්නට 'උල්ලඞ්ඝෙත්වා'යි යොදනවිට පාකාර-ශබ්දයේ කම් විභක්තිය යෙදිය යුතු.

† මේහිත් අස්ස - ශබ්දයේ කම් විභක්තිය යෙදීම ප්‍රමාණයි.

11. ඒ උත්සවය බැලීම සඳහා නානාභරණවිභූෂිත වූ නානාවණ්ණ වස්ත්‍ර ඇඳගත් බාල - මහලු - තරුණ ස්ත්‍රී පුරුෂයෝ ගම් නියම්ගම් නුවරවලින් පැමිණියහ.

12. ඒ දන්තධාතුව ඇතුළුනුවර පිහිටි දළදා මන්දිරයෙන් අභයගිරි මහා විහාරයට ගෙන ගොස් එහි මහාමන්දිරයක තබා අනූදිනක් මුළුල්ලේ† සුවඳ දුම් - මල් - පහන් ආදියෙන් පිදූහ.

මෙහි අමුතු වචන :-

අතට පත් = හත්ථප්පත්ත. 3.
අනුභව කෙරේවා = අනුභවතු; විඳතු.
ඇඳගත් = නිවත්ථ. 3.
ඉවත ලා. ඡඩ්ඩෙත්වා. පූ. ක්‍රි.
උඩින් පැන = උල්ලඞ්ඝෙත්වා. පූ. ක්‍රි.
උත්සවය = උස්සව; ඡණ. පු.
උසැති = උබ්බෙධ. 3.
කරඬුව = කරණ්ඩ. පු.
කලබලව = සංඛුභිත්වා. පූ.ක්‍රි.
කෙළපිඬ = බෙලපිණ්ඩ. පු.
ගෙවා (ඉකුත් කොට) = අතික්කමිත්වා. පූ. ක්‍රි.
තුන්සිවුරු = තිචීවර. න.
දළදුව = දඨාධාතු. ඉ.
දැන්විය = ආරොචෙසි.
ධිවජය = ධජ. පු.
පෙදෙස = පදෙස. පු.
බඹලොව = බ්‍රහ්මලොක. පු.
රජසැප = රජ්ජසුඛ. න.
රාජ්‍ය සම්පත් = රජ්ජසුඛ. න.
රිදී තහඩුව = රජතපට්ට. න. පු.
වනරොද = වනරාජි. ඉ.
සත්රුවන් = සත්රතනමය. 3.
සිත්කලු = රමණීය. 3.
සුවඳදුම් = ගන්ධධූප. පු.

තද්ධිත පද

48. නාමයකින් පරව යම්කිසි අර්ථ විශේෂයක් ප්‍රකාශ කිරීම පිණිස ප්‍රත්‍යයක් යොදූ සාදන පදය තද්ධිත නම් වේ.

ප්‍රත්‍යය නම් යම්කිසි විශේෂාර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා නාමයකින් හෝ ධාතුවකින් පසුව යොදනු ලබන කොටසකි.

† අමුතු වචනයක් නොයොදූ කම් විභක්තිය යෙදීමෙන් "මුළුල්ලේ" යන අර්ථය ලැබේ. මේ අර්ථය යෙදෙන තැනට "අත්‍යන්තසංයොග" යයි කියත්.

1. සාමඤ්ඤ තද්ධිත
2. භාව තද්ධිත
3. අව්‍ය තද්ධිත
යයි තද්ධිතය තුන් කොටසකට බෙදන ලදි. එයින්

1. සාමඤ්ඤ තද්ධිතය

1. අපච්චත්ථ
2. අනෙකත්ථ
3. අත්ථත්ථ
4. සංඛ්‍යා - යන සිවු කොටසකට බෙදන ලදි.

49. ණ - ණි - ණෙය්‍ය ආදී ණ් - කාරයක් සහිත ප්‍රත්‍යයක් කළ කල්හි මුලින් සිටි නාම පදයාගේ මුල් ස්වරයට වෘද්ධි වේ. වෘද්ධිය නම් අ-කාරයට ආ-කාරයත්, ඉ-ඊ-දෙදෙනට එ-කාරයත්, උ ඌ- දෙදෙනට ඔ - කාරයත් වීමයි. මුල් ස්වරයට වෘද්ධි වූ පසු ප්‍රත්‍යයෙහි වූ ණ්-කාරය ද ලොප් කරනු ලැබේ. බැඳි අකුරු පරව සිටි කල්හි මුල් වෘද්ධි නොවේ.

1. සාමඤ්ඤ තද්ධිතයෙහි
(1) අපච්චත්ථ හෙවත් පරමපරාථීය

50. ඔහුගේ පරම්පරාවෙහි වූ යන අර්ථයෙහි ඇතැම් තැනක නාමයෙන් පරව ණ - ප්‍රත්‍යය වේ.

වසිට්ඨ (සෘෂි) ගේ පරම්පරාවෙහි වූ පුරුෂයකු කියනු කැමති කල්හි වසිට්ඨ - ශබ්දයෙන් පරව ණ - ප්‍රත්‍යය වේ. "වසිට්ඨ + ණ" යි සිටි විට ණ - සහිත ප්‍රත්‍යයක් පර බැවින් වසිට්ඨ - ශබ්දයේ මුල් ස්වරය වූ අ- කාරයට වෘද්ධිය වූ ආකාරය වේ. ණ් - කාරය ලොප් කළ විට "වාසිට්ඨ + අ" යි සිටී. පූර්‍ව ස්වරලෝපසන්ධිය කළ විට වාසිට්ඨ යි සිටී. පුල්ලිඞ්ගයෙහි පාඨමා එක වචනය යෙදූ විට වාසිට්ඨො වේ. "වශිෂ්ටගේ පරම්පරාවෙහි උපන් (පුරුෂයා)" යන අර්ථ ඇත්තේයි.

ඒ පරම්පරාවෙහි ස්ත්‍රියක් කිය යුතු වී නම් ස්ත්‍රීලිඞ්ගික ඊ - ප්‍රත්‍යය යොදා වාසිට්ඨාවී යැයි සැදිය යුතු. ඒ පරම්පරාවෙහි වූ නපුංසකයකු හෝ පවුලක් කිය යුතු වී නම් "වාසිට්ඨ" ශබ්දයට නපුංසක ලිඞ්ගික විභක්ති රූප යෙදිය යුතු. වාසෙට්ඨ යි එකාරයෙන් යුක්තව ද මෙය දක්නා ලැබේ.

භාරද්වාජ + ණ = භාරද්වාජ (= භාරද්වාජගේ පරම්පරාවෙහි වූ.)
ගොතම + ණ = ගොතම (ගෝතමගේ පරම්පරාවෙහි වූ.)
වාසුදෙව + ණ = වාසුදෙව (= වාසුදේවගේ පරම්පරාවෙහි වූ.)
බලදෙව + ණ = බාලදෙව (බලදේවගේ පරම්පරාවෙහි වූ.)

මේ ශබ්දයෝ වාසිට්ඨ - ශබ්දය හා සමාන වෙති. මුල් පද දෙකෙහි ස්වරයන් දීඝී බැවින් වෘධියක් ඕනෑ නොවේ.

51. වච්ඡ - කච්ච - ආදි ශබ්දයන් කෙරෙන් පුත්‍රාර්ථයෙහි ණායන - ණාන - යන ප්‍රත්‍යයෝ වෙත්. (ණ්-කාරය මුල් ස්වරයට වෘධිකිරීම සඳහා යයි ද, වච්ඡ - කච්ච යන දෙතැන්හි ම බැඳි අකුරු පරව තිබෙන බැවින් වෘධි නොවේ යයි ද දතයුතු.)

වච්ඡ + ණායන = වච්ඡායන (වච්ඡගේ පුත්‍රයා)
වච්ඡ + ණාන = වච්ඡාන " "
කච්ච + ණායන = කච්චායන (කච්චගේ පුත්‍රයා)
කච්ච + ණාන = කච්චාන (කච්චගේ පුත්‍රයා)
මොග්ගල්ල + ණායන = මොග්ගල්ලායන (=මොග්ගල්ලගේ පුත්‍රයා.)
මොග්ගල්ල + ණාන = මොග්ගල්ලාන (= මොග්ගල්ලගේ පුත්‍රයා.)

52. කත්තික - විනතා - ආදි ස්ත්‍රී ලිඞ්ගික ශබ්දයන් කෙරෙන් පුත්‍රාර්ථයෙහි ණෙය්‍ය ප්‍රත්‍යය වේ.

කත්තිකා + ණෙය්‍ය = කත්තිකෙය්‍ය (= කත්තිකාවගේ පුත්‍රයා)
විනතා + ණෙය්‍ය = වෙනතෙය්‍ය (=විනතාවගේ පුත්‍රයා, ගුරුළා.)
භගිනී + ණෙය්‍ය = භාගිනෙය්‍ය (= සොහොයුරියගේ පුත්‍රයා, බෑනා.)
රොහිනී + ණෙය්‍ය = රොහිණෙය්‍ය (= රොහිණියගේ පුත්‍රයා)

අන්තිම දෙපදයෙහි ඉතිරි වී තිබෙන න - ණ දෙදෙන ණෙය්‍ය ප්‍රත්‍යයේ ණ කාරය නොවන බව සැලකිය යුතු.

53. උපගු - මනු ආදි උකාරාන්ත ශබ්දයන් කෙරෙන් පුත්‍රාර්ථයෙහි ණව-ප්‍රත්‍යය වේ.

උපගු + ණව = ඔපගව (= උපගුගේ පුත්‍රයා)
මනු + ණව = මාණව (= මනුගේ පුත්‍රයා = මනුෂ්‍යයායි.)
පණ්ඩු + ණව = පණ්ඩව (= පණ්ඩු රජුගේ පුත්‍රයා.)

54. විධවා ආදි ශබ්දයන් කෙරෙන් පුත්‍රාර්ථයෙහි ණෙර ප්‍රත්‍යය වේ.

විධවා + ණෙර = වෙධවෙර (= වැන්දඹුවගේ පුත්‍රයා)
සමණ + ණෙර = සාමණෙර (= ශ්‍රමණයාගේ පුත්‍රස්ථානයෙහි සිටි සාමණෙර තෙමේ.)
(1) සාමඤ්ඤ (2) අනෙකත්‍ථ තද්ධිතය.

55. එයින් මිශ්‍ර වූයේ ය, එහි යෙදුනේ ය, එයින් ජීවත් වන්නේ ය, එයින් යන්නේ ය, එයින් උසුළන්නේ ය, එය ඔහුගේ ශිල්ප ය, එය හා සම්බන්ධ ය. එයින් ගනුදෙනු කරන්නේ ය, එය උගනී, එහි උපනේ ය, එතැනට අයිතිය යනාදි අර්ථයන්හි ණික - ප්‍රත්‍යය වේ.

A. එයින් මිශ්‍ර වූයේ :-

සත + ණික = සාතික (= ගිතෙලින් මිශ්‍ර වූ හෙවත් ගිතෙලින් හැනූ බත් ආදිය.)
ලොණ + ණික = ලොණික = (ලුණින් මිශ්‍ර වූ)
ණ් - කාරලෝපය හා වෘධිය පෙර මෙනි.

B. එහි යෙදුණේ :-

ද්වාර+ණික=දෙවාරික (=දොරටුවෙහි යෙදුණේ; දොරටුපාලයායි.)

මෙහි ද්වා - යන්නේ වකාරයට මුලින් ඔකාරයක් ආගම වේ. එවිට දෙ - කියා සිටී.

භාණ්ඩාගාර+ණික=භාණ්ඩාගාරික(=භාණ්ඩාගාරයෙහි නියුක්ත වූ.)
සකට + ණික = සාකටික (= ගැලෙහි නියුක්ත වූයේ.)

නාවා + ණික = නාවික (= නැවෙහි නියුක්ත වූයේ.)

C. එයින් ජීවත් වෙයි.

බලිස + ණික = බාලිසික (= බිලිබාන්නා)
වෙතන + ණික = වෙතනික (= වැටුප් ලබා ජීවත් වන්නා.)
ජාල + ණික = ජාලික (= දැලින් සතුන් මරන්නා)

D. එයින් යයි :-

පද + ණික = පදික (= පයින් යන්නා)
රථ + ණික = රථික (= රථයෙන් හැසිරෙන්නා.)

E. එයින් උසුලයි :-

සීස + ණික = සීසික (= හිසින් බරගෙන යන)
හත්ථ + ණික = හත්ථික (= අතින් උසුලන)

F. එය ඔහුගේ ශිල්පය :-

වීණා + ණික = වෙණික (= වීණා වාදනය කරන්නා.)
වංස + ණික = වංසික (= නළා පිඹින්නා.)

G. එය හා සම්බන්ධය :-

සංඝ + ණික = සංඝික (= සංඝයාට අයත්)
ලොක + ණික = ලොකික (= ලෝකයට අයත්)
අපාය + ණික = ආපායික (= නිරයට අයත්)
සමුද්ද + ණික = සාමුද්දික (= මුහුදට අයත්)

H. එයින් ගනුදෙනු කරයි.

තණ්ඩුල + ණික = තණ්ඩුලික (= සහල් වෙළෙන්ද)
තෙල + ණික = තෙලික (= තෙල් වෙළෙන්ද)
සූකර + ණික = සූකරික (= ඌරන් විකුණන්නා)

I. එය උගනී

විනය + ණික = වෙනයික (= විනය ඉගෙන ගන්නා හෙවත් හදාරන්නා)
අභිධම්ම + ණික = ආභිධම්මික (= අභිධර්මය හදාරන්නා.)

J. එහි උපන්නේ හෝ එතනට අයත් වූයේ :-

මගධ + ණික = මාගධික (= මගධරට උපන් හෝ එරටට අයත්.)
සරීර + ණික = සාරීරික (= ශරීරයෙහි උපන් හෝ එයට අයත්.)
වන + ණික = මානසික (= සිතෙහි උපන් හෝ එයට අයත්)
අරඤ්ඤ + ණික = ආරඤ්ඤික (= වනයෙහි උපන් හෝ එයට අයත්.)

K. ආදි ශබ්දයන්

සන්දිට්ඨ + නික = සන්දිට්ඨික (= තමා විසින් දැක්ක යුතු;
මෙලොව පිළිබඳ)
මාතු + ණික = මාතික (= මවගෙන් ආ.)

අභ්‍යාසය 11
සිංහලට නගා තද්ධිත පද දැක්විය යුතු

1. "අයං මාණවෝ මයි මනං පසාදෙත්වා කාලඞ්කත්වා තාවතිංසදෙවලොකෙ තිංසයොජනිකෙ කනකවිමානෙ නිබ්බත්තිස්සති" (මට්ටකුණ්ඩලී වත්ථු ධ. අ.)

2. සූකරිකා සාකුණිකා ජාලිකා ච සංඝිකං බලක්කාරෙන ගහෙත්වා බාදන්තා ච ඉතෝ චුතා ආපායිකා භවිස්සන්ති.

3. එකූනතිංසවස්සෝ බොධිසත්තෝ අත්තනෝ එකමෙව පුත්තං සබ්බසමපත්තිං ච පහාය ගන්ත්වා කාසාවනිවත්ථෝ මත්ති - කාපත්තමාදය අඤ්ඤෙහි දින්නා'හාරෙන ජීවිකං කප්පෙසි.

4. භාණ්ඩාගාරිකො රඤ්ඤ ධනං ලභිත්වා මහන්තං පාසාදං කාරෙත්වා ද්වාරෙ දෙවාරිකං ඨපෙත්වා උපරිපාසාදගතො කායික මානසිකං සුඛං විඳති.

5. මහාකච්චායනත්ථෙරෙ කුරරඝරනගරං උපනිස්සාය විහරන්තෙ සොණො නාම සෙට්ඨිපුත්තො තස්ස සන්තිකෙ පබ්බජිත්වා "සොණො කුටිකණ්ණො"ති පාකටො අහොසි.

6. "අථ ඛො ආයස්මා ආනන්දෙ කොසිනාරකානං මල්ලානං ආරොචෙසිඃ- අජ්ජ ඛො, වාසෙට්ඨා, රත්තියා පච්ඡිමෙ යාමෙ තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සතීති."

7. සුත්තන්තිකා වෙනයිකා ආරඤ්ඤිකා ච බහවො භික්ඛූ ලංකායං මහාදුබ්භික්ඛභයෙ වත්තමානෙ සමුද්දපාරං ගන්ත්වා අත්තනො ජීවිතං ධම්මවිනයං ච රක්ඛිංසු.

8. ඉද්ධිමන්තානමග්ගො මහාමොග්ගල්ලානත්ථෙරො භගවතො පරිනිබ්බානතො පුරෙතරමෙව පරිනිබ්බායි.

9. "අථ ඛො තෙසං ද්වාදසනහුතානං මාගධිකානං බ්‍රාහ්මණ - ගහපතිකානං එතදහොසි :- උරුවෙලකස්සපො මහාසමණෙ බ්‍රහ්මචරියං චරතීති." (විනයමහාවග්ග)

10. "අස්සොසි ඛො රාජා මාගධො සෙණියො බිම්බිසාරො සමණො බලු හො ගොතමො සක්‍යපුත්තො, සක්‍යකුලා පබ්බජිතො, රාජගහං අනුප්පත්තොති." (එම)

මෙහි අමුතු වචන

අග්ග = ශ්‍රෙෂ්ඨ වූ. 2.
අනුප්පත්ත = පැමිණි. 3.
අස්සොසි = ඇසුවේ ය.
ආයස්මන්තු = ආයුෂ්මත්. 3.
(භික්ෂූන් අතරෙහි ගෞරව පිණිස යොදන්නකි.)
උපනිස්සාය = ආශ්‍රයකොට. පූ.ක්‍රි.
එතදහොසි = මේ සිත උපන්නේය. (එතං + අහොසි)
කනකවිමාන = රන්විමන. න.
කසාවනිවත්ථ = කසාවත් හැඳි. 3.
කොසිනාරක = කුසිනාරාවෙහි උපන්. 3.
බලු = ඒකාන්තයෙන්. (පද පූරණයෙහිත් වේ.) නි.

චුත = (මෙලොවින්) පහවගිය. 3.
(ජීවිකං) කප්පෙති = (ජීවිකාව) කරයි.
නහුත = දසදහස. න.
පරිනිබ්බාති = පිරිනිවේ.
පාකට = ප්‍රකට වූ. 3.
පුරෙතරං = (ඊට) ප්‍රථමයෙන්. ක්‍රි.වි.
සෙණිය = සේනා (පිරිස්) ඇති 3.
බලක්කාර = බලාත්කාරය. පු.
බොධිසත්ත = බෝසත්. පු.
බ්‍රහ්මචරියා = බඹසර, ශ්‍රේෂ්ඨ හැසිරීම. ඉ.
හො = පින්වත. නි.
මත්තිකාපත්ත = මැටිපාත්‍රය. පු.
මල්ල = මල්ල රාජ වංශිකයෝ. පු.
මහාසමණ = ශ්‍රේෂ්ඨ ශ්‍රමණයා. පු.
යාම = රාත්‍රියේ තුනෙන් කොටස. පු.
යොජනික = යොදුනක් පමණ ඇති. 3
වත්තමානෙ = පවත්නා කල්හි.
සක්‍යකුලං = ශාක්‍යවංශය. න.
සමුද්දපාර = මුදෙන් එතර. න.
සාකුණික = පක්ෂීන් විකුණන්නා. පු.
සුත්තන්තික = සූත්‍ර උගත්. 3.

හැකි තන්හි තද්ධිත පද යොදමින් පාලියට නැඟිය යුතු :-

1. පාටලිගමෙහි උපාසකවරු එතුමාගේ එහි පැමිණීම අසා එතුමන් වසන තැනට ගොස් තමන්ගේ සන්ථාගාරයට පැමිණෙන්ට ආරාධනා කළහ. 2. එහි පැමිණි ඔවුහු ශාලාවෙහි වැලි විසුරුවා ආසන පණවා දෙරටුව සමීපයෙහි දිය හැළියක් තබා පහන් දැල්වූහ. 3. බුදුරද සිවුරු පොරවා පාත්‍රය ගෙන භික්ෂූන් සමග සන්ථාගාරයට ගොස් පා සෝදු ඇතුළු වී මධ්‍යයෙහි පිහිටි කුලුන මුල නැගෙන හිරට මූණලා වැඩහුන්නේ ය.

4. ආනන්දය, තෝ දැන් කුසිනාරාවට ගොස් එහි වැසි මල්ලයන්ට මෙසේ දැනුම් දෙව. 'වාසෙට්ඨයිනි, අද රෑ පශ්චිමයාමයෙහි බුදුන්ගේ පිරිනිවීම වන්නේය' යි.

5. එකල්හි ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරතෙම මහත් භික්ෂු පිරිසක් සමග පාවානුවරින් කුසිනාරාවට එන්නේ මාර්ගයෙන් ඉවත්ව එක්තරා ගසක් මුල වැඩහුන්නේ ය.

6. මහා පජාපතී ගෝතමිය හිසකෙස් කපා කසාවත් හැඳ ශාක්‍යවංශික ස්ත්‍රීන් බොහෝ දෙනකුන් සමග වෛශාලියට ගොස් බුදුරදුන්ගෙන් පැවිද්ද ඉල්වී ය.

7. මගධරජ වූ බිම්බිසාර තෙමේ දියෙන් පිරූ රන්කෙණ්ඩියක් ගෙන බුදුරදුන්ගේ අතෙහි පැන් වත්කොට වෙළුවන උයන බුදුන් ප්‍රමුඛ සංඝයාට පිදී.

8. ආනන්දය, යම් ශාසනයක (= ආගමක) ස්ත්‍රීන්ට පැවිද්ද දෙනු ලැබේ නම්, බොහෝ ස්ත්‍රීන් ඇති ගෙයක් සොරුන් විසින් පහසුවෙන් විනාශ කළ හැකි වන්නා සේ ඒ ආගම වැඩිකල් නො පවත්නේ ය.

9. ඒ මහෝත්සවය බැලීමට ගැල් පදවන්නෝ ද නාවිකයෝ ද රථවලින් හැසිරෙන්නෝ ද පයින් යන්නෝ ද කුලී වැඩ කරන්නෝ ද රැස්වූහ.

10. භාරද්වාජ ගෝත්‍රයෙහි වූ සාමණේර තෙමේ කච්චායන මහතෙරුන්ගේ බෑනා විය. හෙතෙම ලෞකික සැපය නො කැමැත්තේ ලෝකෝත්තර සැපය සෙවී ය.

මෙහි අමුතු වචන :-

ආරාධනා කළේය = නිමන්තයි.
ඉවත්ව = අපක්කම්ම. පූ.ක්‍රි.
කුලුන = ථම්භ. පු.
කෙණ්ඩිය = භිංකාර. පු.
දියසැළිය = උදකචාටි. ඉ.
දෙනු ලැබේ = දීයති
දෙරටුව = ද්වාරකොට්ඨක. පු.
නැගෙනහිරට මූණ ලා =
පුරත්‍ථාභිමුඛ. 3.
පහසුවෙන් විනාශ කළ හැකි
= සුප්පධංසිය. 3.
පැමිණීම = පාපුණන, ආගමන. න.
පැමිණෙන්ට = පාපුණිතුං. නි.
පැවිද්ද = පබ්බජ්ජා. ඉ.
පොරවා = පාරුපිත්වා. පූ. ක්‍රි.
බුදුන් ප්‍රමුඛ = බුද්ධප්පමුඛ. 3.
මධ්‍යයෙහි පිහිටි = මජ්ඣිම. 3.
රැස්විය = සන්නිපති
ලෝකෝත්තර = ලොකුත්ත. 3.
වසන තැන = වාසට්ඨාන. න.
ශාක්‍යවංශික ස්ත්‍රී = සාකියානී. ඉ.
සෙවීය = පරියෙසයි.

56. ඒ වණ්ණයෙන් පොවන ලද්දේ ය, ඔහුට අයත් ය, එය දන්නේ ය, එහි හටගත්තේ හෝ උපන්නේ ය, ඔහුගේ මාංශය, එය ඔහුට ඇත්තේ ය යනාදී අර්ථයන්හි "ණ" ප්‍රත්‍යය වේ.

A. එයින් පොවන ලද්දේ

කසාව + ණ = කාසාව (= කසාවන් පැහැයෙන් රැඳි: වස්ත්‍රාදියයි.)
හලිද්දි + ණ = හාලිද්ද (= කහපෙවූ වස්ත්‍රාදියයි)
නීල + ණ = නීල (නිල් පැහැයෙන් රැඳි)
පත්තඞ්ග + ණ = පත්තඞ්ග (= පතඟි පෙවූ.)

B. ඔහුට අයත් :-

සුගත + ණ = සොගත (= බුදුන්ට අයත් = ධර්‍මාදිය.)
පුරිස + ණ = පොරිස (= පුරුෂයාට අයත් + බලාදිය)
මගධ + ණ = මාගධ (= මගධ රටට අයත්)

C. එය දන්නේ ය :-

ව්‍යාකරණ + ණ = වෙය්‍යාකරණ (= ව්‍යාකරණ දන්නා.)
(ව්‍යා - යන්නට වෙය්‍ය - ආදේශය වේ.)

D. එහි හට ගත්තේ හෝ උපන්නේ :-

මන + ණ = මානස (= සිතෙහි හටගත්)
සර + ණ = සාරස (= විලෙහි හටගත්; පියුම් ආදියයි.)
උර + ණ = ඔරස (= ළයෙහි වැඩුණේ; ඖරස) පුත්‍රයායි.
(මේ තුන්තැන ප්‍රත්‍යයටත් ශබ්දයටත් මැද සකාරාගම වේ.)
නගර + ණ = නාගර (= නුවර උපන් හෝ වසන)
මගධ + ණ = මාගධ (= මගධ දේශයෙහි උපන්)
කුසිනාරා + ණ = කොසිනාර, (= කුසිනාරාවැසි)

E. එය ඔහුගේ මාංශය :-

සූකර + ණ = සොකර (= ඌරුමස්). න.
මහිස + ණ = මාහිස (= මීමාගේ මස්). න.
සකුණ + ණ = සාකුණ (= පක්ෂිමස්). න.

F. එය ඔහුට ඇත්තේය :-

සඬා + ණ = සඬ (= ශ්‍රද්ධා ඇති.)

පඤ්ඤු + ණ = පඤ්ඤු (= ප්‍රඥ ඇති.)

57. එහි වූයේ, එය ඔහුට ඇත්තේ ය යනාදී අර්ථයන්හි ඉම-ඉය යන ප්‍රත්‍යයෝ වෙත්.

A. එහි වූයේ :-

පච්ඡා + ඉම = පච්ඡිම (= පසුව උපන් හෝ වූ.)

අන්ත + ඉම = අන්තිම (= කෙළවරෙහි හෝ අන්තයෙහි වූ.)

මජ්ඣිම + ඉම (මජ්ඣිම (= මධ්‍යයෙහි වූ.)

උපරි + ඉම = උපරිම (උඩින් වූ: මත්තෙහි වූ:)

හෙට්ඨා + ඉම = හෙට්ඨිම (= යටින් වූ.)

මනුස්සජාති + ඉය = මනුස්සජාතිය (= මිනිස් ජාතියෙහි වූ.)

ලොක + ඉය = ලොකිය (= ලෝකයෙහි වූ.)

බොධිපක්ඛ + ඉය = බොධිපක්ඛිය (= බෝධියගේ පක්ෂයෙහි වූ.)

පඤ්චවග්ග + ඉය = පඤ්චවග්ගිය (= පස්වගෙහි වූ.)

උදර + ඉය = උදරිය (= උදරයෙහි වූ: නොපැසුණු ආහාරයයි.)

B. එය ඔහුට ඇත්තේ :-

පුත්ත + ඉම = පුත්තිම = පුත්‍රයන් ඇති.

පුත්ත + ඉය = පුත්තිය = පුත්‍රයන් ඇති.

ජටා + ඉය = ජටිය (= ජටා ඇති.)

58. සමූහාර්ථයෙහි තා - ප්‍රත්‍යය වේ. එය ස්ත්‍රී ලිංගයෙහියි.

ගාම + තා = ගාමතා (= ග්‍රාමයන්ගේ සමූහය, ගම් සමූහය.)

ජන + තා = ජනතා (= ජන සමූහය.)

ස්වාර්ථයෙහි ද තා - ප්‍රත්‍යය වේ.

දෙව + තා = දෙවතා (= දේවතාවා) යනු උදාහරණයි. දෙවි තෙමේම 'දෙවතා' නම් වේ. නමුත් තා ප්‍රත්‍යයාන්ත වූ මේ ශබ්දය ස්ත්‍රී ලිඞ්ගයෙහි වේයයි දතයුතු.

59. සමූහාර්ථයෙහි ණ - ප්‍රත්‍යය ද වේ.
ද්වි + ණ = ද්වය (= දෙදෙනාගේ සමූහය)
ති + ණ = තය (= තිදෙනාගේ සමූහය.)

මේ දෙතැන්හි ද්වි-ති- ශබ්දයන්ගේ ඉකාරයන්ට අය - ආදේශ වේ.

60. එය එයට හේතුව වේ යන අර්ථයෙහි ඊය - ප්‍රත්‍යය වේ.
බන්ධන + ඊය = බන්ධනීය (= බැඳීමට කාරණයඃ බැන්ද යුතු)
මුච්ඡන + ඊය = මුච්ඡනීය (= මූර්ජාවීමට කාරණය)
බමන + ඊය = බමනීය (= ඉවසීමට හේතු වූ, ඉවසිය යුතු.)
රජන + ඊය = රජනීය (= ඇලීමට හේතු වූ, ඇලිය යුතු)
(මේවා අනීය ප්‍රත්‍යයෙන් ද සිද්ධ කළ හැක.)

61. එය බහුල කොට ඇත්තේ යන අර්ථයෙහි ආලු - ප්‍රත්‍යය වේ.
අභිජ්ඣ + ආලු = අභිජ්ඣාලු (= දැඩි ලෝභය බහුල කොට ඇත්තේ.)
ධජ + ආලු = ධජාලු (= ධ්වජ බහුල වූ)
දයා + ආලු = දයාලු (= කරුණා බහුල කොට ඇත්තේ.)

62. ඇතැම් විට ආලු ප්‍රත්‍යයෙන් පසුව කකාරගමයක් වේ. අන්‍යශබ්දයන් කෙරෙන් ද නොයෙක් අර්ථයන්හි කකාරාගමය වේ.

අභිජ්ඣාලුකො, දයාලුකො යනු උදාහරණයි. පෙර දැක්වූ අර්ථම ඇත්තාහ.

A මේ ස්වාර්ථයෙහි ක - ප්‍රත්‍යයයි. මෙයින් කිසි අමුතු අර්ථයක් ප්‍රකාශ නොවේ.

කුමාරයාම කුමාරක නම් වේ.
මාණවයා හෙවත් තරුණයාම මාණවක නම් වේ.
මුදු හෙවත් මෘදුවූයේම මුදුක නම් වේ.

B. කුඩා අර්ථයෙහි
පුත්තක + ක = පුත්තක (= කුඩා පුත්‍රයා.)

පීඨ + ක = පීඨක (= කුඩා පුටුව)
මඤ්ච + ක = මඤ්චක (= කුඩා ඇඳ)

C. නින්දර්ථයෙහි :

පණ්ඩිත + ක = පණ්ඩිතක (= නින්ද ලැබිය යුතු උගතා)
ලුද්ද + ක = ලුද්දක (= නින්ද ලැබිය යුතු වැද්ද)

මේ ක - ප්‍රත්‍යය 'එහි උපන්නේ හෝ වසන්නේ' යන අර්ථයෙහි ණ - ප්‍රත්‍යයෙන් සිඬවූ පදයන් කෙරෙන් ද සම්බන්ධාර්ථයෙහි වූ බහුබ්බීසි සමාස පදයන් කෙරෙන් ද විශේෂාර්ථයක් නැතිව යොදනු ලැබේ.

කුසිනාරා + ණ = කොසිනාර = **කොසිනාරක** (= කුසිනාරාවෙහි උපන් හෝ වසන.)
රාජගහ + ණ = රාජගහ = **රාජගහක** (= රාජගහවෙහි උපන් හෝ වසන)
බහු + නදී + ණ = **බහුනදික** (= බොහෝ ගංගා ඇති)

63. එයින් කරණ ලද දෙය හෝ එයින් උපන් දෙය යන අර්ථයෙහි මය - ප්‍රත්‍යය වේ.

සුවණ්ණ + මය = සුවණ්ණමය හෝ සොවණ්ණමය (= රනින් කරන ලද හෝ සෑදූ)

රජත + මය = රජතමය (= රිදියෙන් කළ)
දාරු + මය = දාරුමය (= ලීයෙන් කළ)
ඉද්ධි + මය = ඉඬිමය (= ඍද්ධියෙන් උපන්)
මන + මය = මනොමය (= සිතින් උපන්)

අන්තිම පදයෙහි මන - ශබ්දය මනෝගණයට අයත් බැවින් මධ්‍යයෙහි ඔකාරාගම කරනු ලැබේ. 'සොවණ්ණමය' යන තැන උකාරයට ඔකාරාදේශ වේ.

ගො + මය = ගොමය (= ගවයාගෙන් උපන් මලඃ ගොම)

අභ්‍යාසය 12

සිංහලට නැඟිය යුතු.

1. "යථා පන දුරුආදීහි නිප්ඵන්නාති තානි තානි භණ්ඩානි දුරුමයාදීනි නාම හොන්ති. තථා එතෙ'පි මනතො නිප්ඵන්නත්තා මනොමයා නාම" (ධ. අ.) 2. "මාණව, අහං තෙ සුවණ්ණමයං වා මණිමයං වා රජතමයං වා ලොහමයං වා චක්කයුගං දස්සාමී" ති බ්‍රාහ්මණො වදි. 3. මාගධො බිම්බිසාරො රාජා අන්තනො පාසාදස්ස උපරිමතලෙ ඨිතො පිණ්ඩාය චරන්තං බොධිසත්තමනුගච්ඡන්තෙ නාගරෙ දිස්වා "කිමෙත"න්ති පුච්ඡි. 4. දයාලු භගවා මහාජනතං අනුකම්පන්තො සබ්බදා එකඤ්ඣ අවසිත්වා තත්ථ තත්ථ විචරන්තො සන්දිට්ඨිකං ධම්මං දෙසෙසි.

5. පාටලීගාමිකාපි බො උපාසකා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පුරත්ථිමං භිත්තිං නිස්සාය පච්ඡිමාභිමුඛා නිසීදිංසු." (විනය මහාවග්ග)

6. "අස්සොසුං බො වෙසාලිකා ලිච්ඡවී භගවා කිර කොටිගාමං අනුප්පත්තොති. අථ බො වෙසාලිකා ලිච්ඡවී භද්‍රානි යානානි යොජාපෙත්වා..... වෙසාලියා නීයිංසු භගවන්තං දස්සනාය." (විනය මහාවග්ග)

7. "තෙන බො පන සමයෙන රාජගහිකස්ස සෙට්ඨිස්ස සත්ත වස්සිකො සීසාබාධො අහොසි. බහූ මහන්තා මහන්තා දිසාපාමොක්ඛා වෙජ්ජා ආගන්ත්වා නා'සක්ඛිංසු ආරොගං කාතුං" (එම)

8. "අථ බො ජීවකො කොමාරභච්චො සෙට්ඨිං ගහපතිං මඤ්චකෙ නිපජ්ජාපෙත්වා මඤ්චකෙන සම්බන්ධිත්වා සීසච්ඡවිං ඵාලෙත්වා..... ද්වෙ පාණකෙ නීහරිත්වා ජනස්ස දස්සෙසි." (එම)

9. "සෙට්ඨිපුත්තො 'නියාානිකං වත බුද්ධසාසනං'ති පසීදිත්වා යොජනිකං සුවණ්ණචෙතිං කම්බල - කඤ්චුකෙන පරික්ඛිපිත්වා තත්ථ තත්ථ රථචක්කප්පමාණෙහි සුවණ්ණපදුමෙහි අලංකරි." (අඞ්ගුත්තරට්ඨකථා)

10. "තස්මිං සමයෙ චතුසත්තති - සහස්සජටිලා පණීත පණීතානි ඔජවන්තානි ඵලාඵලානි ගහෙත්වා ආචරියස්ස සන්තිකං සම්පත්තා.' (එම)

මෙහි අමුතු වචන

අරොග = රොගනැති, නීරෝගී. 3.
අසක්බි = හැකිවිය
ආබාධ = රෝගය. පු.
ආවසථාගාර = තානායම. පු.
ඔජවන්ත = ඕජස් ඇති. 3.
කඤ්චුක = සැට්ටය, වැස්ම. පු.
කම්බල = ලොම්පිළි, කම්බිලි. පු.න.
චක්කයුග = රෝද දෙක. න.
කොමාරභච්ච = ළදරුවන්ට
බෙහෙත් කිරීම දත්:
කුමරකු විසින් පෝෂිත වූ. 3.
ජන = මිනිහා: මිනිසුන් සමූහය.
තෙන ඛො පන සමයෙන =
එකල්හි
දස්සනාය = දැකීමට (චතුර්ත්‍ථී.එ.)
දිසාපාමොක්ඛ = ප්‍රදේශයකට
අධිපති වූ. 3.
නිපජ්ජාපෙත්වා = හොවින්ට
සලස්වා
නිප්ඵන්න = නිපන්, සාදන ලද.
3.
නිස්සාය = ආශ්‍රය කොට. පූ. ක්‍රි.
නියාානික = දුකින් නිදහස් වීමට
පමුණුවන. 3.
නීයි = ගෙනයන ලදී.
පක්ඛාලෙත්වා = සෝද. පූ. ක්‍රි.
පච්ඡිමාභිමුඛ = බටහිරට අභිමුඛවූ.
3.
පණීත = ඉතා රසවත්. 3.
පසීදිත්වා = පැහැද. පූ. ක්‍රි.
පාණක = සත්වයා. පු.
පාටලීගාමික = පාටලී ගමෙහි
උපන් හෝ වසන. 3.
පුරත්ථිම = නැගෙනහිර. 3.
ඵලාඵල = කුඩා මහත්ගෙඩි. න.
ඵාලෙත්වා = පළා. පූ. ක්‍රි.
භද්‍ර = යහපත්. 3.
යාන = (රථාදී) යානය. න.
යොජාපෙත්වා = යොදවා:
පිළියෙළ කරවා. පූ. ක්‍රි.
රථචක්ක = කරත්ත රෝදය. න.
වෙසාලික = විශාලා නුවර වැසි.
3.
සත්තවස්සික = සත් අවුරුද්දක්
පැවැති. 3.

සම්බන්ධිත්වා = සම්බන්ධ කොට,
මනාසේ බැඳ. පූ. ක්‍රි.
සම්පත්ත = පැමිණි. 3.
සීසච්ඡවි = හිසේ සම. ඉ.

තද්ධිත පදවලින් යුක්ත කොට පාලියට නැඟිය යුතු.

1. තෙල් වෙළෙන්ද යකඩින් කළ ආයුධයක් ගෙන දෙරටු පාලයාට පහර දුන්නේ ය. 2. මට්ටකුණ්ඩලී තෙම සඞ්ඝයන් වහන්සේ කෙරෙහි සිත පහදවා කලුරිය කොට තව්තිසා දෙව් ලොව රන්විමනක උපන්නේ ය. 3. පස්වග මහණහු ඒහිපස්සික වූ ධර්මය අසා රහත් ඵලය ලැබූහ. 4. බ්‍රාහ්මණ තෙම මාණවකයාට රනින් කළා වූ හෝ රිදියෙන් කළා වූ මැණික්වලින් කළා වූ හෝ චක්‍ර දෙකක් දෙන්නෙමියි කීය. 5. ආභිධර්මික තෙම මහාජන සමූහයාට තමන් විසින් දැක්ක යුතු (හෙවත් අවබෝධ කටයුතු) ධර්මය දේශනා කළේ ය. 6. මුගලන් තෙරුන් වහන්සේ මනෝමය ශරීරයක් මවා ගෙන තව්තිසා දෙව්ලොවට වැඩි සේක. 7. බෝධිසත්ව තෙම වෙසක් මස පසළොස්වක්ද උදය කිරිබත් වළඳ (අනුභව කොට) සවස් කාලයෙහි බෝ මැඩට පැමිණියේ ය. 8. සංඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේගේ බෑනා වූ සාමණේර නමක් පැවිද්ද හැර ගිහියෙක් විය. 9. නාවිකයෝ යකඩින් කළා වූ ද ලීයෙන් කළා වූ ද රිදියෙන් කළා වූ ද බඩු නැවෙහි පටවාගෙන චීන රටට ගියහ. 10. පුත්‍රයන් ඇති මගියා සහල් වෙළෙන්දගෙන් සහල් ඉල්වීය.

සංලක්ෂ්‍යය :-

මෙහි 1 වැනි වාක්‍යයෙහි 'තෙල් වෙළෙන්ද' යන්න 'තෙල වාණිජෝ' යි පාලියට නොනැගිය යුතු. එය සමාස පදයකි. අර්ථ වශයෙන් එහි වරදක් නැතත් මෙය තද්ධිත පරිච්ඡේදය බැවින් තෙලික යන තද්ධිත පදය යෙදිය යුතු. 'යකඩින්' කළ යන්න 'අයසා කතං' යි නොනැගිය යුතුඃ අයොමය යනු මීට යෝග්‍ය තද්ධිත පදයයි.

මෙහි අමුතු වචන :-

කිරිබත = ඛීරපායාස. පු.
ගිහියා = ගිහී. පු.
තව්තිසා = තාවතිංස. පු.
පටවාගෙන = ආරොපෙත්වා. පු. ක්‍රි.
පසළොස්වක = පුණ්ණමී. ඉ.
බෝමැඩ = බොධිමණ්ඩ. පු.
මගියා = පථික. පු.
වෙසක් මස = වෙසාඛ. පු.
හැර = වජ්ජෙත්වා, පහාය. පූ. ක්‍රි.

(1) සාමඤ්ඤ (3) අතථ්‍යත්ථ තද්ධිතය.

64. එය ඔහුට ඇත්තේ ය යන අර්ථයෙහි අව - අල - ඉල - ඉක - ඊ - වී - ස්සී යන ප්‍රත්‍යයෝ වෙති.

අව : කෙස + අව = කෙසව (= හිසකෙස් ඇති)
අල : වාචා + අල = වාචාල (= වැඩි කථා ඇති)
ඉල : ජටා + ඉල = ජටිල (= ජටා ගෙතුණු හිසකෙස් ඇත්තේ.)
තුණ්ඩ + ඉල = තුණ්ඩිල (= හොට ඇත්තේ: පක්ෂිවර්‍ගයක්.)
ඵෙණ + ඉල = ඵෙණිල (= බොහෝ පෙණ ඇති: පෙණෙල ගස)

ඉක : දණ්ඩ + ඉක = දණ්ඩික (= අතේ සැරයටියක් ඇති)
මාලා + ඉක = මාලික (= මල්දමක් ඇති)
ගණ + ඉක = ගණික (= සමූහ = පරිවර ඇති.)

ඊ මාලා + ඊ = මාලී (= මාලා ඇත්තා)
කුට්ඨ + ඊ = කුට්ඨී (= කුෂ්ට ඇත්තා.)
දන්ත + ඊ = දන්තී (= දත් ඇත්තා: ඇතා.)
වම්ම + ඊ = වම්මී (= යුධ ඇඳුම් ඇත්තා.)

වී: මෙධා + වී = මෙධාවී (= නුවණැති.)
මායා + වී = මායාවී (= මායා ඇත්තා: ඉන්ද්‍රජාල දන්නා.)

ස්සී: තප + ස්සී = තපස්සී (= තපස් ඇත්තා: තාපසයා)
යස + ස්සී = යසස්සී (= කීර්තිය හෝ පිරිවර ඇත්තා.)
තෙජ + ස්සී = තෙජස්සී (= තේජස් ඇත්තා.)

සංලක්ෂ්‍යය :-

ස්සී - ප්‍රත්‍යය වන්නේ මනෝ ගණයෙහි වූ ශබ්දයන් කෙරෙන් යයි පෙනේ. මනෝගණික ශබ්දයෝ සංස්කෘතයෙහි 'මනස් තපස්' ආදී වශයෙන් ද සිටිත්. ඒ 'තපස්වී' යනාදිය ම පාලියට තපස්සී ආදී වශයෙන් පෙරළුණේ යයි සිතිය හැක.

65. ඊ - වී - ස්සී - ප්‍රත්‍යයන්ගෙන් සැදුණු පදයන් ස්ත්‍රී ලිංගයෙහි යෙදෙන විට අන්තයෙහි ඉනී = ප්‍රත්‍යයන් යෙදේ.

මාලී + ඉනී = මාලිනී (= මාලා ඇත්තී.)
මන්තී + ඉනී = මන්තිනී (= මැතිනිය)
මෙධාවී + ඉනී = මෙධාවිනී (= නුවණැත්තී.)
තපස්සී + ඉනී = තපස්සිනී (= තපස් ඇත්තී.)

66. මෙයින් යුක්තය යනාර්ථය ප්‍රකාශ කිරීම පිණිස ඇතැම් අකාරාන්ත ශබ්දයන් කෙරෙන් වන්තු - ප්‍රත්‍යය ද ඉ - කාරාන්ත උ - කාරාන්ත ශබ්දයන් කෙරෙන් මන්තු - ප්‍රත්‍යය ද යෙදේ.

ගුණ + වන්තු = ගුණවන්තු (= ගුණ ඇති)
ධන + වන්තු = ධනවන්තු (= ධනවත්)
බුද්ධි + මන්තු = බුද්ධිමන්තු (= නුවණැති)
භානු + මන්තු = භානුමන්තු (= රශ්මි ඇති, සූර්යයා)
ආයු + මන්තු යන තැන උකාරයට අස් - ආදේශ වී = ආයස්මන්තු යි සිඳ වේ.

67. මේ ශබ්දයන් ස්ත්‍රී ලිංගයෙහි යෙදෙන විට ඊ - ප්‍රත්‍යයක් වී පූර්වස්වරය ලොප් වේ. ඇතැම් විට වන්තු - මන්තුන්ගේ න් - කාරය ද ලොප් වේ.

ගුණවන්තු + ඊ = ගුණවන්තී, ගුණවතී (= ගුණ ඇත්තී.)
සතිමන්තු + ඊ = සතිමන්තී, සතිමතී (= සිහි ඇත්තී.)

68. ණව = ණික - ණෙය්‍ය - ණ - යන ප්‍රත්‍යයන්ගෙන් සිඳ වූ තද්ධිත පදයන් ස්ත්‍රීලිංගයෙහි වැටෙන විට ඊ - ප්‍රත්‍යයක් කළ යුතු යි.

ණවඃ මාණව + ඊ = මාණවී (= මෙනවියඃ තරුණිය.)
ණිකඃ නාවික + ඊ = නාවිකී (= නැවෙහි නියුක්ත ස්ත්‍රිය.)
ණෙයඃ භාගිනෙය්‍ය + ඊ = භාගිනෙයී (= ලේලිඃ සොහොයුරියගේ දූ.)
ණ : ගොතම + ඊ = ගොතමී (= ගෞතම ගොත්‍රයෙහි වූ ස්ත්‍රිය.)

69. අධිකාර්ථයක් ප්‍රකාශ කරනු කැමති විට තර - තම - යන ප්‍රත්‍යයන් යෙදිය යුතු. දෙදෙනකුගෙන් අධික ගුණැත්තා ප්‍රකාශ කිරීමට තර - ප්‍රත්‍යය ද බොහෝ දෙනකුගෙන් අධික තැනැත්තා ප්‍රකාශ කිරීමට තම - ප්‍රත්‍යය ද යෙදිය යුතු.

පාප (= පාපියා: පවිටු.)
පාපතර (= වඩා පවිටු)
පාපතම (= අතිශයෙන් පවිටු)
හීන (= ලාමක වූ)
හීනතර (= වඩා ලාමක වූ)
හීනතම (= අතිශයෙන් ලාමක වූ.)
පණීතතර - පණීතතම ආදි නොයෙක් විශේෂණ පදයන් මෙසේ යොදාගත යුතු.

අභ්‍යාසය 13

සිංහලට නඟා තඬිත පද පෙන්විය යුතු :

1. "උච්ඡින්ද සිනෙහමත්තනෝ
කුමුදං සාරදිකංව පාණිනා (ධම්මපද 235 ගා.)

2. "නෙව බෝ අසක්ඛි වාසෙට්ඨෝ මාණවෝ භාරද්වාජං මාණවං සඤ්ඤාපෙතුං, න පන අසක්ඛි භාරද්වාජෝ මාණවෝපි වාසෙට්ඨං මාණවං සඤ්ඤාපෙතුං. (දීඝ.)

3. "කුසාවතියා ආනන්ද රාජධානියා..... එකං ද්වාරං සොවණ්ණමයං, එකං රූපියමමයයං, එකං වෙළුරියමයං, එකං ඵලික මයං." (දීඝ. මහාසුදස්සන)

4. මය්හං භාගිණෙය්‍යා ඉමස්ස රජ්ජස්ස සාමිකොව, ධීතරං එතස්සෙ'ව දත්වා අභිසෙකමස්ස කරිස්සාමීති." (අසිලක්ඛණ ජාතක) 5. "අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්ත රජ්ජං කාරෙන්තෙ බොධි සත්තෝ භාතිකසතස්ස කණිට්ඨෝ අහොසි." (පඤ්චගරු ජාතක) 6. "ඉදං බෝ මහාරාජ, සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරං ච පණීතතරං ච.' (දීඝ සාමඤ්ඤඵල)

7. "රඤ්ඤෝ මහාසුදස්සනස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතුරහොසි සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාරපරිපූරං." (දීඝ)

8. බාරාණසියං යසො නාම කුලපුත්තො සෙට්ඨිපුත්තො සුඛුමාලො හොතිඃ තස්ස තයො පාසාදා හොන්තිඃ- එකො හෙමන්තිකො එකො ගිම්හිකො, එකො වස්සිකො" (විනය මහාවග්ග)

9. "මහාකස්සපථෙරො ච අනුරුද්ධො මහාගණී
උපාලිත්ථෙරො සතිමා ආනන්දෙ ච බහුස්සුතො
අඤ්ඤෙ බහූ අභිඤ්ඤාතා සාවකා සත්ථුවණ්ණිතා
සබ්බෙ පඤ්චසතා ථෙරා නවඞ්ගං ජිනසාසනං
උග්ගහෙත්වාන ධාරෙසුං බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ."

(දීපවංස)

10. "තස්සා ච සාමිනී තත්ථ කුවෙණි නාම යක්ඛිණී
නිසීදි රුක්ඛමූලම්හි කන්තන්තී තාපසී විය." (මහාවංස)

මෙහි අමුතු වචන

අභිඤ්ඤාත = ප්‍රකට වූ. 3.
අභික්කන්තතර = වඩා ප්‍රභාවත් වූ; වඩා සිත්කලු.ඉ.
අභිසෙක = රාජ්‍යාභිෂේකය. පු.
උච්ඡිඳති = සිඳියි, කඩයි
කණිට්ඨ = ඉතා බාලයා.පු.
කන්තන්තී = (නූල්) කටින්නී. ඉ.
කුලපුත්ත = වැදගත් පවුලක පුත්‍රයෙක්. පු.
ගිම්හික = උෂ්ණ කාලයට යෝග්‍ය වූ. 3.
චක්කරතන = චක්‍රරත්නය. න.
දිබ්බ = දෙවියන් හෝ දෙව් ලොව සම්බන්ධ; දිව්‍ය. 3.
නවඞ්ග = කොටස් නවයක් ඇති. 3.
පණීතතර = වඩා උස් වූ හෝ මිහිරි වූ. 3.
පාතුරහොසි = පහළ විය
පුරිම = පළමු; ප්‍රථම. 3.
එලිකමය = පළිඟුවෙන් කළ. 3.
බහුස්සුත = බොහෝ දේ උගත්. 3.
භාතික = සොහොයුරා. පු.
මහාගණී = මහත් පිරිස් ඇති. 3.
යක්ඛිණී = යකින්න. ඉ.
රාජධානි = රජු වසන නුවර. ඉ.
රූපියමය = රිදියෙන් කළ. 3.

වණ්ණිත = පසස්නා ලද. ඉ.
වස්සික = වර්ෂා කාලයට
යෝග්‍ය. 3.
වෙළුරියමය = වෙරළුමිණියෙන්
තැනූ. 3.
සඤ්ඤපෙතුං = අවබෝධ
කරවන්ට. නි.
සනාභික = නැබ (බොස් ගෙඩිය)
සහිත වූ. 3.
සනෙමික = නිම් වළලු (පට්ටම්)
සහිත වූ. 3.
සබ්බාකාරපරිපූර = සියලු
ආකාරයෙන් සම්පූර්ණ වූ. 3.
සහස්සාර = දහසක් දෑති ඇති. 3.
සාමික = අයිතිකාරයා. පු.
සාමිනී = ස්වාමිදුව. ඉ.
සාරදික = සරත් කාලයට
අයත්. 3.
සාමඤ්ඤඵල = මහණ කමේ
ඵලය. න.
සිනෙහ = ප්‍රේමය. පු.
සුබුමාල = සියුමැලි. සුවසේ
වැඩුණු. 3.
හෙමන්තික = ශීත කාලයට
යෝග්‍ය වූ. 3.

තද්ධිත පද සහිත කොට පාලියට නැඟිය යුතු.

1. කුසාවතී නුවර සත්රුවනින් කළ ප්‍රාකාරයෝ සත් දෙනෙක් ද දෙරටු සතක් ද වූහ. 2. බරණැස් රජ තමාගේ බෑනාට ස්වකීය දූ කුමරිය දී රාජ්‍යයෙහි අභිෂේක කරවිය. 3. මහාමන්ධාතු රජතුමා චක්‍රරත්නයේ ආනුභාවයෙන් පොළොව මුළුල්ලේ ඇවිද දෙව්ලොවට ද ගියේ ය. 4. මහා සුදස්සන රජුට සත්රුවන් පොකුණු අසූහාර දහසක් ද හස්ති රත්නය ප්‍රමුඛ අසූහාර දහසක් ඇත්තු ද සියලු ආකාරයෙන් සැරසූ අසූහාර දහසක් රථයෝ ද වූහ. 5. බහුශ්‍රැතයන්ට අග්‍ර වූ ගෞතම ගෝත්‍ර ඇති ආනන්ද මහා ස්ථවිරතුමා සර්‍වඥයන් වහන්සේගේ ධර්‍මභාණ්ඩාගාරිකයා විය. 6. මගධාධිපති අජාසත් මහ රජතුමා පිරිවර සහිතව ජීවකයාගේ අඹ උයනට ගොස් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය ගැන සර්‍වඥයන් වහන්සේගෙන් විචාළේ ය. 7. ගෞතම ගෝත්‍ර ඇති මහා ප්‍රජාපතී දේවිය පන්සියයක් ශාක්‍ය කුමරියන් සමග පැවිදිව භික්‍ෂුණී සංඝයා ඇති කෙළේ ය. 8. මහ පිරිස් ඇති අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ ද තථාගතයන් වහන්සේ පිරිනිවි තැනට පැමිණ සිටියහ. 9. විජය කුමරු ලක්දිවට පැමිණි කල්හි ඔහුගේ එක් සේවකයෙක් ගසක් මුල නූල් කටිමින් හුන් ස්ත්‍රියක් දුටුවේය. 10. යසකුල පුත්‍ර තෙමේ සරත් කාලයෙහි හටගත් පියුමක් කඩන්නා සේ තමාගේ ප්‍රාසාදයන්හි ද ස්ත්‍රීන් කෙරෙහි ද ස්නේහය සින්දේය. 11. දශශීලය පඤ්චශීලයට වඩා ප්‍රණීතතරයැ: ප්‍රාතිමෝක්‍ෂ සංවරය සියලු ශීලයන්ට ශ්‍රේෂ්ඨතම ය.

මෙහි අමුතු වචන :-

අභිෂේක කරවිය = අභිසිඤ්චාපෙසි
අඹ උයන = අම්බවන. න.
කටිමින් = කන්තන්ත. 3.
කඩන්නාසේ = ඡින්දෙන්තො විය.
ගැන = අරබ්භ. පූ. ක්‍රි.
දශශීලය = දසසීල. න.
ධම්භාණ්ඩාගාරිකයා = ධම්ම භාණ්ඩාගාරික. පු.
නූල් - සුත්ත. න.
පංචශීලය = පංචසීල. න.
පිරිනිවි තැන = පරනිබ්බුතට්ඨාන. න.
පොළොව මුළුල්ලේ = සබ්බ - පඨවියා.
ප්‍රණීතතර = පණීතතර. 3
ප්‍රාතිමෝක්ෂසංවරය = පාතිමොක්ඛසංවර. පු.
බරණැස් රජ = බාරාණසීරාජ. පු.
බහුශ්‍රැත = බහුස්සුත. 3.
ශ්‍රාමණ්‍යඵලය = සාමඤ්ඤ ඵල න.
ශ්‍රෙෂ්ඨතම = සෙට්ඨතම. 3.
සරත් කාලයෙහි හටගත් = සාරදික. 3.
සාන්දෘෂ්ටික - සන්දිට්ඨික

1. සාමඤ්ඤ

(4) සංඛ්‍යා තද්ධිතය

70 දෙවැනි තෙවැනි ආදී සංඛ්‍යාපූරණාර්ථයෙහි සංඛ්‍යා ශබ්දයන් කෙරෙන් ම - ප්‍රත්‍යය වේ.

පඤ්ච + ම + පඤ්චම (= පස්වැනි: පස්දෙනකුගේ පිරීමයි.)
සත්තම (= සත්වැනි)
අට්ඨම (= අටවැනි)
නවම (= නවවැනි)
දශම (= දසවැනි)

ඉතිපිලිඹගයෙහි ආ - ප්‍රත්‍යය වී 'පංචමා, සත්තමා' යනාදීහු ද ඊ-ප්‍රත්‍යය වී 'පංචමී, සත්තමී' ආදිහු ද වෙති.

71. ඒ අර්ථයෙහි ම චතු ශබ්දය කෙරෙන් ථ - ප්‍රත්‍යය ද ෂ ශබ්දය කෙරෙන් ඨ ප්‍රත්‍යය ද වේ.

චතු + ථ = චතුත්‍ථ (= සතර වැනි) ෂ + ඨ = ෂට්ඨ (=සවැනි)

ව්‍යඤ්ජනසන්ධියෙහි කී ලෙස ථ - ඨ දෙදෙනට ද්විත්වය වේ. ඉත්‍ථිලිඞ්ගයෙහි "චතුත්‍ථී, ඡට්ඨී, චතුත්‍ථෝ, ඡට්ඨෝ" යි වෙති.

72. ද්වි - ති - ශබ්දයන් කෙරෙන් තිය - ප්‍රත්‍යය ද ඉන්පසු ද්වි ති ශබ්දයන්ට දු - ත යනාදේශ ද වෙති.

ද්වි + තිය = දුතිය (= දෙවැනි) ති + තිය = තතිය (= තුන් වැනි) ඉත්‍ථිලිඞ්ගයෙහි 'දුතියා, තතියා' වෙති.

මේ රීතියෙන් ම "දුවිධ - දුවඞ්ග - දිරත්ත - දිගුණ - දිගු" ආදි තැන්හි ද්වි - ශබ්දයට දු - දි ආදේශ වෙති.

73. එක - ද්වි - ආදි ශබ්දයන් කෙරෙන් වූ පර දස - ශබ්දයේ අන්තයෙහි (සංඛ්‍යාපූරණාර්ථයෙහි) ඊ - ප්‍රත්‍යයක් ඇතැම් තැනක වේ. මේ ඊ - ප්‍රත්‍යයාන්ත ශබ්දය ඉත්‍ථිලිඞ්ගයෙහියි.

එක + දස + ඊ = එකාදසී (එකොළොස්වක් තිථිය)

එකාදස යන්න සමාස පදයකි. 'එකො ච දස ච = එකාදස' යි ද්වන්ද්ව සමාසයෙන් හෝ 'එකකින් අධික වූ දසය' යන අර්ථයෙහි තතියා තප්පුරිස සමාසයෙන් හෝ සිද්ධ කළ හැකි වේ.

සමාසයේදී ද්වි - එක - අට්ඨ යන ශබ්දයන්ගේ අන්තයට ආකාරාදේශ වේ. (මෙයින් එක ශබ්දයේ අකාරයට ආකාරාදේශ වී යයි දත යුතු.) පුල්ලිඞ්ගයෙහි 'එකාදසම' කියා වේ.

ද්වි + දස + ඊ = ද්වාදසී (= දෙළොස්වක් තිථිය). ඉ.

පංච + දස + ඊ = පංචදසී (= පසළොස්වක් තිථිය). ඉ.

74. අනේකාර්ථයෙහි ද්වි-ශබ්දදිය කෙරේ ක - ප්‍රත්‍යය වේ. (දෙකක් පමණක් නොව දෙකේ කොටස් රාශියක් විද්‍යමානවීම අනේකාර්ථයයි.) අන්‍ය සංඛ්‍යාවන් ගැන ද මෙසේ දතයුතු.

ද්වි + ක = ද්වික (= දෙකේ සමූහය). පු. න.

තික (= තුනේ සමූහය). පු. න.

චතුක්ක (= හතරේ සමූහ). පු. න.

පංචක (= පහේ සමූහය). පු. න.

සතක (= සීයේ සමූහය). පු. න.

සහස්සක (= දහසේ සමූහය). පු. න.

2. භාව තද්ධිතය

75. එය ඔහුගේ ස්වභාවය යන අර්ථයෙහි තා - ත්ත - ත්තන - ණ්‍ය - ණෙය්‍ය යන ප්‍රත්‍යයෝ වෙති.

තා : ලහු + තා = ලහුතා (= සැහැල්ලු බව)
කතඤ්ඤු + තා = කතඤ්ඤුතා (= කෘතඥ බව.)
සූර + තා = සූරතා (= ශූර බව)
මුදු + තා = මුදුතා (= මෘදු බව)

ත්ත : මනුස්ස + ත්ත = මනුස්සත්ත (= මනුෂ්‍ය බව මිනිසත් බව)
යාචක + ත්ත = යාචකත්ත (= යාචක බව)
ගත + ත්ත = ගතත්ත (= ගිය බව)

ත්තන: පුථුජ්ජන + ත්තන = පුථුජ්ජනත්තන (= නූගත් මිනිසාගේ ස්වභාව.)
ජායා + ත්තන = ජායාත්තන (= භාර්‍යා බව.)
ජාර + ත්තන = ජාරත්තන (= සොරසැමි බව)

ණ්‍ය: ආරොග + ණ්‍ය = ආරොග්‍ය (= නිරෝගි බව)
දුබ්බල + ණ්‍ය = දුබ්බල්‍ය (= දුර්වල බව)
(ණ් - කාරය වෘද්ධිය පිණිසයයි දත යුතු.)

76. ණ්‍ය - ප්‍රත්‍යය යෙදුණු විට එයින් පූර්වයෙහි සිටි ව්‍යඤ්ජනයෝ ප්‍රත්‍යයෙහි යකාරය සමග නොයෙක් වෙනස්කම්වලට පැමිණෙති.

ත් + ණ්‍ය = ත්‍ය යන්න ච්ච බවට පැමිණේ.
ල් + ණ්‍ය = ල්‍ය යන්න ල්ල බවට පැමිණේ.
ද් + ණ්‍ය = ද්‍ය යන්න ජ්ජ බවට පැමිණේ.
ණ් + ණ්‍ය = ණ්‍ය යන්න ඤ්ඤ බවට පැමිණේ.
ජ් + ණ්‍ය = ජ්‍ය යන්න ජ්ජ බවට පැමිණේ.
ස් + ණ්‍ය = ස්‍ය යන්න ස්ස බවට පැමිණේ.

උදාහරණ :-

පණ්ඩිත + ණ්‍ය = පණ්ඩිත්‍ය = පණ්ඩිච්ච (= පණ්ඩිත බව.) න.
අධිපති + ණ්‍ය = ආධිපත්‍ය = ආධිපච්ච (= අධිපති බව). න.
බහුසුත + ණ්‍ය = බාහුසත්‍ය = බාහුසච්ච (= බොහෝ ඇසූ දේ ඇති බව, බහුශ්‍රැත බව.). න.
මෙහි සුකාරයේ උකාරයට අකාරාදේශ වේ.
කුසල + ණ්‍ය = කොසල්‍ය = කොසල්ල (= දක්ෂ බව) න.
විපුල+ණ්‍ය=වෙපුල්‍ය = වෙපුල්ල (= මහත් බව, විපුලත්වය). න.
සුහද + ණ්‍ය = සොහද්‍ය = සොහජ්ජ (මිත්‍ර බව). න.
සුමන+ණ්‍ය=සොමනස්ස (=යහපත් සිතේ ස්වභාව, සතුට) න.
දුමන + ණ්‍ය = දෙමනස්ස (= අයහපත් සිතේ ස්වභාව, දෙම්නස). න.

මේ අන්තිම දෙතැන්හි ශබ්දයන්ටත් ප්‍රත්‍යයන්ටත් මධ්‍යයෙහි මනෝ ගණයෙහි කී සකාරය ආගම වේ යයි දත යුතු.

සමණ + ණ්‍ය = සාමණ්‍ය = සාමඤ්ඤ (= ශ්‍රමණ බව). න.
ගිලාන +ණ්‍ය = ගෙලන්‍ය = ගෙලඤ්ඤ (= ගිලන් බව, රෝගය). න.
මෙහි ලා - යන්නේ ආකාරයට හ්‍රස්ව වේ.
රාජ + ණ්‍ය = රාජ්‍ය = රජ්ජ (= රාජ්‍යය හෝ රජ බව). න. මෙහි ද හ්‍රස්ව වේ.
නිපුණ + ණ්‍ය = නෙපුණ්‍ය = නෙපුඤ්ඤ (= නිපුණ බව) න.

එය ඔහුගේ කර්මය යනාර්ථයෙහි ද ණ්‍ය - ප්‍රත්‍යය වේ.

භිසජ + ණ්‍ය = භෙසද්‍ය = භෙසජ්ජ (= බෙහෙත, වෙදගේ ක්‍රියාව යන අර්ථයි). න.

ණෙය්‍ය ප්‍රත්‍යය

සුචි + ණෙය්‍ය = සොචෙය්‍ය (= පිරිසිදු බව). න.
අධිපති + ණෙය්‍ය = ආධිපතෙය්‍ය (= අධිපති බව). න.
සඨ + ණෙය්‍ය = සාඨෙය්‍ය (= කපටි බව). න.

77. පටු ගරු ආදි ශබ්දයන් කෙරෙන් ඔහුගේ බව යන අර්ථයෙහි ණ - ප්‍රත්‍යය වේ.

පටු + ණ = පාටව (= දක්ෂ බව). න. පු.
ගරු+ණ = ගාරව (= ගරු බව, ගෞරවය). පු.
} උකාරයට අවාදේශ වේ.

"පටුතා, ගරුතා" යි තා - ප්‍රත්‍යයෙන් ද පටුත්තං, ගරුත්තං" යි ත්ත - ප්‍රත්‍යයෙන් ද පද සිඳවෙති.

අභ්‍යාසය 14

සිංහලට නඟා තද්ධිත පද දැක්විය යුතු.

1. මාගධො බිම්බිසාරො මහාරාජා ද්විසු අඞ්ග - මගධ රට්ඨෙසු ආධිපච්චං රජ්ජං කාරෙසි. 2. එකං සමයං ආයස්මා මහාකස්ස පත්‍ථෙරො ගෙලඤ්ඤෙන පීළිතො රාජගහතො අවිදූරෙ පිප්ඵලි ගුහායං විහාසි. 3. ආනන්දත්‍ථෙරො භගවතො සාවකෙසු බාහුසච්චෙන ච පණ්ඩිච්චෙන ච මහනීයතරො අහොසි. 4. මෙධාවිනී මාණවී දුල්ලභං මනුස්සත්තං ලභිත්වා බහුං පුඤ්ඤං කාතු'මුස්සහති. 5. ගුණවතී නාමිකී සීලවන්තිං භික්ඛුනිං නිමන්තෙත්වා දානම'දාසි. 6. භගවති ධරමානෙ යෙව භික්ඛුසංඝො වෙපුල්ලං පාපුණි. 7. මෙධාවිනො ගරූනං ගාරවං කත්වා නානාසත්‍ථෙසු පාටවං ලභන්ති. 8. සච්චවාදී තපස්සිනො කදාචිපි, වාචාලා න හොන්ති. 9. තෙමිය කුමාරො අත්තනො පණ්ඩිච්චං පකාසෙතුං න ඉච්ඡි. 10. ධම්මාසොකමහාරාජා මොග්ගලිපුත්තතිස්සත්‍ථෙරං නිමන්තෙත්වා සහස්සකං නාමතතියං සංගීතිං කාරාපෙසි. 11. බුද්ධා නාම සාථෙය්‍යෙන ආරාධෙතුං න සක්කා. 12. කතඤ්ඤුනො කදාචිපි සොහජ්ජං න නාසෙන්ති. 13. පාරිලෙය්‍යහත්‍ථිරාජා අන්තොවස්සෙ මාසත්තයං භගවතො වෙය්‍යාවච්චමකාසි. 14. සද්ධා කුලපුත්තා පණීතතරානි චතුහෙසජ්ජාදීනි භික්ඛුසංඝස්ස දෙන්ති. 15. රොගී වෙජ්ජෙන දින්නං භෙසජ්ජමුපසෙවිත්වා ආරොග්‍යං ලභිත්වා අත්තනො සොමනස්සං වෙජ්ජස්ස පකාසෙසි.

මෙහි අමුතු වචන

අවිදූරං = නුදුරු තැන. න. නුදුරු වූ. 3.
උපසෙවිත්වා = සේවනය
ආරාධෙතුං = සිත්ගන්ට. නි.
පකාසෙයි = ප්‍රකාශ කළේ ය.

කොට, අනුභව කොට. පූ.ක්‍රි.
උස්සහති = උත්සාහ කෙරේ.
එකං සමයං = එක් කලෙක
දුල්ලභ = ලැබීමට අපහසු. 3.
ධරමාන = ජීවත් වෙන. 3.
නානාසත්ථං = නොයෙක්
ශාස්ත්‍ර. න.
නාසෙති = නසයි
නිමන්තෙත්වා = ආරාධනා
කොට. පූ. ක්‍රි.
පකාසෙතු = ප්‍රකාශ කරන්ට. නි.
පාරිලෙය්‍යහත්ථිරාජ =
පාරිලෙය්‍ය වනයෙහි ඇත්
රජ. පු.
පීළිත = පෙළුණු. 3.
මහනීයතර = වඩා පිදිය යුතු. 3.
මාසත්තයං = තුන් මසක්
මුළුල්ලේ.
විහාසි = විසී ය
වෙය්‍යාවච්ච = වතාවත. න.
සක්කා = හැකි ය. නි.
සාවක = ශ්‍රාවකයා; කීම් පිළිගෙන
අදහන්නා. පු.

තද්ධිත සමාස පද යොදමින් පාලියට නැඟිය යුතු.

1. නුවණැත්තන් අතරෙන් අතිශයෙන් පිදිය යුතු සැරියුත් මහ තෙරුන් වහන්සේ රජගහ නුවරින් නුදුරු උපතිස්ස ගමෙහි විසූ සාරි බ්‍රාහ්මණියගේ පුත්‍රයා වී ය. 2. දුර්ලභ වූ මනුෂ්‍යාත්මය ලැබූ නුවණැත්තන් විසින් බොහෝ පින් කටයුත්තාහ. 3. ශ්‍රද්ධාවත් නාවික ස්ත්‍රිය සිල්වත් තාපසයන් දැක වැන්ද ය. 4. චක්ඛුපාල ස්ථවිරයන් වහන්සේ පූර්වයේදී වෙදෙකුව ඉපිද එක් ස්ත්‍රියකගේ ඇස්වල ගැමට බෙහෙතක් දුන්නේ ය. 5. ඇතැම් ගුණවත් කුලපුත්‍රයෝ තමන්ගේ දරුවන් ද භාර්‍යාවන් ද මවුපියන් ද ධනය ද හැර කසාවත් හැඳ පැවිදි වෙති. 6. සිද්ධාර්ථ කුමාර තෙම තම නෑයන්ට තමාගේ දක්ෂභාවය පෙන්වා රාජ්‍යය ලැබුවේ ය. 7. සිල්වත් ගුණවත් කුලවත් යසෝධරා කුමරිය ඒ කුමාරයාගේ භාර්‍යා බවට පැමිණියා ය. 8. සර්වඥයන් වහන්සේ ඇතුල් වස තුන්මසක් මුළුල්ලේ තව්තිසා දෙව්ලොවදී දෙවියන්ට ධර්ම දේශනා කළ සේක.

9. ගිලන් බවට පත් බිම්බිසාර රජතෙම ජීවක වෙද විසින් දෙන ලද බෙහෙත් සේවනය කොට ආරෝග්‍ය ලැබ තමාගේ සොම්නස ප්‍රකාශ කෙළේ ය.

10. නුවණැත්තෝ නොයෙක් ශාස්ත්‍රයන් ඉගෙන නිපුණත්වය ලබත්. 11. මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ රජගහනුවර සත්තපණ්ණි ගුහාවේදී පන්සීයේ සමූහය නම් වූ පළමුවැනි සඞ්ගායනාව කරවූ සේක. 12. අලසයා තමාගේ අලසබව නිසා කායික වූ ද මානසික වූ ද දුක් ලබයි. 13. දුටුගැමුණු මහරජ සියලු ලඞ්කාද්වීපයෙහි අධිපතිබව ලැබ යශස් - තේජස් ඇත්තෙක් ව සූවිසි වසක් රාජ්‍යය කරවීය. 14. මාලා ඇති මාණවිකාවෝ වාචාල වූ අලසයන් සමීපයට නොගියහ. 15. පාපතර මනුෂ්‍යයෝ දුර්ලභ වූ මනුෂ්‍යයාත්මය ලැබ කායික වූ ද වාචසිකවූ ද අකුසල් කොට අපායයන්හි ඉපිද අතිශයෙන් භයානක වූ දුක් විඳින්නාහ.

මෙහි අමුතු වචන

අතිශයෙන් භයානක වූ = භයානකතම. 3.
අලසයා = අලස. පු.
ඇතැම් = එකච්ච. 3.
ඇස්වල ගෑමට = අක්ඛිනි අඤ්ජිතුං
ඉපිද = උප්පජ්ජිත්වා
ගිලන්බවට පත් = ගෙලඤ්ඤප්පත්ත. 3.
යශස් ඇති = යසස්සී. 3.
සොම්නස = සොමනස්ස. න.

ප්‍රශ්න :-

1. ඡට්ඨී, සත්තමී, සතිමා, ධිතිමා, මහනීයතර, සත්තසතික, ගාරව, වෙපුල්ල, ජනතා, රාජත්තං, ආණත්‍යා යන පද කිනම් තද්ධිතවලට අයත් වෙත් ද?

2. "ආයු + මන්තු, බහුසුත + ණ්‍ය, කුසල + ණ්‍ය, සුමන + ණ්‍ය, ද්වි + තිය, පටු + ණ, ගිලාන + ණ්‍ය, අධිපති + ණෙය්‍ය, අධිපති + ණ්‍ය, රාජ + ණ්‍ය" යන තැන්හි කෙසේ පද සිද්ධ වෙත් ද?

3. ධනය ඇති, පිරිසිදු බව, සවැනි, අතිශයෙන් ගුණවත්, මහත් බව, ණයනැති බව, කපටි බව, මායා ඇති ස්ත්‍රී, සිල්වත් ස්ත්‍රී, සතරේ සමූහය, බොහෝ ඇසූ දේ ඇති බව, මිත්‍ර බව, කුඩ ඇත්තා යන අර්ථයන් ප්‍රකාශ කරන පාලි තද්ධිත පද දැක්විය යුතු.

4. භික්ඛු, රාජ, මාණව, ගච්ඡන්ත, තපස්සී, අට්ඨම, මාලී යන පුල්ලිංගික ශබ්දයෝ ඉත්ථිලිඞ්ගයේදී කෙසේ සිටිත් ද?

3. අව්‍යය තද්ධිතය

78. එක, ද්වි - ආදි සංඛ්‍යා ශබ්දයන් කෙරෙන් වරක් යන අර්ථයෙහි 'ක්ඛත්තුං, ප්‍රත්‍යය වේ. (වරක් යන අර්ථය නම් එක් වරක්, දෙවරක්, යනාදියෙහි පෙනෙන අර්ථ යයි.)

එක + ක්ඛත්තුං = එකක්ඛත්තුං (= එක්වරක්). නි.

ද්වික්ඛත්තුං (= දෙවරක්)	තික්ඛත්තුං (= තුන්වරක්)
දසක්ඛත්තුං = (= දසවරක්)	සතක්ඛත්තුං (= සියක් වරක්)
සහස්සක්ඛත්තුං (= දහස් වරක්)	බහුක්ඛත්තුං (= බොහෝ වරක්)

79. විභාගාර්ථයෙහි හෙවත් ආකාරයකින් යන අර්ථයෙහි එකාදිසංඛ්‍යා ශබ්දයන් කෙරෙහි ධා - ප්‍රත්‍යය වේ. එම අර්ථයෙහි අන්‍ය ශබ්දයන් කෙරෙන් සො - ප්‍රත්‍යයක් ද වේ.

එක + ධා = එකධා (= එක් ආකාරයකින්). නි.
ද්විධා (= දෙයාකාරයකින්) තිධා (= තුන් ආකාරයකින්.)
ඡධා, ඡද්ධා (= සයාකාරයකින්)
සහස්සධා (= දහස් ආකාරයකින්)
කතිධා (= කී ආකාරයකින් ?)
බහුධා (= බොහෝ ආකාරයෙන්)
පද + සො = පදසො (= පද වශයෙන්)
අත්ථසො (= අර්ථ වශයෙන්)
සබ්බසො (= සියලු ආකාරයෙන්)
හෙතුසො (= හේතු වශයෙන්)
ඨානසො (= කාරණා වශයෙන්)
බහුසො (= බොහෝ සෙයින්)
උපායසො (= උපාය වශයෙන්)

80. **A. සර්ව නාමයන් කෙරෙන් 'ආකාරයෙන්' යන අර්ථයෙහි ථා - ප්‍රත්‍යය වේ.**

ත + ථා = තථා (= එසේ ඒ ආකාරයෙන්)
යථා (= යම් සේ). සබ්බථා (= සියලු ආකාරයෙන්)
අඤ්ඤථා (= අන් ආකාරයකින්.) උභයථා (= දෙයාකාරයකින්)

B. කිං - ඉම - ශබ්දයන් කෙරෙන් ආකාරාර්ථයෙහි ථං - ප්‍රත්‍යය වේ.
කිං + ථං = කථං (= කෙසේ) කි - ශබ්දයට කකාරාදේශ වේ.
ඉම + ථං = ඉත්‍ථං (= මෙසේ) ඉමශබ්දයට ඉකාරාදේශ වේ.

81. **ඇතැම් නිපාතයන් කෙරෙන් වීම් අර්ථයෙහි තන ප්‍රත්‍යය වේ.**

අජ්ජ + තන = අජ්ජතන (= අද; අද වූ)
පුරා + තන = පුරාතන (= පෙර වූ)
ස්වෙ + තන = ස්වාතන (= හෙට හෙට වන්නා වූ)
හීයො + තන = හීයතන (= ඊයේ වූ)

'ස්වාතන' යන තැන එකාරයට ආකාරාදේශ වේ. **හීයත්තන** යන තැන ඔකාරයට ආකාරාදේශ හා තකාරයට ද්විත්ව වේ. මේ ශබ්දයෝ තුන් ලිඟුවෙහි වරනැගිය හැකි වෙති.

82. ස්ථානාර්ථය ප්‍රකාශ කිරීම පිණිස සර්වනාමයන් කෙරෙන් ත්‍ර - ත්‍ථ - හිං - හං යන ප්‍රත්‍යයෝ වෙති.

ත + ත්‍ර = තත්‍ර (= එහි). ත + හිං = තහිං (= එහි)
ත + ත්‍ථ = තත්‍ථ (= එහි). ත + හං = තහං (= එහි)
ය ශබ්දය කෙරෙන් ද මේ ප්‍රත්‍යය සතර ම යෙදේ.
කිං + ත්‍ර = කුත්‍ර (=කොහි). කිං + ත්‍ථ = කුත්‍ථ (= කොහි)
කිං + හිං = කුහිං (= කොහි). කිං + හං (කහං) (= කොහි)

තුන් තැනක කිං ශබ්දයට කු - ආදේශය ද එක් තැනක ක - ආදේශද වේ. අන්‍ය සර්වනාමයන් කෙරෙන් ත්‍ර - ත්‍ථ දෙදෙන පමණක් යෙදෙති.

සබ්බ + ත්‍ර = සබ්බත්‍ර (= සැම තැන)
සබ්බ + ත්‍ර = සබ්බත්‍ර
අඤ්ඤත්‍ර, අඤ්ඤත්‍ර (= අන් තැනක)
ඉම + ත්‍ර = අත්‍ර (= මෙහි) ඉම + ත්‍ර = අත්‍ර (= මෙහි)
ඉම + ත්‍ර = එත්‍ර (= මෙහි)
ඉම + ශබ්දයට දෙතැනක අ - ආදේශ ද එක්තැනක එ - ආදේශ ද වේ.

83. කාලාර්ථය ප්‍රකාශ කිරීම පිණිස සර්වනාමයන් කෙරෙන් ද - දනි - දෘචනං ප්‍රත්‍යයෝ වෙති.

ය + ද = යද (= යම් කලෙක); ත + ද = තද (= එකල)
එක + ද = එකද (= එක් කලෙක)
සබ්බ + ද = සබ්බද (= හැම කල්හි)
කිං + ද = කද (= කවද)
ඉම + දනි = ඉදනි (= දැන්). ම - කාරය ලොප් වේ.
කිං + දෘචනං = කුදෘචනං (= කිසි කලෙක)

84. ස්ථානාර්ථයෙහි ඉම - ශබ්දය කෙරෙන් හ - ධ යන ප්‍රත්‍යයෝ වෙති. එවිට ඉම - ශබ්දයේ ඔකාරය ලොප් වේ.

ඉම + හ = ඉහ (මෙහි). ඉම + ධ = ඉධ (= මෙහි)

අභ්‍යාසය 15

සිංහලට නඟා තද්ධිත පද දැක්විය යුතු :

1. "තස්ස ඛිපන්තස්ස නාසිකා අසිධාරාය පටිහතාද්විධා ඡිජ්ජි."
(අසිලක්ඛණ ජාතක)

2. "සහස්සක්ඛත්තුං ආත්තානං නිම්මිණිත්වාන පණ්ඩකො නිසීද'ම්බවනෙ රම්මෙ යාව කාලප්පවෙදනා." (චුල්ලපණ්ඩක ධම්මපදට්ඨ කථා)

3. අහං බො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හ ගිලානො ..... සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො." (දීඝ).

4. "මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං" (දීඝ) 5. "අධනානං ධනෙ අනනුප්පදීයමානෙ දුළිද්දියං වෙපුල්ලමගමාසිඃ දුළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදනං වෙපුල්ලමගමාසි. දුළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදනං වෙපුල්ලමගමාසි." (දීඝ) 6. යථා තස්මිං ගෙහෙ ඨපෙත්වා මාණවකස්ස පල්ලඞ්කං අඤ්ඤං කිඤ්චි ආසනං න දිස්සති, තථා අධිට්ඨාසි. (විනයට්ඨකථා.)

7. "දෙවතා තස්ස නෙපුඤ්ඤං පකාසෙතුං මහාජනෙ
ඡාදෙසුං පොත්ථකං සොපි ද්වත්තික්ඛත්තුම්පි තං අකා."

(මහාවංස)

8. "යො ච සමෙති පාපානි අණුං ථූලානි සබ්බසො
සමිතත්තා හි පාපානං සමණොති පවුච්චති."

(ධම්මපද 265 ගා.)

9. "තතො පට්ඨාය යත්ථ යත්ථ පණ්ඩිත - සමණබ්‍රාහ්මණා අත්ථීති වදන්ති, තත්ථ තත්ථ ගන්ත්වා සාකච්ඡං කරොන්ති. 10. භො ගොතම අධිවාසෙසි මෙ අජ්ජතනාය භත්තං සඞ්ඝ භික්ඛුසංඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන." (දීඝ)

12. (අ) "මලං වණ්ණස්ස කොසජ්ජං පමාදෙ රක්ඛතො මලං"
(ආ) "එකස්ස චරිතං සෙය්‍යො නත්ථි බාලෙ සහයතා."

13. "කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානුකන්තති
සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායු'පකඩ්ඪති" (ධම්මපද)

මෙහි අමුතු වචන :-

අකා = කෙළේ ය
අදින්නාදන = නුදුන් දෙය ගැනීම; සොරකම. න.
අධන = ධනය නැති. 3.
අධිට්ඨාසි = අධිෂ්ඨාන කෙළේය.
අධිවාසෙති = ඉවසයි; පිළිගනී.
අනුකන්තති = සාරයි; කපා තුවාල කරයි.
අනනුප්පදීයමාන = නොදෙනු ලබන. 3.
අසිධාරා = කඩුමුවහත. ඉ.
උපකඩ්ඪති = ළඟට අදී.
එතරහි = දැන්. නි.
කාලප්පවෙදන = කාලය දැන්වීම. න.

කුස = කුසතණ. පු.
කොසජ්ජ = කම්මැලිකම. න.
ඛිපන්ත = කිඹිසින. 3.
චරිත = හැසිරීම. න.
ඡාදෙති = වසයි; සඟවයි
ජිජ්ජති = සිඳේ; කැපේ.
ඨපෙත්වා = හැර; (තබා). පූ. ක්‍රි.
තුණ්හීභාව = නිශ්ශබ්දව. පු.
දළිද්දිය = දිළිඳු බව. න.
දුක්ඛිත = දුකට පත්. 3.
දුග්ගහිත = වැරදි ලෙස ගත්. 2.
දුප්පරාමට්ඨ = වැරදි සේ පිළිපදින ලද. 3.
ද්වත්තික්ඛත්තුං = දෙතුන්වරක්. නි.
නිම්මිණිත්වා = මවා. පූ. ක්‍රි.
පටිහත = හැපුණු. 3.
පඨක = එනම් ඇත්තා. පු.
පවුච්චති = කියනු ලැබේ.
පහීන = දුරු වූ; දුරු කළ. 3.
බාළ්හගිලාන = දැඩි ගිලන් බවට පත්. 3.
මරු = දෙවියා. පු.
මල = කිලුට; මලකඩ. න.
මෙත්තාසහගත = මෛත්‍රියෙන් යුක්ත වූ. 3.
රම්ම = සිත්කලු. 3.
වණ්ණ = (= ශරීර) වර්‍ණය. පු.
සමිතත්තා = සංසිඳ වූ බැවින්. නි.
සමෙති = සංසිඳවයි
සහායතා = මිත්‍ර බව. ඉ.
සාකච්ඡා = සාකච්ඡාව. ඉ.
සෙය්‍යා = ශ්‍රේෂ්ඨය. නි.

තද්ධිත පද ඇතිව පාලියට නැගිය යුතු.

1. ණය නැති බව ජනපද වැසියන්ට මහත් සැනසීම පිණිස පවතී. 2. නිරෝගිබව උතුම් සැපයකැයි තථාගතයන් විසින් දේශනා කරන ලදි. 3. "ඉර උදා වන කල්හි තාගේ හිස සත්කඩක්ව පැළේවා" යි දේවල තාපස තෙම කීයේ ය. 4. අඥනයා තමාගේ අඥන බව නොදනී; ඔහු හා මිත්‍ර බව අන්‍යයන්ට අහිත පිණිස පවතී. 5. මුගලන් මහ තෙරුන් වහන්සේ සෘද්ධිමය ශරීරයක් මවාගෙන නාගයකු දමනය කළහ.

6. එක් කලක ගිලන් බැවින් මැඩුණු තථාගත තෙමේ චුන්‍දස්ථවිරතුමන් ලවා බොජ්ඣඞ්ග සූත්‍රය කියෙව්වේ ය. 7. දිළිඳු බව පැතිරගිය කල්හි අදින්නාදානය බහුල වෙයි. සොරකම බහුල වූ කල්හි අපරාධයෝ වැඩි වෙති. 8. චුල්ලපන්ථක ස්ථවිරතුමා ජීවක වෛද්‍යයාගේ අඹවනයේදී රහත් ව තමා හා සමාන රූප දහසක් මැවී ය. 9. දවසට තුන්වරක් තථාගතයන්ගේ

උපස්ථානයට පැමිණි භික්ෂූන්ට නවාකාරයෙන් බෙදූ ධර්මය දෙසූහ. 10. පුරාතන සැවැත්නුවර වැසියෝ බොහෝ සේ ම තමන්ගේ මිත්‍රයන් සමග සිත්කලු වූ ජේතවනාරාමයට ගොස් ධර්ම ශ්‍රවණය කළහ. 11. බුද්ධඝෝෂාචාර්‍යයන් පළමු කොට 'විශුද්ධි මාර්ගය' දෙවියන් විසින් සඟවන ලද බැවින් උන්වහන්සේ දෙවැනි වරක් එය ලියූහ. 12 දෙවැනි වරත් එය සැඟවූහ. මෙසේ කරන ලද්දේ උන්වහන්සේ ගේ දක්ෂභාවය මහා සංඝයාට ප්‍රකාශ කිරීම සඳහා ය.

මෙහි අමුතු වචන

අඥාන බව = බාල්‍ය. න.	පැතිරගිය = පතළ. 3.
අපරාධය = අපරාධ. පු.	පැළේ = ඵලති
අහිත පිණිස = අහිතාය	බෙදූ = විභත්ත. 3.
උතුම් = උත්තම; පවර. 3.	මැඩුණු = පීළිත. 3.
උදවන = උදයන්ත. 3.	රහත්ව = අරහා හුඤා
ජනපදවැසියා = ජානපදික. පු.	ලියූ = ලිඛිත. 3.
ණයනැති බව = ආණණ්‍ය. න.	සඟවන ලද = ඡාදිත. 3.
දමනය කෙළේ ය = දමෙසි	සූත්‍රය = සුත්ත. න.

ආඛ්‍යාත හෙවත් ක්‍රියාපද

85. ක්‍රියාවක් සෑදීමට ධාතුවක් තිබිය යුතුයි. ධාතුහු නම් යම්කිසි අර්ථයක් ප්‍රකාශ කරන, විභක්ති - ප්‍රත්‍යයාදියෙන් යුක්ත නොවූ, පුරාණ භාෂාවට අයත් ශබ්ද කොටස් වෙති.

ඒ ධාතුහු :- (A) සකර්මක ධාතු

(B) අකර්මක ධාතු වශයෙන් දෙකොටසකට බෙදෙත්.

නැවත ගණ වශයෙන්

1. භූවාදිගණය (= භූ ආදි කොටස)
2. රුධාදිගණය (= රුධ ආදි කොටස)
3. දිවාදිගණය (= දිවු ආදි කොටස)

4. ස්වාදිගණය (+ සු ආදි කොටස)
5. කියාදිගණය (+ කී ආදි කොටස)
6. තනාදිගණය (+ තනු ආදි කොටස)
7. චුරාදිගණය (+ චුර ආදි කොටස)

යි සත් කොටසකට බෙදෙත්.

A සකර්මකධාතු නම් කර්මයක් ගන්නා වූ ධාතුයි. 'පචති + පිසයි' කීවිට පිසනු ලබන දෙයක් ඇතිවිය යුතු වේ. බත් හෝ අන් කිසිවක් පිසිය යුතු ය. 'කරොති + කරයි' කී විට 'කර්මාන්තයක් කරයි' නැතහොත් 'ගෙයක් කෙරේ' යි කර්මයක් ගැනීමෙන් අදහස පැහැදිලි වේ.

B අකර්මකධාතු නම් කර්මයක් නොගන්නා වූ ධාතුයි. 'සයති + නිදයි' කී විට කර්මයක් ඕනෑ නොවේ. තිට්ඨති + සිටී, නිසීදති + හිඳී යනාදිය ද මෙසේයි. කවරෙක් නිදන්නේ ද? සිටී ද? හිඳී දැයි මේ ක්‍රියාවන්ගේ කර්තෘ පමණක් සෙවිය යුතු වේ. ඒ නිදීම් - සිටීම් - හිඳීම් ක්‍රියා කර්තෘගෙන් ඉවත අන් දෙයක් හෝ සත්‍යකු කරා නොයත්, කර්තෘ කෙරෙහි රඳ සිටිත්, එහෙයින් අකර්මක නම් වෙති.

පිසීම ක්‍රියාව කර්තෘ කෙරෙහි පමණක් නොපිහිටා අන්‍ය ද්‍රව්‍යයක් කරා ගමන් කරයි. එහෙයින් එවැනි ක්‍රියා සකර්මක නම් වෙති.

86. ධාතු ගණයන්ගේ වෙනස ඇති වන්නේ ධාතුවටත් (ක්‍රියා පදයක් සැදීම පිණිස) එය කෙරෙන් යොදන විභක්ති ප්‍රත්‍යයටත් අතරෙහි යෙදෙන තවත් ප්‍රත්‍යයකගේ වෙනස මුල් කොට ගෙන ය. ඒ අතරෙහි යෙදෙන ප්‍රත්‍යයන්ට විකරණ යයි නමක් වේ.

1. භුවාදිගණයෙහි අ - විකරණය යෙදේ.
2. රුධාදිගණයෙහි අ-ප්‍රත්‍යය හා ධාතුවගේ මුල් ස්වරයෙන් පසුව බින්දුවක් වේ.
3. දිවාදිගණයෙහි ය - ප්‍රත්‍යය වේ.
4. ස්වාදිගණයෙහි ණා - ඌණා - ණෝ තිදෙන වෙති.
5. කියාදිය කෙරෙන් ණා - ප්‍රත්‍යය වේ.

6. තනාදිය කෙරෙන් ඔ - යිර දෙදෙන වෙති.
7. චුරාදිය කෙරෙන් ඒ - අය - දෙදෙන වෙති.

මේවාට උදාහරණ 91 වැනි අඞ්කයේ පටන් දැක්වෙති.

එක් ස්වරයකට වඩා ඇති ධාතූන්ගේ අන්තස්වරය නිතර ම මකා දමනු ලැබේ.

87. ක්‍රියාපදයන් වරනැගීමේදී (1) අතීත, (2) අනාගත (3) වර්තමාන යන කාල තුනකට බෙදෙන බව පළමු පොතෙහි කියන ලදි. ඒ කාලත්‍රය හා ඊට සමීප වූ ද මිශ්‍ර වූ ද කාලයන් ප්‍රකාශ කිරීමට යෙදූ විභක්ති ප්‍රත්‍යයන්ගේ කොටස් අටක් වෙති. ඒවා නම් :-

1. වත්තමානා
2. පඤ්චමී
3. සත්තමී
4. හීයත්තනී
5. පරොක්ඛා
6. අජ්ජතනී
7. භවිස්සන්තී
8. කාලාතිපත්තී යනු මොහුයි.

මේ අට අතරෙන් අමිශ්‍ර වර්තමාන කාලය ප්‍රකාශ කිරීම සඳහා වත්තමානා විභක්තිය ද, අමිශ්‍ර අතීත කාලය ප්‍රකාශ කිරීම සඳහා හීයත්තනී, අජ්ජතනී දෙක ද අමිශ්‍ර අනාගතය ප්‍රකාශ කිරීම සඳහා භවිස්සන්තී විභක්තිය ද යොදනු ලැබේ.

පඤ්චමී විභක්තිය :- අණ කිරීමෙහි ද ප්‍රාර්ථනය කිරීමෙහි ද කාලනියමයක් නැතිව වේ. (මෙය ඉංග්‍රීසියේ Imparative mood subjunctive mood දෙකින් මිශ්‍රව පවතී.) අණකිරීමෙහි හෙවත් විධානයෙහි පවතින විට Imparative යයි ද ප්‍රාර්ථනයෙහි වැටෙන විට subjunctive යයි ද දත යුතු.

සත්තමී විභක්තිය :- අනුමත කිරීෆමෙහි ද කල්පනය කිරීමෙහි ද කාලනියමයක් නැතිව වේ.

තමාගේ ඇස් හමුවෙහි 'සිදුනොවූ අතීතයෙහි සිඬ වූ ක්‍රියාවක් ප්‍රකාශ කිරීම සඳහා පරොක්ඛා විභක්තිය යොදනු ලැබේ. 'පපච = පිසුවේලුඃ ජගාම = ගියේලු' යනාදියයි.

යම්කිසි ක්‍රියාවකගේ සිද්ධියට බාධාවක් ඇති වූ කල්හි අතීතයෙහි හෝ අනාගතයෙහි කාලාතිපත්ති විභක්තිය වේ. 'අරක්කැමියා කල් නොයවා බත පිසුවේ නම් මම ගියෙමි = සචෙ සූදෙ කාලක්ඛෙපමකත්වා ඔදනං අපචිස්සා අහං අගමිස්සං' යන තැන 'අපචිස්සා, අගමිස්සං' යන දෙක කාලාතිපත්තියට උදාහරණයි. (මෙහි සිංහල භාෂාරීතියට අනුව 'මම ගියෙමි' යන්නට 'මට යන්ට හැකිව තිබුණේය' යි යෙදීම වඩා ගැළපේ.)

88. සියලු ක්‍රියාපද කත්‍රෘකාරක - කම්කාරක යන දෙ කොටසකට බෙදෙත්.

නාරී භත්තං පචති (= ස්ත්‍රිය බත පිසයි.)

යන තැන 'නාරී' යන කත්‍රෘපදය ප්‍රධාන වේ; එය බලාගෙන ක්‍රියාව එකවචනයෙන් සිටී. එය කත්‍රෘකාරකයෙහියි.

නාරියා ඔදනා පච්චන්ති (ස්ත්‍රිය විසින් බත් තුමූ පිසනු ලැබෙත්.) යන තැන ඔදනා යන කම්පදය ප්‍රධාන වන බැවින් ක්‍රියාව එයට අයත් සංඛ්‍යාව ගනී. එය කම්කාරකයෙහියි.

89. වත්තමානාදි ආඛ්‍යාත විභක්ති කොටස් අට මෙසේයි :-

1. වත්තමානා

ති - අන්ති - සි - ථ - මි - ම, තෙ - අන්තෙ - සෙ - විහෙ - එ - මිහ.

2. පඤ්චමී

තු - අන්තු - හි - ථ - මි - ම, තං - අන්තං - ස්සු - විහෙ - එ - ආමසෙ.

3. සත්තමී

එය්‍ය - එය්‍යුං - එය්‍යාසි - එය්‍යාථ - එය්‍යාමි - එය්‍යාම,
එත - එරං - එථො - එය්‍යවිහො - එය්‍යං - එය්‍යාම්හෙ

4. හීයත්තනී

ආ - ඌ - ඔ - ත්‍ථ - අ - ම්හා, ත්‍ථ - ත්‍වුං - සෙ - වහං - ඉං - ම්හසෙ

5. පරොක්ඛා

අ - උ - එ - තෝ - අ - මිහ, - තෝ - රෙ - තොා - විහො - ඉ - මිහෙ.

6. අජ්ජතනී

ඊ - උං - ඔ - තෝ - ඉං - මිහා, ආ - උා - සෙ - විහං - අ - මිහෙ

7. භවිස්සන්තී

ස්සති - ස්සන්ති - ස්සසි - ස්සථ - ස්සාමි - ස්සාම,
ස්සතෙ - ස්සන්තෙ - ස්සසෙ - ස්සවිහෙ - ස්සං - ස්සාමිහෙ

8. කාලාතිපත්තී

ස්සා - ස්සංසු - ස්සෙ - ස්සථ - ස්සං - ස්සම්හා,
ස්සථ - ස්සිංසු - ස්සසෙ - ස්සවිහෙ - ස්සං - ස්සාමිහසෙ

මේ කොටස් අටෙහි ම මුලින් තිබෙන විභක්ති සයට පරස්සපද නාමයද පසුව තිබෙන සයට අත්තනොපද නාමය ද දී තිබේ.

90. ඒ පරස්සපද - අත්තනොපදයන්හි ද විභක්ති දෙක දෙක බැගින් පඨම - මජ්ඣිම - උත්තම යන පුරුෂවලට බෙදනු ලැබේ. හේ මෙසේයිඃ-

වත්තමානා			
පරස්සපද		අත්තනොපද	
එකවචන	**බහුවචන**	**එකවචන**	**බහුවචන**
පඨම පුරිසඃ ති	අන්ති	තෙ	අන්තෙ
මජ්ඣිමපුරිසඃ සි	ථ	සෙ	විහෙ
උත්තමපුරිසඃ මි	ම	එ	මිහෙ

මේ පිළිවෙළින් අන්‍ය කොටස්වල බෙදීම ද තේරුම් ගත යුතුයි.

සංලක්ෂ්‍යය :-

පළමුවෙන් පරස්සපදයන් කර්තෘකාරකය ප්‍රකාශ කිරීම සඳහා ද අත්තනොපදයන් කර්මකාරකය ප්‍රකාශ කිරීම සඳහා ද අදහස් කරන ලද නමුත් පසුව දෙකොටස ම අවිශේෂයෙන් යොදන ලදුයි සිතිය හැක.

භූවාදිගණයට අයත් භූ - ධාතුව වර්තමානාදි ඒ ඒ කොටසෙහි වරනැගෙන ආකාරය මෙසේ දතයුතු :-

91. වර්තමානා

(I) කර්තෘකාරක

A. පරස්ස පද

එකවචන	**බහු වචන**
පඨම පුරිස භවති (= වේ)	භවන්ති (= වෙත්)
මජ්ඣිම පුරිස භවසි (= වෙහි)	භවථ (= වව්)
උත්තම පුරිස භවාමි (= වෙමි)	භවාම (= වෙමු.)

B. අත්තනො පද

පඨම : භවති (= වේ)	භවන්තෙ (= වෙත්)
මජ්ඣිම: භවසෙ (වෙමි)	භවව්හෙ (= වව්)
උත්තම: භවෙ (වෙමි)	භවාම්හෙ (= වෙමු)

'භවති' යන තැන භූ ධාතුව කෙරෙන් 'ති' විභක්තිය කොට භූවාදිගණයට නියම වූ අ - විකරණය මධ්‍යයෙහි කළ විට,

'භූ - අ - ති' යි සිටී.

"කාරිතප්‍රත්‍යයන් හා විකරණාදි අන්‍ය ප්‍රත්‍යයන් පර කල්හි අසංයෝගාන්තයට ඇතැම් විට වෘද්ධිවේ" යන නියමයෙන් භූ ධාතුවගේ ඌකාරයට ඔකාරයක් වේ. ඒ ඔ - කාරයට අව - ආදේශ කොට සන්ධි කළ කල්හි 'භවති' යි සිද්ධ වේ. අන්‍යපද ද ඒ ඒ විභක්ති යොදා සිද්ධ කටයුතුයි. හි - මි - විභක්ති පරකල්හි අ - විකරණය දීර්ඝ බවට පැමිණේ.

භූ ධාතුව අකර්මක හෙයින් කර්මකාරකයෙහි යෙදිය හැකි නොවේ. නමුත් අනු - ආදි ඇතැම් උපසර්ගයන් හා එක්වීමෙන් ඒ අකර්මකධාතුව සකර්මක වේ. එවිට කර්මකාරකයෙහිත් යෙදිය හැක. (උපසර්ගයන් පිළිබඳ විස්තරයක් මේතාක් නොදක්වන ලද බැවින් උපසර්ගයන් මුල් කොට ඇති භූ ධාතුව පිළිබඳ කර්ම කාරක පද පසුව දක්වන්නෙමු.)

92. පඤ්චමී (ආශිංසනයෙහි)

(I) කර්තෘකාරක

A. පරස්ස පද

	එකවචන	බහුවචන
පඨම	භවතු (=වේවා)	භවන්තු (= වෙත්වා)
මජ්ඣිම	භව, භවාහි (=වෙහිවා)	භවථ (=වව්වා)
උත්තම	භවාමි (= වෙම්වා)	භවාම (=වෙමුවා)

(එක් තැනෙක්හි විභක්තියට ලොප් වේ.)

B. අත්තනො පද

පඨම	+ භවතං (= වේවා)	භවන්තං (= වෙත්වා)
මජ්ඣිම	භවස්සු (=වෙහිවා)	භවව්හො (= වව්වා)
උත්තම	භවෙ (= වෙම්වා)	භවාමසෙ (= වෙමුවා)

93. සත්තමී (පරිකල්පයෙහි)

කර්තෘකාරක

A පරස්ස පද

පඨම	භවෙය්‍ය (=වන්නේ නම්)	භවෙය්‍යුං (=වන්නාහු නම්)
මජ්ඣිම	භවය්‍යාසි (=වන්නෙහි නම්)	භවෙය්‍යාථ (= වන්නහු නම්)
උත්තම	භවෙය්‍යාමි (=වන්නෙම් නම්)	භවෙය්‍යාම (= වන්නෙමු නම්)

B අත්තනොපද

පඨම: භවෙථ (= වන්නේ නම්)	භවෙරං (= වන්නාහු නම්)
මජ්ඣිම: භවෙථො (= වන්නෙහි නම්)	භවෙය්‍යව්හො (= වන්නහු නම්)
උත්තම: භවෙය්‍යං (= වන්නෙම් නම්)	භවෙය්‍යාම්හෙ (= වන්නෙමු නම්)

අභ්‍යාසය 16
සිංහලට නැඟිය යුතු

1. "තදා සෙට්ඨිනො භරියා ගරුගබ්භා හොති, තස්මා සො සීඝං ගෙහං පුරිසං පෙසෙසි: ගච්ඡ, භණෙ ජානාහි තං විජාත වා නො වා ති." (ධ. අ. සොසක)

2. "වෙගෙන ගෙහං ගන්ත්වා කාළිං නාම දාසිං පක්කොසිත්වා සහස්සං දත්වා ආහ; ගච්ඡ ඉමස්මිං නගරෙ උපධාරෙත්වා අජ්ජ ජාත - දාරකං ගණ්හිත්වා එහීති" (එම)

3. "ත්වං ඉමං නෙත්වා චක්කමග්ගෙ නිපජ්ජාපෙහි: ගොණා වා නං මද්දිස්සන්ති, චක්කා වා නං භින්දිස්සන්ති, පවත්තිඤ්චස්ස ඤත්වා ච ආගච්ඡෙය්‍යාසි." (එම)

4. "අම්හො පුරිස, යස්ස ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසි, ජානාසි තං පාසාදං පුරත්ථිමාය වා දිසාය, දක්ඛිණාය වා දිසාය, පච්ඡිමාය වා දිසාය, උත්තරාය වා දිසායාති." (දීඝ නිකාය)

5. සෙය්‍යථාපි මහාරාජ පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සම්ඡ්ඣෙය්‍යුං: සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං." (එම)

6. "සෙය්‍යථාපි නාම සුඛං වත්ථං අපගතකාළකං සම්ම'දෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව යසස්ස කුලපුත්තස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි." (විනය මහාවග්ග)

7. "සො වෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍යඃ අහං හි ගිලානො ආගච්ඡන්තු භික්ඛූ ඉච්ඡාමි භික්ඛූනං ආගත'න්ති, ගන්තබ්බං භික්ඛවෙ සත්තාහකරණීයෙන" (එම)

8. "ඉමානි භන්තෙ අසීති - ගාමික - සහස්සානි ඉධූ'පසං කන්තානි භගවන්තං දස්සනාය සාධුමයං භන්තෙ ලභෙය්‍යාම භගවන්තං දස්සනායාති." (එම)

9. "සාධු දෙවො වාහනාගාරෙසු ද්වාරෙසු ච ආණාපෙතුඃ- යෙන වාහනෙන ජීවකො ඉච්ඡති, තෙන වාහනෙන ගච්ඡතුඃ යෙන ද්වාරෙන ඉච්ඡති තෙන ද්වාරෙන ගච්ඡතූති." (එම)

10. "පටිගණ්හාතු මෙ දෙවො* පොසාවනිකන්ති. අලං භණෙ, ජීවක තුය්හෙ'ව හොතුඃ අම්හාකඤ්ඤෙ'ව අන්තෙපුරෙ නිවෙසනං මාපෙහී"ති. (එම)

මෙහි අමුතු වචන

අධිගච්ඡෙය්‍ය = ලබන්නේ ය.
අපගතකාළක = පහව ගිය කළු ලප ඇති. 3.
අම්භො = සමානයන්ට ආමන්ත්‍ර නයට යොදන නිපාතයක්.
ආගත = ඒම. න.
ආරොහන = නැගීම. න. (චතුත්ථී යෙන් 'පිණිස' අර්ථය ලැබේ.)
ඉණ = ණය. න.
උදපාදි = උපන්නේ ය, පහළ විය.
උපධාරෙත්වා = සොයාබලා. පූ. ක්‍රි.
උපසඞ්කන්ත = එළඹුණු. 3.
එති = එයි.
කම්මන්ත = කර්මාන්තය. පු.
ගරුගබ්භා = දරුගැබ් ඇත්තී. ඉ.
ගාමික = ගම්වැසියා. පු.
ඤත්වා = දැනගෙන. පූ. ක්‍රි.
තතො නිදානං = එය හේතු කොට. ක්‍රි. වි.
දස්සන = දැකීම. න.
ධම්මචක්ඛු = දහම් ඇසඃ සත්‍යාවබෝධය. න.
නිස්සෙණි = හිණිමග. ඉ.
පක්කොසිත්වා = කැඳවා. පූ. ක්‍රි.
පටිගණ්හාතු = පිළිගනීවා.
පයොජෙය්‍ය = යොදවන්නේ ය.
පවත්ති = ප්‍රවෘත්තිය; තොරතුර. ඉ.
පහිණෙය්‍ය = යවන්නේ නම්

* මෙහි දෙව - ශබ්දය කුමාරයකු උදෙසා යොද තිබේ. රජුන්ට ද යොදනු ලැබේ. දේවයන්වහන්සේ යි අර්ථ කියයුතු.

පාමොජ්ජ = ප්‍රීතිය. න.
පොසාවනික = පෝෂණය කිරීම ගැන දිය යුතු මුදල. න.
මදදිස්සති = මඩින්නේය; පාගන්නේ ය.
රජන = (රෙදි පොවන) සායම. න.
ලභෙථ = ලබන්නේ ය.
වාහන = නැගීයන රථාදිය. න.
වාහනාගාර = වාහන තබන ගෙය. පු. න.
විජාතා = වැදූ (ස්ත්‍රිය) වැදුවා. ඉ.
විරජ = කෙලෙස් (රජස්) නැති. 3.
වීතමල = පහවූ කිලුටු ඇති. 3.
වෙගෙන = වේගයෙන් ක්‍රි. වි.
සත්තාහකරණීය = සත්දිනකින් නිමවිය යුතු වැඩය. න.
සමිජ්ඣෙය්‍ය = සමෘඩවන්නේය
සම්මදෙව (= සම්මා + එව) මනා ලෙස ම. නි.
සාධු = යෙහෙකි. නි.
සෙය්‍යථාපි නාම = යම්සේ. නි.
සුඛ = පිරිසිදු වූ. 3.

පාලියට නැඟිය යුතු.

1. මවක් ස්වකීය දරුවා යම් සේ රකී ද එමෙන් සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය පැතිරවිය යුතුයි. 2. නිරෝගී මිනිසකුට බෙහෙතින් ප්‍රයෝජන නැත්තාසේ බුදුරදුන්ට ගුරුවරයකුගෙන් ප්‍රයෝජනයක් නැත. 3. ඉදින් මව ළඳරුවා හැර බණ අසන්ට විහාරයට යන්නී නම් ළඳරුවා රැකීමට කිසිවෙක් ගෙහි නො වන්නේ ය. 4. පර්වතයක් උඩ සිට මිනිසකු බිම සිටි මිනිසුන් දක්නා සේ* රහත්ඵලය ලැබූ භික්ෂුනම ලෝකය දෙස බල්නේ ය.

5. තරුණියන් සදෙන උදෑසන ගඟෙහි නා රජමෙහෙසිය වෙත මල් ගෙන ගිය හොත්† එකිඑකියට රන්කාසිය බැගින් ලැබෙන්නේ ය.

6. ඉදින් වස්කාලය තුළදී දයකයෙක් ගිලන්ව භික්ෂුවක් දකිනු කැමැත්තේ දූතයකු යවන්නේ නම් ඒ භික්ෂුව ඔහු වෙත ආ යුතු ය. 7. "අපට බුදුන් දකින්ට ලැබේ නම් යෙහෙකැ" යි අසූදහසක් ගම්වැසියෝ ආනන්ද ස්ථවිරතුමාට කීහ. 8. ණය ගෙන වෙළඳම් කරන පුරුෂයාගේ වෙළඳම සමෘඩවන්නේ නම් හෙතෙම ඒ නිසා ප්‍රීතිය ලබන්නේ ය. 9. පිරිවර සහිතව

* 'යථා' යන්නෙන් පටන් ගතයුතු.

† 'ඉදින්' යන අර්ථය දෙන නිපාතයක් මුලට යෙදීමෙන් 'හොත්' යන අර්ථය ලැබේ.

යන රජු දැක රටවැසියෝ "අපගේ රජ බොහෝ කලක් ජීවත් වේවා" යි ඝෝෂණය කළහ. 10. මේ දරුවා ගෙන ගොස් ගවයන් ගාලෙන් නික්මෙන කල්හි ගාල ඉදිරියෙහි හොවව; ගවයෝ ඔහු පාගා මරන්නාහ"යි සිටුතෙමේ දැසියට කී ය.

මෙහි අමුතු වචන :-

ආයුතු = ආගන්තබ්බ. 3. (කතෘ පදය තතියාවෙන් යෙදිය යුතු.)
ඉදිරියෙහි = පුරතො. නි.
ගාල = වජ. පු.
ඝෝෂණය කරයි = ඝොසෙති
දකිනු කැමති = පස්සිතුකාම. 3.
පවිතය උඩ සිටි = පබ්බතට්ඨ. 3.
පැතිරවිය යුතු = එරිතබ්බ. 3.
ප්‍රයෝජනය = පයොජන. න.
බිම සිටි = භුම්මට්ඨ. 3.
මෛත්‍රිය = මෙත්තා. ඉ.
රටවැසියා = රට්ඨවාසී. පු.
රන්කාසිය = ජාතරූප. න.
වෙළඳම = වණිජ්ජා. ඉ.
හොවව = නිපජ්ජාපෙහි.

94. හීයත්තනී

I කතෘකාරක

A පරස්ස පද

හීයත්තනී - අජ්ජතනී - කාලාතිපත්තී විභක්තීන්හි ඇතැම් විට ධාතුවට මුලින් අකාරයක් ආගම වේ.

	එකවචන	**බහුවචන**	
පඨම :	අභවා (= විය)	අභවූ	(= වූහ)
මජ්ඣිම:	අභවො (= වූයෙහි)	අභවත්ථ	(= වූහු)
උත්තම:	අභව (= වීමි)	අභවම්හා	(= වීමු)

B අත්තනො පද

පඨම :	අභවත්ථ (= විය)	අභවත්ථුං	(= වූහ)
මජ්ඣිම:	අභවසෙ (= වූයෙහි)	අභවව්හං	(= වූහු)
උත්තම:	අභවිං (= වීමි)	අභවම්හසෙ	(= වීමු)

95. පරොක්ඛා

කතෘකාරක
පරස්ස පද

පරොක්ඛාවේදී භූ - ධාතුවට භුව යනාදේශ වේ. ඒ භූ - කාරයට ද්විත්ව වේ. මුලින් සිටි භූ යන්නේ ඌ කාරයට අකාරය ද ශකාරයට බ කාරය ද වේ.

	එකවචන		**බහුවචන**	
පඨම:	බභුව	(=වීලු)	බභූවු	(= වූවාහුලු)
මජ්ඣිම:	බභුවෙ	(=වූවෙහිලු)	බභූවිත්ථ	(= වූවහුලු)
උත්තම:	බභුව	(= වූවෙම්ලු)	බභූවිම්හ	(= වූවෙමුලු)

B අත්තනො පද

පඨම:	බභුවිත්ථ	(=වීලු)	බභූවිරෙ	(= වූවාහුලු)
මජ්ඣිම:	බභුවිත්ථො	(=වූවෙහිලු)	බභූවිව්හො	(= වූවහුලු)
උත්තම:	බභුවි	(=වූවෙම්ලු)	බභූවිම්හෙ	(= වූවෙමුලු)

(පරොක්ඛාව අසබ්බධාතුක හෙයින් ඇතැම් තැනක ඉකාරාගමයත් වී තිබෙන බව සැලකිය යුතු.)

96. අජ්ජතනී

I කතෘකාරක
A පරස්ස පද

	එකවචන	**බහුවචන**
පඨම:	අභවි, භවි, අභවී, භවී (= විය)	අභවිංසු, භවිංසු, අභවුං, භවුං (= වූහ)
මජ්ඣිම:	අභවො, භවො (= වූයෙහි)	අභවිත්ථ, භවිත්ථ (= වූවහු)
උත්තම:	අභවිං, භවිං, (= වීමි.)	අභවිම්හ, භවිම්හ, අභවිම්හා, භවිම්හා (= වීමු)

B අත්තනො පද

එකවචන	බහුවචන
පඨම: අභවා, භවා, අභවිත්ථ, භවිත්ථ (=විය)	අභවූ (=වූහ)
මජ්ඣිම: අභවිසෙ (=වූවෙහි.)	අභවිව්හං (=වූවහු)
උත්තම: අභවං, අභව (=වීමි)	අභවිම්හෙ (=වීමු.)

මෙහි ඇතැම් තැනක ධාතුවට මුලින් අකාරාගමය වේ. ඇතැම් තැනක නොවේ. පරස්ස පදයෙහි ඇතැම් තැනක ඊ - විභත්තියට ද ම්හා විභත්තියට ද හ්‍රස්ව වේ; ඔ - විභත්තියට ඉ කාරාදේශ වේ; උං විභත්තියට ඉංසු - යනාදේශ වේ. අත්තනොපදයෙහි ඇතැම් තැනක ආ - විභත්තියට ත්‍ථ - යනාදේශ ද අ - විභත්තියට අං යනාදේශ ද වෙති. ඇතැම් තැනක අසබ්බධාතුකයන්හි කී ඉකාරාගමය වේ.

97. භවිස්සන්තී

I කත්‍රී කාරක

A පරස්ස පද

එකවචන	බහුවචන
පඨම: භවිස්සති (= වන්නේය)	භවිස්සන්ති (= වන්නාහ)
මජ්ඣිම: භවිස්සසි (= වන්නෙහි)	භවිස්සථ (= වන්නහු)
උත්තම: භවිස්සාමි (= වන්නෙමි)	භවිස්සාම (= වන්නෙමු)

B අත්තනො පද

පඨම: භවිස්සතෙ (= වන්නේය)	භවිස්සන්තෙ (= වන්නාහ)
මජ්ඣිම:භවිස්සසෙ (= වන්නෙහි)	භවිස්සව්හෙ (= වන්නාහු)
උත්තම:භවිස්සං (= වන්නෙමි)	භවිස්සාම්හෙ (= වන්නෙමු)

98. කාලාතිපත්ති

I කතෘකාරක

A පරස්ස පද

	එකවචන	බහුවචන
පඨම :	අභවිස්ස, අභවිස්සා, භවිස්ස (= විය)	අභවිස්සංසු, භවිස්සංසු, (= වූහ)
මජ්ඣිම:	අභවිස්සෙ, භවිස්සෙ, (= වූයෙහි)	අභවිස්සථ, භවිස්සථ, (= වූවහු)
උත්තම:	අභවිස්සං, භවිස්සං, (= වීමි)	අභවිස්සම්හ, භවිස්සම්හ, අභවිස්සම්හා (= වීමු)

(හෙතෙම කණෙක් නොවූයේ නම් රජවිය යනාදි වශයෙන් ක්‍රියාවගේ සිඛනොවීමක් ඇති කල්හි කාලාතිපත්තිය යෙදෙන බව දත යුතු)

B අත්තනො පද

	එකවචන	බහුවචන
පඨම:	අභවිස්සථ (= වීය)	අභවිස්සිංසු (= වූහ)
මජ්ඣිම:	අභවිස්සසෙ (= වූයෙහි)	අභවිස්සවිහෙ (= වූවහු)
උත්තම:	අභවිස්සං (= වීමි)	අභවිස්සාම්හසෙ (= වීමු)

මෙහි පරස්ස පදයෙහි ඇතැම් තැනක ස්සා - විභක්තියට හ්‍රස්ව වේ. ස්සෙ - විභත්තියට ස්ස = යනාදේශ වේ; ස්සම්හා = විභත්තියට ද හ්‍රස්ව වේ. ඇතැම් තැනක ධාතුවට මුලින් අකාරාගමය නොවේ. භවිස්සන්ති කාලාතිපත්ති දෙක්හි සැම තැන ම ඉ - කාරාගමය පෙනේ.

කාලාතිපත්තිය බොහෝ සේ අතීතයෙහි යෙදෙතත් ඇතැම් විට අනාගතාර්ථයෙහි ද යෙදේ. "සචෙ ආනන්ද, නාලභිස්ස මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජං චිරට්ඨිතිකං ආනන්ද, බ්‍රහ්මචරියං අභවිස්ස" (= ආනන්දය, ඉදින් ස්ත්‍රිය, තථාගතයන් වහන්සේ දෙසූ ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම යෑම වූ ප්‍රව්‍රජ්‍යාව නොලැබුවා නම්, ආනන්දය, මේ බ්‍රහ්මචර්‍යාව බොහෝ කලක් පවතින්නේ ය.) යන්න උදාහරණයි.

මෙහි අලභිස්ස, අභවිස්ස යන ක්‍රියා දෙක කාලාති පතිත්තියෙහි'යි. පළමු ක්‍රියාව අතීතාර්‍ථයෙහි වැටේ. දෙවැනි ක්‍රියාව අනාගතාර්‍ථයෙහි යි. ස්ත්‍රීප්‍රකෘය ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව නොලැබුවේ නම් ශාසන බ්‍රහ්මචර්‍යාව (දැන් පවතිනවාට) වැඩිකලක් පවතින්නේ යයි සර්‍වඥයන් වහන්සේ වදළහ. මෙය කියන විට ප්‍රව්‍රජ්‍යාව ලබා තිබුණ බැවින් අලභිස්ස යන්න අතීතයෙහියි; බ්‍රහ්මචර්‍යාවගේ විනාශය ඒතාක් සිදු නොවූ බැවින් අනාගතයෙහි සිදුවන කාරණයක් අභවිස්ස යන්නෙන් ප්‍රකාශ කරන ලදි.

අභ්‍යාසය 17
සිංහලට නැඟිය යුතු

1. කොසම්බකසෙට්ඨී රාජකුලං ගච්ඡන්තො රාජනිවෙසනතො ආගච්ඡන්තං පුරොහිතං දිස්වා: 'කිං ආචරිය, අජ්ජ තෙ නක්ඛත්ත යොගො ඔලොකිතො' ති පුච්ඡි. (ධ. අ. සෝසකවත්ථු)

2. "ආම, මහාසෙට්ඨී, ඉමස්මිං නගරෙ අජ්ජ ජාතදරකො ජෙට්ඨකසෙට්ඨී භවිස්සතී"ති පුරොහිතො ආහ. 3. "සෙට්ඨී, සචෙ මෙ ධීතා ජායිස්සති, තාය නං සද්ධිං නිවාසෙත්වා සෙට්ඨිට්ඨානස්ස සාමිකං කරිස්සාමි: සචෙ මෙ පුත්තො ජායිස්සති, මාරෙස්සාමි න'න්ති චින්තෙත්වා ගෙහෙකාරෙසි." (එම)

4. "ඉමස්මිං අසති මම පුත්තො'ව සෙට්ඨිට්ඨානං ලභිස්සති, ඉදනෙ'වෙ'තං මාරෙතුං වට්ටතීති චින්තෙත්වා කාළිං ආමන්තෙත්වා ගච්ඡ, ජෙ, වජතො ගුන්නං නික්ඛමණවෙලාය ඉමං තිරියං නිපජ්ජාපෙහි..... මද්දිතාමද්දිතභාවං පන'ස්ස ඤත්වා එහී'ති ආහ" (එම)

5. "සචායං භික්ඛවෙ රාජා පිතරං ධම්මිකං ධම්මරාජානං ජීවිතා න වොරොපෙස්සථ, ඉමස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උප්පජ්ජිස්සථ" (සාමඤ්ඤඵලසුත්ත)

6. "සචෙ හි අයං පඨමවයෙ හොගෙ අඛෙපෙත්වා කම්මන්තෙ පයොජයිස්සා, ඉමස්මිං යෙව නගරෙ අග්ගසෙට්ඨී අභවිස්සා: සචෙ පන නික්ඛමිත්වා සබ්බඤ්ඤුතං පාපුණිස්ස." (මහාධන සෙට්ඨිපුත්ත. ධ. අ.) 7. "සචෙ පච්ඡිමවයෙ හොගෙ අඛෙපෙත්වා කම්මන්තෙ පයොජයිස්ස. තතියකසෙට්ඨී අභවිස්ස: භරියාපි'ස්ස සොතාපත්තිඵලෙ පතිට්ඨහිස්ස." (එම)

7. අයමඞ්ගුලිමාලස්ස මාතා අඞ්ගුලිමාලං ආනෙස්සාමීති ගච්ඡති, සචෙ සමාගමිස්සති අඞ්ගුලිමාලො අඞ්ගුලිසහස්සං පූරෙස්සාමීති මාතරං මාරෙස්සති, සචා'හං න ගමිස්සාමි මහාජානිකො අභවිස්ස."

8. සත්තවස්සානි භගවන්තං අනුබන්ධිං පද පදං
ඔතාරං නාධිගච්ඡිස්සං සම්බුඬස්ස සතීමතො."

(සංයුත්තනිකාය)

10. "සො සංඛපාලභූජගො විසවෙගවා'පි
සීලස්ස හෙදනභයෙන අකුප්පමානො
ඉච්ඡං සදෙහ - භරවාහිජනෙ දයාය
ගන්තුං සයං අපදතාය සුසොච නූනං."

(හත්ථවනගල්ල විහාරවංස)

මෙහි අමුතු වචන

අකුප්පමාන = නොකිපෙමින්
අඛෙපෙත්වා = ක්‍ෂය නොකොට අවසන් නොකොට පූ. ක්‍රි.
අග්ගසෙට්ඨී = ප්‍රධාන සිටාණෝ. පු.
අනුබන්ධති = ලුහුබඳී
අධිගච්ඡිස්සං = ලැබුවෙමි.
අපදතා = පා නැති බව. ඉ.
අරහත්ත = රහත්පලය. න.
අසති = නැති කල්හි. (අසන්ත ශබ්දයයි) 2.
ඔතාර = සිදුර, දෝෂය. පු.
ඔලොකිත = බලන ලද. 3.
ජීවිත = ප්‍රාණය. න.
ජෙට්ඨකසෙට්ඨී = ප්‍රධාන සිටාණෝ, පු.
දයා = කරුණාව. ඉ.
ධම්මරාජ = ධාර්මික රජ. පු.
ධම්මික = ධර්මයෙහි පිහිටි. 3.
නක්ඛත්තයොග = නැකත් යෙදීම. පු.
නික්ඛමනවෙලා = නික්මෙන වෙලාව. ඉ.
නිවාසෙත්වා = වාසය කරවා
පතිට්ඨහිස්ස = පිහිටන්නට තිබුණි.
පබ්බජන්ත = පැවිදිවෙන. 3.

පබ්බජිස්ස = පැවිදි වී නම්.
පයොජයිස්ස = යෙදවී නම්
පාපුණිස්ස = පැමිණෙන්ට තිබුණි
පුරොහිත = රජුට අනුශාසනා කරන බමුණා. පු.
පූරෙස්සාමි = පුරවන්නෙමි
භරවාහී = බර උසුළන. 3.
භෙදන = බිඳීම. න.
මද්දිත = මඩින (පාගන) ලද. 3.
මහාජානික = මහත් හානි ඇති. 3.
රාජනිවෙසන = රජගෙය. න.
වජ = ගාල. පු.
වට්ටති = වටී
විසවෙගවන්තු = විෂවේග ඇති. 3.
වොරොපෙස්සථ = තොර කෙළේ නම්
සකදාගාමී = සකෘදාගාමී ඵලය ලැබූ අය. පු.
සදෙහ = ස්වකීය ශරීරය. පු. න.
සමාගමිස්සති = හමුවන්නේ ය.
සයං = තෙමේ. නි.
සුසොව = ශෝක කෙළේලු.
සෙට්ඨිට්ඨාන = සිටු තනතුර. න.
සොතාපත්තිඵල = සෝවාන් ඵලය. න.

පාලියට නැඟිය යුතු :

1. රජගහනුවර ප්‍රධාන සිටාණන්ගේ පුත්‍රයා මත්පැන් බී අසූකෙළක් ධනය වියදම්කොට මහලු කාලයේදී යාචකයෙක් වී අනුන් දුන් ආහාරයෙන් ජීවිකාව කොට මියගියේ ය.

2. ඉදින් ඔහු මධ්‍යම වයසේදී පැවිදි වී නම් අනාගාමියෙක් වෙන්ට තිබුණි. ඒ වයසේදී කර්මාන්තයන් යෙදෙව්වේ නම් ඒ නුවර දෙවෙනි සිටුතනතුර ලබන්ට තිබුණි.

3. අඞ්ගුලිමාල නම් සොරා බොහෝ මිනිසුන් මරා ඇඟිලි කපා තබා සර්‍වඥයන් වහන්සේගේ ද ඇඟිලි කපනු කැමතිව උන්වහන්සේ ලුහුබැඳ ගියේ ය.

4. පසුව හෙතෙම බුදුන්ගේ බණ අසා පැවිදිව රහත්ඵලය ලැබුවේය. ඔහුට තථාගතයන් වහන්සේ හමුනොවී නම් මරණින් මත්තෙහි අපායෙහි උපදින්ට තිබුණේ ය.

5. අජාතසත්තු රජ තම පියා නොමැරුවේ නම් සඒඥයන් වහන්සේගෙන් බණ ඇසූ දවසෙහි සෝවාන් ඵලය ලබන්ට තිබුණි.

6. ජෝර්ජ් මහ රජුගේ වැඩිමහලු පුත්‍රයා ලක්දිවට පැමිණි කල්හි ලක්වැසියෝ 'කුමාරයා බොහෝ කලක් ජීවත් වේවා'යි ආශිර්වාද කළහ.

7. සිටුතෙම තමාගේ මිත්‍ර වූ කුම්භකාරයා වෙතට ගොස් "මේ දහස ගෙන මගේ එක් වැඩක් කරව" යි කීය.

8. පසුද හෙතෙම සෝෂකයා කැඳවා, "දරුව, ඊයේ මා විසින් කුඹලාට එක් වැඩක් අණ කරන ලදි. තෝ ඔහු සමීපයට ගොස් "මාගේ පියා අණකළ වැඩය කරව" යි කියව" යි ඔහු කුඹල් ගෙට යැවී ය.

9. සිටාණන්ගේ අනික් පුත්‍රයා එහි යන සෝෂකයා දැක 'සොහොයුර, කොහේ යෙහි දැ" යි අසා "මේ ළමයි බෝල සෙල්ලම් කොට මා පැරදවූහ. උඹ ඔවුන් පරදවාපන්නැ" යි කී ය.

10. සෝෂකයා දවල් ක්‍රීඩා කොට හවස ගෙට ගිය කල්හි 'කිමෙක් ද? නොගියෙහි දැ" යි සිටාණන් විසින් විචාරන ලද්දේ බාල සොහොයුරා එහි ගිය බව† කීවේ ය.

මෙහි අමුතු වචන

අණකරන ලද = ආණත්ත. 3.
ආශිර්වාද කළේ ය = ආසිංසන-මකාසි
කපනුකැමති = ඡින්දිතුකාම. 3.
කුඹලා = කුම්භකාර. පු.
පරදවයි = පරාජෙති
බෝල සෙල්ලම = ගුළකීළා. ඉ.
මැරුවේ නම් = මාරයිස්සා
ලුහුබැඳ = අනුබන්ධිත්වා. පූ. ක්‍රි.
වැඩිමහලු = ජෙට්ඨ. 3.
විචාරන ලද = පුච්ඡිත. 3.

† ගියබව = ගතභාව. පු. බාලසොහොයුරා = කණිට්ඨ, පාලියෙහිදී කණිට්ඨ ශබ්දයේ ඡට්ඨී එකවචනය හා 'ගතභාව' යන්න යෙදිය යුතු. භාවය කියවෙන අන් තැන්හි ද එසේ යෙදිය යුතු.

අවශේෂ ධාතුගණයෝ

මේ පරිච්ඡේදයෙහි මෙතෙක් වරනගා දක්වන ලද්දහු භුවාදි ගණික ධාතූහු ය. අන්‍යගණයන්ගේ වෙනස ඇතිවන්නේ ක්‍රියාවන්ගේ අන්තයෙහි නොව මධ්‍යයෙහියි. ධාතූන්ගෙන් ඉතා වැඩි කොටසක් භුවාදි ගණයට හා චුරාදි ගණයට ඇතුළත් වේ. අන්‍ය ගණයන්ට අයත් සංඛ්‍යාව අල්ප ය.

99. රුධාදි ගණයට අයත් විකරණය 'o - අ' (නිග්ගහීත පූර්‍ව අකාරය) යි දක්වන ලදි. වත්තමානාදි විභක්ති ප්‍රත්‍යයන් හැම ගණයට ම සාධාරණ බැවින් මෙහි ඒ ඒ ගණයන්ට අයත් ධාතූන් හා විකරණයන් යෙදීමෙන් සිද්ධ වන පද කීපය බැගින් දක්වනු ලැබේ.

රුධි (අවහිර කිරීමෙහි) o - අ = රුන්ධ + ති = රුන්ධති
(අවහිර = කරයි. බින්දුව ධාතුවේ මුල් ස්වරය සමීපයට යේ.)
බධ (බැඳීමෙහි) + o - අ = බන්ධ + ති = බන්ධති (බඳී)
විද (විඳීමෙහි) + o - අ = වින්ද + ති = වින්දති (විඳී)
යුජ (යෙදීමෙහි) + o - අ = යුඤ්ජ + ති = යුඤ්ජති (යෙදේ)
භුජ (අනුභව කිරීමෙහි) + o - අ = භුඤ්ජති + ති = භුඤ්ජති (අනුභව කරයි)

100. දිවාදි ගණයෙහි ය - විකරණය යෙදේ. ඒ ය - ප්‍රත්‍යය ධාත්වන්තය සමග නොයෙක් විට විකාරයට පැමිණේ. දීර්ඝ ස්වරාන්ත ධාතුවකින් පසුව යෙදුණු විට පමණක් වෙනස් නොවී සිටී.

ධි + ය = ජ්ඣ = බවට ද
ස් + ය = ස්ස = බවට ද
ව් + ය = බ්බ = බවට ද පැමිණෙති.

දිවු (ක්‍රීඩා කිරීමෙහි) + ය = දිබ්බ + ති = දිබ්බති (ක්‍රීඩා කෙරේ.)
යුධ (යුද්ධ කිරීමෙහි) + ය = යුජ්ඣ + ති = යුජ්ඣති (යුද්ධ කෙරේ)
බුධ (අවබෝධයෙහි) + ය = බුජ්ඣ + ති = බුජ්ඣති (අවබෝධ කෙරේ.)
දුස (කිපීමෙහි) + ය = දුස්ස + ති = දුස්සති (කෝප වේ)

ගා (ගී කීමෙහි) + ය + ති = ගායති (ගායනා කෙරේ.)
ඣා (කල්පනයෙහි) + ය + ති = ඣායති (කල්පනා කරයි)

101. ස්වාදි ගණයෙහි ණා - උණා - ණෝ විකරණයෝ වෙති.

සු (ඇසීමෙහි) + ණා + ති = සුණාති (අසයි)
ප + අප (පැමිණීමෙහි) + උණා + ති = පාපුණාති (පැමිණේ)
ප = උපසර්ගය මුලින් සිටී.
ආ + චු (ඇමිණීමෙහි) + ණා + ති = ආවුණාති (අමුණයි)
සක්ක (හැකි) + උණා + ති = සක්කුණාති (හැකි වේ)
සු + ණෝ + ති = සුණෝති (අසයි)

102. කියාදි ගණයෙහි ණා = විකරණය වේ.

කි (ගනුදෙනු කිරීමෙහි) + ණා + ති = කිණාති (මිලට ගනී)

ජි (ජය ගැන්මෙහි) + ණා + ති = ජිනාති (දිනයි)

ධූ (කම්පා කිරීමෙහි) + ණා + ති = ධූනාති (කම්පා කෙරේ)

ඤ (දැනීමෙහි) + ණා + ති = ජානාති (දනී : දැනගනී)

ඤ - හට ජා ආදේශ වේ.

අස (කෑමෙහි) + ණා + ති = අස්නාති (අනුභව කරයි)

මී (මැණීමෙහි) + ණා + ති = මිණාති (මණියි)

ගහ (ගැන්මෙහි) + ණා + ති = ගණ්හාති (ගණියි.)

මෙහි හ - කාර ණ - කාරයෝ මාරුවෙති.

103. තනාදිය කෙරෙන් ඔ - යිර දෙදෙන වෙති. යිර - ප්‍රත්‍යය කලාතුරකින් ඇතැම් ධාතුවකින් පමණක් යෙදේ.

තනු (පැතිරවීමෙහි) + ඔ + ති = තනොති (පතුරුවයි)
කර (කිරීමෙහි) + ඔ + ති = කරොති (කරයි)
මන (සිතීමෙහි) + ඔ + ති = මනොති (සිතයි)
ප + අප (පැමිණීමෙහි) + ඔ + ති = පප්පොති (පැමිණේ)
කර + යිර + ති = කයිරති (කරයි). ධාතුවේ රකාරය ලොප් වේ.

104. චුරාදිය කෙරෙන් එ - අය දෙදෙන වෙති. ඒ දෙදෙන නිසා ධාතුවේ මුල් ස්වරයට වෘද්ධි ද වේ. මුල් ස්වරයෙන් පසුව බැඳි අකුරක් වේනම් වෘද්ධි නොවේ.

චුර (සොරකමෙහි) + එ + ති = චොරෙති
චුර + අය + ති = චොරයති (සොරකම් කරයි)
ගුප (රැකීමෙහි) + එ + ති = ගොපෙති (රකියි)
ඡඩ්ඩ (ඉවත දැමීමෙහි) + එ + ති = ඡඩ්ඩෙති (ඉවත දමයි)
කථ (කීමෙහි) + එ + ති = කථෙති (කියයි)
දිස (දැක්වීමෙහි) + එ + ති = දෙසෙති (දේශනා කරයි)

අභ්‍යාසය 18
සිංහලට නැඟිය යුතු

1. "සුරාමෙරයපානඤ්ච යො නරො අනුයුඤ්ජති,
ඉධෙ'වමෙ'සො ලොකස්මිං මූලං ඛණති අත්තනො
(ධම්මපද)

2. 'භන්තෙ, ඉමං උදකං දරකස්ස සීසෙ ආසිඤ්චාමී"ති පුච්ඡිත්වා තෙන 'සිඤ්චථා'ති වුත්තෙ තථා කරිංසු. දෙවතා තාව දෙවතං මුඤ්චිත්වා ලෙණද්වාරෙ අට්ඨාසි." (ධම්මපදට්ඨ කථා)

3. "මුහුත්තම්පි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා" (ධම්මපද)

4. "අථ පාපානි කම්මානි, කරං බාලො න බුජ්ඣති." (එම)

5. "න කහාපණවස්සෙන තිත්ති කාමෙසු විජ්ජති." (එම)

6. "ධුනාති පාපකෙ ධම්මෙ දුමපත්තං ව මාලුතො."
(ථෙරගාථා එකක.නි.)

7. "පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති,
කුසා'පි පූතිං වායන්ති, එවං බාලුපසෙවනා"
(සත්තිගුම්බ ජාතක)

8. "යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා"

(ධම්මපද)

9. "කො සුජ්ඣති, මුච්චති, බජ්ඣති ච ?
කෙන'තත්නා ගච්ඡති බ්‍රහ්මලොකං ?"

(සුත්ත නිපාත)

10. "එකො'ව ඉඤ්ජ අසුරෙ ජිනාති,
එකො'ව සෙනො හන්ති දිජෙ පසය්හ" (තච්ඡසූකර ජා.)

11. අරඤ්ඤෙ කොට්ඨකෙ බන්ධිත්වා මිගෙ රුන්ධිත්වා මාරෙත්වා මංසං වික්කිණිත්වා ජීවන්තා ලුද්දකා අනාගතෙ සුඛං න විඳන්ති.

12. "සචෙ භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සති, භොතො සොණදණ්ඩස්ස යසො හායිස්සති."

මෙහි අමුතු වචන

අනුයුඤ්ජති = යෙදේ.
අබ්භ = වලාකුළ. න.
ඉන්ද = ශක්‍රයා. පු.
උපනය්හති = වෙළයි: ඔතයි
උපසංකමති = එළඹේ
උපසෙවනා = ආශ්‍රය කිරීම. ඉ.
කරං = කරොන්ත ශබ්දයේ
ප්‍රථමා එකවචනයි
කහාපණවස්ස = කහවණු
වර්‍ෂාව. න.
කාම = ඉඳුරන් පිණවීම. පු.
කොට්ඨක = කොටුව. පු.
චන්දිමා = චන්ද්‍රයා. පු.
තාවදෙව = එකෙණෙහි ම. නි.
තිත්ති = තෘප්තිය. ඉ.
දුම = ගස. පු.
පත්ත = කොළය. න.
පභාසෙති = බබුළුවයි
පමජ්ජති = ප්‍රමාද වේ.
පයිරුපාසති = ආශ්‍රය කරයි.
පසය්හ = බලාත්කාර කොට.
පූ. ක්‍රි.
පූති = කුණු වූ. 3. කුණුගඳ. පු.
බජ්ඣති = බැඳේ
භොතො = යන්න භවන්ත -
ශබ්දයේ ෂට්ඨී එකවචනයි.
භවං - යන්න ඒ ශබ්දයේ
ප්‍රථමා එකවචනයි. පින්වතා
- යන අර්ථ ඇත්තේ යි.

මච්ඡ = මත්ස්‍යයා. පු.
මාලුත = වාතය. පු.
මුඤ්චිත්වා = මුදා අතහැර. පූ.ක්‍රි.
මුච්චති = මිදේ, නිදහස් වේ.
මුත්ත = මිදුණු. 3.
මුහුත්ත = මොහොත. පු.
රස = රසය. පු.
රුන්ධිත්වා = හිරකොට. පූ. ක්‍රි.
විජානාති = දනී. දැනගනී
සුජ්ඣති = පිරිසිදු වේ.
සූප = ව්‍යඤ්ජනය. පු.
සෙන = උකුස්සා. පු.
හන්ති = නසයි (හනති කියාත්වේ)
හායිස්සති = පිරිහෙන්නේය.

පාලියට නැඟිය යුතු :-

1. යමෙක් සිල් රැකීමෙහි යෙදේ නම් හෙමෙ මරණින් මත්තෙහි දෙව්ලොව ඉපිද දිව්‍ය සම්පත් ලැබ නන්දනවනාදියෙහි ක්‍රීඩා කරන්නේ ය. 2. සසර දුකින් මිදෙනු කැමැත්තෝ කෙලෙසුන් හා යුද්ධ කොට ජයගෙන ආර්‍ය්‍ය සත්‍යයන් අවබෝධ කරත්. 3. යම් කෙනෙක් බුදුන් සමීපයට පැමිණෙත් නම් ඔවුහු එතුමන්ගෙන් බණ අසා කෙලෙසුන් කම්පාකොට මාර්ගඵලයන් ලබන්ට සමර්ථ වෙති. 4. සත්වයන් කෙරෙහි නිතර මෛත්‍රිය පතුර වන්නේ නම් හෙතෙම සැම කල්හි සැමතන්හි සැපයට පැමිණේ. 5. අඥානයා බොහෝ කලක් පණ්ඩිතයන් ආශ්‍රය කරන්නේ ද ධර්මය ඉගෙන ගන්ට අසමර්ථ වේ. සැන්ද ව්‍යඤ්ජන රසය දැනගන්ට අසමර්ථ වන්නාක් මෙනි. 6. අනාගතයෙහි සැප විඳිනු කැමැත්තෝ කොටු බැඳ සතුන් හිර කොට උන් මරා මස්, විකුණා ජීවත් වීමට කැමැති නො වෙත්. 7. වාතය ගස්වල අතු හා කොළ කම්පාකරන්නා සේ යෝගී තෙමේ තමාගේ සිතෙහි උපන් ක්ලේශයන් කම්පාකරයි. 8. නගර සෝභිනිය තමා වැදූ පුතා කුල්ලක දමා ගෙනගොස් කසළ ගොඩක දමවයි දැසියට අණකළා ය.

9. සීවලී තෙරණුවෝ පෙර භවයකදී නුවරක් වටලා සත් අවුරුදු සත් වසක් මුළුල්ලේ එහි මිනිසුන් හිර කළ බැවින් මවුකුසින් බිහිවන්ට නොහැකිව බොහෝ දුක් වින්දහ.

10. සංඛපාල නාරජ වැද්දන් විසින් අල්වා බැඳ ගෙනයනු ලබන්නේ උන් කෙරෙහි අනුකම්පාව නිසා තමාට පයින් යන්ට නොහැකිවීම ගැන ශෝකකෙළේලු.

11. මත්පැන් බීමෙහි යෙදෙන්නා මෙලොවදී ම ධනහානියට ද දුකට ද පැමිණේ. 12. යමෙක් කුසල් කිරීමෙහි ප්‍රමාද වන්නේ නම් හෙතෙම අපායෙහි ඉපිද අතිකටුක දුක් විඳින්නේ ය.

මෙහි අමුතු වචන :-

අනුකම්පාව = අනුකම්පා. ඉ.
ආශ්‍රය කරන්නේ = සෙවමාන. පු.
කසළගොඩ = සංකාරකූට. පු. න.
කුල්ල = සුප්ප. පු.
කෙලෙස් = කිලෙස. පු.
ක්ලේශ = කිලෙස. පු.
ජයගෙන = ජිනිත්වා. පූ. ක්‍රි.
නගරසෝභිනිය = නගර සොභිනී. ඉ.
නිසා = පටිච්ච. පූ. ක්‍රි. නි.
නොහැකි වීම = අසමත්ථතා. 3.
පතුරුවන = ඵරන්ත. 3.
පෙරභවය = පුබ්බජාති. ඉ.
බිහිවන්ට = (බහි) නික්ඛමිතුං. නි.
මිදෙනු කැමති = මුඤ්චිතුකාම. 3.
යෝගියා = යොගී. පු.
වටලා = පරික්ඛිපිත්වා. පූ. ක්‍රි.
වැද්ද = ව්‍යාධ. ලුද්දක. පු.
සැන්ද = දබ්බී. ඉ.
හිර කළ බැවින් = රුන්ධිතත්තා

උපසර්ගයෝ

105. අති, අධි, අනු, අභි, අප, අපි, අව, ආ, උ, උප, දු, නී, නි, ප, පරා, පරි, පති, වි, සං, සු යන මොවුහු උපසර්ග නම් වෙති.

මොවුහු ක්‍රියාවන්ගේ හා නාමයන්ගේ මුල යෙදී ඇතැම් විට ඒ පදයන්ගේ අර්ථය වෙනස් කෙරෙත්, ඇතැම් විට විරුද්ධාර්ථයක් ගෙන දෙත්. ඇතැම් විට සම්බන්ධවූ පදයාගේ අර්ථයම ස්ථිර කරත්.

106. එක් ධාතුවක් නානා උපසර්ගයන් හා එක්වීමෙන් නොයෙක් අර්ථයන් ප්‍රකාශ කරන සැටි මෙසේයි :-

උපසර්ග		ධාතුව		පද	අර්ථ
අභි	+	කමු	=	අභික්කමති	(ඉදිරියට යේ.)
අති	+	කමු	=	අතික්කමති	(ඉකුත් කෙරේ.)
අප	+	කමු	=	අපක්කමති	(ඉවත්ව යේ.)
ආ	+	කමු	=	අක්කමති	(පාගයි)

උප	+	කමු	=	උපක්කමති	(උපක්‍රම යොදයි: උත්සාහ කරයි.)
නි	+	කමු	=	නික්ඛමති	(නික්ම යේ)
ප	+	කමු	=	පක්කමති	(යේ)
සං	+	කමු	=	සඞ්කමති	(තැනින් තැනට යේ)
පරා	+	කමු	=	පරක්කමති	(උත්සාහ හෝ වීර්‍ය්‍ය කෙරේ.)
අනු	+	කමු	=	අනුක්කමති	(අනුව යේ)

107. එක් එක් උපසර්‍ගය වෙනස් වෙනස් අර්ථයන් ද ගෙන දේ. පහත උදාහරණවලින් ඔවුන් ප්‍රකා කරන අර්‍ථ සමහරක් තේරුම් ගත හැකිය.

ආ

ආකඩ්ඪති (= සමීපයට අදී) ආකිරති (= විසුරුවයි)
ආසන්න (= ළංවූ) ආගච්ඡති (= එයි)

අති

අතික්කමති (= ඉක්මවා යයි.) අතිවුට්ඨි (=අධික වර්‍ෂාව). ඉ.
අතිරොචති (= අතිශයෙන් බබළයි) අතිඡත්ත (=විශේෂ පත්‍රය)
අතිභාරිය (= ඉතා බැරෑරුම්). 3.

අධි

අධිපති (=ස්වාමියා, ප්‍රධානියා) අධිගච්ඡති (= අවබෝධ කරයි.)
අධිට්ඨාන (= ස්ථිර සිත, ස්ථිර සිටීම)

අධිවසති (= වාසය කරයි) මෙය හා සත්තමිය නොව කර්‍ම විභක්තිය යෙදේ.

අනු

අනුගච්ඡති (= අනුව හෝ පසුපස්සේ යයි.)
අනුසරං (= ගෙයක් පාසා, ගෙපිළිවෙළින්)
අනුක්කම (පිළිවෙළ). පු.

අනුවස්සං (= අවුරුද්දක් පාසා). ක්‍රි. වි.
අනුවිතක්කෙති (= අනුව කල්පනා කරයි.)

අභි

අභිමුඛ (= ඉදිරියෙහි වූ: හමු වූ)
අභිධම්ම (= විශිෂ්ට ධර්මය). පු.
අභිරූප (= මනා රූ ඇති.) 3.
අභිවාදෙති (= වඳියි.)
අභිරති (= ඇලීම). ඉ.

අප

අපගච්ඡති (= ඉවතට යේ)
අපචිති (= ගෞරවය). ඉ.
අපරාධ (= අපරාධය). පු.
අපචිනාති (= බිඳහෙළයි)
අපකාර (= විරුද්ධ ක්‍රියාව.) පු.

අව

අවජානාති (= අවමන් කෙරේ)
අවහරති (= ඉවත ගෙනයයි: සොරකම් කරයි.)
අවසිට්ඨ (= ඉතිරි වූ). 3.
අවසිත්ත (= ඉසින ලද: වත්කළ)

මෙය බොහෝ විට ඔ - බවට පැමිණේ.

ඔනමති (= නැමේ)
ඔමුඤ්චති (= වහන් ආදියක් ඉවත් කරයි.)
ඔක්කමති (= බසී)
ඔනීත (= ඉවත් කළ). 3.

උ

උක්ඛිපති (= ඔසවයි)
උත්තම (= උතුම්: ශ්‍රේෂ්ඨ). 3.
උච්ඡිඳති (= කඩයි: උපුටා දමයි)
උදය (= අභිවෘද්ධිය, පහළවීම)
උප්පන්න (= උපන්). 3.
උස්සහති (උත්සාහ කෙරේ.)
උම්මග්ග (= උමග). පු.
උස්සාරණා (= පස්සට තල්ලු කිරීම). ඉ.

උප

උපක්කම (= උපායඃ හිංසාව). පු.
උපකාර (= උපකාරය). පු.
උපනිසීදති (= සමීපයෙහි හිඳියි)
උපමාන (= සමාන කිරීම). න.
උපවාද (= දෝෂාරෝපණය). පු.
උපනය්හති (= ඔතයිඃ වෙළයි)

දු

දුග්ගන්ධ (= අප්‍රිය ගඳ). පු.
දුක්කර (= කිරීමට අපහසු). 3.
දුබ්භික්ඛ (= ආහාර දුර්ලභත්වය)
දුක්ඛ (= දුක). න.

නී

නියාති (= ඉවත්ව යේ.)
නීහරති (= නෙරපයි)
නිම්මිත (= මවනලද). 3.
නීවරණ (= සිතේ දියුණුවට බාධක දෙය). න.

නි

නිචය (= රැස් කිරීම.) පු.
නිගච්ඡති (= විඳියි; ලබයි)
නිබ්බාත (= සාරන ලද). 3.
නිබ්බිල (= සියලු). 3.

ප

පභවති (= පටන්ගනීඃ ගලාබසී)
පක්ඛිපති (= දමයිඃ බහාතබයි)
පධාන (= ප්‍රධාන වූ). 3.
පසන්න (= පැහැදුණු). 3.
පණිදහති (= ප්‍රාර්ථනා කරයි)
පජානාති (= මනාසේ දනගනී)

පරා

පරාජෙති (= පරදවයි)
පරාභව (= පිරිහීම, අපකීර්තිය)
පරාමසති (= ස්පර්ශ කරයිඃ අතගායි)
පරක්කම (= මහත් උත්සාහය.) පු.

පරි

පරිචරති (= සේවය කරයි)
පරිච්ඡින්දති (= පිරිසිදියිඃ සීමාකරයි)
පරිධාවන (= ඔබිනොබ දිවීම). න.
පරිවිසති (= අනුභව කරවයිඃ අනුභව කරන විට සේවය කරයි.)

පරිභාසති (= ආක්‍රෝශ කෙරේ: බණී)
පරිහරති (= පාවිච්චි කරයි.)
පරිපුණ්ණ (= මනාසේ පිරුණු). 3.

පති - පටි

පටික්ඛිපති (= ප්‍රතික්ෂෙප කරයි: ආපසු විසි කරයි.)
පතිරූප (= සුදුසු: සමානව පෙනෙන: බොරුවට පෙනී සිටින). 3.
පටිරාජ (= විරුද්ධරජ). පු. පටිනිස්සජති (= අත්හරී)
පටිභාති (= වැටහේ) පටිගණ්හාති (= පිළිගනී)
පටිවෙධ (= අවබෝධය). පු.

වි

විගච්ඡති (= වෙන්ව යේ: ඉවත යේ)
විකිරති (= විසුරුවයි)
විජානන (= විශේෂ දැනීම). න.
විවිධ (= නානාකාර වූ). 3.
විධූම (= පහවූ දුම් ඇති). 3.
විඝාටන (= විවෘත කිරීම: ගලවා දැමීම). න.

සං

සංවසති (= සමග හෝ එක්ව වසයි)
සම්බොධි (= සම්පූර්ණ අවබෝධය). ඉ.
සංකිණ්ණ (= මිශ්‍ර වූ, අවුල් වූ). 3.
සංසරණ (= එහා මෙහා යාම, සැරිසැරීම). න.
සම්මුඛා (= ඉදිරියෙහි වූ). 3.
සම්මුති (= එකඟබව: සම්මතය). ඉ.

සු

සුගන්ධ (= සුවඳ: මනාගඳ). පු. සුගති (= සැප ඇති භවය). ඉ.
සුකර (= පහසුවෙන් කළ හැකි). 3. සුචිණ්ණ (= මනාසේ පුරුදුකළ). 3.
සුහික්ඛ (= සුලභ ආහාර ඇති.) 3. සුදුක්කර (= ඉතා අපහසු). 3.

අභ්‍යාසය 19

සිංහලට නැඟිය යුතු

1. "සචෙ භවං සොණදෙණ්ඩා සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සති, භොතො සොණදණ්ඩස්ස යසො පරිහායිස්සති; සමණස්ස ගොතමස්ස යසො අභිවඩ්ඪිස්සති." (දීඝනිකාය)

2. "සො ගන්ත්වා තං භත්තං පඤ්චහි පච්චෙක බුධ-සතෙහි සද්ධිං සංවිභජි..... තෙපි ඔලොකෙන්තා එව අට්ඨංසු. (ධම්මපදට්ඨ කථා)

3. "සො තතො චුතො දෙවලොකෙ නිබ්බත්තිත්වා දෙව මනුස්සෙසු සංසරන්තො ඉමස්මිං බුද්ධුප්පාදෙ භද්දියනගරෙ සෙට්ඨිකුලෙ නිබ්බත්ති." (එම)

4. "සො..... නික්ඛිත්තධඤ්ඤෙ පරික්ඛීණෙ පරිජනං පක්කොසාපෙත්වා ආහ: ගච්ඡථ, තාතා, පබ්බතං පවිසිත්වා ජීවන්තා සුභික්ඛකාලෙ මම සන්තිකං ආගන්තුකාමා ආගච්ඡථ, අනාගන්තුකාමා තත්ථෙව ජීවථාති." (එම)

5. "පුන කච්ඡුං පූරෙත්වා ආචාව ආගච්ඡන්තිං උත්තරාය දුසියො දිස්වා: 'අපෙහි දුබ්බිනීතෙ, න ත්වං අම්හාකං අය්‍යාය උපරි පක්කසප්පිං ආසිඤ්චිතුං අනුච්ඡවිකා'ති සන්තජ්ජෙන්තියො..... පොථෙත්වා භූමියං පාතෙසුං." (එම)

6. 'සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය..... එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො." (නොයෙක් සූත්‍රයන්හි.)

7. "අථ ඛො අම්බට්ඨො මාණවො යෙන සො විහාරො සංවුතද්වාරො තෙන අප්පසද්දෙ උපසංකමිත්වා අතරමානො ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගලං ආකොටෙසි. විවරි භගවා ද්වාරං." (දීඝ අම්බට්ඨසුත්ත)

8. "අථ ඛො අම්බපාලී ගණිකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි." (දීඝ මහාපරිනිබ්බාණ)

9. "අත්තනො වාමපාදෙ ද්වීහි අඞ්ගුලීහි තස්ස පාදෙ ගහෙත්වා විහාරඞ්ගණෙ පොථෙන්තො තතො තතො ආකඩ්ඪී. සො පරිවත්තන්තො ඨාමසා විස්සජ්ජෙතුං උස්සහන්තොපි විස්සජ්ජෙතුං නා'සක්ඛි" (රසවාහිනී)

10. "යක්ඛො ගජ්ජන්තො භුජෙ අප්පොථෙන්තො අභිධාවි. යොධොපි තත්‍ථ ඨිතො වෙගෙන ආකාසම්බභුග්ගන්ත්වා වාමපාදඞ්ගුලීහි තස්ස හනුකට්ඨිං පහරි." (එම)

මෙහි අමුතු වචන

අග්ගල = අගුල. න.
අධිවාසනා = ඉවසීම: (ආරාධනාවක්) බාරගැනීම. ඉ.
අතරමාන = ඉක්මන් නොවෙමින්. 3.
අනුච්ඡවික = සුදුසු වූ. 3.
අපෙති = ඉවත් වෙයි.
අප්පොථෙන්ත = අප්පුඩි
අභිධාවති = විරුඬව දුවයි
අභිවඩ්ඪති = වැඩේ
අබ්භුග්ගන්ත්වා = උඩපැන. පූ.ක්‍රි.
අසක්ඛි = හැකි විය:
ආකොටෙති = තට්ටු කරයි.
ආගන්තුකාම = එනුකැමති. 3.
ආචික්ඛෙය්‍ය = කියන්නේය: දැනුම් දෙන්නේය
ආලිඳ = පිටබරාඳය. පු.
උක්කාසිත්වා = කාරා. පූ. ක්‍රි.
උක්කුජ්ජෙය්‍ය = උඩිකුරු කරන්නේය
උස්සහන්ත = උත්සාහ කරන. 3.
ගජ්ජන්ත = ගර්ජනා කරමින්. 3.
ගණිකා - වෙශ්‍යා ස්ත්‍රිය. ඉ.
තාත = දරුවා, පියා. පු.
ඨාම = ශක්තිය. පු.
දුබ්බිනීත = නොහික්මුණු. 3.
නික්කුජ්ජිත = යටිකුරු කළ. 3.
පක්කාමි = ගියේය
පටිච්ඡන්න = පෙරළෙමින්. 3.
පරිහායති = පිරිහේ
පරියාය = ආකාරය, සමානාර්‍ථ ඇති ශබ්දය. පු.
පරික්ඛීණ = ගෙවීගිය: අවසන්වූ. 3.
පොථෙන්ත = තළමින්. 3.
බුද්ධුප්පාද = බුදුන් උපදනා කාලය පු.
භුජ = අත. පු.
මූළ්හ = මුළා වූ: මංමුළා වූ. 3.
වාම = වම් (පැත්ත). 3.

විදිත්වා = දැන. පූ. ක්‍රි.
විස්සජ්ජෙතුං = අත්හරවන්ට, නි.
සන්තජ්ජෙන්ති = තර්ජනය කරන්නී. ඉ.
සංවුත = ආවරණය කළ. 3.
සංවිභජති = බෙදයි
සංසරන්ත = ඇවිදිමින්: ඔබ් නොබ යමින්. 3.

පාලියට නැගිය යුතු :-

1. තරුණ දුටුගැමුණු කුමාරතෙමේ විශාල සේනාවක් රැස් කොටගෙන එළාර නම් දෙමළ රජුට විරුඬව ඉදිරියට ගියේ ය. වෙසක් මස ශුක්ල පක්‍ෂයේ සිවුවැනිද ඔබ ගිහිගෙන් නික්ම පැවිදි විය යුතු ය. 3. මේ ප්‍රදේශයෙහි ගංගාවෝ සමන්තකූට පර්වතය හාත්පස පිහිටි කඳු වැටියෙන් ගලා බසිත්. 4. යක්‍ෂාධිපති වෛශ්‍රවණ තෙමේ ධනයෙන් ලොව සියල්ලන් ඉක්මවයි. 5. රජතෙමේ රාජ කුමාර වූ තෙරුන් වහන්සේගේ ධාතූන් චෛත්‍යයෙහි නිදන් කොට අවුරුදු පතා ඒ ධාතූන්ට ගෞරව කිරීම පිණිස එහි ගියේ ය. 6. රාත්‍රිය බොහෝ සේ ඉක්මගියකල්හි බුදුරදුන්ගේ ධර්මය ඇසීමට පැමිණි දේවතාවෝ උන්වහන්සේට වැඳ ඉවත්ව ගියහ. 7. රජ බිසව මේ කාරණය අනුව බොහෝ වේලාවක් කල්පනාකොට ආගන්තුකයා තමා ඉදිරියට ගෙනෙන්ට සේවිකාවන්ට අණ කළේ ය. 8. මහලු ස්ත්‍රිය විසින් තඹ භාජනයක රැස්කොට තබනලද සියලු රන්කාසි සොරුන් විසින් ඉවත ගෙනයනලදි. 9. මහාධන සිටුතෙමේ තමාගේ හා භාර්‍යාවගේ ධනය අවසන් වූ කල්හි ඇඳ - පුටු - භාජන ආදි ගෙයි බඩු විකුණා මත්පැන් පීම් ආදියෙහි යෙදුණේය. 10. ඉක්බිති අම්බලට්ඨ මාණවක තෙමේ සිය පිරිස සමග බුදුන් වෙත එළඹ උන්වහන්සේට නොවැඳ උන්වහන්සේගෙන් නොයෙක් ප්‍රශ්නයන් විචාළේ ය.

මෙහි අමුතු වචන

අනුව කල්පනාකොට = අනුචිතක්කෙත්වා. පූ.ක්‍රි.
කඳුවැටිය = පබ්බතමාලා. ඉ.
ගිහිගෙයි = අගාරං ගහ. න.
ගෙයිබඩු = ගෙහභාණ්ඩ. න.
ගෞරව කිරීම පිණිස = සම්මා-නෙතුං. නි.
තඹ භාජනය = තම්බභාජන. න.
නිදන් කොට = නිදහිත්වා. පූ. ක්‍රි.
ප්‍රශ්නය = පඤ්හ. 3.

රැස් කොට ගෙන = සන්නි-පාතෙත්‍වා. පූ. ක්‍රි.

බොහෝ සේ ඉක්මගිය = අභික්ක-න්තඃ අතික්කන්ත. 3.

රැස් කොට තැබූ = සඤ්චිත. 3.

ශුක්ල පක්‍ෂය = සුක්කපක්ඛ. පු.

කර්මකාරක ක්‍රියා

108. කර්මකාරක ක්‍රියාවන් සිද්ධ කිරීම පිණිස ධාතුවටත් විභක්ති - ප්‍රත්‍යයටත් අතරෙහි ය - ප්‍රත්‍යය යොදනු ලැබේ. ඒ ය ප්‍රත්‍යය ආකාර කීපයකින් ධාතුව හා ගැළපේ.

A. ආකාරාන්ත - ධාතූන් කෙරෙන් එය යෙදෙන විට ආ - කාරය ඊ - කාර බවට පැමිණේ. ඉ - කාර - උ - කාරාන්ත - ධාතූන් කෙරෙන් යෙදෙන විට ඉ - කාර - උකාරයෝ දීඝ බවට පැමිණෙත්.

B. අනුබන්ධස්වරය[1] ඉවත් කළ විට ව්‍යඤ්ජනාන්තව සිටින ධාතූන්ට පසුව ය - ප්‍රත්‍යය යෙදූ විට ධාත්වන්තයට ඉ කාරයක් හෝ ඊකාරයක් එක්වේ.

C. බොහෝ විට එසේ ව්‍යඤ්ජනාන්තව සිටින ධාතූන් කෙරෙන් වූ ය - ප්‍රත්‍යයේ ය් - කාරය ධාත්වන්ත ව්‍යඤ්ජනය සමග අන්‍ය අකුරකට පෙරළේ.

පිළිවෙළින් උදාහරණ :-

A.	දා + ය + ති	=	දීයති (දෙනු ලැබේ.)
	පා + ය + ති	=	පීයති (බොනු ලැබේ)
	වී + ව + ති	=	වීයති (රැස්කරනු ලැබේ.)
	සූ + ය + ති	=	සූයති (ඇසේඃ අසනු ලැබේ.)
	නී + ය + ති	=	නීයති (ගෙනයනු ලැබේ.)
	භූ + ය + ති	=	භූයති (සිදුවේඃ වෙයි.)

ඇතැම් විට මෙහි ය් - කාරයට ද්විත්‍ව වී ධාත්වන්තස්වරය හ්‍රස්ව වේ :-

[1] අනුබන්ධස්වරය නම් පච - ධාතුවේ අවසන් අකාරය මෙන් පහසුවෙන් කීම පිණිස යෙදූ ස්වරයකි.

නී + ය + ති = නිය්‍යති (ගෙනයනු ලැබේ.)
දෘ + ය + ති = දිය්‍යති (දෙනු ලැබේ.)

B. කර + ඊ + ය + ති = කරීයති (කරනු ලැබේ.)
හස + ඊ + ය + ති = හසීයති (සිනාසෙනු ලැබේ.)

(මූලය) භුඤ්ජ+ඊ+ය+ති = භුඤ්ජීයති (අනුභව කරනු ලැබේ.)
(මූලය) ඉච්ඡ + ඊ + ය + ති = ඉච්ඡීයති (කැමතිවනු ලැබේ.)

C. පච් + ය + ති = පච්චති (පැසේ; පිසනු ලැබේ.)
හන් + ය + ති = හඤ්ඤති (නැසේ; නසනු ලැබේ.)
බාද් + ය + ති = බජ්ජති (කනු ලැබේ.)
බධ් + ය + ති = බජ්ඣති (බැඳේ; බැඳෙනු ලැබේ.)
ලභ් + ය + ති = ලබ්භති (ලැබේ.)

109. අන්ත ව්‍යඤ්ජනය සමග ය - ප්‍රත්‍යයාගේ මේ විපර්යාසයන් පහත දැක්වෙන ආකාරයෙන් සිදුවන බව පෙනේ.

ච් + ය හෝ ක් + ය = ච්ච බවට පැමිණේ
ජ් + ය හෝ ඛ් + ය = ච්ඡ බවට පැමිණේ.
ජ් + ය හෝ ද් + ය = ජ්ජ බවට පැමිණේ.
ඣ් + ය හෝ ධ් + ය = ජ්ඣ බවට පැමිණේ.
ඤ් + ය හෝ න් + ය = ඤ්ඤ බවට පැමිණේ.
ව් + ය = බ්බ බවට පැමිණේ.
ස් + ය = ස්ස බවට පැමිණේ.

දිවාදි ගණයේ විකරණය වූ ය - ප්‍රත්‍යය ද මෙසේ විපර්යාසයට පැමිණේ.

අභ්‍යාසය 20
සිංහලට නැඟිය යුතු

1. "සමිතත්තා හි පාපානං සමණොති පවුච්චති." (ධම්මපද)

2. "සො බජ්ඣතං පාසසතෙහි ඡබ්භි;
රම්මා වනා නිය්‍යතු රාජධානිං
තුත්තෙහි සො හඤ්ඤතු පාජනෙහි
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි" (භිස ජාතක)

3. "සො..... භන්තෙ, 'අජ්ජ ආදිං කත්වා අග්ගිනාපි මම සන්තකං මා ඩය්හතු, උදකෙනාපි මා වුය්හතු'ති පත්‍ථනං අකාසි." (ධම්මපදට්ඨ කථා.)

4. "අද්දසා ඛො අඤ්ඤතරො උපාසකො තං භික්ඛුං කීටාගිරිස්මිං පිණ්ඩාය චරන්තං දිස්වාන..... තං භික්ඛුං අභිවාදෙත්වා එතදවොච අපි භන්තෙ පිණ්ඩො ලබ්භතීති." (චුල්ලවග්ගපාළි)

5. කච්ඡපො හංසෙහි නීයමානො දට්ඨට්ඨානතො දණ්ඩකං විස්සජ්ජෙත්වා ආකාසඞ්ගණෙ පතිත්වා ද්වෙධා භිජ්ජි.

6. "අථෙ'කො මක්කටො තත්‍ථ තත්‍ථ ගොචරං පරියෙසමානො ඵලවන්තං තං රුක්ඛං ආරුය්හ ඵලානි ඛාදන්තො තස්මිං පාසෙ පාදෙන බජ්ඣි" (රසවාහිනී.)

7. "එවජ කිර'ස්ස අහොසි සඬා තාව ධම්මං සොතුකාමා ගමිස්සන්ති යෙව: අස්සද්ධාපි පන ධනලොභෙන ගන්ත්වා ධම්මං සුත්වා දුක්ඛා මුච්චිස්සන්ති"ති. (ධම්මපදට්ඨකථා)

8. "එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපති භගවා එතදවොච: අපි නු තෙ ගහපතිකුලෙ දානං දීයතීති." (අඞ්ගුත්තර)

9. "දීඝස්ස අද්ධුනො අච්චයෙන තස්ස මහානිරයස්ස පුරත්‍ථිමං ද්වාරං අවාපුරීයති; සො තත්‍ථ සීඝෙන ජවෙන ධාවති: තස්ස සීඝෙන ජවෙන ධාවතො ඡවිපි ඩය්හති, චම්මම්පි ඩය්හති, මංසම්පි ඩය්හති" (මජ්ඣිම නිකාය)

10. මධුවා මඤ්ඤති බාලො යාව පාපං න පච්චති:
යදා ච පච්චති පාපං අථ බාලො දුක්ඛං නිගච්ඡති. (ධම්මපද)

මෙහි අමුතු වචන

අද්ධා = දීර්ඝකාලය. පු. (අද්ධුනො චතුත්ථී එකවචනයි.)
අවාපූරීයති = විවෘතවේ
අහාසි = බලාත්කාරයෙන් හෝ සොරකමින්) ගෙන ගියේ ය.
කීටාගිරි = ගමක නමක්. පු.
ගොචර = ආහාරය, ගොදුර. පු.
ජව = වේගය. පු.
ඩය්හති = දැවේ
තුත්ත = ඇතාගේ කන්මුලට විදින කටුව. න.
නිගච්ඡති = පැමිණේ: ලබයි.
පරියෙසමාන = සොයන, සොයමින්. 3.
පාචන = (පාජන) = කෙවිට. න.
පාස = පුඩුව: මළපුඩුව. ප.
බජ්ඣතං = බැඳේවා
භිජ්ජි = බිඳුණේය, කැඩී ගියේ ය.
මක්කට = වඳුරා. පු.
විස්සජ්ජෙත්වා = අතහැර. පූ. ක්‍රි.
වුය්හති = පාවේ; දරනු ලැබේ
සන්තක = අයිති දෙය. න.
සමිතත්ත = සංසිඳුණු බව. න.
හඤ්ඤති = නසනු ලැබේ: වෙහෙසේ

පාලියට නැඟිය යුතු :

1. කපටියෝ කිසිවකු විසින් ප්‍රිය කරනු නොලැබෙත්. ඔවුහු සියල්ලන් විසින් දුරු කරනු ලැබෙත්. 2. මහානරකයේ දෙර ඇරුණු විට නිරයවාසීහු එතැනට ඉක්මනින් දුවත්; එසේ දුවන විට ඔවුන්ගේ සම් ද මස් ද දැවෙති.

3. "ගෘහපතිය, දැනුත් ඔබගේ ගෙයි දන් දෙනු ලැබේ දැ" යි බුදුරට සිටාණන්ගෙන් විචාළේ ය. 4. සිටුහු විසින් "ශ්‍රද්ධා නැත්තෝත් ධන ලෝභයෙන් අවුත් බණ අසා දුකින් මිදෙන්නාහ" යි සිතා බුදුරදුන් වසන ගෙයි සත්රුවන් විසුරුවන ලදි. 5. අපගේ අසල්වැසියා ඔහුගේ දුෂ්ට ක්‍රියාවන් නිසා සියලු මිතුරන් විසින් වර්ජනය කරන ලදුයි අසන්ට ලැබේ. 6. කුමාරතෙමේ ඔහුගේ සියලු ගමන්වලදී ආචාර්‍යවරුන් විසින් ද ඇමතියන් විසින් ද ආරක්ෂකයන් විසින් ද පිරිවරනු ලැබේ. 7. මගියා තනි වූ බැවිනුත් ඔහු අතේ ආයුධ නොතිබුණු බැවිනුත් සොරුන් විසින් පහර දෙන ලද්දේ ද පැහැර ගන්නා ලද්දේ ද විය.

8. යුද්ධ භූමියෙහිදී බොහෝ අශ්වයෝ ද භටයෝ ද මරණ ලදහ. සේනාපතියා විසින් අණකරන ලද මිනිසුන් විසින් එම මළ සිරුරු වළලන ලදහ.

9. බෝසත් කුමරා ඇතැම් කිරිමවුන් විසින් කිරි පොවනු ලැබේ: ඇතැමුන් විසින් නාවනු ලැබේ. ඇතැමුන් විසින් නිදිකරවනු ලැබේ. සියල්ලන් විසින් රකිනු ලැබේ.

10. රජු විසින් රටවැසියෝ පාලනය කරනු ලැබෙත්: රටවැසියන් විසින් ධාන්‍ය උපදවනු ලැබේ. ඒ ධාන්‍ය වෙළඳුන් විසින් විකුණනු ලැබේ. සියල්ලන් විසින් එය අනුභව කරනු ලැබේ.

මෙහි අමුතු වචන

අසල්වැසියා = පටිවිස්සක. පු.
ඇරුණු = විවට. 3.
උපදවනු ලැබේ = උප්පාදීයති.
කපටියා = සඨ, වඤ්චක. පු.
කිරීමව = ධාති. ඉ.
තනි වූ = එකකි. 3.
දුරු කරනු ලැබේ = වජ්ජියිත
දුෂ්ට ක්‍රියාව = දුච්චරිත. න.
නාවනුලැබේ = නහාපීයති
නොතිබුණු බැවින් = අවිජ්ජමා-
නත්තා
පහරදෙන ලද = පහට. 3.
පිරිවරනු ලැ බේ = පරිවාරීයති.
පැහැරගන්නා ලද = අච්ඡින්න. 3.
ප්‍රියකරනු ලැබේ = පියායීයති
මළසිරුර = මතකලෙබර. න.
වර්ජනය කරන ලද = වජ්ජිත. 3.
වළලන ලදි = නිබණිියි
විසුරුවන ලදි = විප්පකිරීයි

හෙත්වර්ථ පද

110. පළමු පොතෙහි දැක්වූ හෙත්වර්ථ ප්‍රත්‍යයන් අතුරෙන් එ, අය දෙක පමණක් උ - ඌ කාරාන්ත ධාතූන් කෙරෙන් යොදනු ලැබේ. අ - කාරාන්ත ධාතූන් කෙරෙන් ආපෙ, ආපය දෙදෙන පමණක් යොදනු ලැබේ. අන්‍ය ධාතූන් කෙරෙන් සතර ම යෙදිය හැක.

111. කර්මකාරකයෙහි මේ ප්‍රත්‍යයන් යෙදෙන විට ඊට මුලින් ඊ - කාරයක් සහිත ය - ප්‍රත්‍යය යෙදිය යුතුයි. උදාහරණ :-

හෙඤ්ඣර්ථ-කර්තෘකාරක - හාරාපෙති (=ගෙනයන්ට සලස්වයි.)
හෙඤ්ඣර්ථ-කර්මකාරක - හාරාපීයති (=ගෙනයන්ට සලස්වනු ලැබේ.)

112. මේ හෙඤ්ඣර්ථ ප්‍රත්‍යයෝ ක්‍රියාපදයන්හි පමණක් යෙදෙන්නාහු නොවෙත්: පූර්වක්‍රියා, කිතක පද, තු - ප්‍රත්‍යායාන්ත ශබ්ද යන මොවුන් කෙරෙහි ද යෙදෙත්.

කර + ආපෙ + ත්වා = කාරාපෙත්වා (= කරවා)
භුජ + ආපෙ + ත්වා = භොජාපෙත්වා (= අනුභව කරවා)

කිතක පද

පච + ඒ + න්ත = පාචෙන්ත (= පිසවන)
කර + ඒ + න්ත = කාරෙන්ත (= කරවන)
ද + ආපෙ + තු = දාපෙතු (= දෙවන්නා)
ගහ + ආපෙ + තු = ගාහාපෙතු (= ගන්වන්නා.)

තුං - ප්‍රත්‍යයාන්තයෝ

මර + ආපෙ + තුං = මාරාපෙතුං (= මරවන්ට)
ගහ + ආපෙ + තුං = ගාහාපෙතුං (= ගන්වන්ට)

113. සකර්මක ධාතුවකින් හෙඤ්ඣර්ථ පදයක් සැදුණු විට ඒ පදය කර්ම එකකට වඩා ගනී. එසේ කර්ම දෙකක් ගත්විට ඉන් එකක් ප්‍රධාන කර්ම යයි ද අනික අප්‍රධාන කර්ම යයි ද කියනු ලැබේ.

"පුරිසෝ කම්මකාරං රුක්ඛං ඡින්දාපෙති."

යන තැන 'කම්මකාරං, රුක්ඛං' යි කර්ම දෙකකි. මෙහි ගස කපාගැනීම ඕනෑකම බැවින් 'රුක්ඛං' ප්‍රධාන කර්මයයි; අනික අප්‍රධාන කර්මයයි.

114. මේ අප්‍රධාන කර්මය නොයෙක් විට කරණ විභක්තියෙන් සිටී. "ගහපතානී දාසියා ඔදනං පාචාපෙති"

යන තන්හි 'දාසියා' යන්න කරණ විභක්තියෙන් සිටී. මෙම 'දාසි' යි කර්මවිභක්තියෙන් යෙදුවත් ඒ අර්ථයම ලැබේ.

115. ශුද්ධ ක්‍රියා පදයකින් යුත් වාක්‍යයක කර්තෘව සිටි පදය හෙඤ්චර්ථ පදයකින් යුක්ත වූ වාක්‍යයකදී අප්‍රධාන කර්මය විය හැක. "සූදෙ ඔදනං පචති." යන තන්හි 'සූදෙ' කර්තෘ පදයයි. ඒ වාක්‍යය 'සූදජෙට්ඨො සූදං ඔදනං පාචෙති' යි හෙඤ්චර්ථයෙහි යෙදූ විට (පළමු වාක්‍යයෙහි) කර්තෘව සිටි පදය අප්‍රධාන කර්මය බවට පැමිණේ. මෙය 'සූදජෙට්ඨො සූදෙන ඔදනං පාචෙති" යි ද යෙදිය හැක.

අභ්‍යාසය 21
සිංහලට නැඟිය යුතු

1. "රාජා පසන්නො අපරාතිපි පඤ්ච - චක්ඛසතානි ආහරාපෙත්වා පාදමූලෙ ඨපාපෙසි" (ධම්මපදට්ඨ කථා) 2. රාජා තෙ සබ්බෙ ගාහාපෙත්වා..... ආවාටෙ බණාපෙත්වා තෙ තත්ථ නිසීදාපෙත්වා උපරිපලාලං විකිරාපෙත්වා අග්ගිං දාපෙසි." (උදෙනවත්ථු)

3. "පඤ්චසත - තාපසෙ හිමවන්තතො ආගන්ත්වා නගරෙ භික්ඛාය චරන්තෙ දිස්වා පසීදිත්වා නිසීදාපෙත්වා භොජෙත්වා පටිඤ්ඤං ගහෙත්වා චත්තාරො මාසෙ අත්තනො සන්තිකෙ වසාපෙත්වා.....උය්‍යොජෙසුං." (එම)

4. "දහරකාලතො පට්ඨාය හි තං මාරාපෙතුං වායමන්තොව සෙට්ඨී මාරාපෙතුං නාසක්ඛි: කිං අක්ඛරසමයං සික්ඛාපෙස්සති?" (එම)

5. "ගාමමජ්ඣෙ වුත්තප්පකාරං ගෙහං කාරෙත්වා ගාමසතකො පණ්ණාකාරං ආහරාපෙත්වා ජනපදසෙට්ඨිනො ධීතරං ආහරිත්වා මඞ්ගලං කත්වා සෙට්ඨිස්ස සාසනං පහිණි." (එම)

6. "තස්ස හෙට්ඨාභාගං සොධාපෙත්වා පාකාරපරික්ඛෙපං කාරාපෙත්වා වාලිකං ඔකිරාපෙත්වා ධජ - පතාකං උස්සාපෙත්වා වනප්පතිං අලංකරිත්වා..... පත්ථනං කත්වා පක්කාමි." (චක්ඛුපාල වත්ථු)

7. "තෙන ඛො පන සමයෙන ආයස්මතො සාරිපුත්තස්ස උපට්ඨාකකුලං ආයස්මතො සාරිපුත්තස්ස සන්තිකෙ දරකං පාහෙසි. "ඉමං දරකං ථෙරො පබ්බාජෙතූ"ති (විනය මහාවග්ග)

8. "සචෙ වො ධනෙන අත්ථො බ්‍රිප්පං මං බන්ධනා මොචෙත්වා සීසං නහාපෙත්වා අහත - වත්ථානි අච්ඡාදෙත්වා ගන්ධෙහි විලිම්පා පෙත්වා පුප්ඵානින පිලන්ධාපෙත්වා ඨපෙථාති." (වෙදබ්භ ජාතක)

9. "සක්කො දෙවරාජා 'කිං නො සාධාරණෙන රජ්ජෙනා'ති අසුරෙ දිබ්බපානං පායෙත්වා මත්තෙ සමානෙ පාදෙසු ගහෙත්වා සිනෙරුපපාතෙ බ්‍රිපාපෙසි." (කුලාවක ජාතකය)

10. 'රාජා පඤ්චසතෙ නග්ගසමණකෙ ගාහාපෙත්වා.....ආවාටෙසු නිඛණාපෙත්වා පලාලෙහි පටිච්ඡාදෙත්වා අග්ගිං දෙපෙසි." (ධම්මපදට්ඨකථා)

මෙහි අමුතු වචන

අක්ඛරසමය = අකුරු ශාස්ත්‍රය, කියවීමේ හා ලිවීමේ අභ්‍යාසය. පු.
අහත = අලුත්, පොඩිනොවූ. 3.
ආහරපෙත්වා = ගෙන්වා. පූ. ක්‍රි.
උය්‍යොජෙසි = පිටත්කෙළේය.
ඔකිරාපෙත්වා = විසිරුවවා, පූ. ක්‍රි.
දහර = තරුණ, බාල. 3.
නග්ග = නිවීස්ත්‍ර. 3.
නිඛණාපෙත්වා = වලවල පිහිටුවන්ට සලස්වා. පූ. ක්‍රි.
පටිඤ්ඤූ = පොරොන්දුව. ඉ.
පණ්ණාකාර = පඬුර, තෑග්ග. පු.
පත්ථනා = ප්‍රාර්ථනාව. ඉ.
පබ්බාජෙති = පැවිදි කරවයි.
පරික්ඛෙප = වටකිරීම. පු.
පලාල = පිදුරු. න. පු.
පායෙත්වා = පොවා. පූ. ක්‍රි.
බන්ධන = බැම්ම. න.
මඞ්ගල = (විවාහාදී) මඟුල. න.
මොචෙත්වා = මුදා: නිදහස් කොට. පූ. ක්‍රි.
වනප්පති = මල්නැතිව ගෙඩි හට ගන්වන ගස. පු.
වායමන්ත = උත්සාහ කරන. 3.
විලිම්පාපෙත්වා = ආලේප කරවා. පූ. ක්‍රි.
විකිරාපෙත්වා = විසුරුවන්ට සලස්වා. පූ. ක්‍රි.
වුත්තප්පකාර = කී ආකාර ඇති. 3.
සාධාරණ = විශේෂනොවූ. 3.
සොධාපෙත්වා = ශුද්ධ කරවා. පූ.ක්‍රි.

පාලියට නැඟිය යුතු.

1. එරට රජතෙමේ තෙරුන් පිරිනිවි තැන ශුද්ධ කරවා උළු වඩුවන්[1] ගෙන්වා මහා චෛත්‍යයක් බැන්දවිය.

2. හෙතෙමේ රන්මිල දශලක්ෂයක වියදමෙන් බොහෝ කම්කරුවන් ලවා මහා ප්‍රාසාදයක් ගොඩනංවා එහි භික්ෂූන් වාසය කරවිය.

3. කොසඹෑ සිටුතෙම සෝෂක කුමරු මරවන්ට කීපවරක් උත්සාහ කළ නමුත් මරවන්ට නොහැකි විය. සෝෂකගේ භායර්‍යාව නුවණින් පිළිපැද ඔහු සිටුතනතුරට පැමිණවිය.

4. "ඉඳින් රාජ්‍යය ලබනු කැමති නම් දෙමළුන් හා යුද කොට ඔවුන් පලවා හරිනු මැනවැ"යි රජතෙමේ කැරලිකාර බමුණාට කියෙව්වේ ය.

5. දේවදත්ත ස්ථවිරතෙමේ අජාසත් කුමරු තමා කෙරෙහි පහදවා බුදුන් මැරීමට මිනිසුන් යෙදෙව්වේ යඃ කුමරු ලවා ඔහුගේ පියා හිංසාකරවා මැරෙව්වේ ය.

6. ගෘහපතියා කම්කරුවන් විසි දෙනකුන් ලවා ගොනුන් දශදෙනකුන් ගෙන්වා කුඹුරු සතරක් සීසාවා වපුරවා වැටවල් බැන්දෙව්වේ ය.

7. දෘසයන් ලවා වැඩ කරවීමට ගිය මිනිසා වනයෙහි වැවක් සාරවා එය අවට කුඹුරු ශුද්ධ කරවා ඔවුන් ලවා ගස් කප්පවා ඒවා මාර්ගය සමීපයට ඇද්දෙව්වේ ය.

8. බිම්බිසාර රජ පස්යොදුන් පමණ මග සමකරවා වැලි අතුරුවා මල් විසුරුවා ධ්වජයන් නංවා අලංකාර කරවිය.

9. උදේන රජ මාගන්දියගේ නෑයන් රැස් කරවා ඔවුන්ගේ හිස් සින්දවා මරවා උඩින් පිදුරු දමා දවන්ට සැලැස්වීය.

10. ධර්මාශෝක මහරජ බෞද්ධ භික්ෂු පිරිසක් මෙරටට එවා මෙරට

[1] මේසෙන් වැඩ කරන්නායි.

වැසියන් බෞඩයන් කරවිය. ඒ රජ දේවානම්පිය තිස්සරජු දෙවැනි වරටත් අභිෂේක කරවිය.

මෙහි අමුතු වචන :-

අද්දවයි = ආකඩ්ඪාපෙති.
අතුරුවවා = සන්ථරාපෙත්වා. පූ. ක්‍රි.
ඇතුළු කරවයි = පවෙසෙති
උළුවඩුවා = ඉට්ඨකවඩ්ඪකී. පු.
එවා = පෙසෙත්වා. පූ. ක්‍රි.
කියෙව්වේ ය = කථාපෙසි.
කැරලිකාර = දුම්රික. 3.
දවන්ට සලස්වයි = දහාපෙති.
නංවා = උස්සාපෙත්වා. පූ.ක්‍රි.
පමණ = මත්ත. 3.
පලවාහරියි = පලාපෙති.
පැමිණවිය = පාපෙසි.
පිරිනිවිතැන = පරිනිබ්බුතට්ඨාන. න.
පිළිපැද = පටිපජ්ජිත්වා. පූ. ක්‍රි.
බන්දවයි (චෛත්‍යය) = චිණා පෙති: (වැට) බන්ධාපෙති.
යෙදෙව්වේය = යොජාපෙසි.
ලබනු කැමති = ලභිතුකාම. 3.
වපුරවා = වපාපෙත්වා. පූ.ක්‍රි.
වාසය කරවිය = වසාපෙසි.
වැට = වති. ඉ.
සමකරවා = සමං කාරෙත්වා
සාරවා = බණාපෙත්වා. පූ. ක්‍රි.
හිංසාකරවා = හිංසාපෙත්වා. පූ.ක්‍රි.

කිතක පද

116. ධාතුවකින් (යම්කිසි අර්ථයක) ප්‍රත්‍යයක් කොට සෑදූ නාමය කිතක නම් වේ.

තද්ධිත - කිතක දෙදෙනාගේ වෙනස නම් : තද්ධිතය නාමයකින් ප්‍රත්‍යයක් වී සෑදුණු අන්‍ය නාමයකි. කිතකය ධාතුවකින් ප්‍රත්‍යයක් වී සෑදුණු නාමයකි. කිතක නාමයකින් තද්ධිත ප්‍රත්‍යයක් කොට එය තද්ධිත නාමයක් කළ හැක. දයක-යන කිතක පදයෙන් භාවාර්ථයෙහි ත්ත-ප්‍රත්‍යය කොට 'දයකත්ත' (= දයක බව) යි සෑදූ විට එය තද්ධිත නාමයක් වේ. තද්ධිත නාමයක් කිතක නාමයක් කරන්ට නොහැකි බව සැලකිය යුතු.

117. කිතක ප්‍රත්‍යයෝ (1) කිච්ච, (2) කින් යන දෙකොටසකට බෙදන ලදහ. (කිච්චප්‍රත්‍යයෝ ස්වල්ප දෙනෙකි. කිත් ප්‍රත්‍යයෝ බොහෝ දෙනෙකි.)

(1) කිච්චප්‍රත්‍යයෝ නම් තබ්බ, අනීය, ණ්‍ය, ණිය, තය්‍ය, ඉච්ච යන මොහුයි. මොවුහු භාව - කර්මදෙක්හි පමණක් වෙති. අකර්මධාතූන් කෙරෙන් භාවාර්ථයෙහි පමණක් ද සකර්මකධාතූන් කෙරෙන් ඒ අර්ථ දෙකෙහි ම ද වෙති. මොවුන්ට කාලවිශේෂයක් නැත.

කිච්චප්‍රත්‍යයෝ

118. සියලු ධාතූන් කෙරෙන් භාවාර්ථ - කර්මාර්ථ දෙක්හි තබ්බ, අනීය - ප්‍රත්‍යයෝ වෙති. මොවුහු යුතු = යෝග්‍ය යන අර්ථය ප්‍රකාශ කරත්.

A. කර (කිරීමෙහි) + තබ්බ = කාතබ්බ හෝ කත්තබ්බ
(= කළයුතු හෝ කළයුත්ත)
කර + අනීය = කරණීය (= කළයුතු හෝ කළයුත්ත.)
සු (ශ්‍රවණයෙහි) + තබ්බ = සොතබ්බ (= ඇසිය යුතු)
සු + අනීය = සවණීය (= ඇසිය යුතු)

පළමු උදාහරණයෙහි තබ්බ - පරකල්හි කර - ධාතුවට කා - ආදේශ වේ. දෙවෙනි තැන්හි ධාඤන්ත අ - කාරය ලොප් වූ පසු ර් - කාරයට ත් - ආදේශ වේ.

සොතබ්බ - යන තැන සු - ධාතුවේ උ - කාරයට වෘධි වේ. සිවුවැන්නෙහි වෘධිය වූ පසු ඔ - කාරයට අව - ආදේශ වේ.

කරණීය - සවණීය - යන දෙතැන්හි ප්‍රත්‍යය අනීය වුවත් ධාතුව හා එක්වූ පසු "රකාර - හකාරාදීන් කෙරෙන් පරවූ න - කාරයට ණ - කාර වේ." යන නියමයෙන් ණ - කාරාදේශ වේ.

B. ගමු (යාමෙහි) + තබ්බ = ගන්තබ්බ හෝ ගමිතබ්බ = යායුතු
ගහ (ගැනීමෙහි) + තබ්බ + ගහෙතබ්බ හෝ ගණ්හිතබ්බ (= ගතයුතු)

මෙහි පළමු උදාහරණයෙහි ධාඤන්තය ලොප් කළ පසු ම් - කාරයට න් - කාරයක් වේ. දෙවෙනි තැන ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරෙහි ඉ - කාරාගමයක් වේ. මේ ඉකාරාගමය පචිතබ්බ, හරිතබ්බ ආදි අන්‍ය බොහෝ තැන්වල ද යෙදේ.

ගහෙතබ්බ යන තැන ධාතු - ප්‍රත්‍යයන් අතරෙහි වූ ඉකාරාගමයට එකාරාදේශ වේ. **ගණ්හිතබ්බ** යන්න ආඛ්‍යාතයෙහි කී සේ විකරණය වූ ණා ප්‍රත්‍යය යෙදූ පසු (ගහ් + ණා + තබ්බ යින සිටි තැන) හ - කාර ණ - කාර පෙරැළිය වී 'ගණ්හාතබ්බ' යි සිටි විට ඉකාරාගමය වී ආකාරය ලොප්වීමෙන් සිද්ධයි.

කත්තබ්බො කම්මන්තො (= කළ යුතු කර්මාන්තය)
කත්තබ්බා පූජා (= කළ යුතු පූජාව)
රක්ඛිතබ්බං සීලං (= රැක්ක යුතු ශීලය)

ආදි වශයෙන් මේ පදයන් තුන් ලිඟුවෙහිත් අතීතාදි කාල තුනෙහිත් යෙදෙන බව සැලකිය යුතු.

119. ඇතැම් ධාතූන් කෙරෙන් භාවාථ - කම්මාථයන්හි ණ්‍ය - ණිය යන ප්‍රත්‍යයෝ වෙති. මෙහි ණ් - කාරය වෘද්ධිය පිණිසයි.

ධාතුවකින් ණ්‍ය - ප්‍රත්‍යය යෙදුණු විට ධාත්වන්තස්වරය හා ණ් - කාරය ලොප් වී ය - කාරය ධාත්වන්ත ව්‍යඤ්ජනය සමග බැඳුණු විට ඒ ය - කාර සහිත ව්‍යඤ්ජනය විකාරයට (වෙනස් ආකාරයකට) පැමිණේ.

වෙනස් වන සැටි මෙසේයි.

ද්‍ය	සංයෝගය	ජ්ජ - බවට පැමිණේ
ම්‍ය	සංයෝගය	ම්ම - බවට පැමිණේ
ජ්‍ය	සංයෝගය	ජ්ජ - බවට පැමිණේ
ග්‍ය	සංයෝගය	ග්ග - බවට පැමිණේ
ච්‍ය (හෝ ක්‍ය	”	ච්ච - බවට පැමිණේ

වද (කීමෙහි) + ණ්‍ය = වද්‍ය - වජ්ජ (= කියයුතු දෙය: දෝෂය)
ගමු(අවබෝධයෙහි) + ණ්‍ය = ගම්‍ය - ගම්ම (= අවබෝධ කටයුතු)

යුජ (යෙදීමෙහි) + ණ්‍ය = යොග්‍යං = යොග්ග (= යෙදිය යුතු)
භුජ (අනුභවයෙහි) + ණ්‍ය = භොජ - භොජ්ජ හෝ භොග්ග
(= අනුභව කටයුතු)

වච (කීමෙහි) + ණ්‍ය = වාච්‍ය - වාක්‍ය (= කියයුතු දෙය, වාක්‍යය)

බාද (කෑමෙහි) + ණ්‍ය = බාද්‍ය - බජ්ජ (= කැවිලි, කෑයුතු දෙය)

B. හකාරාන්ත ධාතූන් කෙරෙන් ණ්‍ය - ප්‍රත්‍යය වූ විට ප්‍රත්‍යයේ ය - කාරයත් ධාතුවේ හ - කාරයත් මාරුවෙති.

ගහ + ණ්‍ය = ගහ්‍ය - ගය්හ (= ගතයුතු)
ගරහ (ගර්හාවෙහි) + ණ්‍ය = ගාරහය = ගාරය්හ (= ගර්හා කටයුතු)

ආ - ඉ - ඊ අන්ත වූ ධාතූන් කෙරෙන් පර වූ ණ්‍ය - ප්‍රත්‍යයට එය්‍ය - ආදේශ වේ.

ද + එය්‍ය = දෙය්‍ය (= දිය යුතු)
පා + එය්‍ය = පෙය්‍ය (= බිය යුතු)
ජි + එය්‍ය = ජෙය්‍ය (= දිනිය යුතු)
නී + එය්‍ය = නෙය්‍ය (=ගෙනයා යුතු හෝ අවබෝධ කළ යුතු)
ඤු + එය්‍ය = ඤෙය්‍ය (= දත යුතු)
කර + ණිය = කාරිය (= කළ යුතු, කෘත්‍යය)
හර + ණිය = හාරිය (= ගෙන යා යුතු)
මර + ණිය = මාරිය (= මැරිය යුතු.)

120. ඉච්ච, තය්‍ය යන ප්‍රත්‍යයෝ ධාතූන් කීපදෙනෙකුන් කෙරෙන් පමණක් වෙති.

කර + ඉච්ච - කිච්ච (= කටයුත්ත)
මෙහි ධාඃඛන්ත ර - කාරය ලොප් වේ.
ඤු + තය්‍ය = ඤුතය්‍ය (= දත යුතු)
පද (යාමෙහි) + තය්‍ය =පත්තය්‍ය (= පැමිණිය යුතු)
ධාඃඛන්තයට ත් - කාරාදේශ වේ.
දිස + තය්‍ය = දට්ඨය්‍ය (= දැක්ක යුතු) ප්‍රත්‍යයේ තකාරය සමග දිස - හට දට්ඨාදේශ වේ.)

121. මෙහි දැක්වූ කිච්ච ප්‍රත්‍යයන් කමී - භාවකාරකයන්හි පමණක් වන බැවින් ඒවායින් සිද්ධ වූ පදයන් සමග උක්ත කතෘ නොයෙදේ. ඒවා හා යෙදෙන කතෘපදය තතියාවෙන් සිටිය යුතුයි.

"අම්හෙහි පුඤ්ඤං කාතබ්බං" (= අප විසින් පින කළ යුතු ය.) යි මිස "අම්හෙ පුඤ්ඤං කාතබ්බං" (අපි පින කළ යුතු ය) යි නොයෙදිය හැක. මතු අභ්‍යාසයෙහි පෙනෙන නිදර්ශනවලින් මෙය ප්‍රකටව පෙනෙනවා ඇත.

122. කිතක පදයන්ගේ විශේෂ පැවැත්මක් නම් 'අම්හෙහි ඛෙත්තං කසිතබ්බං, සො ගාමං ගතො' ආදී වශයෙන් අවසාන ක්‍රියාවක් නොගෙන සිටීමයි. වාක්‍යයක් සම්පූර්ණ වීමට ක්‍රියාවක් තිබිය යුතුම ය. කිතකය නාමයක් බැවින් මේ දැක්වූ වාක්‍ය දෙකෙහි ම ක්‍රියාවක් නැති හෙයන් වාක්‍යයෝ පරිපූර්ණ නො වෙති. එබැවින් මේවා සම්පූර්ණ කිරීම පිණිස 'හොති' යන ක්‍රියාපදය යෙදිය යුතුයි. එවිට

අම්හෙහි ඛෙත්තං කසිතබ්බං හොති (= අප විසින් කෙත සී සෑ යුතු වේ.)

සො ගාමං ගතො හොති (හෙතෙම ගමට ගියේ වේ.) යි සම්පූර්ණ වාක්‍ය ලැබෙත්. නමුත් අවසාන ක්‍රියාව නොයොදා කිතක පදයෙන් පමණක් යුක්තකළ වාක්‍ය පාලියේ නොයෙක් තැන දක්නා ලැබෙන බැවින් එසේ තැබීම භාෂා රීතියට විරුද්ධ නොවේ. එසේ සිටි විට 'අප විසින් කෙත සී සෑ යුතු ය, හෙතෙම ගමට ගියේය, යි සිංහලෙන් ද අවසාන ක්‍රියාව නැතිව අර්ථ දිය හැක.)

කත්තබ්බා පූජා (= කළ යුතු වූ පූජාව)
පූජා කත්තබ්බා (= පූජාව කළ යුතු ය)

යන දෙයාකාර පැවැත්මක් ද කිතක පදයන්ට ඇති බව සැලකිය යුතු.

අභ්‍යාසය 22

සිංහලට නඟා කිතක පද පෙන්විය යුතු.

1. ඛජ්ජ - භොජ්ජ - ලෙය්‍ය - පෙය්‍ය වසෙන චතුබ්බිධා හොන්ති මනුස්සානං ආහාරා. 2. "සචෙ මෙ ගතට්ඨානෙ ධීතු දෙසො උප්පජ්ජති, තුම්හෙහි සොධෙතබ්බො" (ධ. අ. විසාඛාවත්ථු.)

3. "පතිකුලෙ වසන්තියා නාම අන්තො අග්ගි බහි න නීහරි තබ්බො, බහි අග්ගි අන්තො න පවෙසෙතබ්බො, දදන්තස්සෙ'ව දාතබ්බං, අදදන්තස්ස න දාතබ්බං, සුඛං භුඤ්ජිතබ්බං, සුඛං නිපජ්ජිතබ්බං" (එම)

4. සුදස්සං වජ්ජං අඤ්ඤෙසං
අත්තනො පන දුද්දසං" (ධම්මපද)

5. "කාලස්සෙ'ව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා..... දන්තකට්ඨං දාතබ්බං, මුඛොදකං දාතබ්බං, ආසනං පඤ්ඤාපෙතබ්බං" (විනය මහාවග්ග) 6. "සචෙ යාගු හොති, භාජනං ධොවිත්වා යාගු උපනෙතබ්බා, යාගුං පීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා..... ධොවිත්වා පවිසාමෙතබ්බං." (එම) 7. "උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං, නාතිදූරෙ ගන්තබ්බං, පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං." (එම) 8. "සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති, චුණ්ණං සන්නෙතබ්බං, මත්තිකා තෙමෙතබ්බා, චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. (එම) 9. "නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමි" (චතුක්කඞ්ගුත්තර)

10. "පුඤ්ඤමාකඞ්ඛමානෙන
දෙය්‍යං හොති විජානතා" (දෙවතාසංයුත්ත)

11. තං සුත්වා ඉතරො "භාරියං වත මෙ සාහසිකං අනනුච්ඡවිකං කම්මං කත"න්ති බාහා පග්ගය්හ කන්දන්තො..... අහොසි. (ධම්මපදට්ඨ කථා) 12. මහාසමුද්දෙ අසංඛෙය්‍යා මච්ඡකච්ඡපා, අප්පමෙය්‍යා උදකරාසි, අගය්හානි බහූනි රතනානි ච සන්ති.

මෙහි අමුතු වචන

අගය්හ = නොගත හැකි. 3.
අන්ත = කෙළවර. පු.
අනනුච්ඡවික = නුසුදුසු. 3.
අප්පමෙය්‍ය = මැණිය නොහැකි. 3.
අපෙය්‍ය = නොබිය හැකි
අසංඛෙය්‍ය = ගණන්ගත නොහැකි. 3.
ආකඞ්ඛමාන = කැමති වන, බලාපොරොත්තු වන.3.
උපජ්ඣාය = අවවාද දෙන ගුරුවරයා. පු.
උපනෙතබ්බ = ළඟට පැමිණ විය යුතු. 3.
උපාහන = වහන්: සෙරෙප්පුව. පු.
ගමන = යාම. න.
චතුබ්බිධ = සතරාකාර, සිවු වැදෑරුම්. 3.
චුණ්ණ = (නැමට ඕනෑ) කුඩු
ජන්තාඝර = ගිනිහල් ගෙය. න.
තෙමෙතබ්බ = තෙමිය යුතු. 3.
දන්තකට්ඨ = දෑහැටි. න.
දුද්දස = දැකීමට අපහසු. 3.
දෙස = වරද. පු.
නාච්චාසන්න = ඉතා ළං නොවූ. 3.
නික්බිපිතබ්බ = තැබිය යුතු. දැමිය යුතු. 3.
නිපජ්ජිතබ්බ = නිදිය යුතු. 3.
නිසීදිතබ්බ = හින්ද යුතු. 3.
නීහරිතබ්බ = පිටත ගෙනයා යුතු. 3.
පච්ඡාසමණ = පස්සෙන් යන ශ්‍රමණයා. පු.
පඤ්ඤුපෙතබ්බ = පිළියෙළ කළ යුතු. 3.
පටිසාමෙතබ්බ = තැන්පත් කළ යුතු. 3.
පතිකුල = ස්වාමිපුරුෂයාගේ ගෙය. න.
පත්තපරියාපන්න = පාත්‍රයෙහි වූ දෙය. න.
පවිසිතුකාම = ඇතුළුවෙනු කැමති. 3.
පවෙසෙතබ්බ = ඇතුල්කට යුතු. 3.
පීත = බොන ලද. 3.
භාරිය = බැරෑරුම. 3.
භුඤ්ජිතබ්බා = අනුභව කළ යුතු. 3.
මුඛොදක = මූණ සේදීමට දිය. න.
විජානන්ත = දන්නා වූ. 3.
සනෙනබ්බ = අනා මිශ්‍රකළ යුතු. 3.
සාහසික = දරුණු, ඉක්මන් ගති ඇති. 3.
සුදස්ස = පහසුවෙන් දැක්ක හැකි. 3.
සොධෙතබ්බ = ශුද්ධ කටයුතු, පරීක්ෂා කළ යුතු. 3
හොතබ්බ = විය යුතු. 3.

කිතක පද යුක්ත කොට පාලියට නැඟිය යුතු.

1. අප විසින් දන් දිය යුතුයි, අකුසල් නොකටයුතුයි. මෛත්‍රිය වැඩිය යුතුයි. 2. දූ පුතුන් විසින් මවුපියෝ වැන්ද යුත්තාහු ද පෝෂණ කළ යුත්තෝ ද වෙති. 3. සවීඥතෙමේ දෙව් මිනිස් ආදීන් විසින් සත්කාර කටයුත්තේ ගරු කටයුත්තේ බුහුමන් කළ යුත්තේ වෙයි. 4. දශ දිනකින් කළ යුතු වැඩය ඔහු විසින් සය දිනකින් කරන ලදි.

5. ගර්හාකටයුතු වචන නොකිය යුතුයයි ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට අවවාද දිය යුතු ය. 6. ශිෂ්‍යයා විසින් ගුරුවරයාට සිහිල් පැන් උණු පැන් දිය යුතුය. ආසනය පැනවිය යුතු ය, පවන් සැලිය යුතු ය. 7. ඔහු වසන ගෙය ඇමදිය යුතු ය, කසළ ඉවත් කළ යුතු ය, ඇඳපුටු ශුද්ධ කළ යුත්තාහ. 8. දරුවන් විසින් මවුපියවරු ද සැමියන් විසින් අඹුදරුවෝ ද පෝෂණය කළ යුත්තාහ. 9. ගෘහපතියා විසින් දසයන් ලවා ඔවුන්ගේ ශක්තියට අනුරූප ලෙස කර්‍මාන්ත කරවිය යුත්තාහ.

10. ගොවියා විසින් පළමු කොට කුඹුර සී සෑ යුතු ය. ඉන්පසු වැපිරිය යුතු ය, ජලය පැමිණවිය යුතු ය. වැට බැන්ද යුතු ය, ගොයම් රැක්ක යුතුයි.

11. ශ්‍රද්ධාවෙන් පැවිදිවූවන් විසින් ධර්‍මය ඉගෙනිය යුතු ය. වැඩි මහල්ලන්ට ගෞරව කළ යුතු ය. ධර්‍මය දේශනා කළ යුතු ය. ධර්‍මයට අනුව පිළිපැද්ද යුතු ය.

12. විශාඛාවගේ පියා ඇ ස්වාමිකුලයට යවද්දී දෝෂයක් උපනහොත් එය ශුද්ධ කටයුතු යයි කියා කෙළෙඹියන් දස දෙනෙකුන් යැවී ය.

මෙහි අමුතු වචන :-

ඇමදිය යුතු = සම්මජ්ජිතබ්බ. 3.
ඉවත් කළ යුතු = නීහරිතබ්බ. 3.
කරවිය යුතු = කාරෙතබ්බ. 3.
කසළ = කචවර. පු.
කෙළෙඹියා = කුටුම්බික. පු.
ගරුකටයුතු = ගරුකාතබ්බ. 3.
ගොයම් = සස්ස. න.
දේශනා කළ යුතු = දෙසෙතබ්බ. 3.
ධර්‍මයට අනුව = යථාධම්මං. ක්‍රි. වි.
පවන්සැලිය යුතු = වීජෙතබ්බ. 3.

පැමිණවිය යුතු = පාපෙතබ්බ. 3.
පිදිය යුතු = පූජෙතබ්බ. 3.
පිළිපැද්ද යුතු = පටිපජ්ජිතබ්බ. 3.
පෝෂණය කළ යුතු = පොසෙතබ්බ. 3.
බැන්ද යුතු = බන්ධිතබ්බ. 3.
යවද්දී = පෙසෙන්තෙ.
වැඩිමහලු = වුද්ධ. 3.
වැඩිය යුතු = වඩ්ඪෙතබ්බ. 3.
වැපිරිය යුතු = වපිතබ්බ. 3.
ශක්තියට අනුරූප ලෙස = යථා සත්ති. ක්‍රි. වි.
සත්කාර කටයුතු = සක්කාරෙතබ්බ. 3.
සිහිල් = සීතල. 3.
හොත් = සචෙ. නි.

123. මිශ්‍ර ක්‍රියාපදයන් සෑදීම පිණිස සියලු ධාතූන් කෙරෙන් න්ත - මාන යන ප්‍රත්‍යයෝ යොදනු ලැබෙත්.

ඒ ප්‍රත්‍යයන් පර වූ කල්හි ඇතැම් ධාතූහු ස්වරූපය වෙනස් කරතිඃ හේ මෙසේ යිඃ-

ගමු (යාමෙහි) ධාතුව	ගච්ඡ - බවට පැමිණේ
ඉසු (කැමැත්තෙහි)	ඉච්ඡ - බවට පැමිණේ
දිස (දැක්මෙහි)	පස්ස, දක්ඛ - බවට පැමිණේ
පා (බීමෙහි)	පිබ, පිව - බවට පැමිණේ
ඨා (සිටීමෙහි)	තිට්ඨ - බවට පැමිණේ
දා (දීමෙහි	දද - බවට පැමිණේ
ඤා (දැනීමෙහි)	ජාන - බවට පැමිණේ
කර (කිරීමෙහි)	කුරු, කුබ්බ - බවට පැමිණේ

ගච්ඡ + න්ත = ගච්ඡන්ත (යන, යමින්)
ඉච්ඡ + න්ත = ඉච්ඡන්ත (කැමැතිවෙන)
පස්ස + න්ත = පස්සන්ත (දකිනඃ දකිමින්)
දිස්ස + මාන = දිස්සමාන (දක්නා ලැබෙනඃ පෙනෙමින්)
තිට්ඨ + මාන = තිට්ඨමාන (සිටිනඃ සිටිමින්)
දද + මාන = දදමාන (දෙන, දෙමින්)
ජාන + න්ත = ජානන්ත (දන්නා වූ.)

කුරු + මාන = කුරුමාන (කරන, කරමින්)

(න්ත - ප්‍රත්‍යය පර කල්හි කර - ධාතුව තම රූපය වෙනස් නොකරයි, නමුත් තමාගේ ගණයට අයත් ඔ - විකරණය ගනියි.)

කර + ඔ + න්ත + කරොන්ත (කරන; කරමින්)

භූ - ධාතුව න්ත - මාන දෙක ම පර කල්හි අ - විකරණය ගෙන භව - යන රූපයෙන් සිටියි.

භූ + අ + මාන = භවමාන
භූ + අ + න්ත = භවන්ත } (වෙනඃ වෙමින්)

උඩින් දක් වූ සියලු උදාහරණයන්ට මාන - න්ත දෙකින් ම යුත් පද ඇති බව සැලකිය යුතු. මෙකී ප්‍රත්‍යය දෙක වර්තමාන කාලයෙහි වෙති. ඉංග්‍රීසියෙහි Present Participle මේවා නමින් හැඳින්වෙති.

124. අතීතයෙහි සිදුවූවක් ප්‍රකාශ කිරීම පිණිස ධාතූන් කෙරෙන් ත, තවන්තු, තාවී යන ප්‍රත්‍යයෝ වෙති.

A. බොහෝ තැන්වලදී මේ ප්‍රත්‍යයන් ඉදිරියෙන් වූ ධාතූන්ගේ අන්ත ව්‍යඤ්ජනය ලොප් වේ. ප්‍රත්‍යයන්හි ත් - කාරය ද්විත්ව බවට පැමිණේ.

භුජ (අනුභවයෙහි) + ත = භුත්ත
භුජ + තාවී = භුත්තාවී
භුජ + තවන්තු = භුත්තවන්තු } අනුභව කළ

තවන්තු - තාවී - ප්‍රත්‍යයන් බහුලව නොයෙදෙන බැවින් ත - ප්‍රත්‍යය පමණක් යොදා මින් මත්තෙහි උදාහරණ දක්වනු ලැබේ.

මුච (මිදීමෙහි) + ත = මුත්ත (මිදුණුඃ නිදහස් වූ)
තප (රත්වීමෙහි) + ත = තත්ත (රත්වූඃ උණුසුම් වූ)
පද (යාමෙහි) + ත = පත්ත (පැමිණි)
මද (මත්වීමෙහි) + ත = මත්ත (මත්වූඃ උඩඟු වූ)
යුජ (යෙදීමෙහි) + ත = යුත්ත (යෙදුණු, යෝග්‍ය, යොදන ලද)
සුප (නිදීමෙහි) + ත = සුත්ත (නිදගත්)

B. ඇතැම් තැනක ප්‍රත්‍යයන්හි ත් - කාරය ද්විත්ව නොවේ. ධාත්වන්ත ව්‍යඤ්ජනය පමණක් ලොප් වේ.

කර + ත = කත (කළ: කරන ලද)
මර (මැරීමෙහි) + ත = මත (මළා වූ)
හන (නැසීමෙහි) + ත = හත (නසන ලද)
ගමු (යාමෙහි) + ත = ගත (ගිය)
රමු (සිත් ඇලවීමෙහි) + ත = රත (ඇලුණු)

C. ඇතැම් විට ත - ප්‍රත්‍යය ධාත්වන්ත - ව්‍යඤ්ජනය සමග විකාරයට (වෙනස් අකුරක් බවට) පැමිණේ. (ධාත්වන්ත ස්වරය සුබොච්චාරණය පිණිසයි.)

1. ස් + ත = ට්ඨ බවට පැමිණේ :-

දස (ඩැසීමෙහි) + ත = දට්ඨ (ඩසින ලද)
කස (සෑමෙහි) + ත = කට්ඨ (සීසාන ලද)
හස (සිනාවෙහි) + ත = හට්ඨ (ප්‍රීතිමත් වූ)
රුස (කෝප වීමෙහි) + ත = රුට්ඨ (කෝප වූ)
සුස (ශබ්ද නැගීමෙහි) + ත = සුට්ඨ (ඝෝෂණය කළ)
ආ + කුස (අක්‍රෝශයෙහි) + ත = අක්කුට්ඨ (ආක්‍රෝශ ලැබූ.)

2. ම් + ත = න්ත බවට පැමිණේ :-

ඛමු (ඉවසීමෙහි) = ඛන්ත (ඉවසූ)
සමු (සංසිඳවීමෙහි) + ත = සන්ත (සංසිඳුණු)
භමු (කැරකීමෙහි) + ත = භන්ත (භ්‍රමණය වූ)
දමු (දමනයෙහි) + ත = දන්ත (දැමුණු, දමනය කළ)
ප + කමු (යාමෙහි) + ක = පක්කන්ත (ගිය)

3. ධ් + ත = ද්ධ බවට පැමිණේ :-

බුධ (අවබෝධ කිරීමෙහි) + ත = බුද්ධ (අවබෝධ කළ: දන්නා අය)
රුධ (අවහිර කිරීමෙහි) + ත = රුද්ධ (අවහිර කරනු ලැබූ.)

4. භ් + ත = ද්ධ බවට පැමිණේ :-

ලභ (ලැබීමෙහි) + ත = ලද්ධ (ලැබූ: ලැබුණු)
ලුභ (මසුරුවීමෙහි) + ත = ලුද්ධ (ලොභොබි වූ)

5. ජ් + ත = ග්ග බවට පැමිණේ :-

භුජ (බිඳීමෙහි) + ත = භග්ග (බිඳුණු: බිඳින ලද)
සං + විජ (කලකිරීමෙහි) + ත = සංවිග්ග (සංවේගයට පත් කලකිරීමට පත්.)

7. අන්‍යාකාර වූ ඇතැම් පෙරළි ද වෙති :-

දුහ (දෙවීමෙහි) + ත = දුද්ධ (දෙවින ලද)
රුහ (නැගීමෙහි) + ත = රුළ්හ (නැගි, නැංගාවූ, වැඩුණු)
මජ්ජ (මැදීමෙහි) + ත = මට්ඨ (මට්ටම් වූ)
පච (පිසීමෙහි) + ත = පක්ක (පැසුණු: පිසූ)
වස (විසීමෙහි) + ත = වුත්ථ (විසූ: වාසය කළ)

D. ඇතැම් විට ත - ප්‍රත්‍යය වෙනස් නොවී සිට ධාතුව අන්‍යාකාරයකට පමුණුවයි.

ජන (ඉපදවීමෙහි) + ත = ජාත (උපන්, හටගත්)
පා (බීමෙහි) + ත = පීත (පානය කළ)
ඨා (සිටීමෙහි) + ත = ඨිත (සිටි, නැවතුණු)
මා (මැණීමෙහි) + ත = මිත (මණිනලද)

E. එක් ස්වරයක් හෝ ධාතූන් කෙරෙන් ත - ප්‍රත්‍යය වූ විට එය හෝ ධාතුව හෝ වෙනසට නො පැමිණේ.

භූ (වීමෙහි) + ත = භූත (වූ: සිදු වූ)
නී (පැමිණවීමෙහි) + ත = නීත (ගෙනගිය)
භී (භය වීමෙහි) + ත = භීත (බියපත්)
ඤා (දැනීමෙහ) + ත = ඤාත (දත්, දන්නා ලද)
යා (ගමනෙහි) + ත = යාත (ගිය)

ජි (ජය ගැන්මෙහි) + ත = ජිත (දිනූ)
චි (රැස් කිරීමෙහි) + ත = චිත (රැස් කළ)
න්හා (නෑමෙහි) + ත = න්හාත (නෑ, ස්නානය කළ)
නහා + න්හා දෙකම පාළියෙහි තිබේ.

F. ධාතුවටත් ත - ප්‍රත්‍යයටත් අතරෙහි ඉ - කාරයක් යෙදීමෙන් සිදුවන අතීත කිතක පද සුලභ වෙත්.

පච + ඉ + ත = පචිත (පිසූ)
ගහ + ඉ + ත = ගහිත (ගත්, ගන්නා ලද)
බාද + ඉ + බාදිත (කෑ, අනුභව කළ)
මණ්ඩ + ඉ + ත = මණ්ඩිත (සැරසූ)
කථ + ඉ + ත = කථිත (කී, කියන ලද)
ලිඛ + ඉ + ත = ලිඛිත (ලියූ)

125. අතීතාර්ථයෙහි ඇතැම් ධාතූන් කෙරෙන් න ප්‍රත්‍යය වේ. ඇතැම් තැනකදී ඒ ප්‍රත්‍යයේ න් - කාරයට ද්විත්ව වී ධාඞන්ත ව්‍යඤ්ජනය ලොප් වේ. ඇතැම් තැනකදී ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරෙහි ඉ - කාරයක් හෝ ඊ - කාරයක් ආගම වේ. ධාඞන්ත ව්‍යඤ්ජනය ර යන්න වී නම් ප්‍රත්‍යයේ න් - කාරය ණ් වේ.

ඡිද (කැපීමෙහි) + න = ඡින්න (කැපූ: කැපුණු)
ඡද (වැසීමෙහි) + න = ඡන්න (වැසූ, වැසුණු)
භිද (බිඳීමෙහි) + න = භින්න (බිඳුණු, බිඳින ලද)
නි + සද (හිඳීමෙහි) + ඉ + න = නිසින්න (හුන්)
තර (එතර කිරීමෙහි) + ඉ + න = තිණ්ණ (එතර වූ)
පුර (පිරීමෙහි) + න = පුණ්ණ (පිරුණු)
ජර (දිරීමෙහි) + ඉ + න = ජිණ්ණ (දිරුණු, දිරාගිය)
දෘ (දීමෙහි) + ඉ + න = දින්න (දන් දෙන ලද)
ඛී (ගෙවීයාමෙහි) + ඊ + න = ඛීණ (ගෙවුණුර් ක්‍ෂය වූ)
දී (බැගෑබවෙහි) + න = දීන (බැගෑපත්)
ලූ (සිඳීමෙහි) + න = ලූන (කැපූ)
පන + හා (දුරුකිරීමෙහි) + ඊ + න = පහීන (දුරු වූ, දුරු කළ)
ආස (හිඳීමෙහි) + ඊ + න = ආසීන (හුන්)

126. ඇතැම් ධාතූන්ගෙන් දෙවිධියක අතීත කිතක පද සෑදෙති.

ධාතුව
පච - පචිත, පක්ක (පිසූ, පැසුණු)
හර - හරිත, හට (ගෙනගිය)
වස - වුසිත, වුත්ථ (විසූ)
ඤ - ඤාතීත, ඤාත (දන්නා ලද)
ලග - ලගිත, ලග්ග (ඇලුණු)
කස - කසිත, කට්ඨ (හාන ලද)
තප - තාපිත, තත්ත (රත් වූ, රත් කළ)
පුස - පොසිත, පුට්ඨ (පෝෂණය කරන ලද)
ඡිද - ඡින්දිත, ඡින්න (කැපූ, කැපුණු)
දුස - දූසිත, දුට්ඨ (දූෂිත වූ, නරක් වූ)
රුස - රොසිත, රුට්ඨ (කෝප වූ)
ගුප - ගොපිත, ගුත්ත (රක්නා ලද)

අභ්‍යාසය 23
සිංහලට නැඟිය යුතු.

1. "සුමෙධතාපසො ඉද්ධිමාති ජානන්තා උදකහින්නොකාසං සල්ලක්ඛෙත්වා 'ඣං ඉමං ඨානං අලංකරොහී'ති වත්වා අදංසු" (ජාතක නිදාන) 2. 'එවං නිසින්නෙ බොධිසත්තෙ සකල - දස සහස්ස - චක්කවාළෙ දෙවතා සන්නිපතිත්වා..... බොධිසත්තං නානාප්පකාරාහි ථුතීහි අභිත්ථුතිංසු." (එම) 3. යථා පන අඤ්ඤෙ සත්තා මාතුකුච්ඡිතො නික්ඛමන්තා පටික්කූලෙන අසුචිනා මක්ඛිතා නික්ඛමන්ති, න එවං බොධි සත්තො" (එම) 4. "අපරම්පන එකදිවසං උය්‍යානං ගච්ඡන්තො තථෙ'ව දෙවතාහි නිම්මිතං සුනිවත්ථං සුපාරුතං පබ්බජිතං දිස්වා 'කො නාමෙ'සො සම්මා'ති සාරථිං පුච්ඡි." (එම) 5. "අයං බුද්ධත්තාය අභිනීහාරං කත්වා නිපන්නො. සමිජ්ඣිස්සති ඉමස්ස පත්ථනා ඉතො කප්ප - සතසහස්සාධිකානං චතුන්නං අසංඛෙය්‍යානං මත්ථකෙ." (එම)

6. "කිමේම එකෙන තිණ්ණෙන
පුරිසෙන ථාමදස්සිනා?" (බුඬවංස)

7. "දස්සනං මෙ අතික්කන්තෙ සසංඝෙ ලොකනායකෙ
හට්ඨො හට්ඨෙන චිත්තෙන ආසනා වුට්ඨහිං තදෑ" (එම)

8. "උබ්බිග්ගා තසිතා භීතා භන්තා ව්‍යථිත - මානසා
මහාජනා සමාගම්ම දීපංකරමුපාගමුං." (එම)

9. "තත්‍ථ දෙවමනුස්සා ගන්ධමාලාදීහි පූජයමානා මහාපුරිස, ඉධ තුම්හෙහි සදිසො නත්‍ථි. කුතෙ'ත්‍ථ උත්තරිතරො? ති ආහංසු." (ජාතක නිදාන)

10. "ආදිත්තස්මිං අගාරස්මිං යං නීහරති භාජනං
තං තස්ස හොති අත්‍ථාය නොව යං තත්‍ථ ඩය්හති."
(දෙවතාසංයුත්ත)

මෙහි අමුතු වචන

අත්‍ථාය = ප්‍රයෝජය පිණිස (අත්‍ථ-ශබ්ද)
අභිත්‍ථුති = ස්තුති කෙළේ ය.
අභිනීහාර = ප්‍රාර්ථනාව. පු.
අසුචි = අපිරිසිදුදෙය. පු. අපවිත්‍ර වූ. 3
ආදිත්ත = දැල්වුණු, ගිනිගත්. 3.
උත්තරීතර = වඩා ශ්‍රේෂ්ඨ. 3.
උබ්බිග්ග = කලබලයට පත්. 3.
ඔකාස = අවකාශය, ස්ථානය. පු.
තසිත = තැතිගත්. 3.
ථාමදස්සී = ශක්තියදකින්නා. පු.
ථුති = ස්තුතිය. ඉ.
නිපන්න = හොත්, ලැගසිටි. 3.
පටික්කුල = පිළිකුල් කටයුතු. 3.
මක්ඛිත = ගෑවුණු, තැවරුණු. 3.
මත්‍ථකෙ = මත්තෙහි (මත්‍ථක ශබ්ද). පු.
ලොකනායක = ලෝකාධිපති (බුදුරද). පු.
ව්‍යථිත = කම්පිත. වූ, ව්‍යසනයට පත්. 3.
සදිස = සමාන වූ. 3.
සමාගම්ම = එකතුව. පූ. ක්‍රි.
සසඞ්ඝ = සංඝයා සහිත. 3.
සම්ජ්ඣති = සමෘඬ වේ.
සල්ලක්ඛෙත්‍වා = සලකා. පූ. ක්‍රි.
සුනිවත්‍ථ = මනා සේ හැඳි. 3.
සුපාරුත = මනාසේ පොරවාගත්. 3.

කිතක පද සහිත කොට පාලියට නැඟිය යුතුඃ-

1. කුඹලා විසින් සාදන ලද මැටිබඳුන් දුවන ගොනකු විසින් බිඳින ලදහ. 2. සංසිඳුණු සිතැති ක්‍ෂීණාශ්‍රවයන්ට දුන් දානය මහත් ඵල ඇත්තේ වේ. 3. සංසාර සාගරයෙන් ගොඩ නැඟුණු තථාගතයන් වහන්සේ අන්‍යයන්ට ද එයින් ගොඩ නැඟීම සඳහා ධර්ම දේශනා කළහ. 4. ගිනිගත් ගේකින් පිටතට ගත් දෙය පසුව මනුෂ්‍යයන්ට ප්‍රයෝජනය පිණිස පවතී. 5. යස කුල පුත්‍රයාගේ මව ඔහුගේ මන්දිරයට ගියා ඔහු නොදක්නී පියා වෙත ගොස් "ඔබගේ පුතා නොදක්නා ලැබේ" යයි කී ය. 6. විශාඛාව කථාකරන කල්හි බමුණෝ ඇගේ දන්ත කල්‍යාණය බලමින් සිට කථාව නිමවූ කල්හි ඔවුන් ගෙනා රන්දම ඇයට පැළැන්දූහ. 7. භූමිකම්පාවෙන් පීඩිත වූ ප්‍රදේශය වැටුණු ගස්වලින් ද බිඳුණු ගෙවලින් ද මැරුණු මිනිසුන්ගෙන් ද යුක්ත විය. 8. "මෙතැන හිඳිමින් මෙතැන ම හුන් මාගේ පුත්‍රයා දැක්ක හැක" යි සිතමින් සතුටු වූ සිටුතෙමේ බුදුන් සමීපයෙහි වාඩි විය. 9. විහාරදෙරටුවෙන් නික්මුණු බුදුරද පුර වැසියන් විසින් වඳින ලද්දේ පුදන ලද්දේ බුහුමන් කරන ලද්දේ සැරසූ නුවරට ශාන්ත ගමනින් ඇතුළුවිය. 10. එදා එනුවර එසවූ ධ්වජවලින් ද රැස් වූ මනාසේ හැඳි මිනිසුන්ගෙන් ද යුක්ත විය.

එල්ලූ = ඔලිම්බිත. 3.
එසවූ = උස්සාපිත. 3.
කථාකරන = කථෙන්ත. 3.
ගෙනා = ආනීත, ආහට. 3
ගොඩනැගුණු = උත්තිණ්ණ. 3.
ගොඩනැගීම පිණිස = උත්තාරණය
දන්තකල්‍යාණය = දන්ත කල්‍යාණ. න.
පිටතට ගත් - නීහට. 3
භූමිකම්පාව = භූමිචාල. පු.
මණ්ඩපය = මණ්ඩප. පු.
මන්දිරය = පාසාද. පු.
මැටිබඳුන = මත්තිකාභාජන. න.

කාල තුනෙහි ම යෙදෙන කතෘ කාරකයෙහි සිදුවන කිත් ප්‍රත්‍යයෝ

127. කම්පදයක් මුලින් ඇති කල්හි සකම්ක ධාතූන් කෙරෙන් ණ - ප්‍රත්‍යය වේ. (ණ් - කාරය වෘද්ධි පිණිසයි.)

කුම්භං + කර + ණ = කුම්භකාර (වළන් සාදන්නා.)
රථං + කර + ණ = රථකාර (වඩුවා, රථ සාදන්නා)
පත්තං + ගහ + ණ = පත්තගාහ (පාත්‍රය ගන්නා)
සුඛං + කමු + ණ = සුඛකාම (සැප කැමති.)
තන්තං + වෙ + ණ + තන්තවාය (රෙදි වියන්නා)

A.ආකාරාන්ත ධාතුවක් කෙරෙන් ණ - ප්‍රත්‍යය වූ විට මධ්‍යයෙහි ය් - කාරාගමයක් වේ.

දානං + දා + ණ = දානදාය (දන් දෙන්නා)
ධඤ්ඤං + මා + ණ = ධඤ්ඤමාන (ධාන්‍ය මනින්නා)

B. ඇතැම් භාවාර්ථවාචී ශබ්ද ද මේ ණ - ප්‍රත්‍යයෙන් සිද්ධ වෙති.

පච + ණ = පාක (පිසීම)
ගහ + ණ = ගාහ (ගැනීම)
චජ + ණ = චාග (පරිත්‍යාගය, අත්හැරීම)
හර + ණ = හාර (ගෙනයාම)

128. කම්පදයක් මුලින් ඇති විට ඇතැම් ධාතූන් කෙරෙන් අ - අක - අන - ආවී - තු යන ප්‍රත්‍යයෝ වෙති.

(1) අ ප්‍රත්‍යය

ධම්මං + ධර + අ = ධම්මධර (ධර්‍මය දරන)
හිතං + කර + අ = හිතකර (හිතවත් දේ කරන)
දිනං + කර + අ = දිනකර (හිරු, දවස කරන)
ධනුං + ගහ + අ = ධනුග්ගහ (දුනුවායා.)
සබ්බං + ද + අ = සබ්බද, සබ්බද්ද (සියල්ල දෙන)
මජ්ජං + පා + අ = මජ්ජප්ප (මත්පැන් බොන)

කම්පදයක් නොව සත්තම්‍යෙන් යුත් පදයක් මුලින් සිටි විට ද අ - ප්‍රත්‍යය වන බව පෙනේ :-

වනෙ + චර + අ = වනචර (වනයෙහි හැසිරෙන)
ථලෙ + ඨා + අ = ථලට්ඨ (ගොඩසිටි හෝ පිහිටි)
ජලෙ + ඨා + අ = ජලට්ඨ (දියෙහි වූ)
සිරස්මිං + රුහ + අ = සිරොරුහ (හිසකෙස්)

(2) අක - ප්‍රත්‍යය පර විට ඇතැම් තැන වෘද්ධිය වේ :-
දෘ + අක = දායක (දෙන්නා, දෙන)
නී + අක = නායක (නායකයා, ප්‍රධානියා)
කර + අක = කාරක (කරන්නා)
සු + අක = සාවක (අසන්නා, ශ්‍රාවකයා)
පු + අක = පාවක (ශුද්ධ කරන්නා, ගින්න)
ගහ + අක = ගාහක (ගන්නා.)
පාල + අක = පාලක (රකින්නා)
යාච + අක = යාචක (සිඟන්නා)

(3) අන - ප්‍රත්‍යයෙන් භාවාර්ථ පද පමණක් සෑදෙති.
ගහ + අන = ගහන (ගැනීම, ගැන්ම)
භුජ + අන = භොජන (අහාරය, අනුභව කිරීම)
සු + අන = සවණ (ඇසීම)
භූ + අන = භවන (වීම)
පව + අන = පවන (පිසීම

(4) ආවී - ප්‍රත්‍යයෙන් සිදුවන පද බොහෝ නොවෙති.
භයං + දිස + ආවී = භයදස්සාවී (භය දකින්නා)

(5) තු - ප්‍රත්‍යය

A. මෙය පර වූ විට ධාත්වන්ත ව්‍යඤ්ජනය ඇතැම් විට ත් - බවට පැමිණේ.

කර + තු = කත්තු (කරන්නා, කර්තෘ)
හර + තු = හත්තු (ගෙන යන්නා)
භර + තු = භත්තු (පෝෂකයා, ස්වාමියා)

ගමු + තු = ගන්තු (යන්නා)
වද + තු = වන්තු (කියන්නා)
මන + තු = මන්තු (හඟින්නා)
ද + තු = දතු (දෙන්නා)
ඤ + තු = ඤතු (දන්නා)

(ඇතැම් විට යයි කී බැවින් ගන්තු මන්තු දෙතැන්හි ධාඞන්තයට ත් - නොවේ.)

B. ඇතැම් විට ධාතුවේ මුල් ස්වරයට වෘඩි වේ :-

ඡිද + තු = ඡෙත්තු (කපන්නා)
ජි + තු = ජෙතු (දිනන්නා)
සු + තු = සොතු (අසන්නා)

ක්‍රියාමූලයන් *කෙරෙන් ද තු ප්‍රත්‍යය යෙදේ.

පාලෙ + තු = පාලෙතු (රකින්නා)
පාලය + ඉ + තු = පාලයිතු (රකින්නා)
කාරෙ + තු = කාරෙතු (කරවන්නා)
හාරෙ + තු = හාරෙතු (ගෙනයන්ට සලස්වන්නා)
මාරෙ + තු = මාරෙතු (මරන්නා)

129. ඇතැම් ධාතූන් කෙරෙන් කර්‍ෘ අර්ථයෙහි ණි-ප්‍රත්‍යය වේ.

ඡත්තං + ගහ + ණි = ඡත්තගාහී (කුඩය අල්වන්නා)
පාපං + කර + ණි = පාපකාරී (පව් කරන්නා)
බීරං + පා + ණි = බීරපායී (කිරි බොන්නා)
ධම්ම + වද + ණි = ධම්මවාදී (ධර්‍මය කියන්නා)
සීඝං + යා + නී = සීඝයායී (ඉක්මනින් යන්නා.)
අන්නං + ද + ණි + අන්නදයී (ආහාර දෙන්නා)

* ඒ ඒ ධාතුගණයට අයත් විකරණ ප්‍රත්‍යයන් ධාතූන් හා එක්වී සිටින ආකාරය "ක්‍රියා මූල" යයි මෙහි අදහස් කරනු ලැබේ.

130. අන්‍ය නාමයකින් පර වූ ඇතැම් ධාතූන් කෙරෙන් ර - ප්‍රත්‍යය වේ. එහි ර් - කාරය ධාත්වන්ත ව්‍යඤ්ජනය සමග විනාශයට පැමිණේ.

භූජ + ගමු + ර = භූජග (සර්පයා) "භූජෙන ගච්ඡති" = කඳෙන් යයි යන අර්ථයෙහියි.

කුඤ්ජ + රමු + ර = කුඤ්ජර (ඇතා) "කුඤ්ජෙ රමති" = පඳුරෙහි ඇලේ යන අර්ථයෙහියි.

කම්ම + ජන + ර = කම්මජ (කර්මයෙන් හටගත්) "කම්මෙන ජාතො" යන අර්ථයෙහියි.

පඞ්ක + ජන + ර = පඞ්කජ (පියුම) පඞ්කෙ ජාතො" මඩෙහි උපන්නේ යන අර්ථයෙහියි.

ථල + ජන + ර = ථලජ (ගොඩ හටගත්) "ථලෙ ජාතො" යන අර්ථයෙහියි.

අණ්ඩ + ජන + ර = අණ්ඩජ (පක්ෂියා හෝ සර්පයා) "අණ්ඩතො ජාතො" බිජුවටින් හටගත්තේ යන අර්ථයෙහියි.

අභ්‍යාසය 24

සිංහලට නඟා කිතක පද පෙන්විය යුතුයි.

දිනකරෙ අත්‍ථං ගච්ඡන්තෙ නිසාකරෙ ච උදෙන්තෙ රට්ඨස්ස පාලකො, බුද්ධස්ස සාවකො, මහාරාජා, යාචකානං මහාදනං අදාසි.

2. "ගොපුරට්ඨා තු දමිළා බිපිංසු විවිධායුධෙ
පක්කං අයොගුළං චෙව, කථිතං ච සිලෙසිකං" (මහාවංස)

3. "මිගෙ අන්තො පවිට්ඨෙ ච ද්වාරං පිදහිංසු: මිගො මනුස්සෙ දිස්වා කම්පමානො මරණභයභීතො අන්තො - නිවෙසනඞ්ගණෙ ආධාවති, පරිධාවති. (වාතමිග ජාතක 14)

4. "තෙ ජලට්ඨෙ ථලට්ඨෙ ච භූජගෙ'සීති කොටියො
සරණෙසු ච සීලෙසු පතිට්ඨාපෙසි නායකො." (මහාවංස)

5. "යාදිසං වපතෙ බීජං, තාදිසං හරතෙ ඵලං
කල්‍යාණකාරී කල්‍යාණං, පාපකාරී ච පාපකං"

6. "අන්නදෙ බලදෙ හොති වත්‍ථුදෙ හොති වණ්ණදෙ
යානදෙ සුඛදෙ හොති, දීපදෙ හොති චක්ඛුදෙ
සො ච සබ්බදදෙ හොති යො දදති උපස්සයං."

7. "ආරාමරොපා වනරොපා යෙ ජනා සෙතුකාරකා
ධම්මට්ඨා සීලසම්පන්නා තෙ ජනා සග්ගගාමිනො."
(දෙවතා සංයුත්ත)

8. "සඞ්ගාමමජ්ඣෙ ආකාසෙ නිසින්නො තත්‍ථ නායකො
තමං තමොනුදෙ තෙසං නාගානං භිංසනං අකා."
(මහාවංස)

9. A."උය්‍යානපාලො තස්ස මධුමක්ඛික - තිණෙසු පලුද්ධ භාවං ඤත්වා අනුක්කමෙන අත්තානං දස්සෙසි." (වාතමිග ජාතක)

B. වනචාරී පුරෙ ආසිං, සත්තං වනකම්මිකො." (419 වෙනි අපදානය)

10. "අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො කාසිගාමකෙ කුම්භකාරකුලෙ නිබ්බත්තිත්වා කුම්භ කාරකම්මං කත්වා පුත්තදාරං පොසෙසි." (178 වෙනි ජාතකය)

මෙහි අමුතු වචන

අත්‍ථ = විනාසය, බැසීම. පු.
අන්තො නිවෙසනඞ්ගණ = ගෙය ඇතුළේ මිදුල. න.
අයොගුළ = යකඩගුළිය. පු.
ආධාවති = එහා මෙහා දුවයි.
ආරාම = (මල් හෝ පලතුරු) වත්ත පු.
ආසිං = වීමි.
උපස්සය = ගෙය. පු.
කඨිත = ඉතා රත් වූ. 3.
කල්‍යාණකාරී = යහපත කරන්නා. පු.
ගොපුරට්ඨ = දෙර කොටුවෙහි සිටි. 3.
දර = භාය්‍යාව. පු.
දිපද = පහන් දෙන. 3.
ධම්මට්ඨ = ධර්මයෙහි පිහිටි. 3.
නිසාකාර = චන්ද්‍රයා. පු.

පක්ක = රත්කළ. 3.

පතිට්ඨාපෙති = පිහිටුවයි.

පරිධාවති = හාත්පස දුවයි

පලුද්ධභාව = ඉතා ඇලුණුබව. පු.

පවිට්ඨ = ඇතුළු වූ. 3.

බලද = බලය දෙන. 3.

හිංසන = බය උපදවන. 3

යානද = වාහන දෙන. 3.

රොප = වවන්නා. පු.

වණ්ණද = ශරීර වර්ණය දෙන. 3.

වනකම්මික = වනයෙහි වැඩ කරන්නා. පු.

වපතෙ = වපුරයි.

සඞ්ගාම = යුද්ධය. පු.

සග්ගගාමී = ස්වර්ගයට යන්නා. පු.

සිලෙසිකා = ලාටු. ඉ.

සම්පන්න = යුත්. 3.

සෙතුකාරක = පාලම් සාදවන්නා. පු.

හරතෙ = ගෙනයයි.

කිතකපද යුක්ත කොට පාලියට නැඟිය යුතු.

1. මණිඅක්ඛික නාරජුගේ අයැදීම නිසා කැලණියට පැමිණි තථාගතයන් වහන්සේ නාගයයන් දුන් මිණි පලඟෙහි වැඩ හුන්හ. 2. එහිදී නාගයෝ දිව්‍යමය ආහාර පානයෙන් පිරිස් සහිත සම්බුද්ධයන් වහන්සේ වැළඳවූහ. 3. ආහාර දෙන්නා ආයුෂ දෙන්නෙක් ද වර්ණය දෙන්නෙක් ද සැපය දෙන්නෙක් ද වේ. 4. ගොවියා යම් බීජ වර්ගයක් වපුරා නම් ඊට සමාන ඵල වර්ගයක්ම ලබයි. එමෙන් කුසල් කරන්නා යහපත් විපාක ද අකුසල් කරන්නා අයහපත් විපාකද ලබයි.

5. "දුටුගැමුණු රජතුමා එක්සිය විසිරියන් උසැති මහ දඟැබක් කරවන්නේය"යි දෙවානම්පියතිස්ස රජතුමා විසින් ශිලා ලිපියක් පිහිටුවන ලදි.

6. දෙවනපෑතිස් මහරජු විසින් මිහින්තලයෙහි ගල්ලෙන් සැටක් කරවන ලදහ. ඒවා අද දක්වාත් විද්‍යමාන වෙති. 7. ධම්ධරයා මත්පැන් බොන්නන්ට අවවාද කොට ඔවුන් අමද්‍යපයන් කෙළේ ය. 8. යාදකයන්ට ධනය දෙන්නා ද වස්ත්‍ර දෙන්නා ද වාසස්ථාන දෙන්නා ද ලෝවැස්සන් විසින් පසස්නා ලද්දෝ වෙති. 9. රජතුමා රටවැසියන් පාලනය කරන්නා ද ඔවුන්ගේ නායකයා ද ස්වාමියා ද වේ. 10. ගොඩවැසි වූ ද දියවැසි වූ ද සියලු සත්වයෝ

ආහාරය නොමැතිව ජීවත් වීමට අසමර්ථ වෙත්. 11. සිතියම් කරන්නා පිළිම ගෙය තුළ ලෝක නායක වූ දීපඞ්කරාදි තථාගතයන් වහන්සේගේ පිළිරූ අඳියි. 12. මාලාකාරයා රෙදි වියන්නා ලවා වස්ත්‍රයක් වියවා රන්කරුවාට දුන්නේ ය. 13. පින් කැමති ධාන්‍ය මනින්නා බුද්ධ ශ්‍රාවකයන්ට දන් දෙන්නෙක් විය. 14. වනයෙහි හැසිරෙන දුනුවායා බොහෝ ඌරු මුව ආදීන් මරා ඔවුන්ගේ මස් විකුණා ජීවිකාව කෙළේ ය.

මෙහි අමුතු වචන

අද දක්වා = යාව අජ්ජතනා
අඳියි (රූප) = ආලිඛති
අයැදීම = ආයාචනා. ඉ.
අසමර්ථ = අසමත්ථ. 3.
ආයුෂ දෙන්නා = ආයුද. පු.
ගල්ලෙණ = ලෙණ. න. ගුහා. ඉ.
පසස්නාලද = පසත්ථ. 3.
පිහිටුවන ලද = පතිට්ඨාපිත. 3.
පිළිම ගෙය = පටිමාඝර. න.
පිළිරූව = පටිමා. ඉ.
ඵල වර්ගය = ඵලජාති. ඉ.
බීජවර්ගය = බීජ ජාති. ඉ.
මිහින්තලය = චෙතියපබ්බත. පු.
මිණිපලඟ = මණිපල්ලංක. පු.
යහපත් විපාක = කල්‍යාණ ඵල. න.
වැළඳවිය = භොජාපෙසි
වියවා = වායාපෙත්වා. පූ. ක්‍රි.
ශිලා ලිපිය = සිලාලෙඛන. න.

නිපාත මෙන් ගණිනු ලබන කිතක පද

131. **යන්ට, කරන්ට ආදියෙහි පෙනෙන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා ධාතූන් කෙරෙන් තුං - තවෙ යන ප්‍රත්‍යයෝ වෙති.**

A. අකාර - උකාරාන්ත ධාතූන් කෙරෙන් පරවූ ඒ ප්‍රත්‍යයන්ටත් ධාතූන්ටත් අතරෙහි ඉ - ආගමයක් වේ.

B. ආකාරාන්ත ධාතූන්ට කිසි ආගම විපර්යාසයක් නැතිව ඒවා එක්කරනු ලැබේ.

C. ඇතැම් ධාතූන්ගේ අන්තව්‍යඤ්ජනය ප්‍රත්‍යයේ ත් - කාරය හා සමාන බවට පමුණුවනු ලැබේ.

D. ඇතැම් තැනක ධාතුවේ ස්වරයට වෘද්ධි වේ.

A. ඉකාරාගමය වූ තැන් :-

පච + ඉ + තුං = පචිතුං (පිසන්ට)
බාද + ඉ + තුං = බාදිතුං (කන්ට)
හර + ඉ + තුං = හරිතුං (ගෙන යන්ට)
ධාවු + ඉ + තුං = ධාවිතුං (දුවන්ට)

ක්‍රියා මූලයන්ට එක් වූ තැන් :-
සුණ + ඉ + තුං = සුණිතුං (අසන්ට)
බුජ්ඣ + ඉ + තුං = බුජ්ඣිතුං (අවබෝධ කරන්ට)
ජාන + ඉ + තුං = ජානිතුං (දැන ගන්ට)
ඡින්ද + ඉ + තුං = ඡින්දිතුං (කපන්ට)

B. ආකාරාන්ත ධාතූන් කෙරෙන් :-
දා + තුං = දාතුං (දෙන්ට) යා + තුං = යාතුං (යන්ට)
පා + තු = පාතුං (බොන්ට) ඤා + තු = ඤාතුං (දැනගන්ට)
ඨා + තු = ඨාතුං (සිටින්ට) කා + තුං = කාතුං (කරන්ට)
'කාතුං' යන තැන කර - ධාතුවට කා = ආදේශ වූ විට එය ආකාරාන්ත - ධාතුවක් මෙන් ගන්නා ලදි.

C. අන්තව්‍යඤ්ජනය ත් - බවට පැමිණි තැන් :-
කර + තුං = කත්තං (කරන්ට)
ඡිද + තුං = ඡෙත්තුං (කපන්ට, සිඳින්ට)
භූ + තුං = භොත්තුං (අනුභව කරන්ට, බුදින්ට)
පද + තුං = පත්තුං (පැමිණෙන්ට, ලබන්ට)
හර + තුං = හත්තුං (ගෙනයන්ට)
වද + තුං = වත්තුං (කියන්ට)
ගමු + තුං = ගන්තුං (යන්ට)
ලභ + තුං = ලද්ධුං (ලබන්ට)
බුධ + තුං = බොද්ධුං (අවබෝධ කරන්ට)
'ගන්තුං' යන තැන ධාඣන්තයට ත් වේ. ඉන්පසු දෙතැන්හි භ් + ත්, ධ් + ත් - දෙදෙන ද්ධ බවට පැමිණේ.

D. ධාතුවට වෘද්‍ධිය පමණක් වූ තැන් :-
නී + තුං = නෙතුං (ගෙනයන්ට, පමුණුවන්ට)
ජි + තුං = ජෙතුං (දිනන්ට)

සු + තුං = සොතුං (අසන්ට)
හු + තුං = හොතුං (වෙන්ට)

132. චුරාදිගණිකවූ ද හෙත්වර්ථයෙහි වූ ද අකාරාන්ත ක්‍රියා මූලයන් කෙරෙන් මේ ප්‍රත්‍යයන් වූවිට මධ්‍යයෙහි ඉකාරාගමයක් වේ.

චුරාදිගණික ක්‍රියා මූලයෝ :-
චොරෙ + තුං = චොරෙතුං (සොරකම් කරන්ට)
චොරය + ඉ + තුං = චොරයිතුං (සොරකම් කරන්ට)
පාලෙ + තුං = පාලෙතුං (රකින්ට)
පාලය + ඉ + තුං = පාලයිතුං (රකින්ට)
දෙසෙ + තුං = දෙසෙතුං (දේශනා කරන්ට)
දෙසය + ඉ + තුං = දෙසයිතුං (දෙසන්ට)

කාරිත ක්‍රියාමූලයෝ
කාරෙ + තුං = කාරෙතුං (කරවන්ට)
කාරය + ඉ + තුං = කාරයිතුං (කරවන්ට)
මාරාපෙ + තුං = මාරාපෙතුං (මරවන්ට)
මාරාපය + ඉ + තුං = මාරාපයිතුං (මරවන්ට)
ගාහෙ + තුං = ගාහෙතුං (ගන්වන්ට)
ගාහාපය + ඉ + තුං = ගාහාපයිතුං (ගන්වන්ට)

133. භූවාදික්‍රියා පදයන් සම්පාදනය සඳහා ධාතූන් කෙරෙන් ඣා - ඣාන - තුන - ය - තා යන ප්‍රත්‍යයෝ වෙති.

A. ඇතැම් විට මේ ප්‍රත්‍යයන් හා ධාතූන්ගේ අතරෙහි මකාරාගමයක් වේ.

B. ඇතැම් විට මේ ප්‍රත්‍යයන් පර කල්හි ධාඣන්ත ව්‍යඤ්ජනය ලොප් වේ.

C. ඇතැම් ධාතූන්ගේ දීර්ඝ වූ අන්තස්වරය හ්‍රස්ව වේ. ඇතැම් තැනක ස්වරයට වෘධි වේ.

D. ස්වල්ප තැනක ධාඣන්ත ව්‍යඤ්ජනය සමග ප්‍රත්‍යයන්ගේ ත් කාරය විකාරයට පැමිණේ. ඇතැම් විට ත් - කාරය ලොප් වේ.

ඉකාරාගමය සිදු වූ තැන් :-

පච + ඉ + තුමා = පචිතුමා (පිස)
කර + ඉ + තුමාන = කරිතුමාන (කොට)
වන්ද + ඉ + තුන = වන්දිතුන (වැඳ)
වන්ද + ඉ + ය = වන්දිය (වැඳ)

ක්‍රියා මූලයන් හා එක් වූ තැන්
භුඤ්ජ + ඉ + තුමා = භුඤ්ජිතුමා (අනුභව කොට)
සය + ඉ + තුමාන = සයිතුමාන (නිද)
සුණ + ඉ = තුන = සුණිතුන (අසා)
ජහ + ඉ + තුමා = ජහිතුමා (දුරුකොට, අත්හැර)

ධාතුවන්ත ව්‍යඤ්ජනය ලොප් වූ තැන් :-
කර + තුමා = කතුමා (කොට)
හන + තුමා = හතුමා (නසා) හන්තුමා කියාත් සිටී.
භුජ + තුමා = භුතුමා (අනුභව කොට)
පද + තුමා = පතුමා (පැමිණ, ලබා)
චජ + තුමා = චතුමා (හැරදමා)
ඡිද + තුමා = ඡෙතුමා (කපා, සිඳ දමා)
භිද + තුමා = භෙතුමා (බිඳ)

D.අන්තස්වරය හ්‍රස්ව වූ හෝ වෘධියට පැමිණි තැන් :-
ද + තුමා = දතුමා (දී) හූ + තුමා = හුතුමා (වී)
ඤු + තුමා = ඤුතුමා (දැන) ඨා + තුමා = ඨතුමා (සිට)
නී + තුමා = නෙතුමා (ගෙන ගොස්: පමුණුවා)

E. (1) ත් - කාරය ලොප් වූ තැන :-
දිස + තුමා = දිස්වා (දැක)

F. (2) ධාතුවන්තය සමග ත් - කාරය වෙනස් වූ තැන :-
ලභ + තුමා = ලද්ධා (ලැබ)

G. ධාතුවන්ත ස්වරය පමණක් ලොප් වූ තැන :-
හන + තුමා = හන්තුමා (නසා)
මන + තුමා = මන්තුමා (සිතා කල්පනා කොට)
ගමු + තුමා = ගන්තුමා (ගොස්)
මේ අන්තිම තැන ම් - හට න් වේ.

H. කිසි ආගමාදියක් නොවී ධාතුවට එක් වූ තැන් :-

යා + ඡා = යාඡා (ගොස්)

නී + ඡා = නීඡා (ගෙන ගොස්)

පා + ඡා = පාඡා (පානය කොට)

134. ය - ප්‍රත්‍යය නොයෙක් විට ධාඡන්ත ව්‍යඤ්ජනයාගේ රූපය ගනී. දීර්ඝ ස්වරාන්ත ධාතූන් හා යෙදුණු විට ඔහුගේ රූපය වෙනස් නොවේ.

1. වෙනස් නොවී සිටින තැන් :-

ආ + ද + ය = ආදය (ගෙන)

ප + හා + ය = පහාය (අත්හැර, දුරුකොට)

ආ + නී + ය = ආනීය (ගෙනවුත්)

අ + ඤ්ඤ + ය = අඤ්ඤය (දැනගෙන)

2. පූර්ව ව්‍යඤ්ජනයාගේ රූපය ගත් තැන් :-

ආ + ගමු + ය = ආගම්‍ය = ආගම්ම (අවුත්)

නි + සද + ය = නිසද්‍ය = නිසජ්ජ (හිඳ)

ආ + කමු + ය = අක්කම්‍ය = අක්කම්ම (පාගා)

උ + පද + ය = උප්පද්‍ය = උප්පජ්ජ (ඉපද)

උප + ලභ + ය = උපලභ්‍ය = උපලබ්භ (ලබා)

ප + මද + ය = පමද්‍ය = පමජ්ජ (ප්‍රමාදවී)

ආ+රභ+ය = ආරභ්‍ය = ආරබ්භ (පටන් ගෙන, නිමිති කොට)

ප + විස + ය = පවිස්‍ය = පවිස්ස (ඇතුළුවී)

වි + භජ + ය = විභජ්‍ය = විභජ්ජ (බෙදූ)

(ද්‍ය - ජ්‍ය - දෙකට ජ්ජ - වන සැටිත් භ්‍ය - හට බ්භ වන සැටිත් මින් පෙර පරිච්ඡේදයන්හි දක්වන ලදි.)

3. ධාඡන්ත ව්‍යඤ්ජනය හ් = කාරය වීනම් ය - ප්‍රත්‍යය එය හා ස්ථාන මාරුකර ගනී.

ආ + රුහ + ය = ආරුහ්‍ය = ආරුය්හ (නැගී)

ගහ + ය + ගහ්‍ය = ගය්හ (ගෙන)

ප + ගහ + ය = පග්ගහ්‍ය = පග්ගය්හ (ඔසවාගෙන)

සං + මුහ + ය = සම්මුහය = සම්මුය්හ (මුළා වී)

(1) ඇතැම් විට ය - ප්‍රත්‍යයේ ය් - කාරයට ද්විත්ව වේ.
වි + නී + ය = විනෙය්‍ය (දුරුකොට)
වි + චී + ය = විචෙය්‍ය (තෝරා)

135. ත්‍ය - ප්‍රත්‍යය ධාඎන්ත - ව්‍යඤ්ජනය සමග හෝ එය නැතිව හෝ නිතරම ච්ච - බවට පැමිණේ.

උප + හන + ත්‍ය = උපහච්ච (හපා, කෝප කොට)
ආ + හන + ත්‍ය = ආහච්ච (හපා, ඇනලා)
පටි + ඉ + ත්‍ය = පටිච්ච (නිසා, හේතුකොට)
අනු + විද + ත්‍ය = අනුවිච්ච (දැන, සලකාබලා)
අව + ඉ + ත්‍ය = අවෙච්ච (තේරුම් ගෙන)
උප + ඉ + ත්‍ය = උපෙච්ච (සමීපයට පැමිණ, ළංවී)
නි + පද + ත්‍ය = නිපච්ච (බිමවැටී, වැඳ)
නි + හන + ත්‍ය = නිහච්ච (මැඩපවත්වා)
සං + කර + ත්‍ය = සක්කච්ච (මනාසේ කොට, සකසා)
වි + විච + ත්‍ය = විවිච්ච (වෙන්වී, වෙන්කොට)

අභ්‍යාසය 25

සිංහලට නඟා කිතක පද දැක්විය යුතු.

1. "සො කිර පඤ්චපණ්ණාසවස්සානි සූකරෙ වධිත්වා ඛාදන්තො ච වික්කිණන්තො ච ජීවිකං කප්පෙසි." (චුන්දසූකරික)

2. "භික්ඛූ තස්ස සරද්වාරෙන ගච්ඡන්තා තං සද්දං සුත්වා විහාරං ගන්ත්වා සත්ථුසන්තිකෙ නිසින්නා එවමාහංසු :- "භන්තෙ චුන්දසූකරිකස්ස ගෙහද්වාරං පිදහිත්වා සූකරානං මාරීයමානානං අජ්ජ සත්තමො දිවසො." (ධ. අට්ඨ)

3. "අඤ්ඤබාලපිතරං නිස්සාය එවරූපං බුද්ධං උපසංකමිත්වා කායවෙය්‍යාවතිකං වා කාතුං දානං වා දාතුං ධම්මං වා සොතුං නාලත්ථං. අඤ්ඤං කත්තබ්බං නත්ථීති මනමෙව පසාදෙසි." (මට්ටකුණ්ඩලී වත්ථු)

4. "තතො සො තතියෙ වස්සෙ නාගිඤ්ඤ මණ්ඩක්බිකො
උපසංකම්ම සම්බුද්ධං සහසඞ්ඝං නිමන්තයි" (මහාවංස)

5. "අත්තනො පටියාදෙන බජ්ජභොජ්ජෙන තප්පිය
සම්බුධභාසිතං ධම්මං සාමණෙරමපුච්ඡි තං." (එම)

6. "භුසාපෙත්වාන නගරං ගන්ත්වා සංඝං නිමන්තිය
ඝරං නෙත්වාන භොජෙත්වා දත්වා සාමණකං බහුං
සත්ථරා දෙසිතො ධම්මො කිත්තකොති අපුච්ඡථ." (එම)

7. "නිපච්ච සිරසා තස්ස අනන්තගුණ සාගරෙ
නිමුග්ගො පීතිසම්පුණ්ණො ඉදං වචනමබ්‍රවී."
(වක්කලිතෙරාපදාන)

8. "භවනා අභිනික්ඛම්ම අද්දසං ලොක නායකං
ඉන්දීවරංව ජලිතං ආදිත්තංව හුතාසනං." (මණිපූජකාපදාන)

9. "රඤ්ඤෝ පන වන්දිතෙ භගවන්තං අවන්දිත්වා ඨාතුං සමත්ථො නාම එකොපි සාකියො නාහොසි, සබ්බෙ වන්දිංසු යෙව." (ජාතක නිදාන)

10. "රාජා සංවිග්ගහදයො හත්ථෙන සාටකං සණ්ඨපෙන්තො තුරිතතුරිතං නික්ඛමිත්වා වෙගෙන ගන්ත්වා භගවතො පුරතො ඨත්වා ආහ....කිං එත්තකානං භික්ඛූනං න සක්කා භත්තං ලද්ධුන්ති සඤ්ඤං කරිත්ථාති." (එම)

11. "කනත්ථකො ඡන්නෙන සද්ධිං මන්තයමානස්ස බොධි සත්තස්ස වචනං සුණන්තො ඨත්වා..... සොකං අධිවාසෙතුං අසක්කොන්තො හදයෙන එලිතෙන කාලංකත්වා තාවතිංස භවනෙ.....නිබ්බත්ති." (ජාතක නිදාන)

12. "පරුළ්හ - කච්ඡ - නඛ - ලොමො
අහං කම්මෙසු ව්‍යාවටො
චිරස්සං නහාපිතං ලද්ධා
ලොමං තම්පහාරයිං." (391 කාකජාතක)

මෙහි අමුතු වචන

අධිවාසෙතුං - ඉවසන්ට. නි.
අනන්ත = කෙළවරක් නැති. 3
අඤ්ඤබාල = ඉතා අඥාන වූ. 3.
අපහාරයි = ඉවත් කරවිය.
අබ්‍රවි = කීයේ ය.
අභිනික්ඛම්ම = නික්මී. පූ. ක්‍රි.
අසක්කොන්ත = නොහැකි වූ. 3
ඉන්දීවර = නිලුපුල්. න.

උපසංකම්ම = එළඹ. පූ. ක්‍රි.
එත්තකං = මෙපමණ. 3.
කච්ඡ = කිසිල්ල. පු.
කායවෙය්‍යාවතික = කයින් කරන එලිත = පැළුණු. 3.
වතාවත. න.
කිත්තක = කොපමණ. 3.
ගුණසාගර = ගුණ මුහුද. පු.
ඝරද්වාර = ගෙදොර. න.
චිරස්සං = බොහේ කලකින්. නි.
ජලිත = දිලියෙන, දැල්වුණු. 3.
තප්පිය = සන්තර්පණය කොට.
පූ. ක්‍රි.
තුරිතතුරිතං = වහවහා. නි.
නහාපිත=හිස රැවුල් කපන්නා. පු.
නාගින්ද = නාරජ. පු.
නාලත්ථං = නොලදිමි
නිමන්තිය = ආරාධනා කොට. පූ. ක්‍රි
නිමුග්ග = ගිලුණු. 3.
පරුළ්හ = ඉතා වැඩුණු. 3.
පිදහිත්වා = පියා, වසා. පූ. ක්‍රි.
පීතිසම්පුණ්ණ = ප්‍රීතියෙන්
පිරුණු. 3.
භවන = වාසස්ථානය. න.
භුසාපෙත්වා = සරසවා. පූ.ක්‍රි.
මණිඅක්ඛික = නමක් (මිණිඅක්)
මන්තයමාන = කථා කරන. 3.
මාරියමාන = මරනු ලබන. 3.
වධිත්වා = මරා, තළා. පූ. ක්‍රි.
ව්‍යාවට = යෙදුණු. 3.
සඤ්ඤූ = හැඟීම, ඇඳිනීම. ඉ.
සණ්ඨපෙන්ත = මනාසේ තබමින්. 3.
සංවිග්ග = කලකිරුණු. 3.
සාකිය = ශාක්‍යවංශිකයා. පු. ඒ
වංශයට අයත්. 3.
සාමණක = ශ්‍රමණයන්ට යෝග්‍යවූ. 3.
හුතාසන = ගින්න. පු.

කිතක පද යුක්ත කොට පාලියට නැඟිය යුතු.

1. සවීඥයන් වහන්සේ සැවැත් නුවර වසනසේක් මට්ටකුණ්ඩලියා අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

2. චුන්දසූකරිකයා පනස්පස් අවුරුද්දක් ඌරන් මරමින් ජීවිකාව කොට මැරී ගොස් - නරකයෙහි උපන්නේ ය.

3. බ්‍රාහ්මණයා වෙදුන්ට ධනය දෙන්ට නොකැමැති වූයේ වෙදුන් සමීපයට ගොස් "තොපි අසවල් රෝගයට කිනම් බෙහෙතක් කරවිද" යි අසයි.

4. පිරුණු ගඟෙන් එතෙර වූ සොරා තමාගේ මිත්‍රයන් විසින් රක්නා ලද වන රොදට ඇතුළුව හුන්නේ ඔවුන් දුන් ආහාරය අනුභව කෙළේ ය.

5. දේවල තාපස තෙමේ හිමාලයෙන් අවුත් නුවර දෙර සමීපයෙහි සිටි ළමයින් දැක "මේ නුවරට පැමිණි තාපසවරු කොතැන්හි වාසය කරත්ද"යි ඇසීය.

6. වෙදුන් කී පොතු ආදිය ගෙනවුත් බෙහෙත් කරනු ලබන කල්හිම මට්ටකුණ්ඩලීගේ රෝගය බලවත් විය.

7. පෙර එක් වෙළෙන්දෙක් තමාගේ වෙළඳ සැල සමීපයට පැමිණි පසේ බුදුවරයකුගේ පාත්‍රය පුරවා මී පැණි දුන්නේ ය.

8. සුද්ධොදන රජු භාග්‍යවතුන් වහන්සේට වැන්ද කල්හි ඉතිරි ශාක්‍ය රජවරුත් ශාක්‍ය කුමාරවරුත් උන්වහන්සේට නොවැඳ සිටින්ට අසමර්ථ වූහ.

9. තථාගතයන් වහන්සේ කපිලවාස්තු නගරයෙහි පිඬු පිණිස හැසිරෙන කල්හි පියරජතුමා ඒ ප්‍රවෘත්තිය දැන වහා අවුත් "ස්වාමීනි, අපගේ කුලයට නිදු නොකරවුව මැනැවැ" යි කී ය.

